
# දහම්ගුරු අවසාන විභාගය

# අත්පොත

## දෙවන කොටස



ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

# දහම්ගුරු අවසාන විභාගය අත්පොත
# 1 කොටස

ශ්‍රී ලංකාවේ කතෝලික දහම්ගුරු පිරිස සඳහා වූ විභාග තුනක් ඇත. ඒවා හඳුන්වනුයේ දහම්ගුරු ප්‍රථම, දහම්ගුරු මධ්‍යම හා අවසාන විභාගය වශයෙනි. එම දහම්ගුරු විභාග තුනෙන් දහම්ගුරු අවසාන විභාගය තුන්වන හා අවසාන විභාගය වේ. අවසාන විභාගයට පෙනී සිටිමට දහම්ගුරු ප්‍රථම සහ දහම්ගුරු මධ්‍යම විභාගය සමත් වී තිබිය යුතු ය. අ.පො.ස. උසස් පෙළ ක්‍රිස්තියානි ධර්මය හදාරා ඇති සිසුනට දහම්ගුරු ප්‍රථම විභාගයට පෙනී නොසිට ඍජුව ම දහම්ගුරු මධ්‍යම විභාගයට පෙනී සිටිය හැක. ඊට පසු දහම්ගුරු අවසාන විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

දහම්ගුරු අවසාන විභාගය, දහම්ගුරු විභාග අතර අති සුවිශේෂ ගණයේ විභාගය බව පැවසිය යුතුම ය. එය සුවිශේෂ විභාගයක් වනුයේ විෂය කරුණු රාශියක් අඩංගු පුළුල් විෂය නිර්දේශයක් හදාරා විභාගය සමත් ව ඉන්පසු ශාස්ත්‍රීය රචනයක් ලියා ඊටත් පසු ඉගැන්වීමේ ප්‍රායෝගික පරීක්ෂණයකට ද, මුහුණ දීමට සිදුවන විභාගයක් බැවිනි.


මෙම දහම්ගුරු විභාගයේ විෂය නිර්දේශය විභාග අපේක්ෂිකයින්ට පහසුවෙන් හැදෑරීම පිණිස කොටස් දෙකකින් සමන්විත, සංශෝධිත විභාග අත්වැලක් සුදානම් කිරීමට අදහස් කළේ විභාග අපේක්ෂකයින්ගේ ම පහසුව සඳහා ය. ඒ අනුව පළමුවන ප්‍රශ්න පත්‍රයට එක් පොතකුත්, දෙවන ප්‍රශ්න පත්‍රයට තවත් පොතකුත් ලෙස පොත් දෙකක් නිකුත්වී ඇත. මෙම පළමු පොතට ශුද්ධ වූ බයිබල් අධ්‍යයනය ඇතුළත් කර ඇත. පැරණි ගිවිසුමේ දිවැසිවර කැඳවීම හා දිවැසිවර ඉගැන්වීම්, යුගාන්ත ධර්මය හා ප්‍රඥා සාහිත්‍යය ආදි කරුණු අවබෝධ කරගැනීමට උපකාරක සටහන් ගොනුකර ඇත. තවද නව ගිවිසුමේ ශුද්ධවර ජොහන් සුවිශේෂය පාවුලු තුමාගේ සංදේශ ඇතුළු ව, එළිදරව් පොත පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට උපකාර ව සටහන් ගොනුකර ඇත.

එපමණකුදු නොව දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශන ගැන සාමාන්‍ය අවබෝධයක් දැන ගැනීමට උපකාර කරන අතර දේව ප්‍රසාද නිධාන ගැන අවබෝධයක් යොමු කිරීමට මෙම පළමු පොත පිටුවහලක් වනු ඇත.

දහම්ගුරු අවසාන විභාගය සමත්වීම තුළ දහම් ගුරුවරයා ශුද්ධ වූ බයිබලය ගැන, සහා ඉගැන්වීම් ගැන හා දේව ප්‍රසාද නිධාන ගැන හසළ දැනුමක් නොතිබුණහොත් දහම්ගුරු භූමිකාවට මහත් මදිපුංචිකමක් වනු නියත ය. විභාගයට පෙර ඒ දැනුම ලැබීමට කියවිය යුතු පොත් පත් රාශියක් ඇත. විටෙක දී ඒ පොත් සොයා ගැනීමට අපහසුකම් හා දුෂ්කරතා මතුවිය හැක. එවැනි දුෂ්කරතාවයනට මද අස්වැසිල්ලක් වනු පිණිස මෙම පොත දහම්ගුරු අවසාන විභාගයේ පළමු ප්‍රශ්න පත්‍රයට උපකාරකයක් ලෙස ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය සුදානම් කර ඇත.

අධ්‍යක්ෂ පියතුමා,
ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය,
19, බැල්කම් පෙදෙස,
කොටා පාර,
කොළඹ 08.

# දහම්ගුරු
# අවසාන විභාගය
# අත්පොත
## 2-කොටස



ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

පටුන

පිටු අංකය


| | |
|---|---|
| කතෝලික සමාජ දර්ශනය | 4 |
| ධර්මෝපදේශයේ විකාශනය | 21 |
| ශ්‍රී ලංකාවේ කිතුනු සභා ඉතිහාසය | 46 |
| ගැළවීමේ කාර්යය තුළ මරිය තුමියගේ කාර්යභාරය | 67 |
| ආධ්‍යාත්මික ජීවිතය | 72 |
| සහභාගිශීලි සභාව | 76 |
| ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති | 79 |
| අන්තර් සභා සහජීවනය | 81 |

# හතරවන පාඩම

## 4. කතෝලික සමාජ දර්ශනයේ සහා ප්‍රකාශනයන්හි විශේෂ තේමා පිළිබඳ කෙටි හැඳින්වීම

## 4.1. කතෝලික සමාජ දහමට බයිබලීය පසුබිම හා එවැනි සමාජ දහමක් ගොඩ නැගෙන්නට හේතුවූ ඓතිහාසික කරුණු විමසීම

**හැඳින්වීම :**

කිතුනු විශ්වාසය සාමාන්‍ය වශයෙන් සළකනවිට පෞද්ගලික දහමක්වත් හුදු ආධ්‍යාත්මික අංශයට පමණක් සීමා වූ දහමක් නොවන බව තේරුම්ගැනීම වැදගත්ය. කිතුනු දහම මිනිස් ජීවිතයේ සෑම අංශයකටම අදාළ ය. තවද, එම සම්බන්ධය ලෞකික හා ලෝකෝත්තර වශයෙන් බෙදා වෙන් කිරීමට ද නොහැකි ය.

කතෝලික සමාජ ධර්මයක් වශයෙන් අවශ්‍යවන්නේ කුමක් නිසා ද යන්න විමසිය යුතු ය. කිතුනු දහම තුළම සමාජ ප්‍රශ්නවලට පිළිතුරක් නොමැති ද? යන්න විමසනවිට බයිබලීය දැක්ම තුළ පැවති සමාජමය ස්වරූපය කාලයත් සමග දුබලවීමක් දක්නට ලැබිණි. පුරාණ ගිවිසුමෙත් ජේසු සමිඳාණන්ගේ ඉගැන්වීම තුළත් කිතුනු දැක්ම තුළ සමාජමය ස්වරූපය ඉතා පැහැදිලිව විද්‍යාමාන වෙයි.

බයිබලීය දැක්ම තුළ:

අ) **පුරාණ ගිවිසුමෙහි අඩංගු සමාජ දැක්ම – නික්ම යාම සිද්ධිය අනුව ගොඩනැගෙන ''නව සමාජ දහම'' අවස්ථා කිහිපයක් දැක්වීම :**

- නික්මයාම 1 : 15 සිට වින්නඹු මාතාවන් දෙදෙනාගේ කතාව හා මෝසෙස්ගේ ජනිතය හා පැන යාම ජුදා ජනතාවගේ වහල් භාවය

- නික්මයාම 3 : 7 සිට ජනතාවගේ අඳෝනාවට දෙන පිළිතුර මෝසෙස් පාරාවෝ වෙත පැමිණ කරන අභියෝගය – පීඩනය හා වසංගත 10 අවසානයේ නිදහස ලැබීම – මුල් පාස්කුව විමුක්තිදායක ක්‍රියාවලියට දායක වීම

මෙම ක්‍රියාවලියෙන් ප්‍රකාශවන කරුණු මොනවා ද?

1. ගෝත්‍ර 12 අතර ඇතිවන බැඳීම හා දේව ජනතාවක් බවට පත්වීම.

2. සැබෑ විමුක්තිය කුමක් ද යන්න – හැම විමුක්ති අරගලවලට ම ප්‍රතිමූර්තියක් හෝ මොඩලයක් වශයෙන් ගිණිය හැකි ය.

3. පාරාවෝගේ ව්‍යුහය හා නික්මයාමෙන් ඉස්මතුවන ව්‍යුහය අතර ඇති වෙනස
   - පාරාවෝගේ ක්‍රියාකාරිත්වය පිරමිඩ ව්‍යුහයකි. එය ඉහළ සිට පහළට වන අතර සමාජයේ පහළ සිටින අය සූරාකෑමට ලක් වෙයි.
   - නික්මයාම ව්‍යුහය **සහෝදරත්වයේ ව්‍යුහයකි**. සුහදතාවයක් හා සමානාත්මතාවයක් පිළිබිඹු වෙයි.

4. දේව ක්‍රියාකාරිත්වය – දෙවියන් කෙරෙහි විශ්වාසය තැබීම ය – විමුක්තිය මිනිස් උත්සාහයෙන් ලබා ගත් එකක් නොවේ. අවි බලයෙන්වත් ධන බලයෙන්වත් හිමි කර ගත් දෙයක් නොවන වග

5. නික්මයාම 15: 18 සඳහන්වන, සමිඳාණෝ සදහට ම රජකම් කරන සේක යන්නෙහි අරුත තේරුම් ගැනීම ඉතා වැදගත් ය. එයින් ඉස්මතු වන්නේ – මිනිසා අතර ඇති සමානාත්මතාවය ය. එනම් එක් මිනිසෙකුට තවත් මිනිසෙක් යටපත්කර ගන්නට නොහැකි බවය – රජකම දෙවියන්ට පමණයි. එහෙත් පසුව ජනතාවගේ ඉල්ලීම නිසා ලබා දුන්නේ ය. එහෙත් විශේෂ කොන්දෙසි කිහිපයකට යටත් කරමින් සීමාවන් ඇතුව ය.

6. ජුදා ජනතාවගේ එදිනෙදා දිවිය හා සම්බන්ධයෙන් මුල් පාස්කු කථාන්තරයෙන් අරගලයක ස්වරූපයක් ඉස්මතුවන බව තේරුම් ගැනීම වැදගත් ය.

7. ගිවිසුමකින් ඇතිවන පොරොන්දු පත්‍රයක් මගින් ද එක සමානව සැලකීමට එකඟ වෙයි - දස පණත එහි ප්‍රතිඵලයයි.

## ආ) දිවැසිවරුන්ගේ ක්‍රියාකාරිත්වය

දිවැස්වරුන් වරින්වර ගිවිසුම ගැන කරුණු විමසා ජනතාවගේ දුර්වල ප්‍රතිචාරයන් ඉදිරියේ නව ගිවිසුමකට දෙන පොරොන්දු මගින් අනාගතයේ පැමිණෙන්නට සිටින මෙසියස් ගැන සටහනක් ඇත. එසේම දිවැස්වර ඉගැන්වීම්වල ඇති සමාජයීය බලපෑම පිරික්සීමෙන් ද එය හුදු පෞද්ගලික දහමක් නොව සමාජ ආර්ථික දේශපාලනික හා සංස්කෘතික කටයුතු සමග බද්ධවන බව පැහැදිලි වෙයි.

- ආමොස් - මීකා - යෙසායා -ජෙරමියා - එසකියෙල් වැනි අයගේ ජීවිතය හා දෙසුමෙන් ද සමාජ මුහුණුවර පැහැදිලිවෙයි. ජෙරමියාගේ **31:31** නව ගිවිසුමේ ලක්ෂණ - හදවතේ ඇතිවන ආකාරය ගැන කරන විස්තරයකි.

## ඇ) ජේසු සමිඳාණන්ගේ ඉගැන්වීම - ආරම්භක දෙසුම මාක් 1: 14-15

දේව රාජ්‍යය සමීපය. මෙම දේව රාජ්‍යය කුමක් ද යන්න තේරුම් ගැනීමෙන් එහි අඩංගුවන මූලික කරුණු තේරුම් ගැනීමට උදව්වකි. මෙම දේව රාජ්‍යය සියල්ල ඒකාග්‍රවන දහමකි. පෞද්ගලික විමුක්තියකට පමණක් සීමා වන්නක් ද නොවේ. මෙම දේව රාජ්‍යය පිළිබඳ එතුමාණන්ගේ ඉගැන්වීම සම්පිණ්ඩනය කළ විට මෙසේ මූලික කරුණු තුනකින් දැක්විය හැකි ය.

අ) නිදහස - කුමකින් ද නිදහස් වන්නේ, කුමක් අරභයා ද නිදහස් වන්නේ
**Freedom from and Freedom for**.

ආ) සහෝදරත්වය.

ඇ) යුක්තිය සමාජය තුළ සහතික කිරීම

මෙම දහම උගන්වමින් ජීවිතය තුළින් ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලය වූයේ කුරුසියයි. එය අවසානය නොවී ය. කුරුසිය පරදා උත්ථාන වීමෙන් මෙම සමාජ දහමට ප්‍රධාන වන පසුබිම සකසයි.

**මුල් සභාවේ ක්‍රියාකාරිත්වය:**

ක්‍රියා පොතේ සඳහන්ව ඇති ආකාරයට නව සමාජයේ ලක්ෂණ පිළිබිඹු වෙයි. - ක්‍රියා **2: 42-47 4: 32-35** හා **5 : 1-6** අනනියස් හා සපිරා වෙත උදාවූ තත්ත්වයෙන් එහි අනිසි ප්‍රතිඵල දැක්වෙයි. පාවුළුතුමා පිලමොන්ට ලියා යැවූ කෙටි සන්දේශයෙන් ද මෙය පැහැදිලිවෙයි.

මෙම සහෝදරාත්මක සාංඝික බැඳීම මිලාන් ආඥාව ( ක්‍රි.ව **313**) තෙක් පැවැතිණි. ඉන් අනතුරුව සභාව ව්‍යාප්ත විය. ඒ සමඟ ම ක්‍රි.ව. **379** දී රාජ්‍ය ආගම බවට පත්විය.

**මිලාන් ආඥාවෙන් පසුව:**

පශ්චාත් මිලාන් ආඥාව හා සභා ඉතිහාසය පුරා විහිදියාමේ දී මූලික ඉගැන්වීම්වලින් පිට පැනීමක් සිදුවිය.........
දේපල හිමිකම පූජකවරුන්ට පැවරීම
පූජකවරුන්ට විශේෂ බලතල ලබාදීම
පූජක ගිහි ප්‍රභේදය වැඩියෙන් ඉස්මතුවූ අතර, මෙම කාලය තුළ ප්‍රතිගාමීත්වය හිස ඔසවන්නට විය.
ධර්මය පිළිබඳ මත ගැටුම් නිරාකරනය කිරීම සඳහා රාජ්‍ය බලය යෙදවීමට පවා සිදු වූ අවස්ථාවන් ද වාර්තා වී ඇත.

## 1. තාපස නිකායන් ඇරඹීම හා ප්‍රතිසංස්කරණ යුගය

ක්‍රිස්තියානියේ ගුණාත්මක භාවය හීනවීම නිසා ගුණාත්මක භාවය ප්‍රතිෂ්ඨාපනය කිරීමට තාපස දිවිය තුළින් උත්සාහ කිරීම සිදු විය. එහිදී ඊජිප්තුවේ ශු. අන්තෝනි මුනිතුමාත් ශු. බෙනඩික්ට් මුනිතුමාත් ගත් පුරෝගාමී පියවර මගින් තාපස පන්ති ඇරඹීමෙන් ඉටු කළ සේවාව සටහන් කළ යුතු ය. එහෙත් සභාව ඉතිහාසය පුරා ම විවිධාකාරයෙන් සමාජ ප්‍රශ්නවලට මුහුණ දුණි. වරින් වර සභාවට විරුද්ධ ක්‍රියාකාරකම් ඉස්මතු විය. සමහර අවස්ථාවලදී සභාවෙන් වෙන්ව ගිය අතර ම වෙනත් නිකායන් ඇරඹීම 16වන සියවසේ දී සිදුවිය. එකල යටත් විජිත ප්‍රතිපත්තිය නිසා ම යුරෝපයෙන් පිටතට ක්‍රිස්තියානි දහම ගෙනයාම ආරම්භ විය.

## 2. කාර්මික විප්ලවීය ධනවාදය

යුරෝපය තුළ ජනිතවූ පුනරුදය කරණකොට ගෙන ඇතිවූ නව දාර්ශනික බලපෑම් මෙන්ම විද්‍යාත්මක නව සොයා ගැනීම් හේතුවෙන් 17 වැනි සියවසේ දී උද්ගතවූ කාර්මික විප්ලවයෙන්, සභාවට ද අනියම් ආකාරයෙන් බලපෑම් ඇතිවිය. බ්‍රිතාන්‍යයෙන් ඇරඹුණු එම විප්ලවය මුළු සමාජ පැවැත්මේම විශාල වෙනසක් ඇති කරන්නට හේතු විය. වැඩ වසම් යුගයේ සිට පැවැත ආ සමජ රටාව ඉරිතලා ගියෙන්, පන්තිමය ස්වරූපයක් ගොඩ නැඟුණි. ජනජීවිතය හා ක්‍රිස්තියානි ජීවිතය අතර පරස්පරයන් ද ඇති විය. ලාභය මුල් කරගත් සමාජ රටාවක් තුළ මිනිසාට හිමිවූයේ දෙවන තැන ය.

දුප්පත්කම වැඩි වර්ධනය වීම හා ඔවුන් සූරුකෑමට ලක්වීමත් සමග කාන්තා හා ළමා ශ්‍රමිකයන් ද බිහි විය. අවුරුදු 6-10 ළමුන් පවා පොළොව යට පතල්වල දවසට පැය 10-12 කාලයක් වැඩ කරන්නට විය. මෙයට විරුද්ධව හඩක් නගන්නට කවුරුත් ඉදිරිපත් නොවුණි. මෙය සාධාරණීය කරනු ලැබුවා වූ රාජ්‍යය නිර්බාධක වාදය **Liberal Capitalism -** ධනවාදය **(Laissez-faire – liberalism non-interference)** ඇඩම් ස්මිත් 1723- 1790 වන අය එහි නිර්මාතෘවරයා වශයෙන් සැලකෙන්නේ ය.

ඔහුගේ දැක්ම අනුව

- වෙළෙඳපොළ ක්‍රියාත්මක විය යුත්තේ සාමාන්‍ය භෞතික නීතිරීති අනුව ය.
- ආර්ථික කටයුතුවල දී සදාචාරීය හා සමාජ අරමුණු අනුව ක්‍රියාත්මක විය නොහැකි ය.
- කිසියම් බාධාවකින් තොරව නිදහස් වෙළෙඳපොළ ක්‍රියාත්මක වන්නේ නම් හැම අයෙකුම පොහොසත් වී සතුටින් දිවි ගෙවනු ඇත.
- පුද්ගලයාගේ ස්වඋත්සාහය මත පෞද්ගලික දේපල රඳා පවතියි.
- වෙළෙඳපොළේ තරගකාරීත්වයෙන් පමණක් පොදු යහපත ඇතිවන බව සහතික කිරීම සිදුවෙයි.
- ඉල්ලුම හා සැපයුම් න්‍යාය මත වැටුප් තීරණය කළ යුතු ය.
- පුද්ගලවාද න්‍යායික පදනම මත ආධ්‍යාත්මිකත්වය ගොඩනැගීම සිදු විය යුතු ය.

## 3. ප්‍රංශ විප්ලවය හා මාක්ස්වාදය

1789 දී ඇතිවූ ප්‍රංශ විප්ලවය මගින් සම්ප්‍රදායික සමාජ පැවැත්ම වෙනුවට මූලික වූ සාධක තුනක් ඉස්මතු කර ඇත. ඒවා නම් නිදහස, සමානත්වය හා සහෝදරත්වය යි. මෙම විප්ලවයෙන් දේශපාලන රටාව නවතාවයකට යොමු කළ බව කිව යුතු ය. එහි දී ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය ද, ජාතිවාදය පිළිබඳව නීති සංග්‍රහය ද ඉස්මතු වූ කරුණු ය. ප්‍රංශ විපල්වය මධ්‍යම පාන්තික අරගලයකි. මෙම අරගලය පැවතියේ කා සමග ද යන්න විමසන විට පැහැදිලි වන්නේ එය සභාවේ සහයෝගය ලබාගත් වතුහිමි රදල පන්තිය සමග සිටි ඒකාධිපති රාජාණ්ඩුව හා නිදහස් මතවාද මධ්‍යම පන්තිය සමග ය. එනම් ජනතාව සමඟ ඇතිවූවක් බව ය. මෙයින් ධනවාදී රටාවකට වඩා සහයෝගිතාව පදනම් වූ එකමුතුකම මුල් කරගෙන දියත් වූ සමාජ පෙරළියකට මුල පිරිණි. මෙම විප්ලවය මෙන්ම 1776 දී ඇමෙරිකා එක්සත් ජනපදය බිහිවීමෙන් සභාවට ඇති වූ බලපෑම ඉමහත් ය.

**මාක්ස්වාදය**

කාල් මාක්ස් (1818-83) පවතින සමාජ රටාවන් ගැන විමසිලිමත් වීමෙන් අනතුරුව සමාජයේ පවතින සූරාකෑම ගැන අදහස් දක්වමින් නව දර්ශනයක් ඉදිරිපත් කරන ලදි. මාක්ස්ට සහාය ලබා දුන් සගයා

වුයේ ප්‍රෙඩ්රික් එන්ගල්ස් (1820– 1885) ය. 1848 දී මාක්ස් ප්‍රකාශයට පත් කළ **(Communist Manifesto)** කොමියුනිස්ට් ප්‍රතිපත්තිය මගින් සමාජයට හා සභාවට මහත් බලපෑමක් ඇති කරන ලදි. කාල් මාක්ස් හා පෙඩ්රික්ස් එන්ග්ලස් ජනිත කළ සාමාජවාදය මනෝරාජික සමාජවාදීන්ගෙන් වෙනස් වුයේ මේ දෙදෙනා නිර්ධන පන්තියේ අඥාදායකත්වයක් තුළින් දේශපාලන බලය අල්ලා ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීම නිසා ය.

**(DAS KAPITAL)** ඩස් කපිටාල් මේ දෙදෙනා නිකුත් කළ විශාලත ම කෘතිය ය. එය මාක්ස්ගේ බයිබලය වශයෙන් හැඳින්විය හැකි ය.

ඔවුන් දෙදෙනා තමනට ආවේණික සමාජ විග්‍රහයකට අදාළවන ඉගැන්වීමක් ලොවට දානයකර ඇත. ආර්ථිකය සමාජයේ ඉතාම වැදගත්වන නිසාත්, එය සමාජය මෙහෙයවන බලවේගය නිසාත් යටිතල ව්‍යුහය **(infra structure)** වශයෙන් නම් කරනු ලැබුවේ ය. සමාජය වෙනස්කරන ඉතිහාසය සකසන්නේ ද ආර්ථිකයයි. පන්තිමය ස්වරූපය නිසා නිෂ්පාදනය කරවනු ලබන හා කරනු ලබන අය වශයෙන් ධනය හිමි හා නිර්ධන පන්ති වශයෙන් සමාජය බෙදී ඇති අකාරය පෙන්වා දෙයි. ධනවාදය තුළ ම ඇති ඒකලනය හා ධනවාදයේ ඇති ප්‍රතිවිරෝධතා, අන් සාධක එනම් සංස්කෘතිය ආගමේ සුපිරි ව්‍යුහය **(super structure)** වශයෙන් නම් කරනු ලැබුවේ ය,. දේව විරෝධී සංකල්පයක් ගැබ් ව තිබුණේ එහි පැවැති ඉගැන්විම්වලින් දුගී ජනයා අන්ධබවට පත් කිරීමට ය. තවද ආගම අබිං වශයෙන් හඳුන්වා දීමට ද පෙළඹුණි.

## 19 වන සියවසේ කතෝලික සභාවේ බලපෑම:

ප්‍රංශ විප්ලවය මෙන් ම කාර්මික විප්ලවයෙන් ද, මාක්ස්ගේ ඉගැන්වීම නිසා ද කිතුනු සභාවට බලපෑමක් ඇති විය. විශ්වාසිකයින් සභාවෙන් පිට වීම ද, සහා පැවැත්ම පිළිබඳ ප්‍රශ්න කිරීමට ද පටන් ගති

9 වන පියුස් පාප්තුමා (1846-78) බලයට පත්වීමෙන් අනතුරුව 1849 දී පාප්වහන්සේට අයිතිව තිබූ පාප් රාජ්‍යයන්හි **(Papal states)** ප්‍රධානියාගේ ඝාතනය මහත් බලපෑමක් ඇති කළ කරුණකි. එතුමා සියළු මතවාදයන් හෙළා දකිමින් 1864 දී ඉදිරිපත් කළ **Syallabus of Errors** නැමැති ප්‍රකාශනයෙන් ප්‍රගතිශීලින්ට දොර වැසීමක් විය.

1869-70 වතිකාන මුල් කතිකාව කැඳවීම හා පැවැත්වීමත් එය සම්පූර්ණ කිරීමට නොහැකිවුයේත් ප්‍රසියන් යුද්ධය නිසා ය. එයින් පාප් රාජ්‍යයන් පාප්වහන්සේට අහිමිවීමත් පාප්වහන්සේ වතිකානුවේ සිර කරුවෙක් බවට පත්වීම ද සිදුවිය.

එතුමාගේ කාලයේ සිදු වූ දේ අතර විවිධ දර්ශනයන් හෙළා දැකීම සිදුවිය.

- ස්වාභාවවාදය **Naturalism**
- බුද්ධිවාදය **Rationalism**
- සමාජවාදය **Socilaism**
- ගැලිකන්වාදය **Galicanism** - පාප් බලය හා මධ්‍යගත බලයට පටහැනිව ඉදිරිපත් කළ දැක්මකි.
- දේශපාලන ලිබරල්වාදය **Political Liberalism**

කතෝලික සමාජ ධර්මය මග පැදූ අය අතර
ප්‍රංශය තුළ -

1. පෙඩ්රික් ඕසනම් (1813-1853) - සාන්ත විසෙන්ති ද පාවුලා සමිතිය ආරම්භ කිරීමෙන් දැක්වූ ප්‍රවණතාවය ඉතා මහත් ය.
2. ආප් ද ලමෙනේ (1782- 1854) ධනවාදය හෙළා දකිමින් ජනතාවගේ පීඩාව ගැන සංවේදී වීම.
3. මොරිස් මෙයිග්නෙම් - 1869 දී තරුණ කම්කරුවන්ගේ කණ්ඩායමක් ආරම්භ කරන ලදි. 1871 වැඩිහිටි කම්කරුවන්ගේ සංවිධානයක් ද බිහිවි ය.

ඔස්ට්‍රියාවේ -

කාල් වොන් වෝගල්සන්ග් – (1819-91) ධනවාදය හෙළා දකිමින් නවතාවයකින් සමුපාකාර හා සමාන තත්ත්වයක් ඉදිරිපත් කරන ලදි. පත්‍ර කලාව උපයෝගි කර ජනතාවගේ චින්තනය සමාජ ප්‍රශ්න වෙතට යොමු කරන ලදි.

ජර්මනියේ –

විල්හෙල්ම් එම්මානුවෙල්, වොන් කෙට්ලර්ණි මේන්ස් හි රදගුරු (1811-1877) අඩු වැටුප් ගෙවමින් පවත්වා ගෙන ගිය වහල් සේවාවන් ගැන ඉතා දැඩි ලෙස විරුද්ධ නව නීති පැනවීමෙන් දුගී කම්කරුවන්ට සේවාවක් වීමට හඬක් නැඟී ය. රජයේ මැදිහත්වීම සඳහා බලපෑමක් කරන ලදි. වෘත්තීය සමිති වෙනුවෙන් ද ඉදිරිපත් විය. එතුමා සමාජ වෙනස්වීමක් වෙනුවෙන් බලවත් හඬක් නැගූ කෙනෙකි. පූජකවරුන් අර්ථ ශාස්ත්‍රය ගැන පුහුණු කළ යුතු බවට හඬක් නගමින් තම රදගුරු වසම තුළ එය ඉටු කරන ලදි. එතුමා මාක්ස් විරෝධියෙක් ද වූයේ ය. මාක්ස් බොරු දිවැසිවරයෙක් වශයෙන් නම් කරන ලදි. වොන් කෙට්ලර් රදගුරුතුමා කතෝලික කම්කරුවන්ගේ ආදරයට ගෞරවයට පාත්‍රවිය.

බ්‍රිතාන්‍යයේ -

කාර්දිනල් මැනින් (1808 – 1892) වෙස්ට්මිනිස්ටර් රදගුරු පදවිය – මහත් වෙහෙසක් දරමින් වෘත්තීය සමිති වෙනුවෙන් ඉදිරිපත් විය.

ඇමෙරිකාවේ -

කාර්දිනල් ගිබන්ස් බෝල්ටිමෝර් (1834-1921)

ස්විස්ටර්ලන්තයේ -

මර්මිලොඩ් රදගුරුතුමා – 1 වතිකාන කතිකාවතේ දී සමාජවාදය ගැන කරුණු දක්වමින් ධනවත් අයට විශේෂ ආයාචනයක් කරන ලදි. එනම්, ධනවතුන් මෙන්ම බලවතුන්ට ද දුගීන් ගැන අවධානය යොමු කිරීමට ය. එතුමා 1884 දී ද – සමාජ අධ්‍යයනය සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් ආරම්භ කරමින් ප්‍රංශ මෙන්ම ජර්මන් කණ්ඩායම් ගෙන්වන ලදි. මෙම මධ්‍යස්ථානයට 13 වන ලියෝ පාප්තුමාගේ කණ්ඩායමක් ද පැමිණ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අවසන් නිගමනයන් පාප්තුමාට ඉදිරිපත් කරන ලදි.

**ආසියාවේ පසුබිම – “වෙහෙසෙන මිනිස්සු” ලිවීමට පෙර**

16 වන සියවසේ සිට පෘතුගීසි හා ලන්දේසි ආක්‍රමණයන්
18 වන සියවස අවසානයේදී බ්‍රිතාන්‍යයන්ගේ ආක්‍රමණයන්
1842 දී නැන්කින් ගිවිසුම චීනයේ හොං කොං දූපත බ්‍රිතාන්‍යයින්ට පැවරීම

මෙවැනි ඓතිහාසික පසුබිමක් තුළ කතෝලික සමාජ ධර්මයට අඩිතාලම දැමුණි.

## 5.2. කතෝලික සමාජ දහමට අඩංගු විශ්ව ලේඛන ලැයිස්තුව ඒවායින් විශේෂ වන තේමා පිළිබඳව හැඳින්වීමක්

### 1. සමාජ විශ්ව ලේඛන

- **1891 – 13 ලියෝ පාප්තුමා– වෙහෙසෙන මිනිස්සු – රේරුම් නොවාරුම් Rerum Novarum**
- **1931 – 11 පියුස් පාප්තුමා – සතළිස් වසර – කුවාඩ්රාජෙසිමෝ අන්නෝ Quadragesimo Anno**
- **1941 – 12 පියුස් පාප්තුමාගේ ගුවන් විදුලි කථාව**
- **1961 - 23 ජුවාම් පාප්තුමා – අයුක්තියට පිළිතුර - මාටර් එට් මජිස්ට්‍රා Mater et Magistra**
- **1962 - 23 ජුවාම් පාප්තුමා – ලෝකය තුළ සාමය – පාචෙම් ඉන් ටෙර්රිස් Pacem in Terris**

- 1965 - දෙවන වතිකාන කතිකාවත – වර්තමාන ලෝකයේ ශු. සභාව ගෞඩ්ඩියුම් එට් ස්පේස් **Gaudium et Spes**
- 1967 - 6 පාවුළු පාප්තුමා - ජනතා ප්‍රගතිය – පෝපුලෝරුම් ප්‍රෝග්‍රෙස්සියෝ
- **Populorum Progressio**
- 1971 - 6 පාවුළු පාප්තුමා සමාජ සාධාරණත්වය හා සංවර්ධනය ඔක්ටෙජෙසිමා අඩ්වේනියෙන්ස් **Octagesima Adveniens**
- 1971 - රදගුරු කතිකාව – ලෝකය තුළ සාධාරණත්වය **Justice in the World**
- 1979 - 2 ජුවාම් පාවුළු පාප්තුමා – මිනිසාගේ ගැලවුම්කරුවාණෝ –රෙඩෙම්ටෝර් හොමිනිස් **Redemptor Hominis**
- 1981 - 2 ජුවාම් පාවුළු පාප්තුමා – මිනිස් ශ්‍රමය –ලබෝරෙම් එක්සර්සෙන්ස් **Laborem Exercens**
- 1987 - 2 ජුවාම් පාවුළු පාප්තුමා – සමාජ සැලකිල්ල –සොලිසිටුඩෝ රේයි සෝසියාලිස් **Sollicitudo Rei Socialis**
- 1991 - 2 ජුවාම් පාවුළු පාප්තුමා – සිය වස – සෙන්ටේසිමුස් අන්නුස් **Centesimus Annus**

## 2. විශ්ව චක්‍ර ලේඛනය යනු කිම – Encyclical Letter

සාමාන්‍යයෙන් පාප් වහන්සේ විසින් මුළු සභාවට ම හෝ සමස්ත ජනයා වෙනුවෙන් කරන එඩේරික මඟ පෙන්වීම ය. ඒ ඒ අවස්ථාවන්ට ගැලපෙන ආකාරයෙන් විශ්වාසයට හා සදාචාරයට උචිත වන කරුණු මෙහි අඩංගු ය. 18 වන සියවසේ පටන් මෙම ඉගැන්වීමේ සම්ප්‍රදාය භාවිතා කරන ලදි.

**3**. සමාජ විශ්ව චක්‍රලේඛන සම්ප්‍රදාය ආරම්භ කරන ලද්දේ 13 වන ලියෝ (1878 – 1903) පාප්තුමා විසින් ය. පළමු විශ්ව ලේඛනය වන්නේ “වෙහෙසෙන මිනිස්සු” ය. එයින් ආරම්භ වූ ගමන් මඟ හරහා ශත වර්ෂයකට අධික කාලයක් පුරා එම ධර්මය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී ඇති ආකාරය ද වටහා ගැනීම වැදගත් ය. කතෝලික සමාජ ධර්මය (**කතෝලික සමාජ දහම**) ස්ථිතික දෙයක් නොව ගතික ස්වරූපයකින් 1891 සිට වර්ධනය වී ඇති බව ද තේරුම් ගත යුතු ය. 1891 සිට පැවැති තත්ත්වය 2003 වන වෙනස් වී ඇත. ලෝක ඉතිහාසය තුළ ඇතිවූ වෙනස්කම් වලට අනුකූලව සහා ඉගැන්වීම් වර්ධනය තේරුම් ගැනීමට මූලික වන ප්‍රධාන ප්‍රභේදයක් තේරුම් ගත යුතු ය.

(1) එනම් 1891 සිට දෙවන වතිකාන කතිකාවත දක්වා පැවැති ඉගැන්වීම් මුල් කොටස වශයෙන් ද,
(2) දෙවන වතිකාන කතිකාවතෙන් පසු වර්තමානය දක්වා ඉගැන්වීම් දෙවන කොටස වශයෙන් සැලකිය හැකි ය.

කිතු දහම සමාජමය වෙනසක් ඇති කරමින් සැමට යහපතක් ඇති කරනු වස් පෞද්ගලික සුඛ සිද්ධිය පැතීම පමණක් ගැලවීම නොවන බව පෙන්නුම් කරයි. සමාජයේ පවතින අසාධාරණය පිටු දකිමින් බයිබලයේ අඩංගු සත්‍යතාවයන් අනුව සමාජයේ වර්තමානය යථාර්ථය මගින් ඉස්මතුවන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම මෙම විශ්ව චක්‍රලේඛන හරහා උත්සාහයක් දක්නට ඇත.

## 4. කතෝලික සමාජ ධර්මයට මූලිකවන න්‍යායන් කිහිපයක්

1. මානව උදාරත්වය පිළිබඳ ප්‍රතිපත්තිය – මිනිසා දේව සමානකමට හා ස්වරූපයට මවා ඇති නිසාත් ජේසු සමිඳාණන් විසින් ගලවා ඇති නිසාත් මානව සංහතියේ සාමාජික සාමාජිකාවන් වශයෙන් නොවෙනස්වන නොබෙදිය හැකි උදාරත්වයකට හිමිකම් කියනු ඇත. ජාතිය, කුලය, ආගම, වයස හෝ අනුව සැම කෙනෙකුට ම එක සමාන අයිතියක් පැවරෙයි. සැම විශ්ව චක්‍රලේඛනයකට ම පාදකවන මෙම ප්‍රතිපත්තිය උත්පත්ති 1: 26-28 දක්වා මැවීමේ විස්තරයෙන් මතු කළ ඉගැන්වීමකි.

2. මානව ජීවිතය ගරු කිරීමේ ප්‍රතිපත්තිය “පිළිසිඳෙන මොහොතේ සිට මරණය දක්වා ජීවිතය සුරුකීමට අයිතියක් සැමට පැවරෙයි” මෙම කරුණ ද සැම විශ්ව ලේඛනයක ම දක්නට ඇත.
3. සංවිධානවීමට ද හිමිකමක් ඇත. පුද්ගලයා සතු උදාරත්වය අනුව සාමූහිකව කටයුතු කිරීමට ද හිමිකමක් ඇත. මිනිසා ස්වභාවයෙන් ම සමාජමය සත්ත්වයෙක් වන නිසා, එම ස්වභාවයට අනුව කටයුතු කිරීමට ද අයිතියක් ඇත. **වෙහෙසෙන මිනිස්සු, සතළිස් වසර** හා **ලෝක සාමය** යන විශ්ව චක්‍ර ලේඛනවල මෙම කරුණු වඩා ඉස්මතු කර ඇත.

4. සහභාගිත්වය සඳහා අයිතියක් ද ඇත. සමාජයේ ජීවත්වන සැමට එහි පංගුකාරවෙමින් සැමගේ යහපත වෙනුවෙන් සම්බන්ධ වී කටයුතු කිරීමට ද අයිතියක් ඇත. 1971 දී නිකුත් කළ **සමාජ සාධාරණත්වය හා සංවර්ධනය** නැමැති විශ්ව ලේඛනය මගින් මෙම සත්‍යතාවය හුවා දක්වා ඇත.

5. සමාජයේ ක්‍රියාත්මකවන අසමාන තත්ත්වයන් ඉදිරියේ නැති බැරි දුගී අසරණ අයට උදව් උපකාර කිරීමට ද වගකීමක් ඇත. "මගේ ඉතා කුඩා සහෝදරයකුට කළ දේ මට කළෙහි ය" (මතෙව් 25:31-46) යන ජේසු සමිඳුන්ගේ වදන් අනුව යමින් අන්‍යෝන්‍ය වශයෙන් උදව් උපකාර කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ ක්‍රිස්තියානි වගකීම සහතික කරයි. මෙය පොදු යහපත ක්‍රියාත්මක කිරීමකි.

6. සහයෝගිතාවයේ ප්‍රතිපත්තිය - උත් 4:9 "මගේ සහෝදරයාගේ භාරකරු කවුද" යන ප්‍රශ්නයට උත්තර වශයෙන් සැමට වගකීමක් පැවරෙන හෙයින් සියළු දෙනා සමඟ ම සහයෝගයෙන් කටයුතු කිරීමට ආයාචනයකි. 1967 දී නිකුත් වූ **ජනතා ප්‍රගතිය** මගින් ප්‍රේමයේ නව සංස්කෘතියක් වශයෙන් ද හඳුන්වා දී ඇත. 1987 දී ප්‍රකාශයට පත් කළ **සමාජ සැලකිල්ල** විශ්ව චක්‍ර ලේඛනය මගින් ද මෙම කරුණ ඉස්මතු කර ඇත. සහයෝගිතාව ධර්ම ගුණයක් වශයෙන් එය ප්‍රේමයේ තවත් පැතිකඩක් වශයෙන් හුවා දක්වා ඇත.

7. මැවිල්ලේ භාරකරු වශයෙන් මිනිසාට හිමිවන වගකීම පෙන්වා දීමට කතෝලික සමාජ ධර්මය උත්සාහ දරා ඇත. මැවිල්ල සුරක්ෂිතව පවත්වා ගැනීමට ද එය වර්ධනය කිරීමට ද වගකීමක් ඇත. එනම් පරිසරය විනාශයට පත් වන්නට ඉඩ නොදී රැකගැනීම මිනිසා සතු වගකීමකි. 1987 දී නිකුත් වූ **සමාජ සැලකිල්ල** විශ්ව චක්‍රලේඛනය මගින් සනාථ කර ඇත. - නැවත ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් අනාගත පරපුර සඳහා රැක ගැනීමේ වගකීම මතක් කර දෙයි. මැවිල්ල සැමදෙනාට ම මිස ටික දෙනෙකුට පමණක් නොවන බව ද පෙන්වා දෙයි. එසේම පෞද්ගලික දේපළ හිමි කර ගැනීමට සැමට ම අයිතියක් ඇති අතර එය පොදු යහපතට යටත්ව සාපේක්ෂව ක්‍රියාත්මක විය යුතු ය.

8. **ආධාරක කාර්ය ප්‍රතිපත්තිය - (Principle of Subsidiarity)** පහළ මට්ටමේ කළ හැකි දේ සමාජයේ ඉහළ තලයකින් පවරා නොගෙන එසේ පවතින්නට සැලසීමේ න්‍යායයි. රජයට ද තමන් පිට පැවරෙන වගකීම ක්‍රියාත්මක කළ යුතු අන්දම මෙයින් වටහා දීමට උත්සාහ දරයි. දේශපාලන මෙන් ම ආර්ථික ප්‍රශ්නයන් කිතුනුවාට අකැප යයි කියමින් මුනිවත රැකිය නොහැකි බව පෙන්වා දෙයි. මෙම න්‍යාය 1931 දී නිකුත් කළ **සතළිස් වසර** ලේඛනය මගින් දක්වා ඇත.

9. සමාජයේ සමානාත්මතාවය සුරැකීම ද මීන් ඉස්මතුවන වගකීමකි¨ මිනිසාගේ මූලික අයිතීන් සුරැකීමේ වගකීම පෙන්නුම් කර දෙයි. මිනිසාට හිමිවන අයිතීන් කවුරුන් හෝ පවරන දෙයක් නොව, ඒවා අත්‍යන්තයෙන් ම මිනිසාට හිමි වෙයි. 1963 දී නිකුත් වූ **ලෝක සාමය** විශ්ව චක්‍ර ලේඛනයේ මෙය වඩාත් ඉස්මතු කර ඇත.

10. පොදු යහපත සුරැකීම මිනිසාගේ පූර්ණ වර්ධනයට හේතුවන ප්‍රධාන සාධකයකි. ටික දෙනෙකුගේ යහපත පමණක් සැලකීම නොව පූර්ණ මිනිස් ජීවිතයක් ගත කිරීමට අවැසි වන සියළු ම සාධකයන්ගේ එකතුවකි. මෙය **අයුක්තියට පිළිතුර, ලෝක සාමය, වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව හා ජනතා ප්‍රගතිය** යන විශ්ව චක්‍රලේඛනවල දක්නට ලැබේ. ජනතා ප්‍රගතිය විශ්ව චක්‍ර ලේඛනය මගින් සංවර්ධනයේ සැබෑ කිතුනු ස්වරූපය දක්වා ඇත. එනම් සැම මිනිසකුගේම හා පූර්ණ මිනිසාගේ වර්ධනයට අදාළ වන කටයුතු සපුරාලීම ය.

## 5.3. කතෝලික සමාජ ධර්මයට විශේෂිත චක්‍රලේඛන හා ඒවායේ තේමාවන් හඳුන්වා දීම

1. වෙහෙසෙන මිනිස්සු - 1891 මැයි 15 - 13වන ලියෝ පාප්තුමා - Rerum Novarum

වෙහෙසෙන මිනිස්සු ලිවීමට හේතු

I. කාර්මික විප්ලවය නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් ධනවාදය ක්‍රියාත්මක විය. එයින් ජනතාව අන්ත දුගී තත්ත්වයට ඇද දමන බව 13 වන ලියෝ පාප්තුමාට අවබෝධ විය. තවද, ධනවාදය නිසා වැඩවසම් ක්‍රමය විනාශ කරමින් සම්ප්‍රදායික සමාජ ක්‍රමය ද සෝදා පාළුවට ලක්වි ය. ධනය ස්වල්ප දෙනෙකු අත රුඳෙන්නට විය.

II. කම්කරුවන් සූරාකෑමට ලක්වීම ද සිදුවිය.

III. රාජ්‍ය නායකයින්ට දුගීන්ගේ යහපත තකා වැඩ කිරීමට ඇති නොහැකියාව දිස්වීම.

IV. සදාචාරයීය වටිනාකම් පිරිහීම.

V. සමාජවාදීන්ගේ බලපෑම නිසා – ඔවුන්ගේ චෝදනාව වූයේ "සභාව ධනවතුන්ගේ පැත්ත ගන්න බව ය" යන්න ය. මාක්ස් ඇතුළු චින්තකයන්ගේ මතය වූයේ ආගම අබිං යන්න ය. මෙම වැරදි මතයට පිළිතුරු දීමට උත්සාහයක් ද විය.

VI. 13 ලියෝ පාප්තුමා පවා වතිකානුවේ සිරකරුවෙක් වන නිසා එක්තරා පීඩනයට යටත් ව සිටීම නිසාත් ය.

වෙහෙසෙන මිනිස්සු - සාරාංශය

I. **හැඳින්වීම** – කම්කරු ගැටළු ගැන අවධානය 1-2

II. **සමාජවාදී පිළිතුර ප්‍රතික්ෂේප කිරීම** – එය වැරදි විසඳුමකි. 3-12

– සමාජවාදය හෙළා දැකීම – පුද්ගලයා නොතැකීම – දේපළ ගැන දරණ මතය වැරදි ය.

– සමාජවාදය තුළින් සමාජ වෛරයක් ගොඩනැගෙන බව හා සාමාජයට අහිතකර ආකාරයෙන් ඇති වන බලපෑම

III. **සැබෑ පිළිතුරකට අවශ්‍ය සාධක තුනක්**

අ) සභාවේ ක්‍රියාවන්. 13-25

ආ) රජයේ භූමිකාව හා මැදිහත් වීම. 26- 35

ඇ) හාම්පුතුන්ගේ හා සේවකයන්ගේ සම්බන්ධතාවය. 36- 45

**ප්‍රධාන තේමාවන්**

**අ) වැඩ කරන ජනතාව**

වැඩ කිරීම ශාපයක් වශයෙන් නොව දේව මැවිල්ලට සම්බන්ධ බවත් පෙන්නුම් කරමින් ඔවුන් දේව මැවිල්ලට සමානව මවා ඇති හෙයින් ඔවුනට හිමිවන අයිතීන් ගැන කරුණු දක්වයි. එවකට ස්ථිර වැටුප් ක්‍රමයක් නොපැවැති සමයක, සාධාරණ ජීවන වැටුප් ගෙවීම ගැන කරුණු ඉදිරිපත් කිරීම ඉතා විප්ලවකාරී චින්තනයකි. තවද සේවකයන්ට අවශ්‍ය විවේකය ලබා දීම ගැන ද කරුණු වටහා දෙයි. ලාභයේ කොටස්කරුවන් වීම ගැන ද පෙන්වා දෙන අතර දේපළ හිමිකර ගැනීම සඳහා ශ්‍රමය පුදන්නට කටයුතු රජය මගින් හිමි කර දිය යුතු ය. එසේ ම ස්වාමි පක්ෂය සමඟ ද ඉතා සුහදව කටයුතු කිරීමට ආයාචනයක් එහි අඩංගු ය. ළමයින්ව හා වනිතාවන් යොදා ගැනීමේ දී කල්පනාකාරීවීමට ඉල්ලීමක් ඇත. සමාජ මෙහෙවරක් ඉටු කරන ජනතාවගේ සියළු කටයුතු සුරක්ෂිත කිරීමේ වගකීම රජයට පැවරෙයි.

**ආ) සමාජවාදය**

ශ්‍රමිකයන්ගේ ප්‍රශ්න විසඳීමේ දී සමාජවාදය නුසුදුසු බව පෙන්වා දෙයි¨ තවද එහි දැක්ම මානව විරෝධී ය. දේව කැමැත්තට හා සභා ඉගැන්වීමට පටහැනි ය. පන්ති භේදය මගින් ජනතාව අතර වෛරයක් ඇති කරයි. දේපළ පොදුවේ තබාගැනීමෙන් පෞද්ගලික වර්ධනයට එල්ල වන්නේ මරු පහරකි. ස්වභාව නීතියට ද පිටුපා යන්නක් සේ දක්වා ඇත. පුද්ගලයාට හිමිවන නිදහස පාවා දී වස්තුවට මුල් තැන දීමක් මෙයින් සිදු වෙයි.

**ඇ) සභාවේ වගකීම**

වැඩ කරන ජනතාවගේ සුභ සිද්ධිය පතා කටයුතු කිරීමට වගකීමක් පැවරෙයි¨ රජය ලවා අයිතීන් සුරැකීමට කටයුතු කරවීමේ වගකීමක් ඇත. විශ්වාසය හා සමාජ ප්‍රශ්න අතර සබැඳියාව පෙන්වා දෙමින් මිනිසාගේ යහපත වෙනුවෙන් පෙනී සිටිය යුතු ය. මානව සදාචාරය වෙනුවෙන් නිතරම පෙනී සිටීමට

සභාව කටයුතු කළ යුතුවේ. දුගීන් ගැන අවධානය යොමු කරන නිසා ධනවතුන්ට තමන්ගේ වැඩිපුර තිබෙන දේ බෙදා දීමට ආයාචනයක් කර ඇත.

**ඇ) රජයේ භූමිකාව**

ශ්‍රමිකයන් වෙනුවෙන් පෙනී සිට, සූරාකෑමට ලක්වන විට විරුද්ධව පොදු යහපත ඇතිකරනු වස් ක්‍රියාත්මක වීමට වගකීමක් ඇත. හාම්පුතුන්ගේ සීමාවන් ඉක්මවා ක්‍රියා කරන විට එම වරද නිවරදි කිරීමේ වගකීම පැවරෙයි. එසේ ම ජීවන වැටුප් ගෙවීම – අවශ්‍ය විවේකය ලබා දීම වැනි දේ අධීක්ෂණය කිරීම රජයේ භූමිකාවයි. තව ද සමාජයේ අරගල ඇති නොවී, සාමාකාමී වාතාවරණයක් ඇති කිරීමට කටයුතු කළ යුතු වෙයි.

## 2. ලෝක සාමය 1963 අප්‍රියෙල් 11 – 23 වන ජුවාම් පාප්තුමා – **Pacem in Terris.**

**පසුබිම:**

### ලෝක සාමය - විශ්ව චක්‍ර ලේඛනයට හැඳින්වීමක්

වසර 1958 ඔක්තෝබර් මාසයේ දී පාප් තනතුරට විස්තුන්වන ජුවාම් පාප්තුමා පත්විය. එතුමා පත්වී මාස කිහිපයක් ඇවෑමෙන් සභාවේ නවෝදයක් කරා පියවර මැනීමට හොඳම මාර්ගය ජගත් මණ්ත්‍රණ සභාවක් කැඳවීම බව එතුමා තේරුම් ගෙන තිබුණි. මේ අදහස පාප්තුමා ලොවට ඉදිරිපත් කළේ වසර 1959 ජනවාරි 25 වන දිනදී ය. සෑම වසරකම ජනවාරි 18-25 සභාව එකමුතුවීම සඳහා යදින සතිය පැවැත්වේ. එහි අවසන් දිනයේ විසිතුන්වන ජුවාම් පාප්වහන්සේ කළ දේශනය මගින් ජගත් මන්ත්‍රණ සභාව කැඳවීමේ පණිවිඩය ලොවට ඉදිරිපත් කරන ලදී.

එතුමා එසේ කළ කථාවෙන් බොහෝ දෙනා තුළ මවිතයක් ඇතිවිය. එවැනි ජගත් මන්ත්‍රණ සභාවක අත්දැකීමක් තිබුණේ එයට අවුරුදු 88 කට පෙර අතරමග නතර කරන්නට සිදුවූ පළමුවන වතිකාන කතිකාවත (1869 - 70) ගැන මතකය පමණි. තව ද මෙම තනතුරට පත්වූ එතුමා වයෝවෘද්ධයෙක් වූ නිසා එවැනි මන්ත්‍රණ සභාවක් පැවැත්වීමේ සැකයක් සමහර ප්‍රතිගාමීන් තුළ විය. එසේම මෙම අදහස ක්‍රියාත්මක කරවීමට සක්‍රිය කරන්නට වතිකානයේ සභා පාලනයේ සිටි සමහර කාර්දිනල්වරු තුළ එතරම් කැමැත්තක් නොතිබුණි. පාප්තුමන්ට සහායක් ලබා දුන්නේ අතලොස්සකි. එහෙත් එකල සිටි ප්‍රගතිශීලී මත දරූ කාර්දිනල් කිහිප දෙනෙකුගේ සහාය ලබාගෙන වසර 1962 ඔක්තෝබර් 11 වන දින දෙවන වතිකාන කතිකාවත ආරම්භ කරන්නට හැකි විය.

මෙම කතිකාවක පවත්වා ගැනීමේ දි සූදානම් වීමේ කමිටුව මගින් විෂයන් 70 ක් නිර්දේශ කර තිබුණි. සභා නවෝදයක් මෙන්ම කිතුනු පැවැත්මේ වෙනසක් ද මෙන්ම සභාව, ලෝකයා බලන බැල්ම අලුත් කරවීම අපේක්ෂාවෙන් එය පටන් ගැනීමට ගැනීමට පාප්තුමා බලපොරොත්තු විය. තව ද පළමු සැසිවාරයේ දී වැඩි අවධානයක් යොමු වූයේ ව්‍යුහ ගත දේ ගැන කතා කිරීම ය. මේ තත්ත්වය නිසා සමාජ ප්‍රශ්න ගැන සාකච්ඡාවීම ප්‍රමාද වියහැකි බව තේරුම් ගත් පාප්තුමා, පළමු සැසි වාරයෙන් පසුව තමන්වහන්සේ වැඩි කල් ජීවත් නොවන බව තේරුම් ගෙන සමාජ ප්‍රශ්නවලට පිළිතුරක් ඉදිරිපත් කිරිමට මැදිහත් විය.

එසේම කාලීන ප්‍රශ්න ගැන අවධානයෙන් සිටි එතුමා වසර 1961 දී **'අයුක්තියට පිළිතුර'** නමින් සමාජ විශ්ව චක්‍ර ලේඛනයක් නිකුත් කරන ලදී. එය **'වෙහෙසෙන මිනිස්සු'** ප්‍රකාශනයට වසර 70ක් පිරිම නිමිත්තෙනි. එහිදී එතුමා සමකාලීන සමාජ තත්ත්වයන් විග්‍රහ කිරීමට අවස්ථාවක් සකසා ගැනුණි. හැටේ දශකයේ පැවැති දේශපාලන හා සමාජ යථාර්ථයට ඔබින අයුරින් හා දේශපාලන ස්වාධිනත්වය ලැබූ රටවලට ගැලපෙන අයුරින් කරුණු ඉදිරිපත් කෙරිණි.

එසේ ම, එකල වසර 1962 වන විට පැවැති ලෝක වාතාවරණය නම් දේශපාලන ස්වාධීනත්වය හිමිකර ගෙන තිබුණත් ලෝක බලවතුන් දෙපිලකට බෙදී කටයුතු කරන තත්ත්වයක් විද්‍යාමාන විමයි. එනම් ධනවාදි රටවල් හා සමාජවාදි රටවල් යන දෙකොටසම තම පිළට ස්වාධීන රටවල් සම්බන්ධ කර ගැනීමට උත්සාහයක නිරත විය. එම කාලය තුළදි රුසියාවෙන් කියුබාවට අවි බෙදා හැරීම ගැන උරණ

වී සිටි ඇමෙරිකා එක්සත් ජනපදය ලෝක යුද්ධයකට ආවඩන ස්වරූපයක් දක්නට ලැබුණි. මෙවන් පසුතලයක් යටතේ 23 වන ජුවාම් පාප්තුමා කළේ කුමක් ද? මෙම විශ්ව චක්‍ර ලේඛනය හරහා සමස්ත ලෝකයට සාමයේ වැදගත් කම පෙන්වා දීම ය. යුද්ධයෙන් සාමය ඇති කර ගැනීමට නොහැකි බව පෙන්වා දෙමින් සාධාරණත්වය මත පිහිටා සුහද සංවාදයන් ඇතිකර ගැනීමේ ප්‍රවණතාවය දක්වීමට පාප් වහන්සේ උත්සාහ දරා ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 1948 දෙසැම්බර් 10 වන දින මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය අනුමත කරන ලදී. එහි ඇති නිර්දේශ කිතුනු බැතිමතුන්ට බලපාන අන්දම පහදා දීමට ද, විසිතුන්වන ජුවාම් පාප් වහන්සේ අවස්ථාවක් කර ගන්නා ලදි.

ලෝක සාමය යන විශ්ව චක්‍ර ලේඛනය වසර 1963 දී 23 වන ජුවාම් පාප්වහන්සේ රචනා කරන ලද්දේ ''කාලයාගේ සළකුණු හඳුනාගැනීමට'' කරන ආයාචනයකි. එසේම ලොවේ ඇතිවී තිබෙන වෙනස්කම් ගැන අවධානය යොමු කරමින් ඒවා ඉදිරියේ නිරුත්තර නොවී එයට ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය පෙන්නුම් කර ඇත. දේශපාලනමය හා සමාජමය වශයෙන් වැඩි වර්ධනයක් ගොඩනැගී ඇත. එසේම සභාවේ විරුද්ධවාදීන් සමග පවා එකටෙක කිරීම නොව සංවාදශිලීව පෙරමුණ ගැනීමට කටයුතු කළයුතු බව මෙම විශ්ව චක්‍ර ලේඛනය හරහා විසිතුන්වන ජුවාම් පාප්තුමා පෙන්වා දෙයි.

සභාවේ ප්‍රශ්න ගැන පමණක් සාකච්ඡාවට භාජනය නොකොට ලෝකයේ සිදුවන කරුණු ගැන විමසීමට පෙරහුරුවක් මෙයින් දක්නට ලැබේ. සමාජමය ප්‍රශ්න දේශපාලනමය කරුණු සභාවේ දූතමෙහෙයට අකැප නොවේ. දෙවන වතිකාන කතිකාවෙන් වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාවේ එඬේරික ව්‍යවස්ථාවට සුදානමක් වශයෙන් මෙම විශ්ව ලේඛනය සැලකිය හැකිය.

එසේම මෙම විශ්ව චක්‍ර ලේඛනය සභාවට සම්බන්ධ විෂයන්ට අමතරව සභාවෙන් පරිබාහිර මාතෘකාවක් ගැන කථා කිරීම ද සුවිශේෂ සිද්ධියකි. ඒ වන විට ලෝකයා හා සභාව දෙපිලකට බෙදී කිසිදු සම්බන්ධයක් නොමැති ආකාරයේ පිළිවෙතක් අනුගමනය කර තිබුණේ. විශ්ව චක්‍ර ලේඛන ඉතිහාසයේ පළමුවරට ලෝකයේ සැමට ඇරයුමක් මෙමගින් දක්වා තිබීම විශේෂත්වයකි. හොඳ හිත ඇති සැම කෙනෙකුටම මෙම විශ්ව චක්‍ර ලේඛනය හරහා ආමන්ත්‍රණය කළේ ද සැබෑ සාමය ඇති කර ගැනීමේ දි දායකත්වය ලබා ගැනීමට ය.

## ලෝක සාමය රචනා කිරීමට හේතු වූ කරුණු

අ) 1948 දි එක්සත් ජාතීන්ගේ සමුළුව විසින් සම්මත කරගත් මානව අයිතිවාසිකම් ප්‍රඥප්තියට සභා ප්‍රතිචාරය දැක්වීමකි.
ආ) සැබෑ සාමය ගොඩ නැංවීමට අවැසි කරුණු දැක්වීමට අවස්ථාවක් විය. - න්‍යෂ්ඨික යුද්ධයකට අවැසි සියල්ල සූදානම්ව තිබෙන අවස්ථාවක එය වළකා ලීමට දරන උත්සාහයකි.
ඇ) කාලයාගේ සළකුණු තේරුම් ගෙන එයට ප්‍රතිචාර දැක්වීමක් වශයෙනි.
ඈ) ලෝ වැසි සියල්ලනට කතා කරන්නට අවස්ථාවක් කර ගැනීම.

## ලෝක සාමය විශ්ව චක්‍රලේඛනයේ අන්තර්ගතය

**හැඳින්වීම 1-7**

**1කොටසඃ** මනුෂ්‍යයන් අතරේ පිළිවෙල 8 - 45
අ) මිනිස් අයිතිවාසිකම් 11 - 27
ආ) මිනිසාගේ යුතුකම් 28 - 45
**2 කොටසඃ** පුද්ගලයන් හා රජයේ පාලන මණ්ඩලය අතර සම්බන්ධය. 46 - 79
ආධිපත්‍යයේ ස්වභාවය හා පොදු යහපත තකා උනන්දු කරවීම.
**3 කොටසඃ** රාජ්‍යයන් අතර සම්බන්ධතාවය. 80 - 129
සත්‍යය, යුක්තිය හා නිදහස පදනම් කරගෙන ගොඩ නැඟෙන සම්බන්ධතාවය.
**4 කොටසඃ** රාජ්‍යයන් හා ලෝක සමාජය අතර සම්බන්ධය. 130 - 145
ලෝකයේ දේශපාලන ප්‍රජාව බිහිවන අන්තර් බැඳීම.
**5 කොටසඃ** ධර්මානුශාසනය. 146 - 172
කිතුනුවන් තම ආගමික ඇදහිල්ල ක්‍රියාව සමග බද්ධ කර ගත යුතු ය.

**ප්‍රධාන තේමාවන්**

මානව උදාරත්වය ගැන කරුණු දක්වයි. එයට පදනම් වන්නේ මිනිසා දේව සමානකමට මවා ඇති නිසා ය. එයට සමගාමීව ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ ක්‍රියාකාරීත්වයට හසුවන නිසාත් මානව උත්තරීතරභාවය වඩා තිව්‍ර වී ඇත. එසේ ම මානව පුද්ගලිකත්වය හා දේව දරුකම නිසා හිමිවන අයිතිවාසිකම් හා යුතුකම්වල විශ්වාසනියත්වයක් ඇත. ඒවා කැඩිය නොහැකි ය. බෙදිය නොහැකි ය. මිනිසා තම අයිතිවාසිකම් වෙන කෙනෙකුගෙන් ලබන දෙයක් නොවේ. එය මානවයා අත්‍යන්තයෙන්ම ලබන්නකි. එසේ ම මිනිසා සමාජීය ස්වරූපය නිසාම අන් අය සමග දිවි ගෙවීමටත් ඔවුන්ගේ සුබ සිද්ධිය සඳහා කටයුතු කිරීමටත් ඔහු බැඳී සිටියි.

**මානව අයිතීන්**

පහළ දැක්වෙන වගුවේ දක්වා ඇති ආකාරයට මෙම අයිතීන් තුන් ආකාරයකින් දක්වා ඇත.

1. පෞද්ගලික - **Personal** පොදුවේ සෑම කෙනෙකුට ම හිමිවන අයිතීන්
2. සාමාජික - **Social** - සමාජ තලය හිමිවිය යුතු අයිතීන්
3. ආධාරක හෝ උපකාරක - **Instrumental** - ඉහත සඳහන් අයිතීන් හිමි කර ගන්නට සහාය ලබා දෙන අයිතීන් සමූහයක්

| | **අයිතීන්** | **පෞද්ගලික** | **සමාජයීය** | **ආධාරක** |
|---|---|---|---|---|
| 1 | ශාරීරික අයිතිය<br>ලෝ. සා. 11 | ජීවත්වීමේ අයිතිය හා ශාරීරික පූර්ණත්වයට ඇති අයිතිය | ආහාර, වස්ත්‍ර, නිවාස, සෞඛ්‍ය පිළිබඳ අයිතිය | රෝගී භාවයේ දී, වැඩ කළ නොහැකි විට, වයෝවෘද්ධ හා විරැකියාවේ දී සුරක්ෂිතබවට අයිතීන් |
| 2 | ප්‍රකාශන අයිතිය<br>ලෝ. සා. 12-13 | ප්‍රකාශන කිරීමේ අයිතිය | නිදහස්ව අදහස් ප්‍රකාශ කිරීමට හා අධ්‍යාපනයට මෙන්ම සංස්කෘතියට ඇති අයිතිය. | සත්‍යය දැනුවත් වීමේ අයිතිය |
| 3 | ආගමික අයිතිය<br>ලෝ. සා. 14 | ආගම් ඇදහීමේ අයිතිය | පෞද්ගලික හා පොදුවේ ආගම් ඇදහීමේ අයිතිය | ආගමික නිදහස පිළිබඳ අයිතිය |
| 4 | ලිංගික හා පවුල් දිවිය පිළිබඳ අයිතිය<br>ලෝ. සා. 15-17 | තමනට කැමැති ජීවිත තත්ත්වයක් තෝරා ගැනීමේ අයිතිය | පවුලක් ගොඩ නැගීම හෝ තනිව විසීමට හා ප්‍රජනනයට ඇති අයිතීන් | පවුල් ජීවිතයේදී ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා සදාචාරීය කරුණු පිළිබඳ අයිතීන් |
| 5 | ආර්ථික අයිතිය<br>ලෝ. සා. 18-22 | වැඩ කිරීමේ අයිතිය | වැඩ කිරීමේ පහසුකම් හා සාධාරණ වැටුප් පිළිබඳ අයිතීන් | වෘත්තීය සංගම් හා දේපල පිළිබඳ අයිතීන් |
| 6 | සංවිධාන වීමේ අයිතිය<br>ලෝ. සා. 23-24 | සමාජ සම්බන්ධතා පිළිබඳ අයිතිය | ස්වාධීනත්වයට හා සංවිධාන වීමට ඇති අයිතීන් | සමිති සංවිධාන ගොඩ නැගීමේ අයිතිය |
| 7 | සංක්‍රමණය වීමේ අයිතිය<br>ලෝ. සා. 25 | තැනින් තැනට යෑමේ නිදහස පිලබඳ අයිතිය | ජාතිකත්වය හා පදිංචිය පිළිබඳ අයිතීන් | අභ්‍යන්තර, දේශ අතර සංක්‍රමණය වීමේ අයිතීන් |
| 8 | දේශපාලන අයිතිය<br>ලෝ. සා. 26-27 | ස්වාධිපත්‍ය පිළිබඳ අයිතිය | දේශපාලන සහභාගිත්වය පිළිබඳ අයිතිය | දේශපාලන පක්ෂ, නිදහස් මතයට, මැතිවරණයට නෛතික සුරක්ෂිත භාවය ගැන අයිතීන් |

**අයිතිවාසිකම් යනු**:
මිනිසාට උරුම වන්නා වූ ස්වාභාවික අයිතිවාසිකම් සමූහයකි. මිනිසා ජීවියකුවන නිසා ජීවිතයට හා ජීවත්වීමට අයිතියක් ඇත. තව ද සමාජශීලි ස්වභාවය නිසා ම සමාජය සමග අදහස් හුවමාරු කිරීමට හැකිවීමෙන් සමාජය තුළ සමානව සැළකුම් ලැබීමටත්, කෲර හා අවමන් සහගත සැළකීම් වලට භාජනය නොවීමටත් යනාදී වශයෙන් ස්වාභාවික අයිතිවාසිකම් රැසකට හිමිකම් ලබා තිබේ.

**යුතුකම**: තමනට හිමි අයිතිවාසිකම සමග ඇතිවන බැඳීමයි. ජීවත්වීමට අයිතියක් තිබේ නම් තමාට පැවරෙන කාර්යය වගකීමෙන් යුතුව ඉටු කිරීමට ඔහුට/ඇයට යුතුකමක් ඇතිවෙයි. යුතුකම හා වගකීම සාමාන්‍ය වශයෙන් යෙදෙන්නේ එකට එකක් මාරු කළ හැකි පරිද්දෙනි. යුතුකම් හා වගකීම් ප්‍රමිතීන් ය. මෙම ප්‍රමිතීන් හේතුවෙන් මිනිසුන් හා ආයතනයන් යම් විධියකට කටයුතු කිරීම සඳහා හේතුන් සළසා ඇත. යුතුකම් හා වගකීම් නිසා යමෙක් එක්තරා හැසිරීම් රටාවකින් වැළකී සිටිය යුතු ය. අනෙක් යුතුකම් හා වගකීම් අනුව අනුමත ක්‍රියා මාර්ග පරාසයකින් එක්තරා ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතු ය.

**විශ්වාසය හා ලෞකික ක්‍රියාවලිය**

- කිතුනුවන් සමාජය තුළ ක්‍රියාත්මක විය යුතුය. එම ක්‍රියාවලියට විශ්වාසයෙන් පෝෂණය ලැබිය යුතු ය. ඒ සමඟ ම විද්‍යානුකූල දැනුම, තාක්ෂණ අවබෝධය, වෘත්තිය අන්දැකීම් යනාදිය විශ්වාසය මගින් පෝෂණය ලබා සමාජය තුළ ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය පෙන්නුම් කළ යුතු ය.
- කතෝලිකයන්ට සිවිල් සමාජයේ කටයුතුවලට දායක වීමෙන් පොදු යහපත තකා කටයුතු කිරීමට ඇරයුමක් ඇත.
- විශ්වාසය ක්‍රියාවෙන් ඵල දැරිය යුතු බව පෙන්වා දෙයි. ඒ සඳහා අධ්‍යාපනය සැකසිය යුතු ය. විද්‍යාත්මක තාක්ෂණික කටයුතු ගැන තුළානාත්මකව ක්‍රියා කළ යුතු අතර එහි අධ්‍යාත්මිකත්වය ගැන ද අවධානය යොමු කරන්නට ඇරයුම් කරයි.
- අන් ආගම් අතර සංවාදයේ යෙදීමේ වැදගත්කම මතක් කර දෙයි.
- සාමය හිස් වචනයක් නොවන්නට එය ක්‍රමානුකූල පිළිවෙළ අනුව සත්‍යය පදනම් කරගෙන, යුක්තිය මත ගොඩ නැගීමෙන්, ප්‍රේමයෙන් ඒකාග්‍රව, ප්‍රබෝධමත්ව, නිදහස්ව, ප්‍රයෝගිකව ක්‍රියා කිරීමෙන් ශක්තිමත් විය යුතුය.

3. 1967 හයවන පාවුළු - ජනතා ප්‍රගතිය ' පෝපුලෝරුම් ප්‍රෝග්‍රෙස්සියෝ '
**Populorum Progressio**

**පසුබිම**
**1965** දෙවන වතිකාන කතිකාවත නිමවීමෙන් මාස **15**කින් පසු මෙම ලියවිල්ල නිකුත් කිරීමේ දී එම කතිකාවතේ චින්තනය එයට බලපෑ බව නොකියමනා ය. වත්මන් ලෝකයේ ශුද්ධවූ සභාව නැමැති ව්‍යවස්ථාවේ අඩංගු දෑ ප්‍රයෝජනයට ගෙන ප්‍රායෝගික කරුණු දැක්වීමක් වශයෙන් ද සඳහන් කළ හැකි ය.

ජනතා ප්‍රගතිය විශ්ව ලේඛනයේ අන්තර්ගතය :
**හැඳින්වීම 1-5**
**පළමුවන කොටස** – මිනිසාගේ පූර්ණ සංවර්ධනය **6- 42**
– ප්‍රශ්න ගැන දත්තයන්
– සභාව හා සංවර්ධනය
– ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**දෙවන කොටස** – සාමූහිකත්වය තුළ මානව වර්ගයාගේ සංවර්ධනය **43-70**
– දුබලයන්ට දිය යුතු ආධාර
– වෙළෙඳ ගනුදෙනු තුළ සාධාරණත්වය
– විශ්ව ප්‍රේමය
– සංවර්ධනය සාමයේ නව නාමයයි¨

**අවසානය**
**ප්‍රධාන තේමාවන්**

**අ) සංවර්ධනය** – ආර්ථික දියුණුව පමණක් නොවන බව පෙන්වා දෙයි. එය සැම මිනිසාගේ වර්ධනය හා මිනිසාගේ සම්පූර්ණ වර්ධනයයි. එනම් ආර්ථික, සමාජයිය, දේශපාලනමය හා සංස්කෘතික වන අතර අධ්‍යාපනික හා ආධ්‍යාත්මික වර්ධනය ද අඩංගුය. මනුෂ්‍යත්ව ගුණාංගවලින් සමන්විත වේ. අඩු මනුෂ්‍ය තත්ත්වයකින් සිටින අය වඩා උසස් මනුෂ්‍ය තත්ත්වයකට පත් කිරීම ද මෙම සංවර්ධන ක්‍රියාවලියේ ම කොටසකි. සංවර්ධනය ගැන වෙහෙසීම සහාවේ දූත මෙහෙයට අඩංගු කොටසක් වශයෙන් ඉදිරිපත් කර ඇත. සංවර්ධනය කරා පියවර මැනීම දේව කැඳවීමකි. දයාවේ සේවාවන්ගෙන් ඇරඹෙන සුබ සාධන කටයුතුවලට පමණක් සීමා නොකොට තම ඉතිහාසය පාලනය කිරීමෙන් වගකීම තම අතටම ලබා දීමකි. වහල්කමෙන් ජනතාව මුදාලීමට අධ්‍යපානය ලබා දීම ද සංවර්ධනයයි. යුක්තිය ඉටු කිරීම ද මෙයට අදාළ ය. එය සියළු දේ හිමිකර ගැනීමට (**Having**) වඩා ජීවත් වීමකි (**Being**). ඒ අනුව තණ්හාව පිටුදැකීම ද සැබෑ සංවර්ධනයට අදාළ ය.

අංක **22** සඳහන්ව ඇති පාඨය මගින් බයිබලීය දැක්ම මගින් පොළොව පූර්ණකොට යටත් කර ගැනීම ද මෙයට අදාළ ය. එමනිසා සියල්ල සැම දෙනාගේම යහපත වෙනුවෙන් වෙන් විය යුතු බවස සඳහන් වේ. **23** දේපල සම්බන්ධයෙන් ඇම්බ්‍රෝස් මුනිතුමාගේ කියමන ඉතා වැදගත් පැතිකඩක් ඉදිරිපත් කරයි.

''ඔබ දිළින්දාට යමක් දෙන විට එය ඔබ සතු දෙයකින් කරන ත්‍යාගයක් නොව ඔහුට අයත් දේ යළි ඔහුට ම බාර දීමකි. මක්නිසාදයත්, හැමගේ ප්‍රයෝජනය සඳහා පොදුවේ දී ඇති දේ ඔබ විසින් ඔබගේ ම ප්‍රයෝජනයට අයුතු ලෙස යොදා ගනු ලැබ ඇති බැවින් ය. ලෝකය හැම දෙනාටම මිස, ධනවතුන් සඳහා ම නොවේ.''

**ආ) දුබලයන්ට දිය යුතු ආධාර**
සාගින්නට එරෙහිව කරන සටන සම්බන්ධයෙන් ලෝක ආහාර සංවිධානය ගැන කරුණු දක්වා ඇත.

- අනාගතයේ දී හුදෙක් සාගිනි නිවීම පමණක් නොව පූර්ණ මිනිස් දිවියක් ගත කිරීමට පහසුවන ආකාරයේ සාමජයකට අඩිතාලම දැමීමට ද ඇරයුමක් ඇත. සැමගේ හෘදසාක්ෂිය සෝදිසිකර බැලීමට ආයාචනයක් ද එතුමා කරයි.
- ධනවත් සමාජයේ වගකීම කුමක් ද යන්න විග්‍රහයක් කරයි. ලොවේ ඇති සම්පත් නිසි ආකාරයෙන් පරිහරණය කරන්නට ඉල්ලීමක් ද ඇත. තව ද එයාකාරයෙන් ක්‍රියාත්මක කරන්නට මැලි වන්නේ නම් දේව උදහසට ලක් වන බව ද කියැවේ. අතිරික්ත ධනය සැමගේ යහපත සඳහා යෙදවීමේ භාරධූර වගකීම මතක් කර දෙයි.
- දුගීන්ගේ සාධාරණ කෝපය ධනවතුන් වෙත එල්ල විය හැකි බවද පෙන්වා දෙයි.
- ක්‍රම සැලසුම් කිරීමේ අවශ්‍යතාවය මතක් කර දෙයි. ආධාර දීමේ දී සැලසුම් සහගතව සිදුවිය යුතු බව කියැවේ.
- ලෝක අරමුදලක් ගොඩ නැගීමේ වැදගත්කම පෙන්වා දෙයි. එය අවි නිපදවීම තහනම් කිරීමෙන් ඉතිරිවන මුදලින් එම අරමුදල ආරම්භ කරන්නට ඉල්ලීමකි. එයින් ලැබෙන ප්‍රයෝජන ගැන ද කරුණු දක්වා ඇත. තව ද නාස්තිය වැළැක්වීමෙන් ද පුහු ආටෝපයට ඉඩ නොදීමෙන් ද මෙම අරමුදල තර කළ හැකි ය.
- විදේශ ණය මගින් සිදුවන අනිසි යැපීම වඩා සුදුසු තත්ත්වයක් නොවේ. එම නිසා අවශ්‍යවන්නේ සමාන අය සිදුකරන සංවාදයකි.

**ඇ) වෙළෙඳ ගනුදෙනු තුළ සාධාරණත්වය**

ජාත්‍යන්තර කටයුතුවල දී සමාජ සාධාරණත්වයෙන් හෙබවීමේ වැදගත්කම ඉස්මතු වෙයි.

i) අසාධාරණය සිදුවන අවස්ථාවක් නම් අසමාන තත්ත්වය වැඩිවීමයි. එනම් අමු ද්‍රව්‍ය ලබා ගෙන නිපදවනද යලි දුගී රටවල් වෙත යොමු කිරීමේ දී ඇති අයුක්තිය ඔරොත්තු නොදෙයි.

ii) නිදහස භාවිතා කරමින් සිදුවන අක්‍රමිකතාවයන් ගැන කරන සඳහනකි. තරගකාරී තත්ත්වයේ වැඩි වාසිය කාට ද? ඇත්තේ අසමාන අසාධාරණ ක්‍රියාවලියකි.
iii) ඇති කර ගත්තා ගිවිසුම්වලින් ද අසාධාරණය රජ කරන ලීලාවක් දක්නට ලැබේ. ඒවායේ සමානාත්මතාවය ඉස්මතු කරන අයුරින් කරන්නට ඇරයුමකි.
iv) සමබරතාවය රැකීමට ධනවත් රාජ්‍යයන් විසින් ගත යුතු පියවර අතර අවබෝධයෙන් යුතුව සිටීම. ඊට සමගාමීව පරිත්‍යාගශීලිවීමත් කළ යුතුව ඇත.
v) ඉස්මතුවන බාධාවන් නම් ජාතිවාදයයි. ජාතිවාදය සංවර්ධනයට බාධාවක් වුවත් තුන්වන ලොවේ දේශයන්හි ජාති හිතෛෂිභාවයක් දක්නට නොමැති බව ද පෙන්වා දෙයි
vi) වර්ණභේද වාදය අනෙක් බාධාවයි. එය ද සංවර්ධනයට බාධාවකි.
vii) තුන්වන ලොවේ රටවල් වඩා එකමුතුකමකින් යුතුව මුහුණ දීමේ වැදගත්කම පෙන්වා දෙයි.
viii) ජනතාව තමන්ගේ අනාගතය සකස් කරන අන්දම පැහැදිලිව දක්වයි. ඉතිහාසයේ කර්තෘත්වය ජනතාව සතු ය.

**ඇ) විශ්ව ප්‍රේමය**

- ලෝකය රෝගාතුර වී ඇත. ධනය පසුපස හඹා යාම ද සුළු පිරිසක් වැජඹීම ද සහෝදරත්වය වැනසී යාම ද දක්නට ඇත. එසේ ම තුන්වන ලෝකය දෙස කාරුණිකව නෙත් හෙළීමට කරන ඇරයුමක් මෙහි ඇත.
- සිසුන්ගේ තත්ත්වය සිත් කම්පාකරවන තත්ත්වයකි. විදේශ රටවලින් පැමිණෙන සිසුන් වෙනුවෙන් කරන කාරුණික ආයාචනයක් අඩංගු ය. සංක්‍රමණික වැඩ කරන ජනතාව වෙනුවෙන් කරන ඉල්ලීම ව්‍යවසායකයන්ට වෙළෙඳුන්ට සමාජ හැඟීමෙන් කටයුතු කිරීමට කරන ආරාධනාවක් ඇති බව පෙන්වා දෙයි.
- සංවර්ධනයේ නියමුවන් වන විශේෂඥයින් සතු කාර්ය භාරය මතක් කර දෙයි. හිතු මතේ නොකර ශිෂ්ටාචාරයන්ට පක්ෂපාතිව සිදුවිය යුතු බවට පෙන්වා දෙයි. තරුණ අයට කරන ආයාචනයක් ද මෙහි අඩංගු ය.
- යාච්ඤාවට සීමා නොවී ක්‍රියාකාරිත්වයට ද තැනක් ලබා දෙන ආකාරයේ යැදුමකට සම්බන්ධවන්න කරන ආයාචනයක් ද සටහන්ව ඇත.

**ඉ) සංවර්ධනය සාමයේ නව නාමයයි.**

**සාමය හා සංවර්ධනය අතර ඇති බැඳීම.** සාමය යුක්තියේ ප්‍රතිඵලයකි. සාමය යුද්ධයෙන් තොරවීම නොවේ. සාමය ගොඩ නැංවීමට අවශ්‍ය ජාත්‍යන්තර සහයෝගිතාවය පෙන්වා දෙයි. සාමය ක්‍රියාත්මකවන අයුරින් ලෝක බලවතුකගේ අවශ්‍යතාවය හෝ ලෝක පාලන තිබීමේ වැදගත්කම පෙන්වා දෙයි. මෙයින් අපේක්ෂා කරන්නේ වඩා යහපත් ලෝකයක් ඇතිවීමය. (සංවර්ධනය සාමයට සම්බන්ධ කිරීම මෙම විශ්ව චක්‍රලේඛනයේ විශේෂත්වයක් වශයෙන් ගිණිය හැකි ය.)

4. **සමාජ සැලකිල්ල - සොලිස්සිටුඩෝ රේයි සෝසියාලිස් Sollicitudo Rei Socialis දෙවන ජුවාම් පාවුළු පාප්තුමා 1987 දෙසැම්බර් 30**

**පසුබිම:**

1967 දී හයවන පාවුළු පාප්වහන්සේ විසින් නිකුත් කළ ජනතා ප්‍රගතිය විශ්ව ලේඛනයට වසර 20ක් පිරීම නිමිත්තෙනි. එදා ඉදිරිපත් කළ කරුණු විසි වසරකට පසු ගලපා ගන්නා අයුරු විදහා දැක්වීම මෙහි අරමුණයි. විසි වසර පුරා තත්ත්වය වෙනස් වී ඇත. එයට අනුකූලව හැඩ ගැසීමට කරන ආයාචනයක් මෙහි අඩංගු ය.

**සමාජ සැලකිල්ල විශ්ව ලේඛනයේ අන්තර්ගතය:**

i හැඳින්වීම 1-4
ii ජනතා ප්‍රගතිය විශ්ව චක්‍රලේඛනයේ නිර්මාණශීලිත්වය 5-10
iii වත්මන් යථාර්ථයේ තත්ත්වය 11-26

iv සැබෑ සංවර්ධනය 27-34
v නව ගැටළු සම්බන්ධයෙන් දේව ධාර්මික චින්තනය 35-40
vi ප්‍රායෝගික මඟ පෙන්වීම් කිහිපයක් 41-45
vii නිගමනයන් 46-49

මුලින්ම කතෝලික සමාජ දහමට විශේෂ වන න්‍යාය තුන හඳුන්වා දෙයි. එනම්,

අ) මෙනෙහි කළ යුතු සිද්ධාන්තයන් හෝ මූලධර්මයන් ද
ආ) විනිශ්වයේ මිම් හෝ මිනුම් දඬු
ඇ) ක්‍රියාවන්වලට මඟ පෙන්වීම ලබා දීමට ය.

තව ද සමාජ දහම ස්ථිතික දෙයක් නොව ගතික නිසා වෙනස් වෙමින් නවෝදයට ලක් වන බව ද පෙන්වා දෙයි.

**සංවර්ධනය නොවීමේ ආර්ථික හේතු**

- සංවර්ධනය වන දේශයන් හි සිදුවන අතපසුවීම් ද
- ස්වල්ප දෙනෙක් පමණක් සියළු සම්පත් ගොඩ ගසා ගැනීම ද
- සංවර්ධනය වූ දේශයන් අන් අය ගැන සොයා නොබැලීම ද
- කාටත් හොරා අත්‍යන්තයෙන්ම ගොඩනැගෙන යාන්ත්‍රික ව්‍යුහයන් නිසා ද මෙම දරිද්‍රතාවය ඉතා දැඩි ආකාරයෙන් ඉබේ ක්‍රියාත්මක වෙයි.
- අන්තර් යැපීම ද මෙහි එක් ප්‍රතිඵලයකි. සමහර රටවල් ඉතා අධික ආකාරයෙන් ධනවත් වී ඇත්තේ අන් දුගී රටවල සම්පත් ප්‍රයෝජනයට ලබා ගෙන ය.

**ඌන සංවර්ධනයේ විශේෂ ලක්ෂණ වශයෙන් කරුණු තුනක් දක්වා ඇත. ඒවා නම්,**
අ) නිවාස ප්‍රශ්නය - නාගරීකරණය නිසා

ආ) විරැකියාව මෙන්ම ඌන සේවානියුක්තිය නිසා ඇතිවන ස්ව අභිමානය හීනවීම
ඇ) ජාත්‍යන්තර ණයබරතාවය.

**සංවර්ධනය නොවීමේ දේශපාලන හේතු**
- ලෝකය භේද වී සිටීමත්, නැගෙනහිර හා බටහිර වශයෙන් බලය කේන්ද්‍රගතවීමත්, සීතල යුද්ධයක් පැවතීමත් ය.
- මතවාදයන් නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත. මෙම දෙපැත්තේ ම ඇති ප්‍රතිපත්තිවල අඩුවක් ඇත. ඒවා නිවැරදි විය යුතුයයි පාප්වහන්සේ පෙන්වා දෙයි.
- නව යටත්විජිතවාදය තවත් දේශපාලන හේතුවකි.
- සංවර්ධනය වෙමින් සිටින රටවල් ස්වාධීනවනවා වෙනුවට බල කඳවුරුවල ඉත්තන් බවට පත්වීම දක්නට ලැබේ.

**වත්මන් ලෝක තත්ත්වයේ ඇති යහපත්** අංගයන් ද පාප්තුමා දක්වා ඇත.

- ඒවා නම් ජනතාව තමන්ගේ උදාරත්වය ගැන අවබෝධය වර්ධනය වීම.
- මානව හිමිකම් ගැන වඩා උනන්දුවක් දක්නට ලැබේ.
- සදාචාරිය මට්ටමේ අන්තර් සබඳතාවය වර්ධනය වී ඇත.
- ජනතාව තමන් පොදු අරමුණක් කරා පියවර තබන බව තේරුම් ගැනීම
- ජීවිතය අගය කිරීමට උනන්දු වීම
- සාමය හා යුක්තිය අතර ඇති බැඳීම ඉස්මතුවීම
- පරිසරය පිළිබඳව දක්වන උනන්දුව
- බොහෝ අය දරිද්‍රතාවය අවම කරන්නට දරණ උත්සාහය
- ජාත්‍යන්තර හා ප්‍රාදේශීය සංවිධාන බිහිවීම

- සමහර තුන්වන ලෝකයේ සමහර රටවල් ආහාරවලින් ස්වයංපෝෂිත වී තරමක් දුරට කාර්මිකකරණයට ලක්වීම

**සැබෑ සංවර්ධනය**

- සංවර්ධනය ඉබේ සිදුවන්නක් නොවන බවත් එය ආර්ථිකයට පමණක් සීමා නොවන බවත් තේරුම් ගැනීම පිළිබඳව විස්තර දක්වා ඇත.
- සංවර්ධනය යනු භාණ්ඩ බහුලවීම නොවේ. සේවාවන් අධික වීම ද නොවේ.
- එම ක්‍රියාදාමයට අනිවාර්යයෙන් ම සදාචාරාත්මක ස්වරූපයක් ඇතුළත් විය යුතු ය.
- අධිසංවර්ධනය **(Superdevelopment)** ගැන ද මෙම විශ්ව චක්‍ර ලේඛනයේ සාකච්ඡාවට භාජනය කර ඇත. එය ද පිළිගත නොහැකි ය. එය සැබෑ යහපතට හා සතුටට එකඟ නොවන්නකි. එයින් ඇති වන්නේ අසතුටක් පමණි. එයින් ජනිත වන්නේ තණ්හාවයි. පාරිභෝගිකවාදයේ සංස්කෘතිකයක් කරා ජනතාව ගෙන යනු ලැබේ. එසේ ම නූතනයේ පාවිච්චියෙන් පසු විසිකර දමන සංස්කෘතියකට (**Throw away culture**) ජනතාව මෙහෙයවීමක් දක්නට ලැබේ.

සභාව සංවර්ධනය කරා යොමු වන්නේ ද මෙවන් පසුබිමක් යටතේය. මෙය ජේසු සමිඳාණන්ගේ ගැලවීමේ ක්‍රියාව හා බද්ධවන්නකි. මුල් සභාවේ පිතෘවරුන් ද මෙම කරුණු ඔවුන්ගේ ඉගැන්වීම්වලින් සනාථ කර ඇත. ජනතාවගේ අවශ්‍යතාවයන් උද්ගත වන විට වැඩිපුර තිබෙන දෙයින් නොව අත්‍යවශ්‍ය දේ පවා කපා හරිමින් බෙදා ගන්නා ලෙස ආයාචනා කරයි. ශු. බැසිල් හා ශු. ජෝන් ක්‍රිසොස්තොම් ගේ ඉගැන්වීම්වලින් පාඨ ගෙනහැර දක්වමින් එම බෙදා ගැනීමේ උතුම් කම පෙන්වා දෙයි.

- මෙම කාර්යයේ දී සභාව ද ආදර්ශයක් දක්වන ලෙස පාප්තුමා ඉල්ලීමක් කරයි. අත්‍යවශ්‍ය සැරසිලිවලට මෙන්ම සුඛෝපභෝගී භාණ්ඩවලට දක්වන වියදම් කපා හැර දුගීන්ට සරණ වෙමින් බඩගින්න නිවීමට මෙසේ දායක වන ලෙස ඉල්ලා සිටියි.

**පාපයේ ව්‍යූහයන් (Structures of Sin)** හැම තැන රජකරන බව පෙන්වා දෙයි. මෙවැනි සංකල්පයක් එතුමා පළමුවෙන්ම හඳුන්වා දී ඇත්තේ 1983 දී පැවැති රදගුරු කතිකාවතෙන් පසු 1984 දී නිකුත් කළ ප්‍රකාශනය වූ සමගි සන්ධානය හා පසුතැවීම **(Reconciliatio et Paenitentiae)** යන අපෝස්තලික ප්‍රකාශනයෙනි. පාපිෂ්ඨ ව්‍යූහය තේරුම් කර දී ඇත්තේ පොදු යහපතට එරෙහිවන සියළුම ඍණ සාධකවල එකතුව වශයෙනි. මෙවන් සාධක සියල්ල එකතුව බලගතුව පුද්ගලයන් කෙරෙහි බලපෑම් ඇති කරමින් ඔවුනට එවන් ව්‍යූහයනට විරුද්ධව කිසිම දෙයක් කළ නොහැකි තත්ත්වයට පත් කර ඇත. මෙය පෞද්ගලික මෙන්ම සමාජ පාපය යන විග්‍රහයට වඩා ඉදිරියට යැමකි. මෙය ආරම්භ වන්නේ පෞද්ගලික පාපයෙන් බව කිව යුතු ය. මෙම පාපිෂ්ඨ ව්‍යූහය ගැන කරන සඳහන නිසා පෞද්ගලික පාපයේ විෂමතාව හීන නොවේ. එහෙත් පාපයේ සමාජ බලපෑම තේරුම් ගැනීමට මෙන්ම එයට නැවතීමේ තිත තැබීමට මෙම විග්‍රහය රුකුලක් වනු ඇත.

දේව ධාර්මික චින්තනය තුළ ඌන සංවර්ධනය සම්බන්ධයෙන් ඉස්මතුවන කරුණු දෙකක් ඇත. **පළමුවැන්න නම් ලාභයයි**. එය සම්බන්ධයෙන් ජනතාව තුළ පවතින්නේ දැඩි ආශාවකි. ***දෙවැන්න වන්නේ* බලයට හා එය භාවිතා කිරීමට ඇති දැඩි කැමැත්තයි**. මෙම සාධක දෙක ඒකරාශිවූ විට සියළු දේ අභිභවා යමින් සියල්ල ඔවුන්ගේ අණසක යටතට පවරා ගැනීමට වෙර දැරීම අන්දම පැහැදිලි කරුණකි. මෙයින් සමාජ විෂමතාවය වැඩි වර්ධනය වීම පෙනෙන්ට තිබෙන කරුණකි.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන සිත් හැරීමේ අවශ්‍යතාවය මෙම විශ්ව චක්‍ර ලේඛනයෙන් වටහා දීමට උත්සාහ දරයි. තමන් පිළිබඳව පෞද්ගලිකවත්, අසල්වැසියන් සම්බන්ධයෙන් ද, සෙබා දහම හා දෙවියන් පිළිබඳවත් විවෘත වෙමින් නව සබඳතාවයකට අඩිතාලම දැමීමෙන් මෙම සිත් හැරීම ක්‍රියාත්මක කළ හැකි බව වටහා දෙයි. මෙම සිත් හැරීමේ ප්‍රත්‍යක්ෂ සළකුණක් වශයෙන් පාප්තුමා දක්වා ඇත්තේ **සහයෝගිතාවයේ <u>(Solidarity)</u>** ධර්ම ගුණයයි. එය ප්‍රේමය ක්‍රියාත්මක කිරීමයි. එය පොදු යහපතට ඇති කැපවීම යි. සමාජ සාධාරණත්වය සඳහා කරන එඩිතර ඉදිරිපත් වීමයි. සුවිශේෂ පණිවිඩය ජීව ගැන්වීමයි. මෙම සහයෝගිතාවයේ ධර්ම ගුණය සමස්ත මානව ජීවිතයම වෙළා ගන්නා ප්‍රතිපදාව වශයෙන් විස්තර කළ හැකි ය. එය සම්පූර්ණ වන්නට සැමගේ ම සහාය අවශ්‍ය වෙනු ඇත. එනම්,

ධනපතියන් දානපතියන් වීමත් (බෙදා ගැනීමේ ප්‍රතිපත්තිය අනුව යමින්) දුගීන් තම අයිතීන් දිනා ගැනීමට උත්සුක වීමත් මෙම ක්‍රියාවලියේ ම කොටසකි.

අසරණ ජනතාව පිළිගැනීම මෙම නව ප්‍රතිපදාව ක්‍රියාත්මක කරවීමට හේතු වන බව පැහැදිලි ය. එසේ ම දුර්වල අය තමනට කිසි දෙයක් කළ නොහැකි බව පවසමින් ලතැ නොවී තමන්ගේ ශක්තීන් උපයෝගී කරමින් සංවිධානවීමේ බලය පෙන්වා දෙයි. දුගී අය ද හිංසාවට ඉඩ නොතබා සංවිධානය වීම ධනාත්මක කරුණකි. මේ අනුව සභාවට ඇති වගකීම අනුව **දිළිඳුන්ගේ පැත්ත ගැනීමේ වරණීය තෝරා ගැනීමේ** වැදගත් කම හුවා දක්වයි. එයද සහයෝගිතාවයේ ම පැති කඩකි. සහෝදරත්වය ගොඩනැගීමට ද රුකුලක් වනු ඇත. ජාත්‍යන්තර වශයෙන් ද වඩා යහපත් ආකාරයෙන් අන්තර් යැපීම ක්‍රියාත්මක කළ හැකි වනු ඇත.

# පස්වන පාඩම

## 5. ආගම ඉගැන්වීම

## 5.1 ධර්මෝපදේශයේ විකාශනය - ආගම ඉගැන්වීමේ විවිධ ක්‍රම

ධර්මදානය තම ප්‍රධාන කාර්යය ලෙස භාර ගත් ශු. සභාවේ ධර්මෝපදේශ ප්‍රයත්නයට දීර්ඝ ඉතිහාසයක් ඇත. ඔබේ අධ්‍යයන පහසුව සඳහා එම ඉතිහාස මෙහි සාරාංශ ගතකරමු.

### 5.1.1. ක්‍රිස්තු යුගයේ ධර්මෝපදේශය

දේව රාජ්‍යය හා ගැළවීම ගැන දේශනා කළ ජේසුස් වහන්සේ ක්‍රිස්තියානි ධර්මෝපදේශයේ ආරම්භකයා වූ සේක. උන්වහන්සේ "දේශනා ක්‍රමය" උපයෝගී කරගත් අයුරු සුවිශේෂයෙහි දැක්වෙයි. තම ජනතාවට වැටහෙන පරිදි කරුණු දැක්වූ උන්වහන්සේ, සරල බසින් උගන්වමින් ජුදා ගැමි ජීවිතයෙන් ම නිදසුන් ගෙන සාර ධර්මයන් ද දේව රාජ්‍යය පිළිබඳ අභිරහස ද ඉදිරිපත් කළ සේක. ගුප්ත ධර්මය අනාවරණය කිරීමට උපමා යොදා ගත් සේක. දේශනා ක්‍රමය ද, උපමාවන් මගින් ඉගැන්වීම ද එකල ප්‍රචලිත අධ්‍යාපන ක්‍රමයක් විය.

ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ කරුණු හෙවත් විෂය ක්ෂේත්‍රය මෙසේ දැක්විය හැකි ය.

- දේව රාජ්‍යය ආසන්න ය, මනස්ථාපනය වන්න. සුබ අස්න අදහා ගන්න. (මාර්ක් 1:15).
- දේව රාජ්‍යයේ ප්‍රඥප්තිය හෙවත් භාග්‍ය අට (මතෙව් 5:1 සිට).
- ක්‍රිස්තියානි අගයයන් (මතෙව් 5:7).
- දේව රාජ්‍යය සම්බන්ධ අභිරහස (මතෙව් 13:3-8).
  - දේව වචනයෙන් ඵල දැරීම (මතෙව් 13:3-8).
  - විරෝධතාවයට විනිශ්චය (මතෙව් 13:24-30), යහපත හා නපුර මිහිපිට දේව රාජ්‍යය තුළ දිස්වෙයි.
  - වර්ධනය පියවි ඇසට නොපෙනෙයි (මතෙව් 13:31-32).
  - ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය (මතෙව් 13:33)
  - වටිනාකම (මතෙව් 13:4-46).
  - යහපත් අයහපත් සාමාජිකයෝ (මතෙව් 13:46-48).
  - චින්තන ගැටුම (මතෙව් 13:52)
  - පාපයට හේතු (මතෙව් 15:10)
  - දැනුම නැති දහම් ගුරුවරු (මතෙව් 15:14)
  - උචිත ලෙස දැනුම දීම (මතෙව් 15:26)
  - සාමාජිකයන් නොමග යෑම (මතෙව් 18:12-14)
  - සමාව දීම (මතෙව් 18:23-35)
  - දේව රාජ්‍යයට කැඳවීම (මතෙව් 20:1-6)
  - සාමාජිකයන්ගේ හැසිරීම (මතෙව් 21:28-32)
  - පරිවර්තනය (මතෙව් 21:33-44)
  - කැඳවීම හා සූදානම (මතෙව් 22:2-14)
  - ඵල දැරීමේ අවශ්‍යතාවය (මතෙව් 24:32-35)
  - අවදිව සිටීමේ අවැසියාව (මතෙව් 24:45-51, 25:1-13)
  - දැහැමි ජීවිතය සඳහා දීමනා (මතෙව් 25:14-30)
  - අවසාන විනිශ්චය (මතෙව් 25:31-33)

- දේව රාජ්‍යයේ සලකුණු හෙවත් දෙවියන් වහන්සේගේ සුලක්ෂණ

  - ස්වාභාවික බලවේගයන් මත ආධිපත්‍යය (මාර්ක් 4:35-40, ජොහන් 2:1-10, මතෙව් 14:22-23, ජොහන් 6:1-15)

- රෝග සුව කිරීමේ බලය (මාර්ක් 1:29-31, ලූක් 12:5-17, මාර්ක් 8:7-26, ලූක් 7:1-17)
- සාතන් මත බලය (ලූක් 8:26-39, මාර්ක් 5:1-20, මතෙව් 4:12-17)
- මිනිස් හදවත් මත බලය (මාර්ක් 2:1-9, ලූක් 19:1-9, ජොහන් 9:6-34)
- ජීවිතය හා මරණය මත බලය (මාර්ක් 5:21-43, ලූක් 7:11-17, ජොහන් 11:1-44)

මෙලෙස දේව රාජ්‍යය හා ගැලවීම සම්බන්ධව කරුණු රාශියක් ඉදිරිපත් කළ ජේසුස් වහන්සේ සුබ අස්නට ජීවිත සාක්ෂි දැරූ සේක. එය ප්‍රබල ධර්මෝපදේශයක් විය.

### 5.1.2. අපෝස්තලික යුගය

**ශුද්ධාත්ම ආගමනයෙන් පසුව අපෝස්තුළුවරු ද සුබාරංචිය දේශනා කළ හ. ඔවුන් විෂය ක්ෂේත්‍රය කොට ගත්තේ:**

- ජේසුස් වහන්සේ කී වචන
- ජේසුස් වහන්සේ කළ දේ
- ජේසුස් වහන්සේගේ දේවත්වය
- සුබාරංචිය පිළිගැනීමේ අවශ්‍යතාවය
- ගැළවීම ලැබීමේ කොන්දේසි ............වැනි කරුණු ය.

ඔවුන් කළ ප්‍රාතිහාර්යය හා ඔවුන්ගේ ජීවිත සාක්ෂිය ද වැදගත් වෙයි. ජේසුස් වහන්සේ උපයෝගි කරගත් දේශනා ක්‍රමය ම අපෝස්තුළුවරු ද යොදා ගත් හ.

**මේ ගැන සිතා බලන්න**

(i) සුවිශේෂය වැදගත් වෙයි. උපරිම දේව ප්‍රකාශනය වන ක්‍රිස්තුන් වහන්සේ කළ කී දෑ එහි දැක්වෙයි. සුවිශේෂය ධර්මෝපදේශයේ පදනම වනුයේ මේ නිසා ය. දහම් ගුරුවරයාට සුබාරංචිය හෙවත් සුවිශේෂය ගැන මනා දැනුමක් තිබිය යුතු ය.

(ii) අපෝස්තුළුවරුන්ගේ ධර්මෝපදේශය එකවරම දේව කේන්ද්‍රිය හා ක්‍රිස්තු කේන්ද්‍රිය විය.
එය දේව කේන්ද්‍රිය වූයේ, ගැළවීමේ ඉතිහාසය තුළ අනාවරණය වූ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය ගැන සඳහන් කරමින්, ඉගැන්වීම ආරම්භ කළ නිසා ය.
(ක්‍රියා 3:12 සිට, 10:34 සිට, 7:1 සිට, 13:16 සිට). එය ක්‍රිස්තු කේන්ද්‍රිය වූයේ, ක්‍රිස්තුන් වහන්සේ තුළ පූර්ණ දේව ප්‍රකාශනය සිදු වූ බව ඉගැන්වූ නිසා ය.
(2 කොරින්ති 4:5, ක්‍රියා 13:16-33, හෙබ්‍රෙව් 1:3).

(iii) අපෝස්තුළුවරුන් අනුගමනය කළ දේශනා ක්‍රමය තුළ පියවර තුනක් දිස්වේ.
- පැරණි ගිවිසුම් පසුබිම දැක්වීම
- උද්ධෘත පාඨයකින් සනාථ කිරීම
- ජීවිතයට අර්පිත කිරීම හෙවත් සම්බන්ධ කිරීම (ක්‍රියා 13:30 සිට).

(iv) අපෝස්තුළුවරු බොහෝ විට ධර්මෝපදේශය දුන්නේ ජනවන්දනාවට සම්බන්ධ කරමින් ය. නිදසුන් ලෙස, මළවුන්ගෙන් උත්ථාන වීම ගැන උගැන්වූ පාවුළු තුමා, එය තහවුරු කිරීම සඳහා බෞතිස්ම ස්නාපන පිළිවෙත ඇදා ගත් බව (රෝම 6:3-5) පැහැදිලි වෙයි.

"බෞතිස්ම ස්නාපනයෙන් ක්‍රිස්තුන් ජේසුස් වහන්සේ හා සමග ඒකාබද්ධ වූ අප සියල්ලන් ම එම බෞතිස්ම ස්නානයෙන් උන්වහන්සේගේ මරණයෙහි, උන්වහන්සේ හා සමග ඒකාබද්ධ වූ බව, ඔබ නොදන්නහු ද?.... උන්වහන්සේගේ මරණය වැනි සිද්ධියකින් අපි උන්වහන්සේ හා සමග එක්වුණෙමු නම්, උන්වහන්සේගේ උත්ථානය වැනි සිද්ධියකින් ද අපි උන්වහන්සේ හා සමග එක්වන්නෙමු."

(v) ධර්මෝපදේශය හා පොදු ජන වන්දනාව එකට ගමන් කළ බව (ක්‍රියා 2:42) ද අනාවරණය වෙයි.
"ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද, සහභාගිකමෙහි ද පූප කැඩීමෙහි ද යාච්ඤාවෙහි ද නිරතව කල්ගත කළ හ."

### 5.1.3. මුල් කිතුනු සභා යුගය

මෙම යුගයේ විකාශනය ක්‍රි.ව. 100-600 දක්වා වූ කාලය සැටියට ගත හැකි ය. දහම් සේවාවේ ප්‍රචලිත ක්‍රමය වූයේ දේශනා කිරීම හා සුබාරංචිය විස්තරකර දීම ය. කුඩා දරුවන් සඳහා එකල දහම් පාසල් නොවී ය. වැඩිහිටියන්ට ධර්මදානය දෙන ලද්දේ ඉරුදින පූජා මෙහෙය වේලාවේදීත්, සතියේ දිනවල සැඳෑ මෙහෙය මගිනුත් ය. දිව්‍ය පූජාව ආරම්භයේදි ම රාජගුරුප්‍රසාදීතුමන් විසින් සැදැහැවතුන්ට ශු. ලියවිල්ල විස්තර කර දෙන ලදි. සමහර අවස්ථාවලදි එතුමන්ගේ අනුමැතිය පරිදි, විවිධ ස්ථානවල විශ්වාසකයන් රුස්කර, පූජකවරු ද උපස්ථායකවරු ද ඔවුන්ට ශු. ලියවිල්ල ඉගැන්වූ හ. එවැනි අවස්ථාවල දී ඔවුන් සැවොම එක්ව යාච්ඤා කළ හ. ගීතාවලියෙන් ගී ගැයූ හ.

තෙවන ක්‍රිස්තු ශත වර්ෂයේ දී "කැටක්‍යුමිනේට්" හෙවත් ධර්මෝපදේශ ව්‍යාපාරය ඇරඹිණි. එහි පරමාර්ථය වූයේ, බෞතිස්ම ස්නාපනය සඳහා අපේක්ෂකයන් සූදානම් කිරීම ය. මේ සඳහා අවුරුදු තුනක කාලයක් ගත විය. බයිබලයේ ප්‍රඥා සාහිත්‍යයෙන් කොටස් ගෙන, අපේක්ෂකයන්ට විස්තර කර දෙන ලදි. එමගින් මානුෂික වටිනාකම් කාවද්දන ලදි. තෙවසරකට පසු නවකයනට දිව්‍ය පූජාවේ මුල් කොටසට සහභාගි වීමට අවසර ලැබිණි. විශ්වාස ලක්ෂණය හා ස්වාමිවාක් ආරාධනාව මගින් වේද සත්‍යතාවයන් උගන්වන ලදි. එම උපදෙස් කාලය හමාර වූයේ අපේක්ෂකයන් බෞතිස්මය ලැබූවායින් පසුව ය. එකල බෞතිස්මය ලැබුවනට දිව්‍ය සත්ප්‍රසාදය ද දෙන ලදි. එම යුගයේ දී පැවැති වාචික ධර්මෝපදේශයේ විෂය ක්ෂේත්‍රය වූයේ:

- ප්‍රඥා සාහිත්‍යය (ජෝබ්, තෝබිත්, උපදේශකයා, සලමොන්ගේ ප්‍රඥාව වැනි බයිබල් ග්‍රන්ථ)
- විශ්වාස ලක්ෂණය
- පරමණ්ඩල ආරාධනය
- ආගමික සංදේශ (රාජගුරුප්‍රසාදිවරුන්ගේ දේශන, සංදේශ, ප්‍රාණ පරිත්‍යාගිවරුන් සම්බන්ධ විස්තර) යනාදිය ය.

ක්‍රි.ව. 600 වනවිට ජර්මානු හා ස්ලාව් නැමති ම්ලේච්ඡ ගෝත්‍රිකයන් බොහෝ ගණනින් ශු. සභා සාමාජිකත්වය පැතූ බැවින් ධර්මෝපදේශ ව්‍යාපාරය ක්‍රම ක්‍රමයෙන් අභාවයට පත් විය. බෞතිස්ම ස්නාපනය ලැබීමෙන් පසු ධර්මෝපදේශය ඉගැන්වීමේ අවශ්‍යතාවය ද එළඹිණි. ක්‍රි.ව. 405 න් පසුව ශු. අගුස්තිනු තුමාගේ (හිප්පෝ නගරයේ රදගුරුතුමා) ධර්මෝපදේශ ක්‍රමය මුදුන් පත්විය. එය ද වැඩිහිටියන් වෙත එල්ල විය. එහි සංයුක්ත පියවර මෙසේ දැක්විය හැකි ය.

- බයිබලය ආශ්‍රයෙන් ගැලවීමේ ඉතිහාසය
- ශු. සභා ඉතිහාසයෙන් ගැලවීමේ ඉතිහාසය
- ශු. ලියවිල්ලෙන් වේද සත්‍යතාවන් උපුටා ගැනීම
- එම සත්‍යතාවන් ජීවිතයට සම්බන්ධ කිරීම

මෙහි විශාල වැදගත්කමක් දිස්වෙයි. ගැලවීමේ ඉතිහාසය මගින් දෙවියන් වහන්සේ මිනිසාට දැක්වූ ප්‍රේමය ඉස්මතු විය. එම ප්‍රේමය නිසා ම දේව පුත්‍රයාණන් මාංශගත වී, පාස්කු අභිරහස මගින් අප ගලවා ගත් බව ප්‍රත්‍යක්ෂ වෙයි. ගැලවීමේ සැලැස්ම හා එහි ක්‍රියාකාරිත්වය ශු. සභාව මගින් කාලයේ අවසානය දක්වා ම ශුද්ධාත්මයාණෝ ඉදිරියට ගෙන යති. පොදු ජනවන්දනාව තුළ ප්‍රදානය කෙරෙන ප්‍රසාද නිධාන මගින් මනුෂ්‍යයන් ශුද්ධවන්ත කරනු ලැබ, ඔවුන් තුළ දේව දරුකම හෙවත් "දෙවි-මිනිස්" සබැඳියාව තහවුරු වෙයි. මෙම ධර්ම සම්පිණ්ඩනය අගුස්තිනු තුමාගේ දහම් සේවා සැලැස්ම තුළ ගැබ්වෙයි. ආදරවන්ත දෙවියන් වහන්සේට ආදරයෙන් පිළිතුරු දීමට මනුෂ්‍යයන් පෙළඹවීම ශු. අගුස්තිනු තුමන්ගේ අභිලාෂය වූ බව ඉහත දැක්වෙන ධර්මෝපදේශ පියවර සතරෙන් ඔබට පැහැදිලි වනවා ඇත.

### 5.1.4. මැදි යුගයට පෙර යුගය - ක්‍රි.ව. 600-900

මේ යුගයේ දී පශ්චාත් - බෞතිස්ම ධර්මෝපදේශය කරළියට පැමිණියේ ය. ක්‍රි.ව. 500 න් පසුව, ළදරුවනට ප්‍රසාද ස්නාපනය දීම සිරිත විය. ඔවුන්ගේ විශ්වාස වර්ධනය ගැන වගකීම කිතුනු පවුල්, කිතුනු සමාජය හා පොදු ජනවන්දනාව මත පතිත විය. බාල, මහළු සැම දෙන ම ජනවන්දනාවට සහභාගි වූහ. ප්‍රධාන ධර්මෝපදේශ මාධ්‍යය වූයේ මෙයයි. මේ තත්ත්වය වෙනස් වූයේ සුළු පූජාව ප්‍රචලිත

වීමෙන් ය. දේශනය ද කෙටි විය. එපමණක් ද නොව, විවිධ භාෂාවන් කථා කරන පිරිස් දිව්‍ය පූජාවට පැමිණි නිසා, එක් භාෂාවකින් දේශනය පැවැත්වීම දුෂ්කර විය. ක්‍රි.ව. 900 වනවිට පවුල්වල ක්‍රිස්තියානි වාතාවරණය ද හීන විය. මේ හේතුවෙන්, ආගමික අධ්‍යාපනය සඳහා පාසල කේන්ද්‍රීය විය. කෙසේ වෙතත් ජන සමාජයේ ක්‍රිස්තියානි භාවය පළුදු වූයේ කුරුස යුද්ධවලින් පසුව ය.

### මැදි යුගය - ක්‍රි.වෂී 900-1500

මෙකල ද ධර්මෝපදේශය ජනවන්දනා කේන්ද්‍රීය විය. චතාරික කාලයේ දී පූජකවරු ආගම ඉගැන්වූහ. විෂය ක්ෂේත්‍රය වූයේ,

- විශ්වාස ලක්ෂණය
- පරමණ්ඩල ආරාධනාව
- දස පණත
- නමෝ මරිය
- මූල් අගුණ පව් සත
- ශුද්ධාත්ම දීමනා සත

යනාදියයි. බයිබල් කථා මගින් ගැලවීමේ ඉතිහාසය උගන්වන ලදී. එහෙත් විධිමත් ධර්මෝපදේශයක් තවමත් නොවී ය. වැඩි වගකීම රුඳුණේ පවුල හා සමාජ වාතාවරණය මත ය.

මැදි යුගයේ ධර්මෝපදේශ ප්‍රයත්නය මෙසේ දැක්විය හැකි ය.

i) වැඩිහිටියන් හා ළමුන් සඳහා විධිමත් ධර්මෝපදේශය විරල විය.
ii) පැරණි "කැටක්‍යුමිනේට්" හෙවත් ධර්මෝපදේශ ව්‍යාපාරයට හිමි තැන ක්‍රිස්තියානි පරිසරයට ලැබිණි.
iii) කිතුනු පරිසරය - පවුල, ජන වන්දනාව හා සමාජය යන සාධකයන්ගෙන් සංයුක්ත විය.
iv) බාලයනට ආගම ඉගැන්වීමේ වගකීම පවුලට හිමි විය.
v) වැඩිහිටියෝ ජනවන්දනාව මගින් ආගම ඉගෙන ගත් හ.
vi) ක්‍රිස්තියානි අගයයන් ප්‍රචාරය කිරීමෙහි ලා ආසන දෙව්මැදුරු, ගිල්ඩ් හෙවත් කම්කරු සමාජ, වන්දනා ස්ථාන, මංගල පෙරහැර හා ප්‍රාතිහාර්යය, ශීලධර්ම කේන්ද්‍රීය නාට්‍ය සංදර්ශන ප්‍රමුඛස්ථානය ගත් බව ප්‍රත්‍යක්ෂ වෙයි.

**මේ ගැන සිතන්න**

- මැදි යුගයේදී පැවැති දහම් සේවාව ක්‍රම ක්‍රමයෙන් හීන වූයේ ජනතාව දිව්‍ය පූජාවෙන් ඈත්වී, සත්ප්‍රසාද ආශිර්වාදය, පෙරහැර, මුනිවරුන් වෙත හා භක්ති මෙහෙය වැනි සංස්කාරයනට මුල් තැන දුන් නිසා ය.
- කුරුස යුද්ධවලට පසු යුගයේදී (ක්‍රි.ව. 1350-1500) ආගම වඩා වාණිජමය ස්වරූපයක් ගත්තේ ය. කිතුනු ජනතා අවධානය, බාහිර දයා ක්‍රියා, පශ්චාත්තාපී ක්‍රියා වැනි දෑ වෙත එල්ල විය.
- ක්‍රි.ව. 1517 වනවිට, ධර්මෝපදේශ ක්ෂේත්‍රය අඩපණ වී තිබිණි. විවිධ මිථ්‍යා මත රාශියක් ද කිතුනු ජනතාව තුළට කඩා වැදිණි.
- ක්‍රිස්තියානි යුරෝපය තුළ දහම් සේවාවේ පදනමව පැවැති දිව්‍ය පූජාව හා පූජකවරය නන්විධ විවේචනයට ද හාස්‍යයට ද ලක්විය.

### 5.1.5 රෙපරමාදු ව්‍යාපාරය හා ඊට පිළිතුර

රෙපරමාදු විප්ලවය ඇරඹූ මාටින් ලූතර් "ද කැටිකිසම්" හෙවත් උපදේශ පොත ප්‍රසිද්ධියට පත් කළේ ය. ප්‍රශ්න උත්තර ක්‍රමයට සැකසුණු මේ පුංචි පොත පාසල් සිසුන්ට දෙන ලදී. සහ ඉතිහාසයෙහි දැක්වෙන සැටියට ලූතර්ගේ වේද භේදික අදහස් මෙම උපදේශ පොත් මගින් ප්‍රචාරය වූ බව පැහැදිලි වෙයි. කෙසේ වෙතත්, වේද සත්‍යතාවන් ප්‍රශ්න උත්තර මගින් දැක්වීමේ ක්‍රමය ලූතර්ගේ උපදේශ පොත ප්‍රචාරය කිරීමෙන් පසු ප්‍රසිද්ධ විය.

ක්‍රි.ව.1555 වනවිට, කතෝලික උපදේශ පොත් කිහිපයක් ද ප්‍රසිද්ධ කරන ලදි. ඒවා අතරින් ජේසු නිකායික පීටර් කැනිසියුස් තුමන් ලියූ පොත, විධිමත් උපදේශ පොතක් ලෙස ගැනිණි. එහි සැලැස්ම මෙසේ දැක්විය හැකි ය.

- විශ්වාසය හා විශ්වාස ලක්ෂණය ගැන කරුණු
- බලාපොරොත්තුව හා යාච්ඤාව ගැන කරුණු
- ප්‍රේමය හා දස පණත සම්බන්ධ කරුණු
- ප්‍රසාද නිධාන ගැන ඉගැන්වීම
- වරප්‍රසාද ගැන කරුණු

මේ පොත (උපදේශ) වැඩිහිටියන් සඳහා විය. 1559 දී කැනිසියුස් තුමන් ළමුන් සඳහා ලියූ උපදේශ පොත ජර්මනියේ පාසල්වල භාවිතා කරන ලදි. එය 1759 වන තෙක් ජර්මනියේ සුප්‍රසිද්ධ වූ බව සහා ඉතිහාසයෙන් සනාථ වේ.

ඉතාලියේ රොබට් බෙලර්මීන් තුමා ද මෙම වකවානුවේදී ම උපදේශ පොතක් පළ කළේ ය. එහි හරය මෙසේ දැක්විය හැකි ය.

- ත්‍රිත්ව ස්තෝත්‍රය
- විශ්වාස ලක්ෂණය
- පරමණ්ඩල ආරාධනය
- නමෝ මරිය
- දස පණත
- ශුද්ධ වූ සභාවේ පණත් හය
- ප්‍රසාද නිධාන
- විශ්වාසය, බලාපොරොත්තුව හා දේව ප්‍රේමය සම්බන්ධ උච්චාරණ හා අර්ථය පැහැදිලි කිරීම
- ශුද්ධාත්ම දීමනා සත
- පුණ්‍ය ක්‍රියා සත
- පාපය සම්බන්ධ කරුණු
- මනුෂ්‍යයාගේ මරණය හා අනාගතය සම්බන්ධ ඉගැන්වීම්

මෙම උපදේශ පොත් හා කැනිසියුස් තුමන් ලියූ ග්‍රන්ථය පොදු වශයෙන් ගත්විට කතෝලික දේව ධර්මයේ සංක්ෂිප්ත සංග්‍රහයක් වූ බව කිව යුතු ය.

ක්‍රි.ව.1566 දී ප්‍රසිද්ධ කරන ලද “ද රෝමන් කැටිකිසම්” නමැති උපදේශ පොත ත්‍රිදෙන්තිනු මහා මන්ත්‍රණ සභාවේ ප්‍රතිඵලය විය. එහි:

- වේද සත්‍යතා
- ප්‍රසාද නිධාන
- දස පණත
- පරමණ්ඩල ආරාධනාව

යනුවෙන් කොටස් හතරක් විය. එමගින් ඇදහිල්ල, ජන වන්දනාව හා ක්‍රිස්තියානි පැවැත්ම සම්බන්ධ කරුණු ධර්ම ඒකත්වයෙන් දැක්විණි. එය, මතු උපදේශ පොත් සඳහා ආදර්ශ මූලාශ්‍රයක් බවට පත්විය.

17 වන ශත වර්ෂයේ දී ප්‍රංශයෙහි ප්‍රසිද්ධියට පත් සාන්ත සුල්පිස් ධර්මදාන ක්‍රමය ද වැදගත් වෙයි. දහම් ගුරුවරුන්ගේ ජීවිත සාක්ෂ්‍යය මීට ප්‍රධාන හේතුව වශයෙන් ගත හැකි ය. සාන්ත සුල්පිස් නිකායේ පූජක සිසුන් විසින් දෙන ලද මෙම ධර්මෝපදේශයට කේන්ද්‍රීය වූයේ "වෙස්පර්ස්" හෙවත් ඉරුදින සැඳෑ මෙහෙයයි. ළමුන්ට මෙන්ම වැඩිහිටියනට ද ආගම උගන්වන ලදී. මෙහි විශේෂත්වය වූයේ:

- සුවිශේෂ පාඨ ඉගැන්වීම
- ගී ගායනය
- ලකුණු දීම
- තෑගි බෙදා දීම ය.

මෙම ක්‍රමය සංවිධානය කරන ලද්දේ සුල්පිස් නිකායේ ආරම්භක පියා වූ ජාන් ජක් ඔලියර් තුමන් (1608-1667) විසිනි.

ප්‍රංශයෙහි ව්‍යාප්ත වූ තවත් වැදගත් ධර්මදාන ක්‍රමයක්, ජෝන් බැප්ටිස්ට් ද ලා සාල් තුමන් විසින් අරඹන ලදී. එය පාසල් ක්‍රමය හා නිදහස් අධ්‍යාපන පදනම මත ඉතා ශීඝ්‍රයෙන් පැතිරිණි. එහි නවතාවය වූයේ කථාන්තර ක්‍රමයයි. වේද හරය කථාන්තර මගින් ඉදිරිපත් කරන ලදී. උපදේශ පංතිය ආරම්භයේ දී ගීයක් ගැයීම ද සිරිත විය. ක්‍රිස්තු චරිතය, ශුද්ධවරයන්ගේ චරිත හා ශුද්ධ ලියවිල්ල ධර්මෝපදේශ පාඩමට සම්බන්ධ කරගන්නා ලදී. මෙය දහම් ගුරුවරයාගේ කාර්යය විය. දෘෂ්‍යාධාර වශයෙන් ආගමික චිත්‍ර, චාට්, සටහන් යනාදිය උපයෝගී කරගන්නා ලදී. ධර්ම සාරය කටපාඩම් කරවීම ද සිරිත විය.

ක්‍රි.ව. 1847 දී ජේසු නිකායික ජෝශප් ඩිහාබ් පියතුමා ප්‍රසිද්ධ කළ ධර්මෝපදේශ ග්‍රන්ථය 1850-1900 දක්වා වූ කාලය තුළ ප්‍රසිද්ධියට පත්විය. එහෙත් එයින් ආගම ඉගැන්වීමේ ක්‍රම ක්ෂේත්‍රයෙහි නවතාවයක් ඇති වූයේ ද යනු ප්‍රශ්නයකි. එහි සැලැස්ම වූයේ:

- වේද සත්‍යතා දැක්වීම
- දස පණත
- ප්‍රසාද නිධාන යන ත්‍රිවිධ සංයුතියයි.

එය ශාස්ත්‍රීය ග්‍රන්ථයක් විය. ගැළවීමේ ඉතිහාසය දැක්වීමට වඩා (තර්කානුසාරයෙන්) දේව ප්‍රකාශනය ගැන ද ශුද්ධ වූ සභාව ගැන ද කරුණු දැක්වීමක් එහි දිස්වෙයි. වේද සත්‍යතාවන් හා කිතුනු පැවැත්මට අදාළ ඉගැන්වීම ශුද්ධ ලියවිල්ලෙන් ගැනීම වෙනුවට යම් ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් යොදන තර්කයක් සනාථ කිරීමට බයිබලයෙන් කරුණු විමසීමක් එහි කැපී පෙනෙයි. මෙයින් ප්‍රත්‍යක්ෂ වනුයේ ශු. චාල්ස් බරෝමියෝ ඇතුළු කණ්ඩායම විසින් ලියන ලද රෝම ධර්මෝපදේශ ග්‍රන්ථය ප්‍රබල දේව ධර්ම ශාස්ත්‍රීය කෘතියක් වූ බව ය. එහෙත් 1850-1900 දක්වා වූ කාලය තුළ මෙම ග්‍රන්ථය ප්‍රසිද්ධ ධර්මෝපදේශ මගපෙන්වීමක් විය. එම වකවානුව ඩිහාබ් ධර්මෝපදේශ යුගය වශයෙන් හැඳින්වෙයි.

**මේ ගැන සිතා බලන්න**

- 1900 වනවිට පරිහරණය කරන ලද දහම් සේවා ග්‍රන්ථවල, දේව ධර්ම ශාස්ත්‍රීය පාදක විය. බයිබලය කේන්ද්‍රීය නොවී ය.
- පළමුවන ලෝක මහා යුද්ධයෙන් පසුව කතෝලික ලෝකය තුළ ධර්මෝපදේශය හා සම්බන්ධ පරිවර්තන ව්‍යාපාරයක් ඇරඹිණි.
- ඊට හේතු වූයේ මනෝ විද්‍යාත්මක ව්‍යුහයක් පදනම් කොටගෙන අනෙකුත් පාසල් විෂයයන් සම්බන්ධ පොත පත සම්පාදනය වීම ය.
- දන්නා දෙයින් නොදන්නා දෙයට සිසුවා ගෙන යාම අධ්‍යාපනයේ දි වඩා වැදගත් වන බව කැපී පෙනුණි. ඉගෙන ගැනීමේදී ශිෂ්‍යයා හුදෙක් "අසා සිටින්නෙක්" නොව ක්‍රියාකාරී වන කෙනෙක් වියයුතු බව සම්මත විය. අධ්‍යාපනය දීමේදී "ද ප්‍රොජෙක්ට් මෙතඩ්" හෙවත් ව්‍යාපෘති ක්‍රමය ප්‍රචලිත විය. පන්තියක සිසුන් මානසික වයස අනුව කාණ්ඩ කිරීම වැදගත් වන බවත්, එසේ කිරීමෙන් ඉගෙන ගැනීම පහසු වන බවත් ප්‍රත්‍යක්ෂ විය.
- වඩා යෝග්‍ය ආගමික අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාවය කැපී පෙනෙන්නට විය. මේ හේතුවෙන්, ජර්මනියේ මියුනික් හි රුස්වූ ධර්මධර පඬිවරු කළ (තර්ක - විතර්ක) විමසීමේ ප්‍රතිඵලය වූයේ නව ධර්මෝපදේශ ක්‍රමයක් එළි දැක්වීම ය. එයට අද,
  - මියුනික් ක්‍රමය
  - මනෝ විද්‍යාත්මක ක්‍රම
  - ක්‍රිස්තු කේන්ද්‍රීය ධර්මෝපදේශ ක්‍රමය යන නම් යෙදෙයි.

## 5.1.6 ක්‍රිස්තු කේන්ද්‍රීය ධර්මෝපදේශය

"ද කෙරිග්මැටික් ඇප්‍රෝච්" හෙවත් සුබාරංචිය වන ක්‍රිස්තුන් වහන්සේව ප්‍රකාශ කිරීම, ක්‍රිස්තු කේන්ද්‍රීය ධර්මෝපදේශයේ අත්තිවාරමයි වෙයි. මෙය පැහැදිලි කර ගැනීම සඳහා (කොලොස්සි 1:25-28) ඔබ අවධානයට ලක් කරමු.

"දෙවියන් වහන්සේ ........ඔබේ යහපත සඳහා මට වගකීමක් භාර දුන් සේක. ඒ වගකීම නම්, දෙවියන් වහන්සේගේ පණිවිඩය සම්පූර්ණයෙන් ප්‍රකාශ කිරීම ය. ඒ පණිවිඩය රහසක්ව සැඟවී තිබී, දැන් සැදැහැවතුන් හට අනාවරණය කර ඇත. ඒ රහස නම් ක්‍රිස්තුන් වහන්සේ ඔබ තුළ වැඩසිටීම ය. උන්වහන්සේ ඔබේ බලාපොරොත්තුව වන සේක. අප ප්‍රකාශ කරන්නේ ඒ ක්‍රිස්තුන් වහන්සේ ය."

## ක්‍රිස්තු කේන්ද්‍රීය ධර්මෝපදේශ රටාවේ ප්‍රධාන සංකල්පයන් මෙසේ දැක්විය හැකි ය.

- ජනතාවට සුබාරංචිය ප්‍රකාශ කිරීම ධර්මෝපදේශ පරමාර්ථයයි.
- සුබ පණිවිඩය න්‍යාය ධර්මයක් නොව සිද්ධියකි.
- එම සිද්ධිය නම්, දෙවියන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ මගින් අප ගලවා ගැනීම ය.
- සුභ පණිවිඩයෙහි කේන්ද්‍රීය වනුයේ ක්‍රිස්තුන් වහන්සේම ය.
- විමුක්තිදායක ක්‍රිස්තුන් වහන්සේ මිනිසාට ජීවනය දීම සඳහා පැමිණි සේක. එමනිසා "ජීවනය" සෑම ධර්මෝපදේශයකම හරය විය යුතුය.
- ක්‍රිස්තුන් වහන්සේගේ ද ගෝලයන්ගේ ද ජීවිතය අධ්‍යයනය කිරීම අනිවාර්ය වෙයි.
- ගැළවීමේ ඉතිහාසය තුළ අනාවරණය වන ජීවමාන දෙවියන් වහන්සේ අනාවරණය කරගැනීම ද අවශ්‍ය වෙයි.
- සුබ අස්න ප්‍රකාශ කිරීම ලෝක ජනතාවට ආරාධනයක් ද විය යුතුය. එවිට ඔවුන් තුළ ක්‍රිස්තු අභිරහස ක්‍රියාත්මක වෙයි.
- ක්‍රිස්තු කේන්ද්‍රීය ධර්මෝපදේශයේ විෂය ක්ෂේත්‍රය පන්ති කාල පරිච්ඡේද ගණනාවකට සීමා වන පරිදි ඒකක සංඛ්‍යාවකින් දැක්වෙයි. එක් එක් පාඩම පූර්ණ ස්කන්ධයකි. පාඩමක සාමාන්‍යයෙන් කොටස් 08 කි.

- හැඳින්වීම
- විස්තරය (විෂය කරුණු)
- විමසන්න (විෂය ක්ෂේත්‍රය ගැන ප්‍රශ්න)
- කටපාඩම් කිරීම සඳහා, පාඩම් සාරය පිළිබිඹු කෙරෙන උත්තර කීපයක්
- මාගේ ජීවිතය සඳහා (ආකල්ප ජනනයට මඟපෙන්වීමක්)
- ශු. ලියවිල්ලෙන් කොටසක් (භාවනාව හා නැවත සිතා බැලීම සඳහා)
- වෙනත් විස්තර (පාඩමට අදාළ විවිධ සංකල්ප පහදා දීම සඳහා)
- කළ යුතු දෑ (සිසුනට තමන් උගත් ධර්මය ක්‍රියාත්මක කිරීමටත්, ධාරණය කර ගැනීමටත් පෙළඹවීම ඇතිකරවන සේ සැළසුණු ප්‍රශ්න මාලාවක්)
- ඔබගේ අධ්‍යයන පහසුව සඳහා ඉහත දැක්වෙන සැලැස්ම විග්‍රහ කර දක්වමු.

## විග්‍රහය

ක්‍රිස්තු කේන්ද්‍රීය ධර්මෝපදේශ ක්‍රමය ඉන් ඉහත පැවැති ප්‍රශ්න - උත්තර ක්‍රමයට වඩා වෙනස් වෙයි. පාඩමෙහි මුල් කොටස හෙවත් "හැඳින්වීම" සඳහා කරුණු සපයා ගැනීමට බයිබලය, ශුද්ධවරයන්ගේ ජීවිත කථා, සභා ලේඛන, සභා ඉතිහාසය, වත් පිළිවෙත් සම්බන්ධ කෙටි විස්තර යනාදිය භාවිතා කෙරෙයි. මේ මගින් සිසුන් තුළ යම්කිසි සූදානමක් බිහිවෙයි. මෙය වැදගත් පියවරකි. කථාන්තරයක ස්වරූපයෙන් ම මේ කොටස ඉදිරිපත් කිරීම වටී.

දෙවන කොටසෙහි දැක්වෙනුයේ (සරල බසින් කෙරෙන) විෂය කරුණු විස්තරයකි. මෙහි පාඩමට අදාළ ධර්ම සාරය දැක්වෙයි. මෙය ශිෂ්‍යයාගේ බුද්ධිමය වයසට ප්‍රමාණවත් වන අයුරින් සඳහන් වෙයි. භාෂාව වඩා චිත්තාකර්ෂනීය වූයේ නම් යහපති. මෙහි දැක්වෙන ධර්මය නිතර ම ක්‍රිස්තු කේන්ද්‍රීය වීම ද එබැවින් දේව කේන්ද්‍රීය වීම ද විශේෂ ලක්ෂණයකි (ක්‍රිස්තු ධර්මය 2-71 වන ඒකකය බලන්න).

තෙවන කොටසෙහි "විමසන්න" යන උප නාමය යටතේ ප්‍රශ්නාවලියක් දැක්වෙයි. මෙහි පරමාර්ථය වන්නේ විෂය දැනුම මැන බැලීම ය. මෙය තරමක ආකල්ප පරීක්ෂණයක් ද වෙයි. ශිෂ්‍යයාට පමණක් නොව ගුරුවරයාට ද වැඩදායක වෙයි.

සතරවන කොටසෙහි තද කළු අකුරින් දැක්වෙන පිළිතුරු මගින් පාඩමෙහි හරය ඉදිරිපත් කෙරෙයි. මෙය විභාග අපේක්ෂකයනට ඉතා වැඩදායක වේ. එහෙත් මෙය ද වැරදි ලෙස භාවිතා කිරීමට දහම් ගුරුවරයා පෙළඹෙන්නට පුළුවන. දෙවන කොටස අමතක කර, මෙහි කළු අකුරෙන් දැක්වෙන හරය පමණක් ඉගැන්වීම වරදකි. මෙහිලා ධර්මෝපදේශකයා පරෙස්සම් විය යුතු ය.

පස්වන කොටස (මාගේ ජීවිතය සඳහා) මගින් නිසි ආකල්ප ජනනයක් අපේක්ෂා කරයි. මෙය ඉතා වටිනා පියවරකි. මෙවැනි ආකල්ප ඉස්මතු කිරීම නිසා ම ශිෂ්‍යයා තුළ චර්යා වෙනසක් ඇතිවෙයි. ආගම පාඩමෙහි පරමාර්ථය ද මෙයයි. ඉගෙනීම සම්පූර්ණ වනුයේ චර්යා වෙනසක් ඇතිවන විට ය.

සයවන කොටසින් අදහස් කරන්නේ, අදාළ ශුද්ධ ලියවිලි පාඨ මගින් පාඩමේ හරය ශිෂ්‍ය මනස තුළ පදිංචි කරවීමත්, ශිෂ්‍යයා බයිබලය වෙත ගෙන යාමත් ය. මෙය භාවනා ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම වටී. එවිට තමන් උගත් ධර්මය තාත්වික අත්දැකීමක් බවට පත්කර ගැනීමේ අවස්ථාව ශිෂ්‍යයාට ලැබෙයි.

සත්වන කොටස මගින් පාඩමට අදාළ දුෂ්කර සංකල්ප පැහැදිලි කර දීමක් අපේක්ෂා කරයි. මෙය සිසුන්ට මහඟු රුකුලකි. ඔවුන්ගේ දැනුම පුළුල් වනවා පමණක් නොව, වඩා සක්‍රිය වෙයි. දෛනික ජීවිතයෙහි දී කිතුනු චර්යා රටාවට ද සිසුවෝ ප්‍රවේශ වෙති.

අටවන කොටස ජීවිත අත්දැකීම් කේන්ද්‍රීය වෙයි. මෙය ශිෂ්‍යයාට අභියෝගයකි. ධර්මෝපදේශය පරිපූර්ණ වන්නේ ද ශිෂ්‍යයා මෙම කොටස අවබෝධ කරගෙන ඒ අනුව නිරීක්ෂණයෙහි යෙදෙන විට ය.

(ඔබේ දැනුම වැඩුම සඳහා ක්‍රිස්තු කේන්ද්‍රීය ධර්මෝපදේශ ක්‍රමයට අනුකූල, පාඩම් සටහනක මූලික අංග මෙහි දක්වමු. මේ සැලැස්ම පමණක් උපයෝගී කරගැනීම මෙයින් අදහස් නොකෙරෙයි.)

### 1. අරමුණ

උපදේශ පාඩමක අරමුණක් තිබිය යුතු ය. එය ශිෂ්‍යයාගේ මනෝ චෛතසික තත්ත්වයට අනුකූල වීම වැදගත් ය. අසාර්ථක අරමුණක් හේතුකොට ගෙන සිසුවා තුළ අරුචිය හා කලකිරීම ජනිත වෙයි. අරමුණ ජීවිතයට අර්පිත වීමත්, ප්‍රයෝජනදායක වීමත්, පැහැදිලි වීමත්, සංයුක්ත වීමත් අවශ්‍ය වෙයි.

### 2. දැනුම

පාඩමේ හරය මෙයින් දැක්වෙයි. දහම් ගුරුවරයා සිසු පොතෙහි ඇති පාඩම් විස්තරයට වහල්වීම යෝග්‍ය නොවෙයි. පාඩම සිසුනට අර්ථවත් වන අයුරින් සකසා ගැනීම ධර්මෝපදේශකයා සතු යුතුකම ය.

### 3. ආකල්ප

ආගම පාඩම මගින් කිතුනු ආකල්ප ජනිත කිරීම ඉතා වැදගත් වෙයි. පාඩමේ හරය අනුව ජනිත කළ යුතු ආකල්ප නිශ්චය කරගැනීම අත්‍යවශ්‍ය පියවරකි.

### 4. කුසලතා

බිහි කරන ආකල්පය අනුව ක්‍රියා කිරීමේදී ශිෂ්‍යයන් තුළ කුමන කුසලතාවන් සංවර්ධනය වන්නේදැයි සොයා බැලීම වටී. කුසලතා නැංවීම සඳහා වත් පිළිවෙත් හි සිසුන් සහභාගී කරවීම වැදගත් වෙයි.

### 5. ඉදිරිපත් කිරීම

මෙය චිත්තාකර්ෂනීය විය යුතු ය. රසවත් විය යුතුය. නවතාවයෙන් යුක්ත විය යුතු ය. ක්‍රිස්තුන් වහන්සේද ගැඹුරු ආධ්‍යාත්මික පාඩම් ඉගැන්වූයේ උපමාවන් මගින් ය. මෙහිදී සංයුක්ත දෙයින් පටන් ගෙන, කේවලමය දැ වෙත ශිෂ්‍යයන් ගෙන යාම වඩා යෝග්‍ය වෙයි. පාඩම යෝග්‍ය ලෙස ඉදිරිපත් කරන විට ශිෂ්‍යයන්ගේ අවධානය දිනාගැනීමට පහසු වෙයි. ආගමික ලැදියාව ද ඔවුන් තුළ උද්දීපනය වෙයි.

## 6. විස්තර කිරීම

මෙය ශිෂ්‍යයාට පාඩම නිසි ලෙස ග්‍රහණය කරගැනීමට උදව්වකි. පාඩමෙහි සඳහන් ක්‍රිස්තු ප්‍රතිපත්ති විශ්වකරණීය වීම වටී. මානව අගයයන් මත රඳනා ක්‍රිස්තියානි වටිනාකම් වඩා ස්ථාවර වෙයි. ඒවා සිසුනට පහසුවෙන් ග්‍රහණය කළ හැකි ය. විස්තර කිරීම, සංවාදී වීම ද යෝග්‍ය වෙයි. ඒ නිසා ම සිසුන්ගේ ක්‍රියාකාරීත්වය සහ සහභාගිත්වය වර්ධනය වෙයි. මෙම පියවර අවසානයේ දී පාඩමේ හරය එක් වැකියකින් සම්පිණ්ඩනය කරගැනීමේ හැකියාව සිසුන් ලැබිය යුතුම ය.

## 7. භාවිතය (ක්‍රියාකාරකම්)

ධර්ම අවබෝධය ක්‍රියාවට තුඩු දෙයි. ක්‍රියාවට පරිවර්තනය නොවන දැනුමෙන් පලක් නැත. භාවිතය සාමූහික අභ්‍යාසයක් වීම වඩා යෝග්‍ය වෙයි. ජෝන් ඩිවිගේ මතය අනුව "යම් පාඩමක් තහවුරු කරගැනීමට, ළමා මනසට දෙන හොඳ ම රැකුල නම් පන්ති ක්‍රියාකරකම් ය."

### ක්‍රියාකාරකම් වශයෙන්:

- පාඩමට අදාළ ගීයක් ගැයුම
- සුළු යාච්ඤාවක් සිසුන් ලවා ම සාදා කීම
- ජන වන්දනාවට සහභාගි වීම
- නාට්‍ය සංදර්ශන
- සමූහ සාකච්ජා
- සමිති සමාගම් ඇරඹුම
- උචිත බයිබල් පාඨ සොයා සටහන් කිරීම
- වාර්තා - රචනා ලිවීම
- විවිධ "දැනුම මිනුම" තරග
- දයාවේ ක්‍රියාවන් හි යෙදීම
- ක්ෂේත්‍ර සටහන් පොතක් ගොඩ නැංවීම
- දෙබස්, නාට්‍ය හා ගී, කවි යනාදිය තැනීම

යෝග්‍ය ය. කරමු. මීට අමතර අභ්‍යාසයන් සොයා ගැනීම දහම් ගුරුවරයාගේ ඇප කැපවීමේ විශේෂ ලක්ෂණයක් වශයෙන් ගත හැකි ය. තම සිසුන් හඳුනන ධර්මෝපදේශකයාට මෙය එතරම් දුෂ්කර කාර්යයක් ද නොවෙයි.

### මේ ගැන සිතන්න:

"ජේසුගේ යහළුවෝ මෙහෙමයි ඉන්නේ
කියලා සමගියේ මග පෙන්වන්නකො,
ජේසුගේ වචනයේ රස විඳ ගන්නට
කියුමත් කෙරුමත් එක්කර දෙන්නකෝ" (කිතුනු ගී අංක 208).

වඩා නවීන ලෙස ගැනෙන, මානව කේන්ද්‍රීය ධර්මෝපදේශය වෙත දැන් ඔබේ අවධානය යොමු කරමු.

### 5.1.7 මානව කේන්ද්‍රීය ධර්මෝපදේශය

මෙය නවීනත ම ධර්මෝපදේශ ක්‍රමය වශයෙන් ගැනෙයි. දේව ප්‍රකාශනය පිළිගන්නා මිනිසාට මෙහි උතුම් ස්ථානයක් ලැබෙයි. බාල කල සිට ම, තම ජීවිත අත්දැකීම් මගින් දෙවියන් වහන්සේත්, උන්වහන්සේගේ මැවිල්ලත්, එහි ගැබ්වන දේව සැලැස්මත් මිනිසා හඳුනා ගනියි. ළදරුවාට දෙවියන් වහන්සේ තම මව ය, පියා ය. විමුක්තියේ සුබාරංචිය තම මවගේ සුරතල් වදන් ය. දෙවියන් වහන්සේගේ මුහුණ තම මවගේ සිනාබර, ආදරබර මුහුණම ය, නව ජීවනය තම මවගේ රසවත් කිරි ය. මෙලෙස තම ජන්ම වයස තුළ හැදෙන වැඩෙන දරුවා, ක්‍රම ක්‍රමයෙන් පවුල, පාසල, ගම, නගරය, මිසම, රට, ලෝකය, විශ්වය වැනි පුළුල් සමාජ ඒකකයන් තුළ දේව සැලැස්ම හා දේව සලකුණු හඳුනා ගනියි. මෙයද දේව සැලැස්මේ ප්‍රධාන අංගයකි.


මෙලෙස ශික්ෂණය කරන කල, මානව කේන්ද්‍රීය ධර්මෝපදේශ ක්‍රමය ඉතා උචිත ආගමික අධ්‍යාපන රටාවක් බව ප්‍රත්‍යක්ෂ වෙයි. එහෙත් එය ද නොනිසි ලෙස භාවිතා කළහොත් ආගම පාඩම හුදෙක් සමාජ

අධ්‍යයන පාඩමක් විය හැකි ය. මෙය අවාසනාවකි. එමනිසා මානව කේන්ද්‍රිය ධර්මෝපදේශ ක්‍රමයට අදාළ විවිධ පියවර යෝග්‍ය ලෙස ධාරණය කරගැනීම ඔබේ යුතුකම වන බව සඳහන් කළ යුතු ය.

## පියවර

- මානව අත්දැකීමකින් පාඩම ඇරඹීම
- එම අත්දැකීම තුළ ගැබ්වන මානව වටිනාකම් සංවාදය මගින් ඉස්මතු කරලීම
- සුවිශේෂ ආලෝකයෙන් එම අත්දැකීම සෝදිසි කර බැලීම.
- සුවිශේෂ පණිවිඩයෙහි ගැබ්වන අභියෝගයට තමා දිය යුතු පිළිතුර හඳුනාගෙන එය ක්‍රියාත්මක කිරීම

මෙම පියවරයන් මෙසේ සටහන් ගත කරමු.




මානව අත්දැකීම වශයෙන් ළමා ජීවිත සිද්ධියක් ගත හැකි ය. එපමණක් ද නොව, බයිබල් කථාවක්, ජන ගීයක්, කවියක්, සින්දුවක්, සමාජ කථාවක්, සාහිත්‍ය කථාවක්, ප්‍රවෘත්ති පත්‍රයෙන් උපුටා ගැනීමක්, සඟරා වාර්තාවක් හෝ වෙනයම් අත්දැකීමක් හෝ ඉදිරිපත් කළ හැකි ය. එය උපදේශ පාඩමට නිසි මඟපෙන්වීමක් විය යුතු ය.
සංවාදය මගින් මුල් පියවරෙහි සඳහන් අත්දැකීම විග්‍රහ කිරීම යෝග්‍ය වෙයි. එහි ගැබ්වන මානව අගයයන් පිළිබිඹු කිරීමත්, ඒවා දේව රාජ්‍යයේ වටිනාකම්වලට අත්තිවාරම වන බව විදහා දැක්වීමත් අවශ්‍ය වෙයි.
තෙවන පියවරෙහි දැක්වෙන ධර්ම සාරය මගින්, මුල් පියවරෙහි දැක්වූ අගයයන් වඩා ආලෝකමත් විය යුතු ය. එහි රුඳෙන ප්‍රකාශිත පණිවිඩය එවිට පැහැදිලි වෙයි. දේව සැලැස්ම ඉස්මතු වෙයි. දේව සලකුණු විසිතුරු ලෙස හඳුනාගත හැකි ය. මානව අත්දැකීම් මගින් ද ඒවා තුළින් ද දෙවියන් වහන්සේ,

**මිනිසාට**
↘ කථා කරන බව
↘ කැඳවීමක් දෙන බව
↘ වගකීම් පවරන බව
↘ අනතුරු ඇඟවීම් කරන බව
↙ විපාක පෙන්වන බව
↙ ප්‍රේම ප්‍රකාශනයක් කරන බව
↙ අභියෝගයක් ඉදිරිපත් කරන බව

ශිෂ්‍යයාට පැහැදිලි වෙයි.

සතරවන පියවර නම්, දේව කැඳවීමට - අභියෝගයට හා දේව ප්‍රේමයට දැක්විය යුතු ප්‍රති උත්තරය සෙවීමකි. එපමණක් ද නොව එම ප්‍රතිචාරය දැක්වීමට මඟ පෙන්වීමකි, ඊට අවස්ථාව සැලසීමකි. ලුහුඩින් කියතොත් එය කිතුනු පැවැත්මට පෙලඹවීමකි.

මේ අනුව බලන කල, පැහැදිලි වනුයේ ආගම ඉගැන්වීමේ දී මානුෂික අත්දැකීම් මුල් පියවර වශයෙන් ගෙන ඒ තුළ, ඒ මගින් අනාවරණය වන දෙවියන් වහන්සේව ද දේව සැලැස්ම ද හඳුනා ගැනීමට ළමුන් පෙලඹවීම දහම් ගුරුවරයෙක් වන ඔබ සතු ප්‍රධාන යුතුකම හා වගකීම වන බව ය.

### 5.1.7.1 ප්‍රාථමික, පශ්චාත් ප්‍රාථමික පංති සඳහා විශේෂ ක්‍රම :

### ප්‍රාථමික පංති සඳහා විශේෂ ක්‍රම

වයස 5-11 දක්වා කාලය ප්‍රාථමික අධ්‍යාපන යුගය වේ. මෙම වයස්වල පසුවන සිසුන්ට ආගම ධර්මය ඉගැන්වීමේ දී භාවිතා කළ යුතු ක්‍රම තුළින් විධිමත් දේව ධර්මයක් ඉගැන්වීමට වඩා දෙවිඳුන් හා දෙවිඳුන්ගේ ප්‍රේමය, ජේසුතුමා හා දෙව්මව් මගින් හඳුනා ගැනීමත්, දේව දරුවන් වශයෙන් ජීවත් විය යුතු ආකාරය එදිනෙදා ජීවිත ආදර්ශ වලින් පිළිබිඹු කර, ඒ අනුව ජීවත්වීමත් අපේක්ෂා කෙරේ. එබැවින් ප්‍රාථමික පංතිවල සරල ඉගැන්වීම් ක්‍රම භාවිතා කෙරේ.

### ඉන් සමහරක් නම්:

### අ) කථාන්තර ක්‍රමය:

පාඩම ආරම්භයේදී ම ගුරුවරයා පාඩමට අදාළ වන ඉතා සිත් කාවදින කථාන්තරයක් ඉදිරිපත් කරයි. මෙයට සිසු සැමදෙනාගේ ම අවධානය යොමුවේ. ඉන්පසු ප්‍රශ්න උත්තර සංවාදයක් මගින් ඉහත කියන ලද කථාවේ කරුණු මගින් පාඩමට අදාළ විෂය කරුණු කිපයක් ඉදිරිපත් කළ හැකි ය. ජේසුස් වහන්සේ ද උපමා මÛsන් කළේ මෙවැනි දෙයකි.

### ආ) පින්තූර ක්‍රමය:

එකිනෙකට සම්බන්ධ පින්තූර කිහිපයක් මÛsන් සම්පූර්ණ පාඩම ඉගැන්විය හැක. එක එක පින්තූර ක්‍රමානුකූල ලෙස ඉදිරිපත් කිරීමෙන් පසුව ඒවායේ ඇති දර්ශනය ගැන සිසුන් හා සංවාදයක් ගොඩනÛd ගෙන විෂය කරුණු ඉගැන්විය හැකි ය. වර්ණ සහ විශාල පින්තූර මෙම කාර්යයට වඩාත් උචිත ය.

### ඇ) සංවාදක ක්‍රමය:

යම් ක්‍රියාවලියක් (උදාː දිව්‍ය පූජාව) සිසුන්ට නිරීක්ෂණය කිරීමට ඉඩ දීමෙන් පසුව ඔවුන් සමග ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමෙන් සංවාදයක යෙදී පාඩම ඉගැන්වීම.

### ඈ) ක්‍රියාකාරකම් ක්‍රමය:

යම් ක්‍රියාකාරකමක සිසුන් යොදවා ඔවුන්ගේ අත්දැකීම් විස්තර කිරීමෙන් හා අදහස් ප්‍රකාශ කිරීමෙන් පාඩම ගොඩනැගීම. මෙම ක්‍රියාකාරකම්වලින් සමහරක් නම්, නාට්‍යයක් රඟ දැක්වීම, දිව්‍ය පූජාවට සහභාගි වීම, අනාථ නිවාසයක් බලන්නට යාම, දෙමාපියන් සමග වන්දනා ගමනක් යාම.

### 5.1.7.2 පශ්චාත් ප්‍රාථමික පංතිවලට විශේෂ ක්‍රම

### අ) ව්‍යාපෘති ක්‍රමය

විෂය නිර්දේශයට අයිති යම් කොටසක් සිසුන් කිප දෙනෙක් ලවා අධ්‍යයනය කොට ඒ පිළිබඳ තමන් ඉගෙන ගත් දෙය වාර්තා කිරීම. ව්‍යාපෘති මÛsන් එක එක විවිධ වැඩ කොටස් අධ්‍යයනය කොට නිම කිරීමට භාර දිය හැකි ය.

### ආ) කණ්ඩායම් වැඩ

කණ්ඩායම් මගින් විෂය කරුණු ඉගෙන ගෙන තම කණ්ඩායමේ කටයුත්ත නිම කර, ඒ පිළිබඳව වාර්තා සැපයීම.

### ඇ) ගැටළු විසඳීමේ ක්‍රමය

ගුරුවරයා සමාජයේ හෝ පුද්ගල ජීවිතයට අදාළ ගැටළුවක් පාඩම ආරම්භයේ දී ඉදිරිපත් කරයි. සිසුන් විසින් මෙය ගැඹුරට සලකා බැලීම. තවද කිතුනු දර්ශනය ඔස්සේ එයට විසඳීමක් සෙවීම. ඉදිරිපත් කරන විසඳුම්වල අඩුපාඩු සෙවීම. අවසානයේ දී කිතුනු දර්ශනය මෙම අවස්ථාවේ දී පෙන්වා දීම.

## ඇ) යෞවන ධර්මෝපදේශය

යෞවනයින්ට ආගම ධර්මය ඉගැන්වීමේ දී ඔවුන්ගේ ස්වභාවය සැලකිල්ලට ගැනීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව ක්‍රමවේදයන් සොයා ගත යුතු ය. යෞවනයින් ආගම ඉගැන්වීම පිළිබඳව එතරම් ඇල්මක් නොදක්වීමට එක් හේතුවක් නම් ඔවුන්ට ආගම ධර්මය ඉගැන්වීම සඳහා භාවිතා කරන ක්‍රමවේදයන් ඔවුනගේ වයසට අනුකූල නොවීම ය.

**යෞවන ධර්මෝපදේශ ක්‍රමවේදයක් සකස් කරන විට පහත සඳහන් කරුණු සිහි තබා ගත යුතු ය.**

- අද සමාජයට, අද ජීවිතයට ගැලපෙන අයුරින් ආගමික සත්‍යතාවයන් ඉදිරිපත් කිරීම.
- ආගමික කරුණු තර්කානුකූලව ඉදිරිපත් කිරීම.
- ඇදහිල්ලේ ජීවිතයකට පොළඹවන ධර්මෝපදේශ ක්‍රම වේදයන් භාවිතා කිරීම.
- ක්‍රිස්තු ධර්මය පිළිබඳ වඩා ගැඹුරු අධ්‍යයනයක් වෙත සිසුන් ගෙනයමින් කිතුනු ඇදහිල්ල වඩාත් සවිමත් කිරීම.
- පොදු ජනවන්දනාව හා ප්‍රසාද නිධාන ගැන මනා අවබෝධයක් ඇති කර අර්ථවත් ලෙස ඒවාට සහභාගිවීමට පෙළඹීමක් ඇති කිරීම.
- ක්‍රිස්තුන් වහන්සේ හා උන්වහන්සේගේ ධර්මය වෙත පෞද්ගලික කැපවීමකට යොමු කෙරෙන මඟ පෙන්වීමක් ධර්මෝපදේශයෙන් ලබා දීම.
- ආදරය, ලිංගික ජීවිතය, විවාහය, අන්‍යෝන්‍ය සබඳතා පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දීම.
- යහපත් ගුණාංග අගය කර, ඒවා තම ජීවිතය තුළ වර්ධනය කරගැනීමට මඟපෙන්වීම් ලබා දීම.
- පිරිසිදුකම අගය කිරීමටත්, ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීමටත් අභියෝගාත්මක ලෙස කිතු දහම ඉදිරිපත් කිරීම.
- සමාජ සේවයට ලැදියාවක් ඇති කර තම ශ්‍රම ශක්තිය තුළින් අන්‍යයන්ට සේවය කිරීමේ උතුම්කම අවබෝධ කර දීම.
- යුක්තිය, සත්‍යය, සාධාරණකම, එකමුතුකම, සාමය යන උදාර මානව ප්‍රතිපත්ති තම ජීවිතය පුරාම ක්‍රියාත්මක කිරීමට උද්යෝගයක් ඇති කිරීම.
- කිතු සමිඳුන්ගේ දේව රාජ්‍යය මෙලොව ගොඩනැÚsම සඳහා දායකවීමට පෙළඹවීම.

### 5.1.7.3 යෞවන ධර්මෝපදේශයේ අරමුණු

ඉහත දක්වන ලද කරුණු අනුව යෞවන ධර්මෝපදේශයේ ක්‍රම වේදය පිළිබඳව යම් හැඟීමක් ඇතිකර ගත හැකි ය. යෞවනයින්ගේ ආගමික, මානසික, බුද්ධිමය, සමාජීය අවශ්‍යතා කුඩා ළමුන්ගේ මෙන් නොවන බව මින් පැහැදිලි වේ. ඔවුන්ට ආගම ධර්මය ඉගැන්වීමේ දී අරමුණු කරගත යුතු ප්‍රධානතම කරුණු කිපයක් පහත දක්වේ.

- ධර්මය ඉගැන්විය යුත්තේ ඒ අනුව ජීවත්වීමට
- කිතුනු විශ්වාසය තහවුරු කර දීමට
- සමාජයෙන් එල්ලවන අභියෝගවලට එඩිතරව මුහුණ දීමට
- අර්ථවත් ලෙස ආගමික වත් පිළිවෙත් වලට සහභාගි වීමට
- පිරිපුන් කිතුනුවකු ලෙස ක්‍රියා කිරීමට
- ජීවිතයේ යථාර්ථය නිසියාකාරව අවබෝධ කර දීමට
- සමාජය තුළ වැඩදායක පුද්ගලයෙකු ලෙස ජීවත්වීමට
- ආගමික ප්‍රතිපත්ති අනුව ජීවිතය හැඩගස්වා ගැනීමට
- යාච්ඤාව හා භාවනාව තුළින් දේව සබඳතා වර්ධනය කර ගැනීමට
- මෙලොව දේව රාජ්‍යය ව්‍යාප්ත කිරීමට දායකවීමට

මෙම වැදගත් අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා භාවිතා කරගත හැකි ක්‍රමවේදයන් කීපයක් වෙත විමසා බලමු.

**දේශන ක්‍රමය :**

මෙය යෞවනයින් හා වැඩිහිටියන් සඳහා උපයෝගී කරගන්නා සාමාන්‍ය ධර්මෝපදේශ ක්‍රමයකි. ක්‍රිස්තුන් වහන්සේ ද විශාල පිරිසකට එතුමන්ගේ ධර්මය පහදා දීම සඳහා මෙම ක්‍රමය භාවිතා කළ ආකාරය ශු. ලියවිල්ලේ සඳහන් වේ. දේශන ක්‍රමය භාවිතා කරනවිට එයින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට පහත සඳහන් වන උපදෙස් ප්‍රයෝජනවත් වේ.

- දේශන ක්‍රමය භාවිතා කරන විට ගුරුවරයා ඒ පිළිබඳව මනා සූදානමක් ඇතිව සිටිය යුතු ය.
- දේශනයක් අවසානයේ දී සිසුන්ට ප්‍රශ්න ඇසීමට යම් යම් ගැටළු නිරාකරණය කරගැනීමට අවස්ථාවක් ලබා දිය යුතු ය.
- දේශනය පවත්වන වේලාවේ දී අතරින් පතර නිදසුන් ගෙනහැර දැක්වීම, යම් සුළු අත්දැකීමක් හෝ කථාවක් හෝ සිද්ධියක් ගෙනහැර දක්වා ඉදිරිපත් කරන කරුණු පැහැදිලි කර දීම ප්‍රයෝජනයත් ය.
- දේශනයේ යම් යම් අවස්ථා නිරූපණය කිරීම සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍යාධාර, විශේෂයෙන් ම කළුලෑල්ල භාවිතයට ගැනීම යෝග්‍ය වේ.
- දේශනයේ ඒකාකාරී ස්වභාවය නැති කිරීමටත්, සිසු අවධානය යොමු කර ගැනීමටත්, ඇතැම් අවස්ථාවලදී සංවාදාත්මක ලෙස කරුණු පහදා දීම ප්‍රයෝජනවත් වේ (ප්‍රශ්න ඇසීමට ඉඩ දීම).
- දේශනය තුළින් උගන්වන කරුණු හුදු ඇසීමට පමණක් සීමා නොකර පෞද්ගලිකව යම්යම් දේ සටහන් කරගැනීමට අවකාශ දිය යුතු ය.
- දේශනය අවසානයේ දී වැඩි අවබෝධය සඳහා තවත් කරුණු සොයා ගැනීමට අතිරේකව කියවීම සඳහා පොත් කිපයක් නම් කිරීම තුළින් සිසුන්ගේ දැනුම වැඩිකර දීමට පෙළඹීමක් කළ හැකි ය.
- දේශනයෙන් පසුව සිසු දැනුම තහවුරු කිරීම සඳහා උචිත ක්‍රියාකාරකම් සොයා බලා ඒ සඳහා ඔවුන් යොමු කළ යුතු ය.

**සම්මන්ත්‍රණ ක්‍රමය :**

අදාළ මාතෘකාවේ පැතිකඩ කිපයක් අළලා ප්‍රවීණ ගුරුවරුන් කිප දෙනෙකු විසින් දේශන හා සාකච්ඡා කිපයක් පැවැත්වීම සම්මන්ත්‍රණ ක්‍රමය ලෙස හැඳින්වේ. ක්‍රිස්තු ධර්මය යෞවනයින් හෝ වැඩිහිටියන්ට ඉගැන්වීමේ දී නිදසුනක් වශයෙන් එය මෙසේ පෙන්වා දිය හැකි ය. දේව ප්‍රසාද නිධාන පිළිබඳ සම්මන්ත්‍රණයක් යයි සිතමු.

මෙහිදී ප්‍රවීණ ගුරුවරුන් කිප දෙනෙකුට එක එක දේව ප්‍රසාද නිධානය තේමාව කරගෙන සාකච්ඡා හා දේශන කිපයක් සංවිධානය කරගත හැකි ය. මෙසේ දේව ප්‍රසාද නිධාන පිළිබඳව ඉතා වැදගත් කරුණු රාශියක් සිසුනට ලබා ගැනීමට හැකි වේ. සම්මන්ත්‍රණ ක්‍රමයේ වැදගත් ම ප්‍රයෝජනය වන්නේ කෙටි කාලයක් තුළ යම් විෂයයක් හෝ තේමාවක් ගැන කරුණු රැසක් ප්‍රවීණ ගුරුවරුන් කිපදෙනෙකු මගින් ලබා ගැනීම ය. විභාගයකට සූදානම් වීම සඳහා සම්මන්ත්‍රණ ක්‍රමය වඩාත් ප්‍රයෝජනවත් වේ.

**කණ්ඩායම් ක්‍රමය**

පංතියක් කණ්ඩායම් වශයෙන් බෙදා, එක එක කණ්ඩායමකට ක්‍රිස්තු ධර්මය පාඩමේ යම් අංශයක් කණ්ඩායම් වශයෙන් කරුණු සොයා ගෙන, දත්ත රැස්කර ගෙන ඉන්පසුව අධ්‍යයනය කර සටහන් කරගැනීම කණ්ඩායම් ක්‍රමයේ සැලැස්මයි. මෙහිදී ගුරුවරයා මාර්ගෝපදේශකයකු මෙන් ක්‍රියා කරයි. ඔහුගේ කාර්යය වන්නේ ඉගැන්වීම නොව, දැනුම සොයා ගැනීමට සිසුන් යොමු කිරීම ය. ඒ සඳහා මූලාශ්‍ර පොත් නම් කිරීම, ආශ්‍රිත ග්‍රන්ථ සොයා ගැනීමට උදව්වීම. කියවිය යුතු පොත්වල පරිච්ඡේද සොයා දීම යනාදිය ගුරුවරයාගෙන් අපේක්ෂා කරන මාර්ගෝපදේශකත්වය වේ.

අධ්‍යයන කටයුතු කරගෙන යන ආකාරය සහ එහි ප්‍රගතිය ගුරුවරයා විටින් විට විමසා බැලිය යුතු ය. යම් කණ්ඩායමක ඉගෙනීමේ කටයුතු නිසියාකාරව නොකෙරෙන්නේ නම්, එහි නායකත්වය වෙනස් කර අවශ්‍ය උපදෙස් දිය යුතු ය. කණ්ඩායම් ක්‍රමයක් තුළින් අපේක්ෂා කරන්නේ සාමූහික ලෙස ඉගෙනීමට

සිසුන් පෙළඹවීම ය. කණ්ඩායම් වශයෙන් එකතු වී ක්‍රියා කිරීමට යෞවන ශිෂ්‍යයන් වඩාත් කැමති නිසා කණ්ඩායම් ක්‍රමය ඔවුන්ට උචිත යෞවන ක්‍රම වේදයක් ලෙස පිළිගැනේ.

අවසානයේ දී සිසුන් රුස්කර ගත් කරුණු ගොනු කිරීමේ දී කණ්ඩායමේ සියලු දෙනා ම දායකවීම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා කණ්ඩායම එකතු වී සාකච්ඡා කිරීම, සොයා ගත් කරුණු නිවැරදිව ගළපා ඉදිරිපත් කිරීම, අවබෝධ නොවූ කරුණු ගුරුවරයා වෙත ඉදිරිපත් කර පැහැදිලි කරගැනීම මේ ක්‍රමය සාර්ථක වීමට දායක වේ.

### නිගමනය


යෞවනයින්ට ධර්මය ඉගැන්වීමේ දී, ප්‍රාථමික වසරවල භාවිතා කරන ධර්මෝපදේශ ක්‍රමවලට වඩා යෞවන ධර්මෝපදේශ ක්‍රම වේද භාවිතා කිරීම යෝග්‍ය වේ. තව ද පාඩම තුළ සිසුන් සමග සංවාදයකට පිවිසි ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමටත්, අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමටත්, ගුරුවරයා නිතරම ඉඩ දිය යුතු ය.

ආගමික සත්‍යතාවයන් ජීවිතයට සම්බන්ධ කර, එම සත්‍යතාවයන් අනුව ජීවත්විය යුතු ආකාරය යෞවනයින් තුළ තහවුරු කිරීම ඉතා වැදගත් වේ.

## 5.2. දහම් පාඩමක් සැලසුම් කිරීම

කුමන වසරකට (පන්තියකට) හෝ නියමිත ක්‍රිස්තු ධර්මය විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනෙන අවසාන පියවර වන්නේ පාඩමක් සැලසුම් කිරීම ය. ඉගැන්වීම් ක්‍රියාවලියේ අවසන් සූදානම ද එයයි. ඉතා ම මැනවින් මේ සූදානම ඇතිව පන්තියට පිවිසෙන දහම් ගුරුවරයා ඇත්ත වශයෙන් ම දේව වචනයේ සැබෑ සාක්ෂිකරුවකු වන්නේ ය.

මෙම පාඩම් සැලසුම ගුරුවරයාගේ අත්දැකීම් ද, විෂය නිර්දේශය ද, පෙළ පොත් සහ වෙනත් විෂය මාලා ද්‍රව්‍යයන්ගේ සංකලනයක් ද විය යුතු ය. එය පහත දැක්වෙන සටහන තුළින් තේරුම් ගත හැකි ය.




දහම් පාඩමක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු තවත් කරුණු කීපයක් ඇත.

1. සිසුන්ගේ වයස් සීමාව
2. විෂය කරුණු
3. අරමුණු
4. ඉගැන්වීමේ ක්‍රමය
5. ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාර
6. ක්‍රියාකාරකම්
7. ඇගයීම

### 1. සිසුන්ගේ වයස් සීමාව

මේ මිහිපිට එක හා සමාන මනුෂ්‍යයන් දෙදෙනෙක් නැත. එකම වයස් සීමාවේ වුවද දරුවන්ගේ කායික, මානසික සහ බුද්ධිමය තත්ත්වයන් වෙනස් ය. සෑම පුද්ගලයෙක්ම සුවිශේෂ අනන්‍යතාවක් ඇත්තෙකි. පාඩමක් සැලසුම් කරණයේ දී මේ ගැන සැලකිලිමත් වීම අවශ්‍යයි. ගුරුවරයාට සිසුන්ගේ අවධානය

ලබාගෙන ඔවුන් තුළ ප්‍රබෝධනයක් ඇති කිරීමට හැකි නම් පාඩම වඩාත් සාර්ථක වේ. එසේ නැති තැන ගුරුවරයා කලකිරී පසුබැමකට ද ලක්විය හැකි ය. මේ සමගම ළමුන්ගේ ආගමික පදනම ද, ජීවත්වන පරිසරය ද එකිනෙකාගේ කුසලතාවන් ද පිළිබඳව පූර්ව අවබෝධයක් ලබාගැනීම ප්‍රයෝජනවත් ය.

## 2. විෂය කරුණු

විෂය නිර්දේශය අනුව සකස් කර ඇති පෙළ පොතේ එක් එක් පාඩමට අදාළ විෂය කරුණු මොනවාදැයි කල්වේලා ඇතිව සොයා බැලිය යුතු ය. අදාළ විෂය කරුණු පිළිබඳව පෙළ පොත (පන්ති පොත) ට අමතරව අතිරේක පොත පත සහ ගුරු අත්පොත ද ඔබට බෙහෙවින්ම ඵලදායක වනු ඇත. විෂය කරුණු තිරණය කිරීමට පමණක් නොව, පාඩම සංවර්ධනය කළ යුතු ආකාරය පිළිබඳව ද විධිමත්ව සකස් කළ ගුරු අත්පොත බෙහෙවින් උපකාරී වේ.

## 3. අරමුණ

අරමුණු (අපේක්ෂණ) දෙවර්ගයකි. එනම්,

- පොදු අරමුණු
- සුවිශේෂ අරමුණු ය.

### පොදු අරමුණු

- මුළු විෂය නිර්දේශයට අදාළ පොදු අරමුණු ඇත.
- එක් එක් ඒකකයට අදාළ පොදු අරමුණු ඇත.

### සුවිශේෂ අරමුණු

එක් එක් පාඩම මගින් දරුවන් තුළ ඇති වියයුතු සාධනය සුවිශේෂ අරමුණුවලින් තේරුම් ගත හැකි ය.

මේ අරමුණු, පාඩම ඉගැන්වීමේ දී ඉටු කළ යුතු ත්‍රිවිධ පරමාර්ථයන් අනුව නැවතත් කොටස් තුනකට වෙන්කර ගත හැකි ය. එනම්,

1. ප්‍රජානන (දැනීම)
2. ආවේදනික (ආකල්ප)
3. මනෝචාලක (කුසලතා)

### ප්‍රජානන (දැනීම)

යනු අධ්‍යාපන ක්‍රියාවලියේ අවම වටිනාකම ය. (බිංදුව ය). එනම් අධ්‍යාපන කාර්යය සාධනයේ පටන් ගැනීම ය. දැනීම වඩාත් උසස් මට්ටමකට සංවර්ධනය කළ යුතු ය.

- වෙනත් ආකාරයකට කිවහොත් දැනීම යනු ශිෂ්‍යයන්ගේ මතක තබා ගැනීමේ හැකියාව ය. දින, වකවානු, නම්, ගම්, නිර්වචන වැනි සුවිශේෂ කරුණු සිහි නගා ගැනීමේ හැකියාව ය.
- දැනීම සංවර්ධනය කිරීමේ දෙවන පියවර **අවබෝධය ය.** අවබෝධය යනු කිසියම් තොරතුරක් අර්ථකථනය කිරීමේ, තේරුම් ගැනීමේ සහ පැහැදිලි කිරීමේ හැකියාව ය.
- තෙවන පියවර **භාවිතයයි.** එනම්, උගත් මූල ධර්ම වෙනත් සමාන අවස්ථාවකට යොදා ගැනීමේ හැකියාව ය.
- සිව්වැනි පියවර **විශ්ලේෂණයයි.** ගැටළුවකට අදාළ හේතු විග්‍රහ කිරීමේ හැකියාවත්, කිසියම් සමස්තයක් කොටස්වලට කඩා දැක්වීමේ හැකියාවත් මෙයින් අදහස් කෙරේ.
- පස්වැන්න සංස්ලේෂණයයි. මෙයින් අදහස් කරන්නේ ගැටළුවලට විසඳීම් ඉදිරිපත් කිරීමේ හැකියාව ය. අලුත් යෝජනා, සැලසුම් විසඳුම් ඉදිරිපත් කිරීමේ හැකියාව ද මීට අයත් ය.
- අවසාන වශයෙන් **ඇගයීම** අයත් වෙයි. එනම්, කරුණු සංසන්දනය, විවේචනය සහ ගුණ දොස් දැක්වීමේ හැකියාව මෙයින් අදහස් කෙරේ.

### ආවේදනික (ආකල්ප):

ශිෂ්‍යයාගේ හැසිරීම් රටාව තුළ ගුණාත්මක වෙනසක් ඇති කරන නව නැඹුරුවකි. දැහැමි බව වෙත දරුවා නැඹුරු කිරීමකි. ආකල්ප යොමු වන්නේ හදවතට ය. එය එක්තරා මානසික නැඹුරුවකි.

**මනෝචාලක (කුසලතා):**

ආකල්ප (ආවේදනය) මගින් ශිෂ්‍යයාගේ හදවතට යොමු කළ කරුණු (අතත්, හිතත්, මPSන්) ක්‍රියාකාරකම්වලට හරවා කිතුනු හැසිරීම් රටාව තුළ නව චර්යාවන් දියත් කිරීම ය.

## 4. ඉගැන්වීමේ ක්‍රම

අවස්ථාවලට සුදුසු, ළමුන්ට වඩාත් ගැළපෙන, වඩාත් සාර්ථක, වඩාත් උචිත ක්‍රමය කුමක්දැයි ගුරුවරයා විසින් ම තෝරා බේරා ගත යුතු ය. ගතානුගතික සම්ප්‍රදායික ක්‍රමවලට සීමාවීම අවශ්‍ය නැත. කුමන ක්‍රමයක් අනුගමනය කළ ද පාඩමේ මූලික හරය එහි ඇතුළත් විය යුතු ය. (ප්‍රජානන, ආවේදනික, මනෝචාලක). මෙකල අධ්‍යාපන ක්ෂේත්‍රයේ මානව කේන්ද්‍රීය ක්‍රමය පිළිබඳව ප්‍රවණතාවක් ඇත. එය පියවර හතරක ක්‍රියාවලියකි.

### මානව අත්දැකීම

එදිනෙදා ජීවිතයේ සිදුවීමක්, බයිබල් කථාවක්, ජන ගීයක්, චිත්‍රපටයක සිද්ධියක්, පුවත්පත් වාර්තාවක් වැනි කුමන ආකාරයේ හෝ මානව අත්දැකීමක් (පාඩමට නොකඩවා සම්බන්ධ කර පෙන්විය හැකි අත්දැකීමක්) විය හැකි ය. එමගින් පාඩමට යහපත් ප්‍රවේශයක් ලැබේ.

### සංවාදය

අත්දැකීම් විග්‍රහ කිරීමේ අවස්ථාව ය. පන්තියේ සිසුන් සැමදෙනාම පාහේ තම අත්දැකීම් විග්‍රහ කරන සංවාදයට එක්කර ගත හැකිවීම ඵලදායක ය. මෙහිදී මානව වටිනාකම් තුළින් දේව රාජ්‍යයේ වටිනාකම්වලට පිවිසීමේ අවස්ථා උදාකර ගත හැකි ය.

### සුබාරංචිය හා සම්බන්ධ කිරීම

අවස්ථාවට උචිත සුබාරංචි පණිවිඩයක් තෝරාගෙන එහි දහම් හරය පැහැදිලි කර, ඉදිරිපත් කරමින්, දේව සලකුණු දෙස අවධානය යොමුකර, දේව සබඳතා වර්ධනය කළ යුතු ය.

### ප්‍රතිචාරය

සිසුන් ලබාගත් දැනුම හා යොමුව අනුව ඔවුන්ගේ ප්‍රතිචාරය ප්‍රකාශ වන අවස්ථා උදා කළ යුතු ය. මෙයින් අදහස් වන්නේ සිසුන් උගත් දේ ජීවිත චර්යාවන් බවට පරිවර්තනය කිරීමට යොමු කිරීම ය.

### ඔබේ අවධානය සඳහා

ජේසුස් වහන්සේගේ ඉතා ම සුප්‍රසිද්ධ ඉගැන්වීම කන්ද උඩ දේශනාව ය. එම දේශනාව සදාතනික අගයක් ඇතිව මානව හදවත් තුළ මුල්බැස ගැනීමට හැකි තරමට එම පාඩම ඉගැන්වූ ක්‍රමය ප්‍රබලවත් විය. ඒ ක්‍රමය මෙසේ විග්‍රහ කළ හැකි ය.

- බුද්ධි කලම්බනය (පොදු සම්මතයට පටහැනි අදහසක් ඉදිරිපත් කිරීම)
- සංවාදය (අදහස් ප්‍රකාශ කිරීම)
- මෙනෙහි කිරීම (මුලින් ඉදිරිපත් කළ අදහසට අදාළ ගැඹුරු චින්තනයකට මග පෙන්වීම).
- ප්‍රතිචාරය (හිස්වීම).
- පණිවිඩය (නව ජීවනයකට මග පෙන්වීමේ දහම් හරය).

## 5. ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාර

ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාර අවශ්‍ය වන්නේ, ඒ මඩිsන් යම් යම් අත්දැකීම්, ඉන්ද්‍රිය ගෝචරකර තහවුරු කිරීමටත්, පාඩම් ඒකාකාරී බව නැතිකර ගැනීමටත්, අවධානය යොමුකර ගැනීමටත් ය. එසේ ම ව්‍යක්ත ආගමික සංකල්ප සංයුක්තකර ඉදිරිපත් කිරීමට ය. වඩාත් ආස්වාදනීය ආකාරයකින් පාඩම ඉදිරිපත් කිරීමට ද එය ප්‍රයෝජනවත් ය. කළුලෑල්ල, සිතියම්, චිත්‍ර, සේයා, රූ, චාට්, කැසට්පට, සංයුක්ත තැටි, පෝස්ටර්, නිසල රූ ආදිය ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාර වශයෙන් ගත හැකි ය. (තවත් බොහෝ දේ ඇත).

## 6. ක්‍රියාකාරකම්

පාඩම මගින් ඉදිරිපත් කළ විෂය කරුණු මගින් ලබා ගත් දැනුම ජීවිතයට සම්බන්ධ කර ගැනීමට අවස්ථාවක් තිබිය යුතුය. එය නව අත්දැකීමක් විය හැකි ය. ඒ නිසා පාඩමක් සැලසුම් කිරීමේ දී ක්‍රියාකාරීත්වයන් ගැන විශේෂයෙන් සලකා බැලිය යුතු ය. එය ලිඛිත පරීක්ෂණයක් විය හැකි ය. කණ්ඩායම් වැඩක් විය හැකි ය.

## 7. ඇගයීම

පාඩමට ඇතුළත් වූ සුවිශේෂ අරමුණු ඉටු වී ඇත්දැයි පරීක්ෂා කිරීම ය. මෙය ගුරු සිසු දෙකොටසට ම වැඩදායක ය.

## පාඩම් සැලසුම් රටා කීපයක්

සැලසුම් රටා 1.

| | | |
|---|---|---|
| දිනය | අභිමතාර්ථ - | ප්‍රජානන |
| කාලය | | ආවේදන |
| විෂය | | මනෝචාලක |
| ඒකකය | ඉගෙනුම ආධාරක | |
| පාඩම | පාඩම සංවර්ධනය කිරීම | |

| ගුරු වැඩ | සිසු වැඩ |
|---|---|
| 1. ........................................ | .......................................... .. |
| 2. ........................................ | .......................................... .. |
| 3. ........................................ | .......................................... .. |
| 4. ........................................ | .......................................... .. |

තහවුරු කිරීම සහ ක්‍රියාකාරීත්වය.

ඇගයීම.

### සැලසුම් රටා 2.

i. විෂය කරුණු :-තේමාව
ඒකකය
පාඩම

ii. අභිමතාර්ථ:- ප්‍රජානන
ආවේදනික
මනෝචාලක

iii. ඇසිදිසි රුකුල්

iv. පිවිසීම

v. පාඩම සංවර්ධනය කිරීම : - පියවර 1
පියවර 2 ආදී වශයෙන්

vi. තහවුරු කිරීම.

vii. ඇගයීම (අභිමතාර්ථ කොතෙක් දුරට ඉටුවී දැයි විමසීම).

## E - 5 ක්‍රියාකාරකම් සැලසුම් කිරීම

අධ්‍යාපන ක්‍රමවේදය නිතර අලුත් වෙයි. වෙනස් වෙයි. එසේ වනුයේ අධ්‍යාපනය ජීවමාන ක්‍රියාකාරිත්වයක් වන හෙයිනි. ඵලදායකවන ප්‍රායෝගිකවන ක්‍රමවේදය වෙනස් වෙමින් ඉදිරියට යාම යහපති. මෙරට කතෝලික ධර්මෝපදේශය සඳහා බොහෝ දහම් පාසල්වල භාවිතා කරනුයේ රජයේ පාසල්වල කතෝලික ධර්මය උගැන්වීම සඳහා යොදුගනු ලබන පොත්පත්ය. ඒවා (E - 5) ක්‍රමයට පහසුවන ලෙස සකස් කර තිබීම වැදගත් ය.

(E - 5) යනු කුමක් ද?

Enagement නියුක්තිකරනය

Exploration ගවේෂණය

Explanation විවරණය

Elaboration විස්තාරණය

Evaluation ඇගයීම

**ඉගෙනුම්** - ඉගැන්වීම් ක්‍රම වේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කරගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකිවන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සුදානම් වීමේදී ගුරු භූමිකාවේ ද පැහැදිලි සහභාගිත්වයක් අපේක්ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුලව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව ( Transmission Role) හා පසුකාලිනව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (Transaction Role) වර්තමාන පන්තිකාමර තුළ තවමත් කැපී පෙනේ. අධ්‍යාපනය හදාරා සමාජයට පිවිසෙන දරු දැරියන්ගේ චින්තන කුසලතා හා සමාජ කුසලතාවල ගුණාත්මක වර්ධනය සඳහා ක්‍රමවේද සංවර්ධනය විය යුතු බව පිළිගත යුතු කරුණකි.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණ කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමාවන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරිමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමග ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතරව සිසු-සිසු අන්තර් ක්‍රියා ද පසුව ඇතිවීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකුගේ (Resource Person) තත්ත්වයට ගුරුවරයා පත්වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරික්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම් හා

ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාර්ය ඇසුරුකොට ගත් ගුරු භූමිකාව පරිණාමක භූමිකාව (Transformation Role ) ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාලාවේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රියාකාරකමක් ම අඩු කරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම් තුළ පළමු පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධකර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධකර ගැනීමේ පියවර (Engagement Step) වශයෙන් නම්කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග දෙබසකට මුල පුරයි. පසුව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් විසින් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ කර, පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනිමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතුව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම / පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණපත් (Flash Cards) වැනි උත්තේජක යොදා ගැනීම/ ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය /දෙබස, භූමිකා රංගන, කවි, ගීත, ආදර්ශන ( Demonstrations) සෘජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ක්‍රියාකාරකම්වල පළමු පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම.
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුනට අවස්ථාව ලබා දීම.
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරිමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දිම.

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණ (Exploration) සඳහා සිසුනට අවස්ථාව ලබා දීමට ය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කර ගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදිමට සිසුනට හැකිවන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදුවේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සවිමත් බවෙන් යුතුව කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන් දීම, අන්‍යයන් සමග සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදව් වීම, කාල කළමනාකරණය, ගුණාත්මකබවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනිම, අවංකබව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනයකර ගැනිමට ද සිසුනට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දි ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකි සිටිය යුතු අතර සිසුන් නායකයන් මතුවිමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සුදානම් කළ යුතුය. සැඟවුණු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමි වේ.

ක්‍රියාකාරකම් තෙවන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරිම් සඳහා සිසුන් දිරිමත් කිරිමයි. සෑම සාමාජිකයෙකුටම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරිම් සැලසුම් කිරිමට සිසුන් මෙහෙයවීම ද වැඩදායක ය. සිසු අනාවරණ පැහැදිලි කිරීම (Explanation) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්ති කාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතුවීමට අවස්ථා සම්පාදනය වී තිබිම ය.

ක්‍රියාකාරකම් තෙවන පියවරේ දී සොයා ගැනීම වැඩි දියුණු කිරිමට නැත්නම් විස්තරාත්මකව ( Elaboration ) සිසුන් යොමු කිරිම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරිම් අවසන්

කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරිමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබා දීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය බාර වන්නේ ගුරුවරයාට ය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වනසේත්, සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරදි අවබෝධය සිසුන් තුළ තහවුරු වනසේත් මෙම සමාලෝචනය සිදු කිරිම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථකව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලිම මෙම ක්‍රමවේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුව හා ඇගයිම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දිම ලබා ගැනීමට සැලසුම් ගත ක්‍රියාකාරකම් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ දෙවන පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් (Assessment ) ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරිම් හා විස්තරණයට යොමු වනවිට ඇගයීමටත් (Evaluation) ගුරුවරයාට ඉඩ තිබේ. තක්සේරුව හා ඇගයීම පිළිබඳ විස්තරාත්මක විමසුමක් 3 කොටසට ඇතුළත් කොට ඇත.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමක භූමිකාව ක්‍රියාත්මක කිරිම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර, ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුව, සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරිමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ඉදිරිපත්වන මෙම විෂයමාලාව සම්බන්ධව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතරව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම විශේෂත්වය ලෙස සඳහන් කළ හැකිවේ.

### 5.3. ආගම පාඩමට අදාළ වෙනත් විෂයමාලා ද්‍රව්‍යඃ

ගුරු අත්පොත්, විෂය ට අදාළ බාහිර පොත්පත්, සඟරා, අධ්‍යයන කව, වෙනත් ප්‍රවීණ ගුරුවරු, ගුවන් විදුලි වැඩසටහන්, වීඩියෝ පට, සංයුක්ත තැටි, නිසල රූ, විනිවිදක (ඔබගේ ප්‍රදේශයට අදාළ තවත් රුසක් මීට ඇතුළත් කරගත හැකි ය.)
සැම පාඩමක් ම ආරම්භක යාච්ඤාවක් තිබිය යුතු ය.
එය ගුරුවරයා විසින් කළ යුතු ය.
අවසාන යාච්ඤාව ශිෂ්‍යයකු විසින් කළ යුතු ය .

## ධර්මෝපදේශය හා ශ්‍රව්‍ය දෘෂ්‍යාධාර

අධ්‍යාපනයෙහි ලා, වැදගත් වන ශ්‍රව්‍ය දෘෂ්‍යාධාර අංශයට, කළුලෑල්ල, ගුරුවරයා, චිත්‍ර, චාට් සටහන්, පෝස්ටර්, සිතියම්, දේව මෙහෙයන්, අර්ථවත් පිළිවෙත්, නාට්‍ය, ගීත, ගුවන් විදුලිය, කැසට් පට, චිත්‍රපට, රූපවාහිනී වැඩසටහන්, සංයුක්ත තැටි, පත්‍ර සඟරා, පොත්පත්, නිසල රූ යනාදිය ඇතුළත් වෙයි.

එසේ වුව ද, ප්‍රායෝගිකව බලන කල අද වඩාත් ක්‍රියාකාරී වනුයේ, ගුරුවරයා ම, ඔහු තම ආර්ථික තත්ත්වය අනුව, ප්‍රයෝජනයට ගන්නේ කළුලෑල්ලක්, චිත්‍ර, සිතියම් යනාදියත් පමණි. සෙසු දෑ සඳහා අධික වියදමක් දැරිය යුතුවෙයි. භාවිතා කෙරෙන ශ්‍රව්‍ය දෘෂ්‍යාධාර ගැන මෙහි විමසමු.

- **කළුලෑල්ල**
  - කළුලෑල්ල නිතර කළු කිරීම අවශ්‍ය වෙයි.
  - එහි දක්වන චිත්‍ර රූප හා අකුරු විශාල වීම ද වැදගත් වෙයි.
  - විවිධ වර්ණ හුණු කැලි භාවිතා කිරීමේ දී දැසට පැහැදිලිව පෙනෙන පාට තෝරා ගැනීම වටී.

- **චිත්‍ර, පෝස්ටර් යනාදිය**
  - ලා පාටින් යුත් පසුබිමක, දම්පාට, කොළපාට, නිල්පාට වැනි වර්ණවලින් රූප හා අකුරු දක්වීම මැනවි.

- සුදු පසුබිමක කළු පාටින් දක්වෙන චිත්‍ර රූප සහ අකුරු ඇස වෙහෙස කරයි.
- රූප හා අකුරු විශාල වීම වැදගත් වෙයි.
- පණිවිඩය සඳහා වැදගත් වන දෙය චිත්‍රයේ හෝ පෝස්ටරයේ වම් පසින් දැක්වීම උචිත ය.
- සිතියම් භාවිතයේ දී, සිසුන් සිතියම් වටා රුස්කර ගැනීම යෝග්‍ය වෙයි. හැකිනම් එක් එක් සිසුවාට සිතියමක් දීම ඉතා වැදගත් වෙයි.
- සමූහ සාකච්ඡාවලදී එක් එක්කෙනාට චිත්‍රයක්, ඡායාරූපයක්, සිතියමක් දීම යහපත්ය.
- චිත්‍ර, ඡායාරූප, පෝස්ටර් යනාදිය මගින් ශීල ධර්මය, ආගම ධර්මය, සමාජ ධර්මය වැනි දෑ දැක්විය හැකි ය. එම නිසා පාඩමට අදාළ ලෙස ඒවා යොදා ගැනීම කළ යුතුය.

## 5.4 අ.පො.ස. (උසස් පෙළ) නව විෂය නිර්දේශය

(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

❖ ශුද්ධ ලියවිල්ල බිහිවීමට පාදක වූ භූගෝලීය හා ඓතිහාසික පසුබිම
❖ පංච පුස්තකයේ ප්‍රාග් ඓතිහාසික කරුණු
❖ නික්මයාමේ සිද්ධිය
❖ දිවැසිවරුන්ගේ කැඳවීම හා මූලික ඉගැන්වීම්
❖ සුබාරංචි අධ්‍යයනය
 - සමදර්ශක සුබාරංචි
 - ජොහන් සුබ අස්න පිළිබඳ විශේෂ අධ්‍යනය
❖ පාස්කු අභිරහස
❖ ශු. සභා ඉතිහාසය
 - සභා පිය යුගය - නූතන යුගය දක්වා
❖ ලංකා සභා ඉතිහාසය
 - පෘතුගීසි යුගයේ සිට නිදහස් යුගය දක්වා
❖ කිතුනු ජනවන්දනාව
❖ සමාජ සංවර්ධනය තුළ මානව සහජීවනය

## 5.5 නව විශ්වීය ධර්මෝපදේශ ග්‍රන්ථය පිළිබඳ පොදු හැඳින්වීම.

### 5.5.1. ධර්මෝපදේශය පිළිබඳ යටගියාව

කතෝලික ආගම වැළඳ ගැනීමට සූදානම් වූ අයගේ පහසුව සඳහා 4-6 වන සියවසේ කාලයේ දී, විශ්වාස ලක්ෂණය, සක්‍රමේන්තු හත (ප්‍රසාද නිධාන) දස පණත සහ යාච්ඤාව පිළිබඳ විස්තර ඇතුළත් පොත් සකස් කරන ලදී. පළමුව දේශන වශයෙන් පවත්වන ලද මේ ඉගැන්වීම් පසුව ග්‍රන්ථාරූඪ කෙරිණ.

උදා: ඇම්බ්‍රෝස් තුමා **(399)** - ජෙරුසලෙමේ ශු. සිරිල් තුමා **(315-387)**
ශු. අගුස්තීනු තුමා **(357-430)** - ශු. ජෝන් ක්‍රිසොස්තම් තුමා **(349-407)**

ධර්මෝපදේශයේ ස්වර්ණමය යුගය වශයෙන් මෙම යුගය සැළකෙන අතර, මෙම ලේඛකයන් දැමූ පදනම මත ඊට පසු යුගවල දී සහ විවිධ යුගවල දී නොයෙකුත් පුද්ගලයන් විසින් ධර්මෝපදේශ සකස් කරන ලදී.

### ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව නොහොත් රෝමානු ධර්මෝපදේශය (1566)

රෙප්‍රමාදු විප්ලවය පසුබිම් කරගෙන ට්‍රෙන්ට් හි පවත්වන ලද මන්ත්‍රණ සභාවේ **(1545 - 1563)** දර්ශනය සහ ඉගැන්වීම් ජනතාව අතරට ගෙනයැම සඳහා ධර්මෝපදේශ පොතක් ශු. චාර්ල්ස් බොරෝමියෝ තුමන්ගේ ප්‍රධානත්වයෙන් සකස් කරන ලදුව **1566** දී **VI** වන පියුස් පාප්තුමන් විසින් ප්‍රකාශයට පත්

කරන ලදී. ධර්මෝපදේශ ජනප්‍රිය කිරීමෙහි ලා රෙප්‍රමාදු ප්‍රතිසංස්කරණයේ පුරෝගාමියා වූ මාටින් ලූතර් විශේෂ ස්ථානයක් හිමිකර ගනියි.

ඔහුගේ අදහස් ප්‍රචාරය කිරීම සඳහා කුඩා ධර්මෝපදේශයක් ද (ළමුන් සඳහා), වැඩිහිටියන් සඳහා වෙන ම ධර්මෝපදේශයක් ද (1529) සකස් කළේ ය. මෙම පොත් ඔහුගේ මව්බස වන ජර්මන් බසින් (කුඩා ධර්මෝපදේශය) ප්‍රශ්න උත්තර සරල ක්‍රමයට සකස් කර තිබූ බැවින් ඉමහත් ප්‍රචාරයක් ලැබිණ. මෙයට පිළිතුරු වශයෙන් ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් ඇතුළත් සුප්‍රකට ධර්මෝපදේශනයකු වූ මිලාන්හි රදගුරු තැන්පත් චාර්ල්ස් බොරෝමියෝ තුමාගේ ප්‍රධානත්වයෙන් ලතින් බසින් රචනය කරන ලද රෝමානු ධර්මෝපදේශය අරමුණු කර තිබුණේ පූජකතුමන්ලා ය. මෙම උල්පතින් උරා බී ජනතාවගේ දහම් පිපාසය සංසිඳුවීම එතුමන්ලාට පැවරුණු කාර්යය විය. තව ද, මෙම රෝමානු ධර්මෝපදේශය පදනම් කරගෙන යුරෝපයේ රටවල් කිහිපයක මව් බසින් ජාතික ධර්මෝපදේශ සකස් විණි. සාන්ත රොබට් බෙලර්මින් තුමන් විසින් (1597-98) ඉතාලි බසින් රචනය කරන ලද ධර්මෝපදේශය විශේෂ ප්‍රසිද්ධියක් ගත් අතර, ධම්දූත රටවල භාවිතය සඳහා රෝමයේ සත්‍ය විශ්වාසය පතල කිරීමේ නියෝජනය විසින් නියම කරන ලදී. තවද, ශ්‍රී ලංකාවට පෘතුගීසි මිෂනාරීන් සහ ගෝවෙන් පැමිණි ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමන් විසින් හඳුන්වා දෙන ලද්දේ ද මෙම ධර්මෝපදේශ පොතයි.

18-19 සියවස්වල දී හටගත් කර්මාන්ත විප්ලවය, ප්‍රංශ විප්ලවය හා භෞතික වාදය හා අදේව වාදය පැතිරීයාම හේතුවෙන්, ආගමික ජීවිතය හා විශ්වාසය පිරිහීමට පටන් ගත් අවස්ථාවේ දී, ඒවායින් පැන නැගුණු ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන කාලානුරූපී ධර්මෝපදේශක අවශ්‍යතාව සභාවට දැනුනෙන් රෝමානු ධර්මෝපදේශයට සමාන නව ධර්මෝපදේශයක් පිළියෙල කිරීමට පළමුවන වතිකාන මන්ත්‍රණ සභාව (1870) අදහස් කළ නමුත්, ප්‍රංශ ජර්මන් යුද්ධයක් හදිසියේ ආරම්භ වූ බැවින් ඒ මන්ත්‍රණ සභාව එය ක්‍රියාත්මක කිරීමට පෙර නිම විය. එයත් සමඟ එම අදහස් ද ඇණහිටි ය.

එහෙත් 1870-1950 යන කාල සීමාවේ දී ධර්මෝපදේශයේ පණිවිඩය හා එය ඉදිරිපත් කරන ක්‍රම පිළිබඳ ගැඹුරු පර්යේෂණ යුරෝපයේ, විශේෂයෙන් ජර්මනිය, බෙල්ජියම, ප්‍රංශය සහ ඔිස්ට්‍රියාව යන රටවල පවත්වන ලදී. විවිධ මධ්‍යස්ථානවල දී පවත්වන ලද ගවේෂණ ඇසුරින් පොත්පත් රැසක් ප්‍රකාශයට පත් කළ අතර, ජර්මනිය, නෙදර්ලන්තය හා ඇමරිකාව යනාදී රටවල නව ධර්මෝපදේශ පොත් සකස් කිරීම ඇරඹිණි.

1962-65 පවත්වන ලද දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මෙම ඉගැන්වීම් ඇතුළත් ලේඛන 16ක් අඩංගු කරමින් දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශන යනුවෙන් ප්‍රකාශය කරන ලදී. VI වැනි පාවුළු පාප්තුමා නිතර පැවසූ අන්දමට නූතන යුගයේ සුවිශේෂ ධර්මෝපදේශය දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශනයයි. එහෙත් මෙම ප්‍රකාශන තුළ තිබූ ගැඹුරු දේව ධාර්මික ඉගැන්වීම් සාමාන්‍ය සැදැහැවතුනට තේරුම් ගැනීමට අපහසු බැවින්, එම අදහස ඉෂ්ට නොවී ය. තවද, මෙම මන්ත්‍රණ සභාව හේතුවෙන් සභාව තුළ ඇතිවූ නිදහස් වාතාවරණය අනුව ඇතැම් දහම්ධරයෝ සභාවේ ඉගැන්වීම් සහා සම්ප්‍රදායනට පටහැනිවන සේ, විවිධාකාර ලෙස ඒවා අර්ථකථනය කරමින් පොත්පත් ලියන්නටත්, සඟරා මගින් ඒවාට ප්‍රසිද්ධියක් දෙන්නටත් පටන් ගත් හ. සහා නිල රදගුරු බලය ද නොතකා මෙසේ කිරීමෙන් ධර්මය පිළිබඳ ව්‍යාකූල තත්ත්වයන් හට ගති. කිතුනුවන්ගේ සම්ප්‍රදායයික විශ්වාසයට මෙය බලවත් අභියෝගයක් වූ අතර පැකිළීමට ද හේතුවක් විය. තව ද, එක අතකින් අදේවවාදය, භෞතිකවාදය, හේතුවාදය, අන්ත මානව වාදයේ විෂ බීජ ඇතුළත් වී ආගම දුබල වීමට මග පෑදූ අතර, වෙනත් අතකින් ආගම, දේශපාලනය හා සමාජ යුක්තිය හා සාධාරණත්වය වැනි ප්‍රශ්නවලට ඍජු ලෙස ඇඳා ගැනීමෙන් ආගම විප්ලවකාරී ස්වරූපයක් ගෙන ජනතාව භේදබින්න කරමින් මහා විනාශයක් ඇතිකිරීමට ද හේතු විය. (ලතින් ඇමරිකාව).

### 5.5.2 කතෝලික සභා ධර්මෝපදේශයේ උපත

ඉහත සඳහන් ව්‍යාකූල තත්ත්වය ඉදිරියේ තැතිගත් සහා ශ්‍රේෂ්ඨයෝ ඉතා ඕනැකමින්, මග පෙන්වීම පතා ශුද්ධාසනය දෙසට හැරෙන්නට වූහ. මේ හේතුවෙන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාව නිම වී 20 වසරකට පසු, එම මන්ත්‍රණ සභා ඉගැන්වීම් ක්‍රියාත්මක වීම ගැන ඇගයීමක් සඳහා, සැම රාජගුරු මණ්ඩලයක ම සභාපතිවරුන් ඇතුළත් විශේෂ රාජගුරු සිනඩ් සභාවක් 1985 දී දෙවන ජුවාම් පාවුළු පාප්තුමන් විසින් රෝමයේ කැඳවන ලදී. මුළු ලොව පුරා පවත්නා ආගමික ප්‍රවණතාව සුපරීක්ෂාකාරී ලෙස විමසා බලා, එම

සිනඩ් සභාව "ධර්මය හා සදාචාරය පිළිබඳ ශු.බයිබලය හා ජනවන්දනාව පදනම් කරගත් සහා සම්ප්‍රදායට අනුකූලව සභාවේ ඉගැන්වීම්වලට මිණුම් දණ්ඩක් ලෙස යොදා ගතහැකි, නව පොදු ධර්මෝපදේශයක් සකස් කරන ලෙස" ඒකමතිකව සසුණිසුරාණන්ගෙන් අයැදුම් කළ හ.

මෙම ආයාචනයට පිළිතුරු ලෙස අප්‍රමාදව ක්‍රියා කරමින් දෙවන ජුවාම් පාවුළු පාප්තුමෝ මෙම මහඟු කාර්යය සඳහා කාර්දිනල්වරුන් සහ රදගුරුවරුන් 12න් යුක්ත මධ්‍යම කොමිසමක් පත්කර, එහි සභාපති වශයෙන් විශ්වාසය හා ධර්මය පිළිබඳ කාර්ය සාධන මණ්ඩලයේ ප්‍රධානියා වන කාර්දිනල් ජෝශප් රැට්සිංගර් හිමිපාණන් පත් කළ හ. (වර්තමානයේ 16 වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියාණන්) 1986 නොවැම්බර් 15 දින පළමුවරට රැස්වූ මෙම කොමිසම මූලික වැඩ සැලැස්ම සකස් කර කෙටුම්පත් සකස්කිරීම සඳහා ධර්මෝපදේශය පිළිබඳ ජගත් කීර්තියක් දරූ ජාත්‍යන්තර විශාරදයන් 40 කින් සමන්විත කමිටුවක් තෝරා ගත් හ.

මෙම මණ්ඩලයේ කැපවීමේ හා කාර්යක්ෂම භාවයේ ප්‍රතිඵලයක් ලෙස 1989 දී 4 වැනි කෙටුම්පතේ පිටපත් 5000 ක්, ප්‍රධාන යුරෝපීය භාෂා 4ට එනම්, ප්‍රංශ, ඉංග්‍රීසි, ස්පාඤ්ඤ හා ඉතාලි භාෂාවලට පිටපත්කර, මුළු ලෝකයේ ම රදගුරුතුමන්ලා, කතෝලික විශ්ව විද්‍යාල හා ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථාන වෙත, ගුණ දොස් විමසීම සඳහා යවන ලදි. 1990 ඔක්තෝම්බර් 15 දින වනවිට රාජගුරු මඩු÷ වලින් හා විවිධ කතෝලික ආයතන විසින් සංශෝධිත 24,000 ක් යෝජනා කර එවා තිබිණ. මෙයට සහභාගි වූ විචාරකයන් අතරින් 92% එය සමස්තයක් වශයෙන් ගත් කල සතුටුදායක බව සඳහන් කළ අතර 8% පමණ එය ගැන යම් ප්‍රමාණයක අසතුටක් පළ කර තිබිණ. එවා තිබූ යෝජනා සැලකිල්ලට ගනිමින් සංශෝධන ඇතුළත් කළ කමිටුව කෙටුම්පත් 10 ක් වනතුරු සංශෝධන කර, 1992 අප්‍රියෙල් මස 30 දී සුදතුම් පියතුමාට අවසාන පිටපත භාර දෙන ලදුව, එතුමා ජුනි 25 දින නිල වශයෙන් එය අනුමත කළේ ය. තව ද 1992 ඔක්තෝබර් 11 වන දින "පිදෙයි දෙපෝසිතුම්" (ධර්ම නිතිය) යන අපෝස්තලික අනුශාසනා පත්‍රයක් මගින් කතෝලික සහා ධර්මෝපදේශය නිල වශයෙන් දෙවන ජුවාම් පාවු÷ සසුණිසුරාණෝ ප්‍රසිද්ධියට එක් කළ හ.

වසර 400 ට පමණ පසු විශ්වයිය ධර්මෝපදේශ පොතක් ප්‍රසිද්ධියට පත් කිරීමේ ඓතිහාසික අවස්ථාවේ වැදගත්කම විදහාපෑම සඳහා, විශේෂ තුති පිදීමේ මෙහෙයක් රෝමයේ මහා බැසිලිකා 4න් එකක් වන දේව මාතාවන්ට කැපකරන ලද මහා බැසිලිකාවේ සුදතුම් පියතුමාගේ ප්‍රධානත්වයෙන් නිර්දෝෂි මාතාවන්ගේ මංගල්‍ය දින වන දෙසැම්බර් 8 දින මහත් හරසරින් පවත්වන ලදි. ලෝකයේ සැම රදගුරු මඩුල්ලක්ම, ජාතික ධර්මෝපදේශ කොමිසමේ සභාපතිතුමාට මෙම මෙහෙයට සහභාගි වන ලෙස ඇරයුම් කර තිබුණ බැවින් එවකට ශ්‍රී ලංකා ජාතික ධර්මෝපදේශ කොමිසමේ සභාපතිව සිටි ස්වර්ගස්ථව් වදාළ හිටපු හලාවත රදගුරු තැන්පත් අති උත්තම ප්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු තුමෝ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් එයට සහභාගි වූහ. කතෝලික සහා ධර්මෝපදේශයේ ගමන ආරම්භ වූයේ මෙසේ ය.

### කර්තෘත්වය හා සංස්කරණය

විශාරදයන් 40 කින් යුත් ජාත්‍යන්තර මණ්ඩලයක් පත් කරනු ලැබූ බව ඉහත සඳහන් විය. එහෙත් සිව් කොණින් පැමිණි විවිධ පසුබිම්වලට අයත් මෙවැනි පිරිසක් විසින් එක පොතක් රචනය කිරීම එතරම් පහසු කාර්යයක් නොවේ. තව ද සැදැහැවතුන්ගේ ජීවිතය පෝෂණය කිරීම අරමුණු කරගත් ධර්මෝපදේශයක් රචනය කළ යුත්තේ වියතුන් විසින් නොව, එඬේරුන් (සහා පාලකයන්) විසින් බව මධ්‍යම මණ්ඩලයේ තීරණය විය. එබැවින් පහත සඳහන් අන්දමට මණ්ඩලය සකස් කෙරිණි. රදගුරුතුමන්ලා දෙනම බැගින් 1,2,3 වැනි කොටස්වලට පවරන ලදි. 1 වන කොටස සඳහා රදගුරු එස්තාපා (ස්පාඤ්ඤය) සහ මර්චිලියෝනි (ඉතාලිය), දෙවන කොටස සඳහා රදගුරු මෙදිනා (චිලි) සහ කාර්ලික් (ආර්ජන්ටිනා). තෙවන කොටස සඳහා රදගුරු හොනෝර් (ප්‍රංශය) සහ කොන්ස්ටන්ට් (බ්‍රිතාන්‍ය), 4 වන කොටස සඳහා පෙරදිග ධම්ශාස්ත්‍රය ආභාසය ලත් පුද්ගලයා සොයා යැමේදී රදගුරුතුමෙකු නොලත් බැවින්, ජාන් කාර්බොන් පියතුමා තෝරා ගන්නා ලදි (බෙයිරූට්).

පටුන සකස් කිරීම උතුරු ඇමරිකාමේ ලෙමන්ඩා අගරදගුරු තුමාට පැවරිණි. මුළු කර්තෘ මණ්ඩලය ම පහසු භාෂාවක් වන ප්‍රංශ භාෂාව ප්‍රධාන භාෂාව වශයෙන් යොදා ගැනිණ. එක පොතක් ලෙස සකස් කිරීමේ දී එක භාෂා ශෛලයක් අවශ්‍ය වන බැවින් සංස්කරණ මණ්ඩලයේ ලේකම් වශයෙන් පත් වූ එවකට ස්විට්සර්ලන්තයේ ෆිබූරග් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකුව සිටි, වියෙන්නාහි සහයක රදගුරු තැන්පත් ක්‍රිස්ටොෆ් ශෝන්බෝන් තුමා එය එක පුද්ගලයෙකුගේ කෘතියක් බවට ඉතා දක්ෂ ලෙස සංස්කරණය කරන ලදුව 1992 පෙබරවාරි 14 වන දින මධ්‍යම කොමිසමට භාර දෙන ලදි. ඔවුන් විසින් එය

ඒකමතිකව අනුමත කරන ලදී. මෙම කාර්යක්ෂම සංස්කරණ මණ්ඩලය කළ උදාර සේවය සඳහා සියලු කිතුනුවන් ඔවුනට සදා ණයගැති විය යුතු ය.

### 5.5.3. කතෝලික සභා ධර්මෝපදේශයේ විශේෂ ලක්‍ෂණ

මෙම නව ධර්මෝපදේශය කලින් තිබූ ධර්මෝපදේශ සමග සසඳන විට විශේෂ ලක්‍ෂණ ගණනාවක් දක්නට ලැබේ. ඒවායින් ප්‍රධාන ලක්ෂණ ස්වල්පයක් පහත දැක්වේ.

- මෙය සකස් කරන ලද්දේ ලෝක රදගුරු මඩුල්ලේ ඉල්ලීමට පිළිතුරු වශයෙනි.
- මෙය පුද්ගලයෙකුගේ හෝ සුළු පිරිසකගේ ප්‍රයත්නයක් නොවේ. ඉතා පුළුල් විමසීමකට පසු ජාත්‍යන්තර කමිටුවක් විසින් රචනා කරන ලදී.
- මෙය දෙවන වතිකාන කතිකාවතේ ඉගැන්වීම්, සරල අන්දමට සැදැහැවතුන් වෙත ගෙන යන බලවත් උපකරණයකි.
- මෙය ජාතික හෝ ප්‍රාදේශීය ධර්මෝපදේශ සකස් කිරීමට මිනුම් දණ්ඩක් වන බැවින් එහි නම්‍ය ස්වභාවයක් ඇත.
- එහි ප්‍රධාන අරමුණ වූයේ දේව වචනයෙන් ජනතාව පෝෂණය කිරීමයි. දැනුමට සීමා නොවේ.
- එය අපෝස්තලික සම්ප්‍රදායට අනුකූල වන බැවින්, නූතන මත හෝ වාද විවාද ඇතුළත් නොවේ.
- ධම්දානයට රුකුලක් වන ලෙස සකස් වී ඇති බැවින්, සෙසු ආගම් පිළිබඳ සුබවාදී ආකල්පයක් දක්නට ලැබෙන අතර, සමයාන්තර සුහදතාවයට තුඩු දෙයි.
- ශු. ලියවිලි, ජනවන්දනාව හා සභා ඉගැන්වීම් පදනම් වී ඇති අතර, සරල බසින් ඒවා ඉදිරිපත් කර ඇත.
- ලෝකය පිළිබඳ පරිපූර්ණ දැක්මක් ඉදිරිපත් කරන බැවින්, නූතන මානව හා සමාජ ප්‍රශ්න ද සැලකිල්ලට ගෙන ඇත.
- ආකෘතිය පැරණි වන නමුත් (ප්‍රධාන කොටස් හතරට බෙදීම) කරුණු කාලානුරූප ලෙස ඉදිරිපත් කර ඇත.

මෙම ලක්‍ෂණ නිසා දැනට ම මෙයට ඉමහත් ජනප්‍රියත්වයක් ලැබී ඇති බව රහසක් නොවේ.

### රෝමානු ධර්මෝපදේශය හා කාතෝලික සභා ධර්මෝපදේශය සැසඳීම

මෙම ධර්මෝපදේශ දෙක අධ්‍යයනය කරනවිට ව්‍යුහයන් අතර වෙනසක් දක්නට නොලැබෙන නමුත් (එනම් ප්‍රධාන කොටස් හතර,

1. විශ්වාස ලක්‍ෂණය   3. දසපණත
2. ප්‍රසාද නිධාන   4. යාච්ඤාව)

විමසිල්ලෙන් බලනවිට මේ දෙක අතර බොහෝ වෙනස්කම් ඇති බව පෙනේ. ඇතැම් වෙනස්කම් පහත දැක්වේ.

ප්‍රධාන කොටස් හතර එකින් එකට දක්වන අවධානය වෙනස් වී ඇත. මුළු පොතේ අන්තර්ගතයන්:

| රෝමානු ධර්මෝපදේශය | | කතෝලික සභා ධර්මෝපදේශය | |
|---|---|---|---|
| 1 කොටස. විශ්වාස ලක්‍ෂණය | 22% | සභාවේ විශ්වාසය | 39% |
| 2 කොටස. ප්‍රසාද නිධාන | 37% | සභාවේ ජනවන්දනාව | 23% |
| 3 කොටස. දස පණත | 21% | ක්‍රිස්තු තුමන් තුළ නව ජීවිතය | 27% |
| 4 කොටස. යාච්ඤාව | 20% | ක්‍රිස්තියානි යාච්ඤාව | 11% |

මෙම ධර්මෝපදේශ පොත් දෙක පළමුවන කොටසට දී ඇති අවධානය දෙස බලන විට, කතෝලික සභා ධර්මෝපදේශයේ 17% පමණ වර්ධනයක් දක්නට ලැබේ. මීට හේතු වශයෙන් කරුණු කිහිපයක් සඳහන් කළ හැක. එනම්, එය දෙවියන් පිළිගැනීම මිනිසාට එතරම් බැරෑරුම් ප්‍රශ්නයක් නොවූවත් තාක්‍ෂණයෙන් හා විද්‍යාවෙන් දියුණුවූ නූතන ලෝකයට දෙවියන් අවශ්‍ය නැති බව පෙනේ. තම දැනුම ගැන උදම් වී සිටින බැවින් දෙවියන් ප්‍රතික්ෂේප කිරීමට හා උත්වහන්සේ සමග සටන් කිරීමට පවා එඩිතර වෙති. එබැවින්,

මෙම කොටසින් දෙවියන් වහන්සේගේ වැඩ සිටීම, උන්වහන්සේ හඳුනා ගැනීමට මිනිසා සතු හැකියාව හා දේව ප්‍රකාශනය ගැන වැඩි අවධානයක් යොමු කිරීමට නව ධර්මෝපදේශයට සිදු වී ඇත. එලෙස ම ජනවන්දනාව හා ප්‍රසාද නිධාන සඳහා වෙන්කර ඇති දෙවන කොටසේ දක්නට ලැබෙන වෙනස නම්, එදා මාටින් ලූතර් හා සෙසු ප්‍රතිසංස්කරණවාදීන් සභාවේ මුළු ප්‍රසාද නිධාන ව්‍යුහයට පහර දුන් බැවින්, එක එක ප්‍රසාද නිධානය වෙන් වෙන් වශයෙන් ගෙන ඒවා පිළිබඳ දීර්ඝ විස්තර ඉදිරිපත් කිරීමට රෝමානු ධර්මෝපදේශයට සිදු විය. තව ද, දිව්‍ය පූජාව සැබෑ යාගයක් වන අතර, දිව්‍ය සත්ප්‍රසාදයෙහි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සැබවින්ම වැඩ සිටින බව අවධාරණය කිරීමට සිදු වූ බැවින්, මෙම කොටස කතෝලික සභා ධර්මෝපදේශයේ දෙවන කොටසට වඩා දීර්ඝ විය.

රෝමානු ධර්මෝපදේශයේ 3 වන කොටස දස පණතට පමණක් සීමා වන නමුත්, කතෝලික සභා ධර්මෝපදේශයේ "ක්‍රිස්තු තුමන් තුළ ජීවිතය" යනුවෙන් නම් කරන මෙම කොටසේ පළමුවන කාණ්ඩයේ සෙසු කරුණු රැසක් ඇතුළත් කර ඇත. එනම්, මිනිසාගේ උතුම්කම, භාග්‍ය සඳහා මිනිසා ලබා ඇති කැඳවීම, මූලික මානව අයිතිවාසිකම්, සදාචාර නීති පද්ධතිය, හෘද සාක්ෂියේ හඬ, පොදු මිනිස් සමාජය, සමාජ සාධාරණත්වය, සාමය යනාදි නූතන සමාජ ප්‍රශ්න රැසක් පිළිබඳ "වර්තමාන ලෝකයේ ශු. සභාව" නැමති දෙවන වතිකාන කතිකාවතේ උපදේශාත්මක ප්‍රකාශනයේ ඉගැන්වීම් මෙම කාණ්ඩයට හා දෙවන කාණ්ඩයට දස පණත හා ශු. සභාවේ පණත් පිළිබඳ විස්තර ඇතුළත් වී ඇති බැවින්, එය වඩා දීර්ඝ වී ඇත. ක්‍රිස්තියානි යාච්ඤාව යන නමින් හැඳින්වෙන 4 වන කොටසේ 1 වැනි කාණ්ඩයට ගැබ් වී ඇත්තේ යාච්ඤාව පිළිබඳ පොදු කරුණු රැසකි. දෙවැනි කාණ්ඩය රෝමානු ධර්මෝපදේශය මෙන් ස්වාමිවාක් ආරාධනාවේ වගන්ති හත පිළිබඳ සරල විස්තරයකි. බොහෝ විචාරකයන්ගේ අදහස ඉතාමත් අලංකාර හා රසවත් විස්තරයක් ඉදිරිපත් කර ඇති බවයි.

## කතෝලික සභා ධර්මෝපදේශය කිතුනුවා සතු ඉමහත් සම්පතකි

දහම් සේවකයා අතට පත්වන මෙම ධර්මෝපදේශය "දෙවියන් වහන්සේ විසින් සභාවට දෙන ලද ඉමහත් තිළිණයකි. නව ධම්දානය සඳහා බලවත් ආයුධයකි" යනුවෙන් දෙවන ජුවාම් පාවුළු සසුණිසුරාණන් එය හඳුන්වා දෙන්නේ හේතු රහිතව නොවේ. ඉහත සඳහන් කර ඇති පරිදි එහි අන්තර්ගතය වැදගත්වනවා හැර පාඨකයන්ගේ පහසුව සඳහා වටිනා උපටුන කිපයක් පොත අවසානයේ ඇතුළත් කර ඇත. එනම්,

- පොතේ සඳහන් බයිබල් පාඨ පිළිබඳ උපුටන පැරණි ගිවිසුම සහ නව ගිවිසුමේ සෑම පොතකින්ම උපුටන ගෙන ඇත.
- ජගත් මන්ත්‍රණ සභා උපුටනඃ 1 වන ජගත් මන්ත්‍රණ සභාව වන නිසියානු මන්ත්‍රණ සභාව (ක්‍රි.ව. 325) සිට 2 වන වතිකාන මන්ත්‍රණ සභාව දක්වා (1962-1965) ප්‍රධාන උපුටන.
- දෙවන වතිකාන කතිකාවතේ ප්‍රකාශන 16 න් ප්‍රධාන කොටස්.
- ප්‍රාදේශීය මන්ත්‍රණ සභාවල ප්‍රධාන ප්‍රකාශන.
  **උදා:** කාතේජ් හි ටොලේඩෝහි
- සුදතුම් පියතුමන්ලාගේ නිල ලේඛන, විශ්ව ලේඛන, අපෝස්තලික අනුශාසනා, ප්‍රධාන කොටස්.
- වතිකාන කාර්ය සාධක මණ්ඩලවල ප්‍රධාන ප්‍රකාශන කොටස්.
- සභා නීති පොතේ වැදගත් වගන්ති.
- ජන වන්දනා පොත්වල ප්‍රධාන උපුටන.
  **උදා:** දිව්‍ය පූජා සංග්‍රහය, වත් පිළිවෙත් සංග්‍රහය.
- සභා පියවරුන්ගේ ප්‍රධාන කෘතීන්.
  **උදා:** ග්‍රීක් පියවරු, ශු. ජෝන් ක්‍රිසොස්තම් තුමා, ලතින් පියවරු, ශු. අගුස්තීනු, ඇම්බ්‍රෝසි තුමා.
- ධර්මධරයන් හා සාන්තුවරයන්ගේ ඉගැන්වීම්.
  **උදා:** තෝමස් අක්විනාස්, සාන්ත මහා තෙරේසා.

විෂය කරුණු අනුව පටුනක් ද ඇතුළත් කිරීමෙන් පාඨකයනට අන්තර්ගතය වඩා පහසුවෙන් සොයා ගැනීමට හැකිවේ. ප්‍රධාන කොටස් හතරකින් ද ජේද 2865 ද පටුනු 11 න් ද යුත් මේ ග්‍රන්ථය සැබවින් ම දෙවියන් වහන්සේගෙන් සභාවට ලැබුණු මහා තිළිණයකි.

# හයවන පාඩම

# ශ්‍රී ලංකාවේ කිතුනු සභා ඉතිහාසය

## 6.1 ලන්දේසී යුගය (1658-1796)

1656 දී පෘතුගීසින් ඕලන්ද ජාතිකයන්ට යටත් වුයෙන් කොළඹ නගරය මත ඕලන්ද පෙරදිග ඉන්දීය සමාගමේ කොඩිය (VUIC හෙවත් වීරනිඩ ඌස්ට් ඉන්ඩිච කොම්පඤ්ඤ යන සුප්‍රසිද්ධ වෙළඳ සමාගමක් විය). ඔසවන ලදී.
මේ සිද්ධියෙන් පසු ලක්දිව කතෝලික සභාවට දරුණු පීඩන සමයක් උදා විය.

### 6.1.1 ලන්දේසී සමයේ කතෝලික පීඩන

1658 සැප්තැම්බර් 19 වන දින නිකුත් කරන ලද නියෝගයක් අනුව කතෝලිකයාට දැඩි පීඩන නියෝගවලට යටත් වීමට සිදු විය. පහත සඳහන් නීති ලන්දේසීන් විසින් කතෝලිකයනට පනවන ලදී.

- ලංකාවේ සිටින සියලුම විදේශික ධර්මදූතවරුන් රටින් පිටුවහල් කිරීම.
- කතෝලික පූජකයන් රහසේ සැඟ වී සිට රජයේ පාලකයන්ට අසුවුවහොත් මරණීය දණ්ඩනය නියම කිරීම.
- කතෝලික පූජකයන්ට රැකවරණය දුන් අයගේ දේපල රාජ සන්තක කිරීම හෝ ඔවුන්ට සිර දඬුවම් දීම.
- කතෝලික සභාව සතු හැම දේපලක්ම රාජ සන්තක කිරීම.
- ලන්දේසී රජයේ සියලුම පාසල්වල ඕලන්ද රෙපරමාදු ධර්මය පමණක් ඉගැන්වීම.
- එම පළාත්වල ඉපැදෙන සෑම දරුවෙක් ම ලන්දේසි රෙපරමාදු පිළිවෙත අනුව බෞතිස්ම කිරීම.
- දරුවන් පාසලට ඇතුළත් කිරීමට පෙර ඔවුන්ගේ තෝම්බුව පරික්ෂා කිරීමට ප්‍රධානීන්ට බලය දීම හා ලන්දේසී පාසල්වලට යාමට බල කිරීම.
- කිසිම කතෝලික වත් පිළිවෙතක් පැවැත්වීම තහනම් වීම.
- කතෝලිකයන්ට රජයේ කිසිම අනුග්‍රහයක් නො දැක්වීම. එනම් රැකියාවක් හෝ තනතුරක් ලබා ගැනීමට අයිතිය අහිමි වීම.
- කතෝලික දෙව්මැඳුරු හා පුණ්‍ය ආයතන විනාශ කිරීම.
- රෙපරමාදු පාසල්වලට ළමුන් නො යැවූ කතෝලිකයනට දඩ මුදල් නියම කිරීම.

මෙවැනි හිංසාකාරී ප්‍රතිපත්ති යටතේ එදා ලාංකික කතෝලික ජනතාව එඬේරෙක් නැති බැටළු රැළක් බවට පත්විය. නමුත් කිතුනු ජනතාව තම ඇදහිල්ල තුළ ස්ථිරව කම්කටොළු මැද දිවි ගෙවූහ. ඇතැම් කතෝලිකයෝ පීඩන විඳ ගත නො හැකිව රෙපරමාදුවට ද, බෞද්ධාගමට ද, හින්දු ආගමට ද, හැරුණ හ. ප්‍රයෝගකාරී ලන්දේසීහු තමන් අල්ලා ගත් පෘතුගීසි බලකොටු මහනුවර රජුට නො පැවරූහ. උරණ වූ ලන්දේසී පීඩනයට පාත්‍ර වූ කතෝලිකයන්ට මහනුවරට පැමිණීමට ආරාධනා කිරීමේ හේතුවෙන් රත්නපුර, අවිස්සාවේල්ල, රුවන්වැල්ල, ගල්ගමුව, මහනුවර, වැඋඩ, වහකෝට්ටේ යන ස්ථානවල කතෝලික සංඝ ජනිත වූ බව කිව හැකි ය.

### 6.1.2 දේශීය පූජකයන්ගේ අවශ්‍යතාවය

යාපනය යටත් වීමෙන් පසුව කතෝලික පියවරුන් ලංකාවෙන් පිටමන් කරන ලද හ. ඔවුන්ගෙන් හතරදෙනෙක් පමණක් ලංකාවේ සිටි නමුත් ඔවුහු ද මහනුවර රජු යටතේ සිරභාරයේ පසු වූහ. ස්වදේශීය පූජකයන් පුහුණු නො කිරීමේ වරද පෘතුගීසින්ට අවබෝධ වූයේ මේ කාලයේ දී ය. මේ තත්ත්වය වාර්තා මගින් රෝමයට සැලවූ විට සෑම රටවලම ස්වදේශීය පූජකයන් පුහුණු කිරීමට ද අවස්ථාවක් උදා වූ කෙනෙහි ම දෙව් සත්හල් ඇරඹීමට ද 1663 දී නියෝග කරන ලදී. ලංකාවේ කතෝලිකයන් පූජකවරුන් එවන ලෙස ගෝවේ ධර්මදූත මධ්‍යස්ථානය වෙත ලිපි යැවූ නමුත් ඒවා නිෂ්ඵල විය.

පීඩනය නිසා වනගත ව යන එන මං නැති වූ කිතුනු ජන සංඛ්‍යාව ද අධික විය. ධෛර්යය අත් නො හල කතෝලිකයෝ තම නිවෙස් තුළ යාච්ඤා කළ හ. දරුවන්ට ප්‍රසාද ස්නාපනය දුන්හ. දරුවන්ට ආගම දහම ඉගැන්වූ හ. ජපමාලය කී හ. බාහිර ලකුණක් වශයෙන් කුරුසිය පැළඳූ හ. මෙලෙස 1658 සිට අවුරුදු 30 ක පමණ කාලයක් තුළ ගිහියන් ධර්මදූතික වගකීම් බාර ගත්හ. මේ කාලය තුළ ශ්‍රී ලංකාවේ ලක්ෂයකට අධික කාතෝලික පිරිසක් තමන්ගේ විශ්වාසය ආරක්ෂා කරගෙන ජීවත් වූ බව ඉතිහාසයේ සඳහන් වේ.

කිතු දහමට නොයෙකුත් තර්ජන එල්ලවන මෙවන් යුගයක කිතුනු අපට එදා ලන්දේසි යුගයේ කිතුනුවන්ගේ අචල විශ්වාසය අභියෝගයකි. පූජකයන් නො මැතිව පවා තම ඇදහිල්ල ගැඹුරු කර ගනිමින් තම දරුවන්ට එය උරුම කර දෙමින් සාංඝිකව එකිනෙකා දිරිගන්වමින් ඔවුහු තම දහමෙහි ස්ථිරව සිටිය හ. ජනසන්නිවේදන මාර්ග මෙතරම් දියුණුව තිබෙන යුගයක අපගේ දහම, විශ්වාසය ව්‍යප්ත කිරීමට අප ඇප කැප වන්නේ කෙසේදැයි විමසා බැලීමට එදා කිතුනුවන් අපට අභියෝග කරනු නො අනුමාන ය.

### 6.1.3 භාග්‍යවර ජුසේ වාස් පියතුමා

1687 දී තම දිවි පරදුවට තබා ලංකාවට පැමිණි ජුසේවාස් පියතුමා ලන්දෙසී පීඩාවලින් හෙම්බත්ව සිටි කතෝලික ජනතාවට දෙවියන් වහන්සේගෙන් ලද අනගි තිළිණයක් වූ බව නිසැක ය. ජුසේවාස් පියතුමා ඔරතෝරියාන නිකායට ඇතුළු වී පූජාත්වරය ලබා 1681 -1684 දක්වා ඉන්දියාවේ කනරාවේ මීසම් සේවයේ යෙදී සිටියේ ය. එතුමා එහිදී ලංකාවේ තත්ත්වය සොයා බලමින් සිටි අතර ලංකාවට පිවිසිය හැකි මගක් ද විමසමින් පසු විය.

ජුසේවාස් පියතුමා ශ්‍රී ලංකාවට පැමිණීමට පසුබිම් වූ සිද්ධීන් අතර ප්‍රධාන සිද්ධිය වනුයේ ශ්‍රී ලංකාවේ කතෝලිකයන් ලන්දේසින් යටතේ මුහුණ දුන් පීඩන යි. තම නිකායේ පියතුමෙකුගෙන් ශ්‍රී ලංකාවේ තත්ත්වය ගැන දැනගත් එතුමෝ අනතුරුදායක වාතාවරණයක අඩපණ ව තිබුණු කිතු සසුන පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා දෙවියන් වහන්සේ තමන්ව කැඳවන බව තේරුම් ගත් හ.

විදේශීය සියලු ධර්මදූතයින් පිටුවහල් කර තිබු නිසා ක්‍රි.ව. 1658 සිට අවුරුදු 30 ක කාලයක් තුළ ලංකාවේ කිසිම පූජකවරයෙක් හෝ පැවිදිවරයෙක් නො සිටිම ද වාස් පියතුමාට ශ්‍රී ලංකාවට පැමිණීමට පසුබිම් වූ සිද්ධියක් විය.

ක්‍රි. ව. 1687 දී ඉන්දියානු කුලීකරුවෙක් ලෙස වෙස් වලාගෙන මෙතුමා තුත්තුකුඩියෙන් මන්නාරමට ද ඉන්පසු යාපනයට ද පැමිණියේ ය. යාපනයේ සිල්ලාලේ නැමැති ග්‍රාමය මධ්‍යස්ථානය කරගෙන ජුසේවාස් පියතුමා ධර්මදූත සේවයේ යෙදුණේ ය. එතුමන් සමග ජෝන් නමින් මෙහෙකරුවෙක් ද වුහ. ඕලන්දයෝ එතුමන් ඇල්ලීමට උත්සාහ කළ හ. 1689 නත්තල් රාත්‍රියේ දිව්‍ය පූජාව සිදු කිරීමට නිවෙස් තුනකම සූදානම්කර තිබෙන විට ඕලන්ද හෝවාහට කණ්ඩයමක් එම ස්ථානවලට කඩා පැන වාස් පියතුමන් සෙවු නමුත් එතුමන් අල්ලා ගැනීමට නො හැකි විය. ඔව්හු එහි රැස්ව සිටි කතෝලිකයන් 300 ක් පමණ ගෙන ගොස් යාපනය කොටුවේ සිරකොට තැබූ හ. පිරිමින්ට තද බල ලෙස දඬුවම් දුන් අතර සියලු දෙනාට ම දඩගැසූ හ. දොන් පේදුරු නැමැත්තා ජන ප්‍රධානියකු වු බැවින් ඔහුට දරුණු දඬුවම් දුන් අතර ඔහු බන්ධනාගාරයේ ම මිය ගියේ ය. ඕලන්ද යුගයේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා දොන් පේදුරු ය.

වාස් පියතුමා යාපනයෙන් පිටත් ව පුත්තලම බලා ගියේ ය. එහි දී එතුමාට ජුවාම් ද බ්‍රගන්සා පියතුමා හමු විය. පුත්තලමේ ටික කලක් සේවය කළ මෙතුමා එහි සිට ඕලන්දයන්ට අයිති පළාත්වල වෙස් වලාගෙන සේවය කළේ ය. පුත්තලමේ දී ඔහුට උඩරට සිට පැමිණි පෘතුගීසී වෙළෙන්දෙකු වු අන්තෝනියෝ සොට්ටුමයෝර් හමු වී උඩරට කතෝලිකයන් සිටින බවත් එතුමාව එහි කැඳවාගෙන යා හැකි බවත් කියා සිටියේ ය.

බ්‍රගන්සා පියතුමා ද උඩරට යාමට ආශාවක් දැක්වු නමුත් එතුමා රෝගාතුර වී ගෝවට ගිය අතර නැවතත් ලක්දිව එකම පියතුමා බවට වාස් පියතුමා පත් විය.

උඩරට සිරකරුවා

1692 දී අන්තෝනියෝ සොට්ටුමයෝර් සමග වාස් පියතුමා උඩරට සේවයට පිටත් වුහ. එවකට රජව සිටි දෙවන විමලධර්මසූරිය රජතුමා වාස් පියතුමා පෘතුගිසින්ගේ ඔත්තුකාරයෙක් යැයි සිතා එතුමන්ව සිරභාරයට ගන්නා ලදි. සැකපිට වාස් පියතුමාව සිර කරනු ලැබුවත් එතුමාගේ ශාන්ත ගතිගුණ හා ජීවිත පැවැත්ම නිසා එතුමා ගැන පැහැදි තදින් ක්‍රියා නො කළේ ය. සිරගෙයි කුඩා පැලක් සාදාගෙන යාච්ඤා කරන්නට පමණක් නොව 1692 වසරේ එහි දිව්‍ය පූජාව තැබීමටත් අවකාශ ලැබිණි. කතෝලික බැතිමතුන්ට එතුමාව සිරගෙට ගොස් බැහැ දැකීමටත් එතුමාගේ සේවය ලබන්නටත් ක්‍රමයෙන් රජතුමාගේ අවසරය ලැබිණි. 1693 දී සිරගෙයින් නිදහස් වූ පසු කුඩා දෙව්මැදුරක් තනාගෙන එහි හිඳ කතෝලිකයන්ට සේවය කරන්නට එතුමාට අවස්ථාව සැලසුණේ විමලධර්මසූරිය රජතුමා වාස් පියතුමාගේ ජීවිතය ගැන පැහැදීමට පත් වූ නිසා බවට කිසිම සැකයක් නැත.

ජුසේවාස් පියතුමාගේ දහම් සේවාව පුත්තලම් ප්‍රදේශය, කන්ද උඩරට ප්‍රදේශය මෙන්ම සීතාවක හා කොළඹ දක්වාත් කළුතර සිට බේරුවල දක්වාත් ව්‍යාප්ත විය. අවුරුදු 24 ක පමණ කාලයක් තුළ ලංකාවේ විවිධ ප්‍රදේශවල සේවාවේ යෙදුණ මෙතුමාගේ දහම් සේවයේ ලක්ෂණ කිහිපයක් පහත දක්වමු.

- තැනින් තැන වෙසෙන කිතුනුවන් සොයා ගොස් ඔවුන් එක් රැස් කර ඔවුන්ගේ ආගමික අවශ්‍යතා ඉටු කිරීම.
- ලංකාවේ විවිධ පළාත්වල කිතුනු සංඝ බිහිකොට ගිහි කිතුනු නායකයින් පුහුණුකර වගකීම් බාර දීම. අද පවා මුහුප්පු, අන්නවි, සංස්කිරිස්තියන් යන නිල නාම කතෝලික ගිහි නායකයන් සඳහා භාවිතා වේ.
- වත් පිළිවෙත් සඳහා රහසේ රුස්වීම, ධර්මය ඉගැන්වීම, ප්‍රසාද නිධාන දානය කිරීම, දිව්‍ය පූජාව සිදු කිරීම.
- කිතුනුවන් තුළ එකම විශ්වාසය හා සහෝදර ප්‍රේමය වර්ධනය කිරීමට දිරි ගැන්වීම.
- ලෙඩ දුකින් පෙළෙන අයට උපස්ථාන කිරීම.
- ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කරමින් බෞද්ධ අයගේ පවා ගෞරවයට පාත්‍ර වීම.

ජුසේවාස් පියතුමාගේ පැමිණීමෙන් අවුරුදු 10කට පසු ඔරතෝරියානු නිකායෙන් තවත් පූජකවරුන් ලංකාවට පැමිණීමත් සමගම ජුසේවාස් පියතුමාගේ කටයුතු පහසු විය. මෙසේ ලාංකික කිතුනුවන්ට උදාර සේවයක් කළ ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයා යන විරුදාවලිය ලත් මෙතුමා ක්‍රි.ව. 1711 ජනවාරි 16 දින දී මහනුවර දි ස්වර්ගස්ථ විය. ශ්‍රී ලංකාවේ දේව රාජ්‍යයේ උදාව සඳහා උදාර සේවයක් කළ මෙතුමාව 1995 ජනවාරි 20 වන දා දෙවන ජුවාම් පාවුළු පාප්තුමා ශුද්ධවරයට එසවීමේ භාග්‍ය උදාකර දීම ගැන අපි දෙවි මහත්තමයාණන් වහන්සේට තුති පැසසුම් කළ යුතු වෙමු.

**භාග්‍යවත් ජුසේවාස් පියතුමන් විසින් සිදුකළ මහනුවර දෙවන විමලධර්මසූරිය රජුගේ සහ බෞද්ධයන්ගේ ගෞරවයට පාත්‍ර වු සිද්ධීන් කිහිපයක්**

**වසූරිය රෝගීන්ට උපස්ථාන කිරීම.**

ක්‍රි. ව. 1697 දී මහනුවර වසූරිය වසංගතය පැතිරී බොහෝ දෙනෙක් මිය ගිය හ. ආහාරපාන හිඟය නිසා මෘගයන් විසින් මිය ගිය අයගේ මළ සිරුරු අනුභව කරන ලදී. වාස් පියතුමා මේ බව දැනගෙන මහනුවරට ගොස් ලෙඩුන් සිටින තැන් සොයා ඔවුන්ට කුඩාරම් සාදා දී ආහාර පාන සපයා මළමිනී වළලා දැමූ බව විජිත රාජාවලිය නම් ග්‍රන්ථයේ සඳහන් කර තිබේ. මෙම ප්‍රබල ජීවිත සාක්ෂිය නිසා බොහෝ දෙනෙක් කතෝලික ආගම වැළඳ ගත් හ.

**නියඟය නැවැත්වීම.**

මහනුවර ප්‍රදේශයේ අස්වනු පාළු වී ගිය ඉඩෝර කාලය තුළ තමන් අදහන දෙවියන්ට යාච්ඤා කර වර්ෂාව ලබා දෙන ලෙස වාස් පියතුමාගෙන් දෙවන විමලධර්මසූරිය රජතුමා ඉල්ලා සිටියේ ය. ජුසේවාස් පියතුමා දෙවියන් වහන්සේ තුළ මුළු විශ්වාසය තබා රජ මාළිගාය ඉදිරිපිට චතුරශ්‍රයෙහි කුරුසියක් තැබූ පීඨකයක් තනා දණින් වැටී යාච්ඤා කළේ ය. එතුමා එතනින් නැගිටින්නටත් පෙර ධාරාණිපාත ලෙස වර්ෂාව පටන් ගත්තේ ය. එතුමාටවත්, පූජාසනයටවත් වැහි පොදක් නො වැටුණේ ය. මෙම සිද්ධිය 1745 දී ලිස්බන් නගරයේ පළ කරන ලද ලිපියක සඳහන් වී ඇත. මෙම සිද්ධියෙන් පසු වාස් පියතුමාට රජුගේ කරුණාවත් වැසියන්ගේ ගෞරවයත් ලැබී මහනුවර ප්‍රදේශයේ ආගමික කටයුතු නිදහස්ව කරගෙන යාමට හැකි විය. 1696 දී මුළු ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ පාලනය සඳහා වාස් පියතුමාව පත් කරන ලද බව කියා කොචිනයේ රදගුරු තුමාගෙන් ලිපියක් ලැබුණි. ඒ අනුව එතුමා කොචිනයේ රදගුරු තුමාගේ අනුනායක බවට පත්විය.

## 6.1.4 භාග්‍යවත් ජුසේවාස් පියතුමා තුළින් දිස්වූ දේව ගුණාංග

1. නිතරම දිව්‍ය සංරක්ෂණය තුළ යැපීමඑතුමාගේ ලක්ෂණයක් විය. පූජාප්‍රසාදීන් සඳහා මරණ තර්ජනය පැවති යුගයක අනාථව සිටින ශ්‍රී ලංකික කතෝලික ජනතාවට සේවය සඳහා පැමිණීමට වාස් පියතුමා ඉදිරිපත් වුයේ දෙවිඳුන් කෙරෙහි එතුමන් තුළ තැබූ ගැඹුරු විශ්වාසය නිසා ය. එමෙන් ම සිඟන්නකුගේ වේශයෙන් ලංකාව පුරා ඇවිද දේව රාජ්‍යය සඳහා වෙහෙසීමේ දී එතුමාගේ එකම සවිය වූයේ දිව්‍ය සංරක්ෂණයයි.

2. බ්‍රහ්මචාරී, අල්පේච්ඡ, දැහැමි, දිවි පෙවතක් ගත කළේ ය. දහම සඳහා තම මුළු දිවි පෙවත කැප කළ මෙතුමාගේ ජීවිතය ද සරල එකක් විය. ජාති ආගම් කුළ භේද නොතකා සැමට එක ලෙස සේවය කළේ ය.

3. තමාගේ මහිමය නොව දේව මහිමය සඳහා වැඩ කළේ ය. නිතර දේව කැමැත්ත ඉටු කළේ ය. නිතරම තම නිකායේ ශ්‍රේෂ්ඨයන්ට කීකරු විය. කාලයේ සලකුණු තුළින් කථා කරන දේව හඬ හඳුනාගෙන ඊට පිළිතුරු දුන්නේ ය.


4. කිතුනු නායකත්වය විමධ්‍යගත කළේ ය. ශ්‍රී ලංකාවේ විකාර් ජෙනරාල් ධූරයට ඔසවනු ලැබූ මෙතුමා තමන්ට සහයට පැමිණි පියතුමන්ලාට විවිධ ප්‍රදේශ බෙදා දී ලක්දිව ධර්මදූත කටයුතු ශක්තිමත් කළේ ය.

5. පීඩිතයන්, අසරණයන්, කොන්වුවන් කෙරේ විශේෂ ආදරයක් දැක්වීය.

6. තම ජීවිතය පරදුවට තබා පරිත්‍යාගිශීලිව ලෙඩුන්ට උපස්ථාන කළේ ය. වසූරිය වසංගතයේ දී මෙතුමා කළ සේවය මීට කදීම නිදසුනකි.

### භාග්‍යවත් ජුසේවාස් පියතුමාගේ සේවය පිළිබඳ වැදගත් වූ ස්ථාන

සිල්ලාලෙයි, යාපනය, ත්‍රිකුණාමය, අනුරාධපුරය, පුත්තලම, වහකෝට්ටේ, මහනුවර, බෝලවත්ත, කොළඹ, හංවැල්ල, සීතාවක, රත්නපුරය, කළුතර, බේරුවල




**භාග්‍යවත් ජු සේවාස් පියතුමාණන්ගේ ගමන් මාර්ග**

### 6.1.5 ඔරතෝරියානු දහම් දූත සේවාව

පිලිප්නේරි පියතුමන් ඇරඹූ ඔරතෝරියානු නිකායට ඇතුළු වූ ජුසේවාස් පියතුමා විසින් එම නිකාය විනය අතින් නිසි තැනට ගෙනෙන ලදී. ශ්‍රී ලංකාවේ නිවී යමින් තිබූ දහම් සිළිල යළි දල්වන්නට දෙවියන් වහන්සේ තෝරා ගත්තේ ඔරතෝරියාන නිකාය යි.

වසර 10 ක පමණ කාලයක් නොයෙක් දුක් ගැහැට මැද ලක්දිව දහම් සේවයේ නිරතවූ ජුසේවාස් පියතුමාට තම නිකායෙන් තවත් දෙදෙනෙක් සහායට ද ලැබෙන්නට යන බව දැන ගන්නට ලැබීම ඉමහත් සතුටක් විය. ඉතා දුෂ්කර වූද ගමනකට පසු 1696 දී ජෝශප් මෙනසස් සහ ජෝශප් කරවල්ලෝ නම් ඔරතෝරියානු පූජකවරු දෙදෙනාව ජුසේවාස් පියතුමා හමු වූහ.

කොචින්හි රදගුරු තුමා විසින් වාස් පියතුමාව ලංකාවේ විකාර් ජෙනරාල් පදවියට පත් කළ අතර. එතුමාගේ සහයට පැමිණි පේද්‍රෝ ෆේරෙං පියතුමාට ලංකාවේ උතුරත්, මෙනසස් පියතුමාට පුත්තලම හා සත්කෝරලයත් කරවල්ලෝ පියතුමාට මහනුවරත් සෙසු ප්‍රදේශ වාස් පියතුමාටත් බෙදා ගන්නා ලදි.

17 වන ශත වර්ෂයේ අග භාගය වන විට ලංකාවේ සිටි කතෝලික ජනතාව ලක්ෂයක් වු බව කියැ වේ. එසේ කතෝලික සංඛ්‍යාව වැඩි වීමේ ගෞරවය ඔරතෝරියානු ධර්මදූත ව්‍යාපාරයට හිමි වේ. වාස් පියතුමන් මගින් ක්‍රියා කළ ක්‍රිස්තුන් වහන්සේ ලක්දිව කිතු සසුන ආරක්ෂා කර ඊට නව පණක් දුන් බව මින් පැහැදිලි වේ.

1705 දී ලක්දිව ධර්මදූත සේවය සඳහා ජෝශප්ද ජේසු මරියා, ජාකොමේ ගොන්සාල්වෙස්, මනුවෙල් ද මිරැන්ඩා, මිගෙල් ද මෙල්ලෝ නැමැති ඔරතෝරියානු පියවරු පැමිණිය හ. එවිට පොදු රැස්වීමක් කැඳවා ජුසේවාස් පියතුමා ලංකාව ධර්මදූත ප්‍රදේශ 8 කට බෙදන ලදී. වාස් පියතුමා මහනුවර නැවතී සාමාන්‍ය පාලනය තමන් යටතේ තබාගෙන විටින් විට පියවරුන් දිරිමත් කිරීමට ඒ ඒ ප්‍රදේශවලට ගියේ ය. මෙම සංවිධානය නිසා ලංකාවේ කිතුනු සසුන වඩාත් තහවුරු විය.

ශ්‍රී ලංකාවේ දහම් සේවයට පැමිණි සැම ඔරතෝරියාන ධර්මදූතවරයෙක් ම ජුසේවාස් පියතුමාගේ මාර්ගයේ යමින් දහම් සේවයට ඇප කැප වූහ. තම ජීවිත පරදුවට තබමින් තහනම් ප්‍රදේශවලට රාත්‍රී කාලයේ ගොස් කතෝලිකයන් හමු වූහ. පීඩන සමය නිසා ඔවුන්ට ස්ථිර වාසස්ථානවල විසීමට නො හැකි වූ අතර නිතර නිතර ස්ථාන වෙනස් කිරීමට සිදු විය. එහෙත් මේ කිසිවකිනුදු පසු නො බැසු මෙම පියතුමන්ලා ශ්‍රී ලක් කිතු සසුන නංවාලීමට වෙහෙසුණ හ. ලන්දේසී යුගය අවසාන වන විට ලංකාවේ ඔරතෝරියානු පූජකතුමන්ලා 15 දෙනෙක් පමණ දහම් ව්‍යාපාරයේ නියුක්තව සිටිය හ.

### 6.1.6 දේශීය කිතුනු සාහිත්‍යයක් බිහි වීම.

#### (අ) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා

ලක්දිව කතෝලික සාහිත්‍යයේ නිර්මාතෘවරයා ලෙස ගැනෙන ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා ජුසේවාස් පියතුමා මෙන් ගෝව ප්‍රදේශයේ කොංකොනි බ්‍රාහ්මන වංශයට අයත් පවුලක 1676 උපත ලැබීය. බාල කාලයේ සිට ම සංගීතයට ලැදියාවක් හා දක්ෂතාවයක් දැක්වූ මෙතුමා ගෝව පුරයේ ජේසු නිකායික පියතුමන්ලා යටතේ උසස් අධ්‍යාපනය ලැබ ශස්ත්‍රවේදී උපාධිය ලබා ගත්තේ ය. ඉන්පසු ඔරතෝරියාන නිකායට ඇතුළු වී ක්‍රි. ව. 1700 දී පූජකවරය ලැබීය.

ක්‍රි. ව. 1705 දි එම නිකායට අයත් පියවරුන් තිදෙනෙකු සමග ශ්‍රි ලංකාවට සම්ප්‍රාප්ත වූයේ මෙරට දහම් සේවය සඳහා ජුසේවාස් පියතුමන්ට ආධාර කරනු පිණිස ය.

**භාෂා ඉගෙනීම**

ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා ලක්දිව පැමිණෙන්ට පෙර සිටම කොන්කානි, ලතින්, පෘතුගිසි, ස්පාඤ්ඤ යන භාෂා දන සිටියේ ය. එතුමා ලක්දිව තම සේවය ආරම්භ කළේ යාපනයේ නගරයේ බැවින් දෙමළ ඉගෙනීමට ද අවකාශ ලැබිණි. වාස් පියතුමා විසින් මෙතුමාව මහනුවරට ගෙන්වා ගනු ලැබු විට භික්ෂුන් වහන්සේලාගේ සහ දස්කොන් මහ අදිකාරම්ගේ සහය ඇතිව ගැඹුරට හෙළ බස හැදෑරුවේ ය. පැරණි සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරින් ශාස්ත්‍රීය භාෂාව ද, ගැමි ජනයා ඇසුරින් එකල භාවිත කළ ගැමි බස ද උගත්තේ ය.

තීක්ෂණ බුද්ධියකින් හා භාෂා හැදෑරීමේ කුසලතාවයකින් යුක්ත වූ ගොන්සාල්වෙස් පියතුමා ග්‍රන්ථකරණයට ඉතාම සුදුස්සකු බව වාස් පියතුමාට පෙනී ගියේ ය. කිතු දහම ඉගැන්වීමට නොයෙක් බාධා පැවති එවන් යුගයක ග්‍රන්ථකරණය මගින් දහම බෙදා හැරීමේ වැදගත්කම දුටු වාස් පියතුමා එම කාර්යය ගොන්සාල්වෙස් පියතුමාට බාර කළේ ය. එම කාර්යය විශිෂ්ට ලෙස ඉටු කළ ගොන්සාල්වෙස් පියතුමා දේශිය කතෝලික සාහිත්‍යයක් නිර්මාණය කළේ අති ප්‍රශංසනීය අයුරිනි. මෙතුමා එකල ලක්දිව භාෂා වූ සිංහල, දෙමළ, පෘතුගිසි හ ඕලන්ද යන භාෂා 4 න් ම පොත් ලිවී ය. තත්කාලීන වාර්තාවලින්

හෙළිවන පරිදි ගොන්සාල්වෙස් පියතුමා අතින් ලියැවුණු පොත් 44 න් 22ක් හෙළ බසින් ද 15 ක් දෙමළෙන් ද, 6 ක් පෘතුගීසි භාෂාවෙන් ද, 1 ක් ඕලන්ද භාෂාවෙන් ද විය. එතුමාගේ පොත් ලිවීමේ අරමුණ වූයේ අනෙකක් නොව ලංකා කතෝලිකයන්ට ආගම පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීම ය. එහෙත් එම පොත්වල සාහිත්‍ය රසයේ ඌනතාවයක් දක්නට නැත. එතුමාගේ පොත්වල මූලික අරමුණ දහම ප්‍රගුණ කරවීම නිසා ඒවායේ ශුද්ධවූ ලියවිල්ල, දේව ධර්ම ශාස්ත්‍රය, ශුද්ධවන්තයන්ගේ චරිත, ක්‍රිස්තියානි වන්දනාව, ක්‍රිස්තු චරිතය, වාද විවාද යන විෂයයන් ගැබ් වී තිබුණ බව පෙනේ. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමන් ලියූ ගද්‍ය පද්‍ය පොත්වල නම් කිහිපයක් පහත පළ වේ.

| | | |
|---|---|---|
| 1. දේව වේද පුරාණය | - | දේව දහම පිළිබඳ කවි |
| 2. දේව නීති විසර්ජනය | - | ලෝක අවසානය හා විනිශ්චය ගැන කවි |
| 3. වේද කාව්‍යය | - | දේව සත්‍යතාවන් පිළිබඳ කවි |
| 4. මංගල ගීතය | - | ප්‍රශංසා ගී මාලාවක් |
| 5. පසන් පොත | - | චතාරික කාලයේ ගයන දුක් ගීත |
| 6. දේව වේද සංකෝපය | - | වේද සත්‍යතා පිළිබඳ කවි |
| 7. ඥානාංජනය | - | සරල කවි සංග්‍රහයක් |
| 8. සුකෘත දර්පනය | - | වාචික සිංහල ගද්‍යයක් |
| 9. ප්‍රාතිහාර්යාවලිය | - | ප්‍රාතිහාර්ය සම්බන්ධ විස්තර |
| 10. දුක්ඛප්‍රාප්ති ප්‍රසංගය | - | දුක් ගායනයක්, ජේසු තුමන්ගේ දුක් ප්‍රාප්තිය හා දේශනා නවය. |
| 11. අඥාන ඖෂධය | - | වාද විවාද මිථ්‍යා දෘෂ්ටිය ගැන කරුණු පහදා දීම |
| 12. සුවිශේෂ විසර්ජනය | - | ගායන සංග්‍රහයක්. |

**දක්ෂ සංගීතඥයකි.**

ගොන්සාල්වෙස් පියතුමා සංගීත ශාස්ත්‍රයත් තූර්ය වාදනයත් මැනවින් දත් කලා රසිකයෙකි. අපරට මුහුදු බඩ ජනතාව සංගීතය ප්‍රිය කළ නිසාත් දේව වන්දනාවට සංගීතය උපයෝගී වන නිසාත් එතුමෝ පෙරදිග සංගීතයට අනුව නව ගීතිකා ප්‍රබන්ධ කළ හ. එතුමාගේ සංගීත කෘති අඩංගු පොත මංගල ගීතය ලෙස හැඳින්වේ. මංගල අවමංගල අවස්ථාවලට ගැලපෙන ගීත එකතු කොට ආනන්ද කලිප්පුව නමින් පොතක් ප්‍රබන්ධ කළේ ය. තව ද ජේසු තුමාගේ දුක්ප්‍රාප්තිය ඇසුරින් සකස් කළ පසන් පොත චාතාරිකයේ ගැයීමට භාවිත කරන දුක් ගීත එකතුවකි. මෙම පොත්වල අඩංගු කරුණු ඇසුරින් කිතුනු කාව්‍ය, භක්ති ගී, සිලෝ, විරිඳු, නිර්මාණයට කතෝලිකයෝ උනන්දු වූහ. එනම් ධර්මදූතවරුන්ගේ ප්‍රයෝජනය සඳහා ශබ්ද කෝෂ 4 ක් ද එතුමෝ සකස් කළ හ.

1. පෘතුගීසි - සිංහල
2. සිංහල - පෘතුගීසි
3. විශේෂ ද්‍රවිඩ වාක්‍ය විස්තර හා පෘතුගීසි
4. දෙමළ - සිංහල

කිතුනු දේශීය සාහිත්‍යයේ ද නාට්‍ය කලාවේ ද විශිෂ්ඨ මෙහෙවරකට තම අගනා දිවිය කැප කළ ගොන්සාල්වෙස් පියතුමා බෝලවත්ත මීසම් ගෘහයේ දී 1742 ජූලි 17 වන ස්වර්ගස්ථ වූහ.

**(ආ) කතෝලික නාට්‍ය කලාව**

සදාචාරයට පටහැනි නොවන නාට්‍ය රඟ දැක්වීමට ක්‍රිස්තු ශාසනය නිතර අනුබල දුන් බව ඉතිහාසයෙන් පෙනේ. දෘෂ්‍ය කාව්‍යයේ මූලික අංග දෙකක්වන දෙබස හා නිරූපණය කතෝලික වන්දනා චාරිත්‍රවලද දක්නට ඇත. දිව්‍ය පූජාව ඊට නිදසුනකි. ප්‍රධාන මංගල්‍යයන් පවත්වන අවස්ථාවල එම මංගල්‍යවලට අදාළ ක්‍රිස්තු ජීවිත පුවත් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම එකල සිරිතක් විය. මේ අනුව ක්‍රිස්තියානි දෘෂ්‍ය කාව්‍ය සිංහලයෙන් හා දෙමළෙන් රඟ දැක්වීමට ධර්මදූතවරු අනුබල දුන් හ. ඒ සඳහා එකතු වී දේව මන්දිර අසල රංග ශාලා ද ඉදි කළ හ.

ප්‍රතිකාල් සමයේ නොයෙක් පල්ලිවල හා විද්‍යා ආයතනවල ක්‍රිස්තියානි නාට්‍ය රඟ දැක්වූයේ යැයි සමකාලීන පොත පත සඳහන් කර තිබේ. 1617 දී හලාවත අභිනව දේවස්ථානය ආශිර්වාද කිරීමේ දී කුස්තන්තීනු අගරජ තුමාගේ සිත් හැරීම පිළිබඳ නාට්‍යයක් රඟපාන ලද බව ඓතිහාසික ලේඛන වල සඳහන් වේ.

අන්තෝනියෝ පෙෂෙන්ටෝ, මාතර පළාතේ ධර්ම සේවයේ නිරතව සිටි උගත් සිල්වත් ප්‍රැන්සිස්කාන තාපසයකු විය. මෙතුමා සිංහල නාට්‍යයට නව උදාවක් ලබා දුණි. ක්‍රි.ව. 1636 ලියැවුනු ඉතිහාස පොතක මෙතුමා ක්‍රිස්තු ධර්මය ඇසුරින් විවිධ නාට්‍යයන් නිර්මාණය කළ බවත් ඒවා නැරඹීමට කිතුනු නො කිතුනු දෙපක්ෂයම පැමිණි බවත්. ඔවුන් ඒවායින් අපූර්ව වින්දනයක් ලබා ගත් බවත් සමහරුන් ප්‍රසාද ස්නාපනය ලබා ගත් බවත් සඳහන් වේ. ලන්දේසී පීඩන සමයේ දී පෘතුගීසි ධර්මදූතවරුන් විසින් රචිත සිංහල දෙමළ දහම් පොත හා සාහිත්‍ය රචනා සියල්ල ගිනි බත් විය.

### 6.1.7 ලන්දේසීන්ගේ ආගමික හා අධ්‍යාපන කටයුතු

ලන්දේසීන්ගේ ආගම වූයේ යුරෝපයේ පැවති කැල්වින් වාදී රෙපරමාදු ධර්මයයි. මෙය බිහිවූයේ 16 වන සියවසේ මුල් භාගයේ දී යුරෝපයේ සිදු වූ ආගම් විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙනි. ජොන් කැල්වින්ගේ ආගමික න්‍යාය තුළින් ආභාෂය ලැබූ මෙම ආගම කතෝලික සභාවෙන් වෙන් වී ස්වාධීන ජාතික ආගමක් ලෙස ඕලන්දයේ මුල් බැස ගත්තේ ය. එම නිසා යුරෝපය තුළ කතෝලිකයන් හා රෙපරමාදු භක්තිකයන් අතර විවිධ මතභේද හට ගැනුණි. ලංකාවට පැමිණි ලන්දේසීහු ඔවුන්ගේ ආගම මෙරට වැසියන් අතර ප්‍රචාරය කිරීමට අධ්‍යාපනය සම්පූර්ණයෙන් ම උපයෝගී කර ගත්හ.

ලන්දේසීහු රෙපරමාදු දහම මෙරට ප්‍රචාරය කිරීම සඳහා පෘතුගීසින්ට වඩා සංවිධානාත්මක ලෙස අධ්‍යාපනය උපයෝගි කරගත් බව පෙනේ. ඔවුන්ගේ අධ්‍යාපන පද්ධතිය ඕලන්ද රෙපරමාදු දහම මත කේන්ද්‍ර වූවකි. ලන්දේසී පූජකවරුන් ද රජයේ සේවකයෝ වූහ. අධ්‍යාපන කටයුතුවල දී ඔවුන් සම්පූර්ණයෙන්ම රජයට වගකිව යුතු විය. ඔවුන් රජයෙන් නියමිත වැටුපක් ලබා ගත් නිසා රජයේ නීති රීති අනුව ක්‍රියා කරන්නට සිදුවිය. ලන්දේසී රජය ද අධ්‍යාපන කටයුතුවලට නිතර මැදිහත් වි ක්‍රියා කළේ ය.

මේ අනුව ආගම ඉගැන්වීමේ මූලික කේන්ද්‍රය කර ගත්තේ පාසල යි. තමන් යටත් කරගත් මුහුදු බඩ ප්‍රදේශවල සංවිධානාත්මක ලෙස පාසල් පිහිටු වූහ. මේවා 'පැරිෂ් පාසල්' නමින් හැඳින් වූහ. එම ප්‍රාථමික පාසල්වල ප්‍රධාන විෂයය වූයේ රෙපරමාදු ආගමයි. ඊට අමතරව කියවීම, ලිවීම, ගණිතය, ගායනය යන විෂයයන් ද ඉගැන්වූ හ. එම පාසල්වල පාලනය සඳහා ලන්දේසී පූජකවරුන් ද පත් කර ගත් හ. ඔවුන් යටතේ ගිහි ගුරුවරු හා උපදේශකයෝ ද සේවය කළ හ. ''කතිකීසීස්'' නම් ගුරුවරයෙකුට හැම පාසලකටම ආගම ඉගැන්වීමට බාර දුන්නේ ය.

ලන්දේසී පාසල්වල භාරකරුවන් වූයේ රෙපරමාදු පූජකවරුන් ය. පාසල් ප්‍රධානීන් වූ ඔව්හු තම සහයට ගිහි ගුරුවරු පත්කර ගත්හ. ඔවුන්ව හැඳින්වූයේ ''පල්ලියේ ගුරුන්නාන්සේ'' නමිනි.

පාසල් පාලනයට අමතරව පාසල් ප්‍රධානීන්ට තෝම්බු තබා ගැනීම ද භාර විය. එමගින් රෙපරමාදු වත් පිළිවෙත් අනුව විවාහ වී තිබේ ද? රෙපරමාදු බෞතිස්මය ලබා තිබේ ද යන කරුණු ලේඛන ගත කිරීමට සිදු විය. දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමේ දි රෙපරමාදු පිළිවෙත් අනුව බෞතිස්ම කර තිබේදැයි දැන ගැනීමට විදුහල් ප්‍රධානීන්ට අවකාශ තිබිණි

අධ්‍යාපනය සම්බන්ධව ලන්දේසීන් පැනවූ පහත සඳහන් නීති මගින් ලංකාවේ ඔවුන් සතුවූ ප්‍රදේශවල අධ්‍යාපනය තමන්ගේ ධර්මය ව්‍යාප්ත කිරීම සඳහා යොදා ගත් ආකාරය වඩාත් පැහැදිලි වේ.

- ❖ සියලුම ලන්දේසි පළාත්වල විසූ දරුවන්ට මූලික අධ්‍යාපනය සඳහා ලන්දේසි රෙපරමාදු පාසල්වලට යැවීමට අණ කිරීම.
- ❖ එම පාසල්වල ලන්දේසි රෙපරමාදු ආගම පමණක් සියලුම දරුවන්ට ඉගැන්වීමට නියම කිරීම හා වෙනත් ආගම් ඉගැන්වීම තහනම් කිරීම.

- ❖ ලන්දේසි පාසල්වල අධ්‍යාපනයක් ලැබීමට රෙපරමාදු පිළිවෙත් අනුව බෞතිස්ම ලැබීම අනිවාර්ය කිරීම.
- ❖ පාසල් ප්‍රධානීන්ට තෝම්බු ලබා ගැනීමට නියම කිරීමෙන් තම දරුවන්ගේ දෙමාපියන්ගේ වතගොත සොයා ගැනීමට උපක්‍රම යෙදීම.
- ❖ කතෝලික ධර්මය ඉගැන්වූ ද එම පිළිවෙත් පැවැත්වූද කතෝලික මිෂනාරිවරුන් ලන්දේසි පළාත් වලින් පිටුවහල් කිරීම.
- ❖ කතෝලිකයන් සතු වූ දෙව් මැඳුරු සහ පාසල් ඕලන්ද රෙපරමාදු සභාවට පවරා ගැනීම.
- ❖ කතෝලික වත් පිළිවෙත් ප්‍රසිද්ධියේ පැවැත්වීම හෝ ඉගැන්වීම තහනම් කිරීම.
- ❖ ලන්දේසි රෙපරමාදු ධර්මය වැළඳගත් අයට පමණක් රජයේ විශේෂ සැලකිලි ලබා දීම

ලන්දේසීහු අධ්‍යාපන කටයුතු මනා ලෙස පාලනය කිරීම සඳහාත් ලංකාවේ සියලුම අධ්‍යාපන ආයතන පාලනය කිරීම සඳහාත් Scholarchal Commision නමැති පාසල් මණ්ඩලයක් පිහිටුවා ගත්හ. මීට අනුබද්ධ පාසල් මණ්ඩල 3 ක් කොළඹ යාපනය සහ ගාල්ල යන නගරවල පිහිටු වූහ.

එක් එක් ප්‍රදේශ බාර දිසානායක, පාසල් මණ්ඩලයේ සභාපති වූ අතර එහි අනිකුත් සාමාජිකයන් වශයෙන් රෙපරමාදු පූජකවරුන් සහ පරිපාලකයින් කීප දෙනෙක් රජය විසින් පත් කරන ලදී. මෙම මණ්ඩල, පාසල් කටයුතු පිළිබඳව සම්පූර්ණයෙන්ම රජයට වගකිව යුතු ය. උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් ලන්දේසින් ගත් පියවරයන් අතර සෙමනේරි නැතහොත් දෙව්සත්හල් ඇරඹීම වැදගත් වේ.

දෙව් සත්හල්වලින් සිදු වූ සේවා කිහිපයක් පහත දැක්වේ.

1. ශ්‍රී ලාංකික ගුරුවරුන් මගින් ආගම ඉගැන්වීමේ ස්ථාවරයක් ඇති වීම.
2. ලිපිකරු, තෝල්ක ආදි රජයේ තනතුරු සඳහා නිලධාරින් බිහි වීම.
3. ශුද්ධ ලියවිලි පරිවර්තනය, පිටපත් සකස් කිරීම වෙනත් ලියවිලි හා ප්‍රකාශන දේශීය භාෂාවලින් සකස් කිරීම.

## ලන්දේසි පාලනයෙන් ශ්‍රී ලංකාවට උරුම වූ සංස්කෘතික දායාද

### 1. ලන්දේසි රෙප්‍රමාදු ආගම නිසා ඇති වු සමාජීය පරිවර්තනය

එතෙක් ලංකාවේ බහුතර පක්ෂයේ ආගම වුයේ බුද්ධාගම හා හින්දු ආගම යි. ආර්ථික වාසි හෝ තාන්න මාන්න ලෝභයෙන් හෝ වේවා බොහෝ රට වැසියෝ රෙපරමාදු ආගම වැළඳ ගත්හ. මේ අනුව මේ යුගයේ දී රට වැසියෝ ආගම් 4 කට අයත් වුහ. එනම් බුද්ධාගම, හින්දු ආගම, කතෝලික ආගම හා රෙපරමාදු ආගම වශයෙනි.

### 2. රෝම ලන්දේසි නීතිය, තේසවලමෙයි නීතිය

මේ යුගයේ දී ලාංකික සමාජය, ශිෂ්ට සම්පන්න සමාජයක් වීමටත් විනය ගරුක ජනතාවක් බිහි කිරීමටත් ඉහත සඳහන් නීති උපකාර විය. පෞද්ගලික ආරක්ෂාවත් සාමයත් ආරක්ෂා කර ගැනීමට සිංහලයන්ට මාර්ගයක් සැලසූයේ රෝමානු ලන්දේසි නීති සම්ප්‍රදායයි. ජනතාවට යුක්තිය අයුක්තිය විසඳා ගැනීමේ හා මානුෂිය අයිතාවාසිකම් රැක ගැනිමේ හැකියාව මෙයින් උදා විය.

### 3. විවාහයේ ස්ථාවරත්වය

විවාහය පිළිබඳ පෘතුගීසි ධර්මදූතවරුන් දැරූ උසස් ආකල්පය ලන්දේසි දේවගැතිවරු වඩාත් තහවුරු කළ හ. විවාහය ලියාපදිංචි කිරීම, උපත ලේඛන ගත කිරීම, බෞතිස්ම සහතික දානය කිරීම යනාදි නීතිරීති පසු කාලයේ පවා ලංකා සමාජයට බොහෝ සෙයින් උපකාර විය. බහු භාර්යා සේවනය රටේ

සම්ප්‍රදායක් ලෙස පිළිගැනුණ එදා සමාජයට ලන්දේසි නීතිය නිසා ඉදිරිපත් වූ එක පති පතිනි විවාහය පිළිබඳ ස්ථිර ප්‍රකාශය විවාහයේ ස්ථිරත්වය සහ උතුම්කම තහවුරු කිරීමට පදනමක් විය.

### 4. ශුද්ධවූ බයිබලය පරිවර්තනය කිරීම. (1739)

මේ නිසා ශුද්ධ බයිබලය දේශීය භාෂාවෙන් හැදෑරීමට ලොකු කුඩා කාටත් හැකි විය.

### 5. මුද්‍රණ ශිල්පය ප්‍රථම වරට ලංකාවට හඳුන්වා දීම

ප්‍රථම වරට සිංහල භාෂාවෙන් මුද්‍රණය කරන ලද්දේ ශුද්ධ බයිබලයේ කොටස් ය. පසුව පොත්පත් මුද්‍රණය කිරීමත් සමග අධ්‍යාපන කටයුතු වර්ධනය වීමට මඟ පෑදිණි. සිංහල දෙමළ පොත පත සුලභ වීම සමග පාසල්වල දරුවන්ගේ ඉගෙනීමේ අවස්ථා වඩ වඩා පුළුල් විය.

### 6. සිංහල හා දෙමළ ක්‍රිස්තියානි සාහිත්‍යය

මේ නිසා සිංහල හා දෙමළ සාහිත්‍යයේ පෝෂණයක් ඇති විය. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාගේ කෘතීන් මීට නිදසුනකි. පෙර අපර දෙදිග ආගම්වල ඇති දර්ශන වාද , සමාජ පෙරළියට අදත් තුඩු දෙයි.

### 7. ගෘහ නිර්මාණ ශිල්පය

උළු පියසිද, ඉතා පුළුල් ඉස්තෝප්පුද විශාල ජනෙල් දොරවල් සහිත ගෘහ නිර්මාණ ශිල්පය ලන්දේසින්ගෙන් අප ලැබූ වටිනා දායාද වෙති. වීදුරු හා පිඟන් බඩු පාවිච්චිය, ඇඳුම් පැළඳුම් හා ආභරණ මෝස්තර පිළියෙල කිරීමේ ක්‍රම ද සමාජයට ඇබ්බැහි විය. මොරටු ලී බඩු ක්‍රමය ද ආරම්භ කරන ලද්දේ ලන්දේසීන් විසිනි.

## 6.2 බ්‍රිතාන්‍ය යුගය (1796-1948)

### 6.2.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යුගයේ ආරම්භය

වෙළෙඳාමේ දක්ෂයන් වූ ඉංග්‍රීසිහු ක්‍රි.ව. 1600 වන විට ඉන්දියාවේ මදුරාසිය, කල්කටාව නගරවල වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවා ගත්හ. ප්‍රංශ මහා විප්ලවය හේතුවෙන් ඕලන්දයේ තත්ත්වය අසීරු විය. යුද්ධ කරදර නිසාම එම රටේ නායකයා එංගලන්තයේ රැකවරණය සොයා ගියෙන් ලන්දේසි විජිතයන් බ්‍රිතාන්‍යයට පවරා දීමේ ලිපියක් යවන්නට සිදු විය. ලංකාවේ සිටි ලන්දේසි පාලකයා එම නියෝගය ප්‍රතික්ෂේප කළේ ය. එහි ප්‍රතිඵලය වූයේ 1795 දී ඉංග්‍රීසින් ත්‍රිකුණාමලයට පහර දී එහි ලන්දේසි බලකොටු අල්ලා ගැනීමයි. ඉන් අනතුරුව 1796 දී ලන්දේසි බලය බිඳ වැටිණි. මෙහි ලන්දේසින්ට යටත්ව තිබූ පෙදෙස් බ්‍රිතාන්‍යයන්ට පවරන ලදි.

මෙසේ 1796 සිට ඉංග්‍රීසිහු පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට අයත්වූ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ සියල්ලක්ම 1802 දී එංගලන්ත රජුගේ පාලනයට බාර ගන්නා ලදී. ක්‍රි. ව. 1815 වන විට මුළු ශ්‍රී ලංකාවේ ම පාලනය අයිතිය බ්‍රිතාන්‍යයන් සතු විය.

### පූර්ණ ආගමික නිදහස ලැබීම

ක්‍රි.ව. 1799 සැප්තැම්බර් 23 වෙනිදා ශ්‍රී ලංකා වාසින්ට තමන් කැමති ආගමක් ඇදහීමේ නිදහස ඉංග්‍රීසි ආණ්ඩුකාරයා විසින් ලබා දෙන ලදී. 1806 මැයි 27 වෙනිදා තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා විසින් ඉහත කී ''ආගම ඇදහිමේ නිදහස'' නිල නිවේදනයක් මගින් නීතිගත කරන ලදි. එය ''මැග්ණාකාර්ටා'' නමින් හැඳින් වේ. එයින් පසුව ලන්දේසින් විසින් ආගම ඇදහීම සම්බන්ධයෙන් කතෝලිකයන්ට පනවා තිබූ සියලුම නීතිරීති අහෝසි කරනු ලැබීය.
පූර්ණ ආගමික නිදහස ලැබීමත් සමගම කතෝලික සභාවට උරුම වූ අයිතිවාසිකම් පහත දැක්වේ.

- තමන් කතෝලිකයන් යන නාමය නො බියව ප්‍රකාශ කිරීමේ අයිතිය

- තම දහම ප්‍රසිද්ධියේ ඇදහීමේ හැකියාව
- තම දරුවන්ට කතෝලික දේවස්ථානවල බෞතිස්මය ලබා දීමේ හැකියාව
- කතෝලික දේවස්ථානවල කෙරෙන විවාහ වලංගු වීම.
- රජයේ වරප්‍රසාද හා රැකියා ලබා ගැනීමට කතෝලික ආගම බාධාවක් නො වීම.
- දහම් සේවාව සඳහා විදේශ මිෂනාරීවරුන් යළිත් කැඳවා ගත හැකි වීම.

1815 මාර්තු 02 දින ඉංග්‍රීසි හා මහනුවර පාලකයන් අතර ඇතිවූ ගිවිසුමේ 5 වන වගන්තිය මෙසේ ය. '' මෙකී රටවල මුලාදෑනින් හා වැසියන් විසිනුත් අදහන්නා වූ බුද්ධ ශාසනය ද, දේවාගම ද කඩ නොවී පැවතිය යුතු ය. එහි කටයුතු ද, විහාරස්ථාන හා දේවාල ද පවත්වන්නට හා ආරක්ෂා කරන්නට ඕනෑ ය'' (මහනුවර ගිවිසුම වගන්ති 5)

### 6.2.2 බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ශ්‍රී ලංකාවට පැමිණි විවිධ මිෂනාරී කණ්ඩායම් හා පැවිදි පූජක නිකායයන්

ඉන්දීය ඔරතෝරියාන නිකායට අයත් පියවරු ක්‍රි.ව. 1834 පමණ වනතුරු ලංකාවේ ධර්මදූත කටයුතුවල නිරත වූහ. එහෙත් 1851 දී ඉන්දියාවේ ඔරතෝරියාන නිකාය විසුරුවා හැරීමත් සමග එම ධර්මදූතයින් ශ්‍රී ලංකාවට පැමිණීම නැවතුනී. මේ නිසා ලක්දිව දහම් සේවයට යුරෝපයෙන් ධර්මදූතවරුන් කැඳවීමේ අවශ්‍යතාවය ඇති විය. මුලින් ම යුරෝපයේ සිට මෙහි පැමිණියේ ඉතාලියේ ඔරතෝරියාන පියවරුන් පිරිසකි. ඔරතෝරියාන නිකායික බැටකිනි පියතුමා මෙරට උතුරු ප්‍රදේශයේ වැඩ බාර ගත්තේ ය. 1847 දී ඔබ්ලේට් පියවරු කීපදෙනෙක් ද ශ්‍රී ලංකාවට පැමිණිය හ. ඉන්පසු බෙනදිකාන පියවරු පැමිණිය හ. මෙසේ පැමිණි සියලු දෙනාම යුරෝපීය ජාතික මිෂනාරීවරුන්වූ නිසා ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ දේශිය ස්වරූපය මැකී නැවත බටහිර ස්වරූපය මතු විය.

මේ යුගයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු සඳහා එංගලන්ත සභාවට අයත් මිෂනාරිවරුන් ද මෙහි පැමිණිය හ. එම කණ්ඩායම්වල නම් පහත දැක්වේ.

| | |
|---|---|
| ✵ ලන්ඩන් මිෂනාරී සමාගම | 1805 |
| ✵ බැප්ටිස්ට් මිෂනාරී සමාගම | 1812 |
| ✵ වෙස්ලියන් ක්‍රිස්තියානි නිකාය | 1814 |
| ✵ ඇමරිකන් මිෂනාරී කණ්ඩායම | 1816 |
| ✵ සභා ධර්මදූත කණ්ඩායම | 1818 |
| ✵ ගැළවීමේ හමුදාව | 1833 |

**පැවිදි පූජක කණ්ඩායම්**

- ප්‍රංශයේ මරිය ගැතිවරු (O.M.I)
- ඉතාලියේ සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන තාපස පියවරු (O.S.B)
- බෙල්ජියමේ ජේසු නිකායික පියවරු (S.J)
- දිව්‍ය ගැළවුම්කරුවාණන්ගේ නිකාය (C.S.S. R )

**පැවිදි සොහොයුරන්ගේ කණ්ඩායම්**

- මාරිස්ට් සොහොයුරන්
- ද ලාසාල් සොහොයුරන්
- ප්‍රැන්සිස්කන් සොයුරු නිකාය

- ශාන්ත ජෝශප් සොයුරු නිකාය

**පැවිදිවරියන්ගේ සංඝ**

- ශුද්ධවූ පවුලේ පැවිදි සංඝය
- යහපත් එඬේරාගේ පැවිදි සංඝය
- අපෝස්තලික කාර්මෙල් සොයුරියෝ
- ප්‍රැන්සිස්කන් සොයුරියෝ
- දිව්‍ය සංරක්ෂණ නිකායේ සොහොයුරියෝ
- දයාවේ සොහොයුරියෝ
- දෙමිනිකාන සොහොයුරියෝ
- සදා සරණ නිකායේ සොයුරියෝ
- රොසේරියාන සොයුරියෝ

**ස්වදේශිය පැවිදි නිකායන්**

- සුරදූතික නිකාය
- භාග්‍යවත් ජුසේවාස් පියතුමාගේ නමින් වු නිකාය
- ප්‍රැන්සිස් සේවියර් තුමාගේ නමින් වු නිකාය

### 6.2.3 ආගමික නිදහස තුළ දහමට කැපවූවන් මගින් සිදු වූ සේවය

බ්‍රිතාන්‍යයන් යටතේ පැවති ආගමික නිදහස තුළ විවිධ විදේශිය පූජක පැවිදි කණ්ඩායම් ශ්‍රී ලංකාවේ දහම් සේවය කරා ඇදෙන්නට වුහ. එපමණක් නොව දේශිය පැවිදි හා පූජක පුහුණු මධ්‍යස්ථාන රට පුරා බිහි වීම ශ්‍රී ලංකාවට ලැබුණු ආශිර්වාදයකි. ඔවුන්ගෙන් ආගමික වශයෙන් පමණක් නොව, සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වශයෙන් ද රටට විශාල සේවයක් සිදු වූ බව නො රහසකි.

දේශිය හා විදේශීය ධර්මදූතයන්ගේ කැප වූ සේවාව නිසා දිවයින පුරා ධර්ම ප්‍රචාර කටයුතු ව්‍යාප්ත විය. තම දූත මෙහෙවර ඉටු කිරීමේ දී පහත සඳහන් ලක්ෂණයන් ඔවුන් තුළ විද්‍යාමාන විය.

- දේශියකරණය සඳහා කිතුනු සභාව මෙහෙයවීමට ඇප කැප වී වැඩ කිරීම.
- ජනතා ප්‍රශ්නවලට සංවේදී වෙමින් පොදු ජන අයිතිවාසිකම් රැක දීමට භේද නොතකා ඉදිරිපත් වීම.
- දරුවන් යහමග ගැන්වීමෙහි අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධ ව්‍යාපෘති දියත් කිරීම. ඒ සඳහා විවිධ වගකීම් දැරීම.

**මෙම යුගයේ පැවිදි පූජක අංශ මගින් දියත් කළ සේවා සමහරක්**

- ආධාර ලබන පාසල් ක්‍රමය රජයට යෝජනා කිරීම.
  මෙරටට පාලකයන් වූ ඉංග්‍රීසි රජය ඉංග්‍රිසි භාෂාවට විශේෂ තැනක් දෙමින් ක්‍රියාකරන විට ගරු බොන්ජන් පියතුමා මෙරටේ මව් භාෂාව දියුණු කිරීමේ වැදගත්කම පෙන්වා දුන්නේ ය. ඉංග්‍රිසි භාෂාව සමග දේශිය භාෂා ඇතුළත් වූ ද්විභාෂා අධ්‍යාපනය එතුමා රජයට යෝජනා කළේ ය. එම යෝජනාව ඉංග්‍රීසි රජය පිළිගත් අතර 1961 පාසල් රජයට ගන්නා තුරුම එම ක්‍රමය ක්‍රියාත්මක විය.
- ගම්බද පාසල් මෙන්ම කිතුනු අධ්‍යාපනය ව්‍යප්ත කිරීම සඳහා ලංකාවේ ප්‍රධාන නගරවල ඉංග්‍රීසි පාසල් විවෘත කිරීම සඳහා පුරෝගාමී වු නිකායන් නම් නිමල මරිය නිකාය, බෙනඩිකාන

නිකාය හා ජේසු නිකාය යි. මීට අමතරව රෙපරමාදු කිතුනු සභා මගින් පාලනය කළ ඉංග්‍රිසි විදුහල් ද තිබිණි.

❖ කිතුනු ලේඛන කලාව මගින් අධ්‍යාපනය නැංවීම.

**කිතු දහම ව්‍යප්තිය සඳහා මෙන්ම අධ්‍යාපනය නැංවීම සඳහා ද අගනා සේවා රැසක් කළ කිතුනු විද්වතුන් කිහිප දෙනෙක් පිළිබඳ කෙටි විස්තර පහත පළ වේ.**

**එම්. ජේ. ලෙගොක් පියතුමා**

නිමල මරිය නිකායට අයත් මෙතුමා ප්‍රංශ ජාතිකයෙකි. කෘෂිකර්මය හා උද්භිද විද්‍යාව පිළිබඳ විශාරදයකු වු මෙතුමා ප්‍රථම වරට විද්‍යා ග්‍රන්ථයක් සිංහලයෙන් සම්පාදනය කළේ ය.

**එස්. ජී. පෙරේරා පියතුමා**

ජේසු නිකායට අයත් මෙතුමා ශ්‍රේෂ්ඨ ඉතිහාසඥයකි. ශ්‍රී ලංකාවේ පෘතුගීසි පාලනයේ සිට ඉංග්‍රීසි පාලන යුගය දක්වා අගනා ඉතිහාස පොත් රාශියක් රචනාකර ඇත.

**තියඩෝර් ජී. පෙරේරා දේවගැති තුමා**

එංගලන්ත සභාවේ පූජකවරයෙක් වු මෙතුමා සිංහල භාෂාව හා ව්‍යාකරණය පිළිබඳ විද්වතෙකි. සිංහල ව්‍යාකරණය පිළිබඳ පොතක් මෙතුමා අතින් සම්පාදනය විය.

**පීටර් පිල්ලේ පියතුමා**

කතෝලික සභාවේ නිමල මරිය නිකායට අයත් පියතුමෙකි. අධ්‍යාපනය පිළිබඳ විශේෂඥයකි.

**ඥානප්‍රකාශරි පියතුමා**

නිමල මරිය නිකායට අයත් මෙතුමා ද්‍රවිඩ භාෂාව, ඉතිහාසය පිළිබඳ විශේෂඥයකි. ද්‍රවිඩ භාෂාවෙන් පොත්පත් රැසක් රචනා කළේ ය.

**ෂූනවෙල් පියතුමා**

නිමල මරිය නිකායට අයත් වූ මෙතුමා ප්‍රංශ ජාතිකයකි. අවුරුදු 71 ලංකාවේ සේවයකර සිංහලයෙන් ග්‍රන්ථ 15 ක් රචනා කළේ ය.

**කාන්තා අධ්‍යාපනය සඳහා මුල් පියවර ගැනීම.**

ඉංග්‍රිසි යුගය ආරම්භයේ දී ම මේ සඳහා අවධානය යොමු කළේ බැප්ටිස්ට් මිෂනාරී නිකායයි. ඉන්පසු මෙතෝදිස්ත නිකාය ද චර්ච් මිෂනාරි සමාගම ද ක්‍රියා කළේ ය. ඉන්පසු කතෝලික සභාව ද මේ සඳහා උනන්දු විය. කාන්තා අධ්‍යාපනය නංවාලීමට උරදුන් නිකායන් දෙකක් නම්, ශුද්ධවු පවුලේ නිකාය සහ යහපත් එඬේරාගේ නිකා ය.

## 6.2.4 කිතුනු සභාවේ දේශානුරූපිකරණය

කිතුනු සභාවේ දේශානුරූපී වීම යනු දේශීය සංස්කෘත හරයන් හා වටිනාකම් තුළ සුබාරංචිය ද, කිතුනු වත් පිළිවෙත් ද ජනවන්දනා ක්‍රම ද අර්ථවත් ලෙස සකස්කර ගැනීමයි. ක්‍රි.ව. 1962- 1965 දක්වා පැවති දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රතිඵලයක් වශයෙන් ලක්දිව කිතුනු සසුන දේශානුරූපි වීමකට යොමු විය. සභාවේ විදේශිය ස්වරූපය වෙනස්කොට ආසියාතික දේව ධර්ම චින්තනයන්ට නැඹුරුවන්නට විය.

### (අ) කිතුනු සභාවේ දේශානුරූපි වීමේ අරමුණු

- ❖ දේශිය සංස්කෘතිය තුළ සුබාරංචිය වඩා ගැඹුරින් මාංශ ගත කිරීමට එමගින් සුබාරංචිය ප්‍රකාශ කිරීමට හා ව්‍යාප්ත කිරීමට පහසු කිරීම.
- ❖ දේව ජනතාව තුළින් පටු ජාතිවාද ආකල්ප තුරන් කිරීම.
- ❖ දේශය හා ජනතාව තුළ වැඩ වසන, ක්‍රියා කරන දෙවියන් වහන්සේ හඳුනා ගැනීම.

### කිතුනු සභාව කිසිම ජාතියකට හෝ සංස්කෘතියට සීමා නොවේ.

කිතුනු සභාවේ සාමාජිකයන් වීමට ලෝකයේ ඕනෑම රටක වෙසෙන කෙනෙකුට හැකි ය. කිතු දහම එක් ජාතියකට හෝ රටකට හෝ සීමා වී නැත. එහි නිජබිම ආසියාවයි. පසු කාලීනව බටහිර සංස්කෘතිය දහමේ සත්‍යතා තුළ ව්‍යප්ත විය. නැවතත් යටත් විජිත වාදයේ ප්‍රතිඵලයක් වශයෙන් ආසියාවට දායද විය. කිතු දහම සත්‍යතා වෙනස් නො වුවත් එහි ප්‍රකාශනය වත් පිළිවෙත් දේශයෙන් දේශයට වෙනස් වේ. කිතුනු සභාවේ දේශානුරූපි කිරීමට මිෂනාරී නිකායන් කිහිපයක් පුරෝගාමි විය. මේ සඳහා මොවුහු ලන්දේසි යුගයේ සිටම පදනම දැමූ හ.

### (ආ) කිතුනු සභාව දේශානුරූපි කිරීමට පුරෝගාමි වූවෝ

### ඔරතෝරියාන පූජකවරු

ඉන්දියාවේ සිට පැමිණි මෙම පූජකවරු ලංකාවේ පරිසරයට හුරුවෙමින් සරල දිවි පෙවෙතක් ගත කළ හ. දේශිය භාෂාවෙන් මෙන්ම ජාතික සිරිත් විරිත් ද අධ්‍යයනය කළ හ. ජන ජීවිතයට වඩාත් සමීප වෙමින් ජන හදවත් දිනා ගැනීමටත් ලංකාවේ මුල් බැසගෙන තිබූ බුදු දහමෙන් ජනතාව කතෝලික දහමට හරවා ගැනීමට හැකි වූයේත්, ඔවුන් ජනතාව තුළ මාංශ ගත වු නිසා ය. තව ද ඔව්හු දේශිය වත්පිළිවෙත් ජනවන්දනාව සඳහා යොදා ගත්හ. දේශිය සංගීතයට අනුව තැනූ ගීත ආගමික මෙහෙයන් හි දී මෙන් ම ආගම ඉගැන්වීමේදි ද භාවිත කළ හ. මීට ඉහත සඳහන් කළ පරිදි ජුසේවාස් පියතුමා, ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා දේශියකරණයේ ලා මුල් තැනක් ගත් ඔරතෝරියාන පූජකයන් ලෙස හඳුන්වා දිය හැකි ය.

### (ඇ) කිතුනු සභාව දේශානුරූපිවීමේ ප්‍රතිඵල

- ❖ ශ්‍රී ලංකාවේ සංස්කෘතියට ආවේණික වටිනාකම්, ජාතික සිරිත් විරිත් අගය කිරීම.
- ❖ ක්‍රිස්තු වටිනාකම් හා එහි හරයන් මගින් දේශිය සංස්කෘතින් වඩා ඔපවත් වීමට අවස්ථාවක් උදාවීම.
- ❖ ජනවන්දනාව දේශිය ජන ජීවිතයට සමීප කරලමින් අර්ථවත්ව පැවැත්වීමට හැකි වීම.
- ❖ සිංහල දෙමළ ජනතාවට ආවේණික වු හරයන් ඔස්සේ සුබාරංචිය වඩාත් පහසු ලෙස ව්‍යප්ත කිරීමට හැකි වීම.
- ❖ දේශිය පූජක හා පැවිදි පුහුණු ආයතන බිහිවීම. (අම්පිටිය, කළුතර, යාපනය, කොළඹ).
- ❖ කිතුනු ගුරු විදුහල් ආරම්භ කිරීම.
- ❖ සිංහල හා දෙමළ බසින් පොත්පත් සඟරා බිහිවීම.
- ❖ ශුද්ධ බයිබලයේ පොදු සිංහල අනුවාදයක් නිකුත් කිරීම.
- ❖ දේව ධර්මය හා ශුද්ධ බයිබලය දේශිය භාෂාවලින් හැදෑරිය හැකි දේව ධර්ම නිකේතන බිහිවීම, ඒ අනුව සමාන්‍ය ජනතාවට දේව ධර්මය තමන්ගේ භාෂාවලින් හැදෑරීමේ අවස්ථා සැලසීම.
- ❖ කිතුනු සාහිත්‍යයට පමණක් නොව දේශීය සාහිත්‍යයට අතදිය හැකි ලේඛක හා කවි පරපුරක් බිහි වීම.

### 6.2.5 ශ්‍රී ලංකාවට නිදහස ලබා ගැනීම සඳහා කිතුනු දායකත්වය

1802 දී බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වූ ශ්‍රී ලංකාව 1948 පෙබරවාරි මස 4 වන විදේශිය පාලනයෙන් පූර්ණ නිදහස අත්පත් කර ගැනීමට සමත් විය. මෙම නිදහස් සටනේ දී කිතුනු පිරිස් තම රටේ සහෝදර ජනතාව සමග සම්පූර්ණ සහයෝගයෙන් පෙරමුණ ගෙන ක්‍රියා කළ බව නො රහසකි.

ක්‍රි.ව. 1915 දී ඇති වු බෞද්ධ, මුස්ලිම් ගැටුම් මැඩලන්නට රජය ගත් දරුණු පියවර නිසා මාර්ෂල් ලෝ හෙවත් හමුදා නීතිය යටතේ ඊට සම්බන්ධ වු බොහෝ දෙනෙකු මරා දමන ලදී. සිංහල බෞද්ධයනට මෙහිදි කරන ලද අපරාධයනට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට කිතුනුවන් ද පෙරමුණ ගත් හ. මේ සඳහා නායකත්වය ගෙන ක්‍රියා කළේ ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් ය.

මෙරට සිටි ඉංග්‍රිසි ආණ්ඩුකාරයාට විරුද්ධව පිළියෙල කරන ලද මෙම පෙත්සම තම පාවහන් තුළ සඟවා ගෙන ජීවිතය පරදුවට තබා බ්‍රිතාන්‍යයට ගෙන යන ලද්දේ සැදැහැවත් කිතුනුවෙකු වු ඊ.ඩබ්. පෙරේරා මැතිතුමා ය.

වඩා සාධාරණ රජයක් බිහිවීමට තුඩුදුන් 1915 'කැගලු කොමිසම' සාර්ථක කර ගන්නට තමන් සතු සියල්ල පරදුවට තබා සටන් කළ වීරයා සැටියට ඇල්බට් ඒ. වික්‍රමසිංහ මහතා හඳුන්වා දිය හැකි ය. එතුමා ද ශ්‍රේෂ්ඨ කතෝලික බැතිමතෙකි. මුළු දිවයින පුරාම මහත් නින්දිත අපරාධ මෙකල සිදු වුවත් ඒවා ඔප්පු කිරීමට කැගල්ලේ දී පමණක් හැකි වූයේ වික්‍රමසිංහ මහතා ඇතැම් ගම්මුලාදෑනීන්ට දුන් අවවාද නිසා ය. මෙවැනි මරණ පරීක්ෂණ අනුව උඩුව ආරච්චි වැනි අයගේ මරණ සාක්ෂි ඉදිරිපත් කර කැගලු කොමිසමේ චෝදනා ඔප්පු කළ හැකි විය.

නිදහස් සටනේ තීරණාත්මක අවස්ථාවක් වූ කැලණි සැසි වාරයේ එලදායකත්වයට ජේ. ඒ. එල්. කුරේ නැමැති කිතුනු නීතිඥ මහතා දායක විය.
නිදහස් සටන මෙහෙයවීමට උරදුන් ලංකා ජාතික සංගමයේ පළමුවැනි සිංහලයා ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිතුමන් ය. (1919) ජාතික සංගමයේ පළමු සමලේකම් දෙදෙනාගෙන් කෙනෙකු වූ ඊ.ටී. ද සිල්වා බැතිමත් කතෝලිකයෙකි. 1921 වන විට ලංකා ජාතික සංගමයේ එක් ලේකම්වරයෙකු හැර ඉතිරි සියල්ලන් කිතුනුවෝ වූහ.

ලංකා ජාතික සංගමයේ 23 වැනි සැසිවාරයට අති අතුම් එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා ද සහභාගි වූහ. දුම්මලදෙනියේ පැවැත්වූ මෙම සැසිවාරයේ දී මෙරට ගැමි ජනතාවගේ හා කම්කරු ජනතාවගේ ආර්ථිකය සංවිධානය කොට දියුණු කර ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා ද, කම්කරු ජනපද ඇති කිරීම සඳහා ද ලංකා ජාතික ජාතික සංගමයේ ප්‍රතිපත්ති යෝජනා මාලාවක් ඇති කරන ලෙස යෝජනා කළේ කතෝලික නීතිඥ ජේ.ඒ. එල්. කුරේ මහතාණන් විසිනි.

නිදහස් ව්‍යාපාරයේ පුරෝගාමීව ක්‍රීයා කළ තවත් කතෝලිකයන් දෙදෙනෙකි, ඊ. ජේ. සමරවික්‍රම මහතා හා එච්. ඒ. පී. සාන්ද්‍රසාගර මහතා.

කම්කරු සුබසිද්ධිය තුළ ජාතික නිදහස පතා වැයවූයේ ද කිතුනු පිරිසකි. ඔවුන්ගේ නම් පහත පළ වේ.

- එච්. ජේ. සී. පෙරේරා
- ගරු ඩී. ජේ. නිකුලස් පෙරේරා පියතුමා
- දොස්තර ගේබ්‍රියල්
- එෆ්. ආර්. සේනානායක
- පී. වයි වික්‍රමසිංහ
- ඩබ්. ඒ. ද සිල්වා

කතෝලික 'සමාජ සාම' ව්‍යාපාරය තුළ ද නිදහස් සටන මෙහෙය වීම සඳහා ඉදිරිපත් වූ පිරිසකි,
පහත සඳහන් වනුයේ

- ජී. සී. එස්. කොරයා

❖ දොස්තර සී. ජේ. ද සිල්වා
❖ ජේ. ඊ. එල්. කුරේ.

අවම වැටුප් ආඥා පණත ඔවුන් ගෙන ගිය ව්‍යාපාරයේ ප්‍රතිඵලයකි

## නිදහස් යුගය (1948 න් පසු)

### නිදහස් ශ්‍රී ලංකාව තුළ කිතුනු සභාව හැඩගැසුණු අයුරු

1948 ශ්‍රී ලංකාව පූර්ණ දේශපාලන නිදහස ලබා ගැනීමත් සමග සියලුම කිතුනු සභාවලට තම ආගම් කටයුතු නිදහසේ ඉදිරියට ගෙනයාමට අවස්ථාව ලැබිණි. තම දහම අනුව දරුවන්ට අධ්‍යාපනය දීමටත්, මීසම තුළ කිතුනුවන් එක් රැස්කර එම සංසයන් වර්ධනය කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය මිෂනාරිවරුන් ගෙන්වා ගැනීමටත් හැකි විය. එම නිදහස නිසාම සභාවේ ක්‍රියාකාරිත්වයන් දිනෙන් දින වැඩි දියුණු විය.
මෙකල ලංකාවේ සෑම නගරයකම ඉංග්‍රීසි අධ්‍යාපනය දීම සඳහා පාසල් බිහිකර තිබිණි. එම පාසල් කතෝලික හා විවිධ කිතුනු නිකායන්ට අයත් විය. සෑම ගමකම දෙව් මැදුරක් ද දෙව් මැදුර යාබදව පාසල් ද ඉදි කර තිබුණි.

යුරෝපීය රටවලින් පැමිණි කන්‍යා සොහොයුරියෝ රජයේ රෝහල්වල සේවය යෙදී සිටිය හ. ඔවුන්ගේ කාරුණික සේවය එදා කිතුනු නො කිතුනු කවුරුත් අගය කළ හ. පෞද්ගලික ලාභාපේක්ෂාවට වඩා රෝගීන් වෙත දක්වූ හුදු ආදරය නිසාම ඔව්හු මෙම සේවාවේ යෙදුණහ.
රටේ අධ්‍යාපනය වර්ධනය සඳහා පැවිදි පූජක නිකායන් කීපයක් ම ඉදිරිපත් වූහ. ආගමික විනය, විධිමත් ඉගැන්වීම, ඉංග්‍රීසි අධ්‍යාපනය දීම ඔවුන්ගේ අධ්‍යාපනයේ වැදගත් අංශ විය. අධ්‍යාපන පරිපාලනයේ ද පැවිදිවරු හා පැවිදි පූජකවරු නිරත වූ නිසා සාර්ථක පාසල් සංවිධානයක් ඇති කිරීමට හැකි විය.

**මෙම යුගයේ දී සභාව තුළ ක්‍රියාත්මක වූ වෙනත් සේවාවන්**

❖ අනාථ දරුවන් බලා ගැනීමට ළමා නිවාස පිහිටුවා පැවිදිවරු ඒවායේ සේවය කිරීම.
❖ නොමඟ ගිය තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරිම සඳහා ආයතන පිහිටුවා එම කටයුතුවල නිරත වීම.
❖ විධිමත් අධ්‍යාපනයක් නො ලැබූ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුවක් ලබාදීම සඳහා මධ්‍යස්ථාන සංවිධාන කිරීම.
❖ මහල්ලන් රැකබලා ගැනීමටත්, ඔවුන්ගේ ශාරීරික අධ්‍යාත්මික වශයෙන් පෝෂණය කිරීමටත් මහළු නිවාස පිහිටුවා ඒවා නඩත්තු කිරීම.

### 6.3.1 නිදහස් ශ්‍රී ලංකාව තුළ කිතුනු සභාවේ දේශීය නායකත්වය

ක්‍රි. ව. 1962-1965 පැවති දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රතිඵල වශයෙන් ශ්‍රී ලංකා කිතුනු සභාවේ ද නවෝදයක් දක්නට ලැබිණි. ලංකාවේ සියලුම ආගම් සමග සහජීවනයෙන් ක්‍රියා කිරීමට පෙළඹීම සභාව විදේශීය ස්වරූපයෙන් ඈත් වී දේශය තුළ මාංශගත වීමට පෙළඹීම ආදි කරුණු නිසා සභාවට වඩාත් ජාතික සංස්කෘතියට සමීප වීමට හැකි වී ඇත.

එපමණක් නොව දහම ඉගැන්වීමට මෙන්ම පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් ද දේශීය පැවිදි ගිහි කිතුනුවන් ඉදිරිපත් වී ඇත. සමාජ සාධාරණත්වය ගැන උනන්දුවක් දක්වන සංවිධාන බිහි වීමට හේතු වී තිබෙනුයේ ද දෙවන වතිකාන කතිකාව හා වෙනත් විශ්ව ලේඛනවල ප්‍රතිපත්ති වශයෙනි. සමාජ සාමූහික කේන්ද්‍රය, සමාජ හා ආර්ථික සංවර්ධන කේන්ද්‍රය (සෙඩෙක්) ජාතික ක්‍රියාකාරී මණ්ඩලයේ

සංවර්ධන සේවා අංශ ආදිය මීට නිදසුන් වශයෙන් ඉදිරිපත් කළ හැකි ය. ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය හා ක්‍රිස්තියානි කම්කරු සහෝදරත්වය යන ව්‍යාපාර ද මේ අංශයෙන් වැදගත් වේ.

මේ යුගයේ ඉහත දැක්වූ සභා නවෝදයන්ට අනුබල දුන් පුරෝගාමීන් ස්වල්ප දෙනෙකු පිළිබඳ විස්තර පහත දැක්වේ.

### ගරු එඩ්මන්ඩ් පීරිස් රදගුරු තුමා

හලාවත ප්‍රථම රදගුරු තුමා වන මෙතුමා සිංහල භාෂා පඬිවරයෙකි. ලංකා ඉතිහාසය හා ලංකා සභා ඉතිහාසය පිළිබඳ පර්යේෂණාත්මක පොත් රැසක් ලියා ඇත. එතුමා විසින් රචිත ගීත ප්‍රබන්ධ අදත් ජනවන්දනා භාවිතයට ගැනේ. ලංකා සභාව දේශානුරූපී කිරීමට අතදුන් මෙතුමා හෙළබසින් වත් පිළිවෙත් පැවැත්වීම සඳහා මූලික යාච්ඤා පොත් සිංහලෙන් සකස් කළේ ය. මෙතුමා භාෂාවට හා ජාතියට කර ඇති උදාර සේවය සඳහා ශ්‍රී ලංකා රජය විසින් උපහාර දක්වන ලදී. 1989 සැප්තැම්බර් මස 01 දින මෙතුමා ස්වර්ගස්ථ විය.

### ගරු පීටර් පීල්ලේ පියතුමා

කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලයේ හා ඇක්වයිනාස් ආයතනයේ විදුහල්පතිවරයෙකි. සභා නවෝදයට මුල පිරුවේ සමාජ සධාරණත්වය සඳහා පුවත්පත් සඟරා බිහි කිරීමෙනි. ප්‍රවීණ අධ්‍යාපනඥයෙකු වූ මෙතුමා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතුවලදී රජය සමග පෙරමුණ ගෙන ක්‍රියා කළේ ය. කම්කරු අයිතිවාසිකම් පිළිබඳ සභාවේ දැක්ම එතුමා විවෘතව ප්‍රකාශ කළේ ය. 1969 දී එතුමා ස්වර්ගස්ථ විය.

### අති ගරු තෝමස් කුරේ කාදිනල් තුමා

අගරදගුරු පදවියෙන් ද කාර්දිනල් පදවියෙන් ද පිදුම් ලද පළමු ලාංකිකයා මෙතුමා ය. දෙවන වතිකාන කතිකාවේ නියෝග අනුව සභාව දේශානුරූපී වීම මෙතුමාගේ නායකත්වය හා මෙහෙයවීම යටතේ සිදුවිය. එතුමන්ගේ උදාරතර ශුද්ධවන්ත භාවය ජීවිතය සියල්ලන්ට ආදර්ශයක් විය. මෙතුමා ගැඹුරු දේව ධර්මශාස්ත්‍රඥයකි. දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් ලක්බිම බේරාදීම වෙනුවෙන් දෙව්මව්ට පිදෙන උපහාරයක් වශයෙන් ආරම්භ කළ තේවත්ත බැසිලිකා දෙව් මැඳුර එතුමන් පිළිබඳ හොඳම සිහිවටනකි. 1988 දී මෙතුමා ස්වර්ගස්ථ විය.

### ගරු ලියෝ නානයක්කාර රදගුරුතුමා

මහනුවර පදවියේ රදගුරුතුමෙකි. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ නියෝග මුල සිටම ක්‍රියාත්මක කිරිමට පුරෝගාමී වුවෙකි. බදුල්ලේ නව රදගුරු වසමේ පළමු රදගුරු තුමා වූ මෙතුමා විවිධ ආගම් හා දේශපාලන කණ්ඩායම් අතර සංවාදයක් ඇති කිරීමට ඉදිරිපත් වූ ප්‍රගතිශීලී නායකයෙකි. සමාජ අසාධාරණකම්වලට නිතර සංවේදී වූ මෙතුමා ශ්‍රී ලංකාවේ විමුක්ති දෙව් දහම ප්‍රචලිත කිරීමේ නිරතවූවන් අතර ප්‍රධාන මාර්ගෝපදේශයකි. බදුලු ප්‍රදේශයේ යාචක ප්‍රශ්නය වෙනුවෙන් ද වැටුප් වැඩි කිරිම සඳහා වර්ජනයේ යෙදුන කම්කරුවන් වෙනුවෙන් ද, ජාතික සමගිය වෙනුවෙන් ද මෙතුමා ක්‍රියාකාරී ලෙස සහභාගී විය. 1986 දී එතුමා ස්වර්ගස්ථ විය.

### ගරු මයිකල් රුද්‍රිගු පියතුමා

මහනුවර දෙව් සත්හලේ දේව ධර්මාචාර්යවරයෙකු වූ මෙතුමා සභාව තුළ නවෝදයක් ඇති කිරීමට පුරෝගාමී වූවෙකි. දේශයට ගැලපෙන දෙව් දහමක් ඇති කිරීම සඳහා වෙහෙස වූවෙකි. ලියෝ නානායක්කාර රදගුරුතුමා සමග සභාවේ දේශියකරණය සම්බන්ධ විවිධ ක්ෂේත්‍ර වැඩ සටහන් දියත් කළ මෙතුමා බටහිරට බරවූ පූජක පුහුණුව දේශීය අවශ්‍යතාවන්ට ගැලපෙන අන්දමින් කිරීමට විවිධ පියවරයන් ගත්තේ ය.

එතුමාගේ කිතුනු දැක්ම තුළ දිළිඳුන්ගේ පැත්ත ගැනීමට විශේෂ තැනක් දුනි. ශුද්ධ බයිබලය තුළ නිතරම පීඩිතයන් හා බෙලහීනයන්ගේ පැත්ත ගත් සමිඳාණන් ලෙස දෙවියන් වහන්සේව හඳුනාගත් මෙම පියතුමා සමාජයේ තැලෙන පෙළෙන ජනතාවට විශේෂ ආදරයක් දැක්වූයේ ය.

දිළිඳුන් හා සහජීවනයෙන් ජීවත්වනු සඳහා බුත්තල ප්‍රදේශයේ දිළිඳු ගම්මානයක් තෝරාගෙන අල්පේච්ඡ දිවියක් ගත කළේ ය. එහි සිටි බෞද්ධ සහෝදර ජනතාව සමග මිත්‍රශීලිව ක්‍රියා කළේ ය.

වන සම්පත වැනි පොදු දේපල විනාශ කිරිමේ දී තම ජීවිත පරදුවට තබා එවැනි කටයුතු වලට අභියෝග කිරීමට පසුබට වූයේ නැත. මානව අයිතීන් දිනාගැනීමට ජනතාව අවදි කිරීමේ විමුක්ති ක්‍රියාවලියේ යෙදෙමින් සිටි මෙතුමාට, එනිසාම තම ජීවිතය පූජා කරන්නට සිදු විය. 1987 එක් දිනක එතුමා දිව්‍ය පූජාව සිදු කරමින් සිටින විට සහසිකයකුගේ වෙඩි පහරකින් ජීවිතක්ෂයට පත් විය. විමුක්ති දේව ධර්මධරයෙක් ලෙස එතුමාගේ නාමය සිරිලක් කිතු ඉතිහාසයේ ලියවී ඇත.

### 6.3.2 පාසල් රජයට පවරා ගැනීම සහ ඉන් ඇති වූ ප්‍රතිඵල

1961 දී බලයට පත් ව සිටි රජය වෙත බෞද්ධ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ යෝජනාවක් අනුව ආධාර ලබන සියලුම පාසල් රජයට පවරා ගන්නා ලදී. මෙහි දී බෞද්ධ කොමිෂන් සභාව ඉදිරිපත් කළ හේතුන් කීපයක් පහත දැක්වේ.

- ❖ ආගමික පාසල් තරගය නිසා පාසල් අතර උස් පහත් යනුවෙන් භේදයක් ඇති වීම.
- ❖ මෙම තරගය නිසා එක ප්‍රදේශයක අධ්‍යාපනයට ඉඩ ප්‍රස්ථා අධික වන අතර වෙනත් ප්‍රදේශයක අඩු ඉඩ ප්‍රස්ථා තිබීම.
- ❖ අධ්‍යාපන පහසුකම් සියලු ශිෂ්‍යයන්ට සාධාරණ නො වීම.
- ❖ මෙම තරගය නිසා රට තුළ භේදයක් හටගන්නා අතර ජාතික සාමය, දේශානුරාගය රටේ සුරක්ෂිතබව පළුදු වේ. එවැනි අධ්‍යාපනයකින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ඇති නොවේ.

එහෙත් කතෝලික සභාවේ ප්‍රතිපත්තිය වූයේ දහම ප්‍රචාරය කරන ප්‍රදේශ තුළ මාංශ ගත වි එහි තිබෙන යහපත් සංස්කෘතිය පෝෂණය කිරීමයි.
පාසල් රජයට පවරා ගැනීම එදා කිතුනුවන් දුටුවේ තම දරුවන්ට කිතුනු පරිසරයක් තුළ කිතුනු අධ්‍යාපනයක් ලබා ගැනීමේ අයිතිය රජය විසින් උදුරා ගැනීමක් ලෙසිනි. එම නිසා කිතුනු සභා සියල්ලම හා වෙනත් ආගමික සංවිධාන මෙම පියවර තරයේ හෙළා දකිමින් දැඩි විරෝධය ප්‍රකාශ කළ හ. එහෙත් රජය එම විරෝධතා නො සලකා ප්‍රධාන පෙළේ පාසල් හැර ඉතිරි සියලුම පාසල් හා ගුරු විදුහල් ද රජයට පවරා ගන්නා ලදී.

#### (අ) පාසල් රජයට පවරා ගැනීම නිසා කිතුනු අධ්‍යාපනය තුළ ඇති වූ අයහපත් ප්‍රතිඵල

- ❖ කිතුනු දරුවන්ට කිතුනු පරිසරයක අධයාපනය ලැබීම අහිමි වීම.
- ❖ කිතු දහම පාසල්වල ඉගැන්වීම සඳහා කිතුනු සභාවන්ට තිබූ නිදහස අහෝසි වීම.
- ❖ පවරාගත් පාසල්වල පරිපාලනය හා විනය පිළිබඳ කිතුනු සභාවන්ට තිබූ වගකීම හා නිදහස ඉවත් වීම.
- ❖ කිතුනු ගුරුවරුන් පුහුණුව හා ඔවුන් පාසල්වලට පත් කිරීම පිළිබඳ තිබූ නිදහස කිතුනු සභාවලට අහිමි වීම.
- ❖ ආගම ඉගැන්වීම පාසල් කාලය තුළ සතියකට කාල පරිච්ඡේද දෙකකට සීමා වීම.
- ❖ කිතුනු සභාවන්ට අයත්ව තිබූ පාසල් ගොඩනැගිලි ඉඩකඩම් දේපල යනාදිය රජයට පවරා ගැනීම.
- ❖ කිතුනු ජීවිත පැවැත්ම සඳහා දරුවන් පුහුණු කිරීමට ඉඩ ප්‍රස්ථා නැති වීම.

පාසල් රජයට පවරා ගැනීමේ අභියෝගයට මුහුණ දුන් සභාව කිතුනු දරුවන්ට සත්‍ය විශ්වාසය උරුම කර දීමට විකල්ප උපක්‍රම සෙවීමට උනන්දු වූහ. ඒ අනුව පාසල් රජයට පවරා ගැනීම වෙස්වලාගත් ආශීර්වාදයක් ලෙස සභා නායකයෝ හැඳින්වූහ.

**(ආ) පාසල් රජයට පවරා ගැනීමේ හිතකර ප්‍රතිඵල**

- දෙමාපියන් තම දරවන්ගේ ආගමික අධ්‍යාපන කෙරේ පෙරට වඩා දැඩි උනන්දුවක් ගැනීම.
- දීප ව්‍යාප්ත දහම් පාසල් ක්‍රමයක් ආරම්භ කිරීම, ඒ සඳහා ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානයක් බිහි වීම.
- පාසල්වල ධර්මෝපදේශ පොත් සංශෝධනය කිරීමට අවකාශය ලැබීම.
- රජයේ පාසල්වල දහම ඉගැන්වීම සඳහා ස්වේච්ඡා ගුරුවරුන් පත් කිරීම.
- කිතුනු සිසුන්ට වෙනත් සිසුන් හා සහජීවනයෙන් යුතුව කටයුතු කිරීමට අවකාශ ලැබීම.
- අප රටේ ඇති ප්‍රධාන ආගම් පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලබා ගැනීමට සියලුම සිසුන්ට අවකාශ ලැබීම.
- විශේෂ ගුරු පුහුණු පාඨමාලා රජයේ සහය ඇතිව පැවැත්වීම.

### 6.3.3. ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය සහ අනුබද්ධිත ප්‍රධාන සංවිධාන

ශ්‍රී ලංකාවේ සෑම කිතුනු පදවියක්ම බාරව කටයුතු කරන රදගුරුවරු ඇතුළු සියලුම රදගුරුවරුන් ඇතුළත් සභාව ශ්‍රී ලංකා කතෝලික රදගුරු මණ්ඩලය ලෙස හැඳින්විය හැකි ය. දැනට ශ්‍රී ලංකාවේ පදවි 11 දක්නට ලැබෙන අතර රදගුරු මඩුල්ලේ සාමාජික සංඛ්‍යාව 11 කි.

ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලයේ ඉතිහාසය දෙස බලන විට ප්‍රථම රදගුරු මඬුල්ල පිහිටුවා ඇත්තේ 1886 දී ක්‍රිස්ටෝපර් බොන්ජන් අගරදගුරු තුමා විසිනි. එවකට ශ්‍රී ලංකාවේ කොළඹ, යාපනය, මහනුවර වශයෙන් පදවි තුනක් දක්නට ලැබුණි. 1899 වන විට රදගුරු හමුව රදගුරුතුමන්ලා සය නමකින් සමන්විත විය. ක්‍රි.ව. 1970 දී ශ්‍රී ලංකා රදගුරු මඬුල්ලේ නව ව්‍යවස්ථාව ශුද්ධාසනය මගින් අනුමත කරන ලද අතර 1975 දී එය නැවතත් සංශෝධනය කරන ලදී.

**කතෝලික රදගුරු මඬුල්ලේ දූත මෙහෙවර**

මෙම රදගුරු මඬුල්ලට අයත් කාර්යභාරයන් ජාතික කතෝලික කොමිෂන් සභා 9 ක් යටතේ ක්‍රියාත්මක වේ. එම කොමිසම් සභා භාරව රදගුරුවරුන් දෙදෙනෙක් බැගින් සිටිති. එක්කෙනෙක් සභාපති වශයෙන් ද අනෙක් තැනැත්තා උප සභාපති වශයෙන් ද ක්‍රියා කරති. කොමිෂන් සභා පහත දැක්වේ.

1. ධර්මදූතික ක්‍රියාකාරකම්
2. අධ්‍යාපනය, ධර්මෝපදේශය හා බයිබල් දූත සේවාව
3. සභා එකමුතුව හා සංවාදය
4. ජනසන්නිවේදනය
5. පූජක පැවිදි දෙව් සත්හල් හා ආගමික නොවන ආයතන
6. ජනවන්දනා හා සංස්කෘතික කටයුතු
7. යුක්තිය, සාමය හා මානව සංවර්ධනය
8. සංචාරකයින්, සෞඛ්‍ය සේවා හා බන්ධනාගාර පිළිබඳ දූත සේවය
9. උපදේශක, දේව ධර්මය හා සසුන් නීතිය

**ජාතික කතෝලික කොමිසම් සභා හැරුන විට ජාතික සංවිධාන 7 ක් ද ඇත.**

1. වතිකාන ධර්මදූත සංගමය
2. ශ්‍රී ලංකා කතෝලික සංගමය
3. මරිය හමුදාව
4. සාන්ත වින්සෙන්ති ද පාවුලා සමිතිය
5. සරසවි සිසුන්
6. කතෝලික තරුණ සංගමය
7. ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය

**අන්තර් පදවි දූත ව්‍යාපරයන් 9 ක් තිබෙන අතර ඉන් කිහිපයක් පමණක් පමණක් පහත දැක්වේ.**

1. ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය දූත සේවාව
2. කිතු දන පුබුදුව
3. ල. ක්‍රි. වි. ව්‍යාපරය

### 6.3.4 ශ්‍රී ලංකා දේශිය කිතු සසුනේ රදගුරු වසම් බිහිවීම.

ක්‍රි.ව. 1534 දී ආසියාවේ පළමු රදගුරු වසම ගෝවේ පිහිටුවන ලදී. 1558 දී කොචින්හි රදගුරු වසම ආරම්භ වූ අතර 1834 වන තෙක් මෙරට කිතු සසුන කොචින්හි රදගුරු වසමට අයත් විය. 1834 දී ශ්‍රී ලංකා ක්‍රිස්තු ශාසනයට ස්වාධිනත්වත්වය ලබා ගත්තේ ය. එහි ප්‍රථම රදගුරු බවට පත්වූයේ ඔරතෝරියානු නිකායේ වින්සන් රොසයිරෝ පියතුමන් ය. 1849 දී යාපනයේ රදගුරු වසම ද 1883 දී මහනුවර වසම ද පිහිවුවන ලදී. 1887 ප්‍රථම රාජගුරු මණ්ඩලය පිහිටවූ අතර අගරදගුරු ධූරය දැරුවේ ගරු ක්‍රිස්ටෝපර් බොන්ජන් රදගුරුතුමාණන් ය. මේ අනුව 1887 වනවිට කොළඹ, මහනුවර, යාපනය යනුවෙන් පදවි තුනක් ශ්‍රී ලංකාවේ තිබිණි.

1893 ගාල්ල හා ත්‍රිකුණාමලය යන රදගුරු වසම් බිහි වූ අතර ඒවා පාලනය කළේ ජේසු නිකායික පියතුමන්ලා විසිනි. 1939 දී වයඹ පළාත බස්නාහිර පළාතෙන් වෙන්කර හලාවත රදගුරු වසම පිහිටු වීය. එහි පළමු රදගුරු තුමා වූයේ ගරු එඩ්මන්ඩ් පීරිස් හිමිපාණන් ය.
ඉන්පසුව බිහිවූ අනෙකුත් රදගුරු වසම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| බදුල්ල | - | 1978 |
| මන්නාරම | - | 1981 |
| අනුරාධපුරය | - | 1981 |
| කුරුණෑගල | - | 1987 |
| රත්නපුර | - | 1996 |

මේ අනුව 1834 එක රදගුරු වසමක් වු ශ්‍රී ලංකාවේ අද රගුරු වසම් 11 ක් දක්නට ඇත.

### 6.3.5 සිරිලක් කිතු සසුනේ ප්‍රධාන සිද්ධීන්

1505 පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණීම.
1543 ප්‍රැන්සිස්කන් පියවරු දහම් සේවය සඳහා ශ්‍රී ලංකාවට පැමිණීම
1544 මන්නාරමේ ක්‍රිස්තු භක්තිකයන් 600 ක් පමණ ප්‍රාණ පරිත්‍යාගි වීම.
1557 දොන් ජුවන් ධර්මපාල රජු බෞතිස්මය ලැබීම.
1602 ජේසු නිකායික පියවරු ලංකාවට පැමිණීම
1605 දොමිනිකාන නිකායික පියතුමන් ලංකාවට පැමිණීම
1606 අගුස්තීනු නිකායික පියවරු ලංකාවට පැමිණීම.
1658 පෘතුගීසින් පලවා හැර මුහුදු බඩ පළාත් ලන්දේසින් අත්පත් කර ගැනීම.
1687 ජුසේවාස් පියතුමා ලංකාවට පැමිණීම
1705 ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා ලංකාවට පැමිණීම.
1711 ජුසේවාස් පියතුමා ස්වර්ගස්ථ වීම.
1739 ඕලන්ද රෙප්‍රමාදු සභාව ශුද්ධ බයිබලය සිංහලයට පරිවර්තනය කිරීම
1742 ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාගේ මරණය
1796 ලන්දේසීන්ට අයත් මුහුදු බඩ පළාත් බ්‍රිතාන්‍ය ඉන්දීය වෙළෙඳ සමාගම සතුවීම.
1803 එංගලන්ත සභාවේ ධර්මදූතවරු ශ්‍රී ලංකාවට පැමිණීම.
1806 මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා පීඩන නීති අවලංගුකර සියලු ආගමිකයන්ට සම්පූර්ණ නිදහස දීම.
1846 ලංකා සභාවේ කොළඹ දියෝකීසිය පිහිටු වීම.
1847 ඔබ්ලේට් පියවරු ලංකාවට පැමිණීම
1862 ශුද්ධවූ පවුලේ නිකාය ලංකාවට පැමිණීම.
1867 ප්‍රැන්සිස්කන් මිෂනාරී සොයුරියෝ රෝහල් සේවය සඳහා පැමිණීම
1887 කොළඹ ශාන්ත ජෝශප් විදුහල ආරම්භ කිරීම.
1887 ලංකාවේ ප්‍රථම රාජගුරු මණ්ඩලය පිහිටු වීම.
1948 දේශපාලන නිදහස ලැබීම
1961 ආධාර ලබන පාසල් රජයට පවරා ගැනීම.
1964 රෝහල් සේවයෙන් කන්‍යාසොහොයුරියෝ ඉවත් කිරීම.
1967 ජාතික කතිකාවත
1970 හයවන පාවුලු පාප්තුමා ශ්‍රී ලංකාවට පැමිණීම
1988 කාර්දිනල් තෝමස් කුරේ හිමිපාණන් ස්වර්ගස්ථ වීම.
1995 දෙවන ජුවාම් පාවුලු පාස්තුමා ශ්‍රී ලංකාවට පැමිණීම සහ ජුසේවාස් පියතුමාව භාග්‍යවරයට එසවීම.

# හත්වන පාඩම

# ගැළවීමේ කාර්යය තුළ මරිය තුමියගේ කාර්යභාරය

## 7.1 ක්‍රිස්තු අභිරහස තුළ මරියෝත්තමාවෝ

ශුද්ධවූ ලියවිල්ලෙන් ද සභාවේ මුඛපරම්පරාගත සම්ප්‍රදායයන්ගෙන් ද මරියතුමියගේ කාර්යභාරය ක්‍රමයෙන් පැහැදිලි වෙයි. මෙසියස් වහන්සේගේ පැමිණීම සඳහා ලෝකය සූදානම් කරන අයුරු ශුද්ධවූ බයිබලයේ පැරණි ගිවිසුමේ දක්වෙයි. ඒ තුළින් මරියතුමිය දරූ ස්වරූපය ද පැහැදිලි කෙරෙයි. ඒදන් උයන පිළිබඳ උපමාවේ ස්ර්පයාගේ හිස පොඩි කරන ස්ත්‍රියගේ වංශය තුළ මරියතුමියගේ පූර්ව ස්වරූපය සභාව දකියි. 'ස්වාමීන් වහන්සේ නුඹලාට ලකුණක් දෙන සේක. බලන්න කන්‍යාවක් පිළිසිඳ ගෙන පුත්‍රයෙකු බිහි කරන්නී ය. එම්මානුවෙල් යන නම ඔහුට තබන්නී ය'' (යෙසායා 7:14)

**මෙසේ කියන ලද්දේ මරියතුමිය ගැන ය.**

පාපය හා මරණය ලොවට ඇතුළු වූයේ ස්ත්‍රියක් හේතුකොටගෙන ය. එම නිසා ස්ත්‍රියක් මගින් ජීවනය දීම සඳහා ද එම ස්ත්‍රියගේ කැමැත්ත දෙවි පියාණන්ට අවශ්‍ය විය. මෙම සැලැස්ම තුළ මරියතුමිය විශිෂ්ට වේ. ජීවනයේ උල්පත වන ධර්මයාණෝ ඕතුමිය තුළ මාංශගත වූහ. එම උතුම් තත්ත්වයට අවශ්‍ය වූ වරප්‍රසාද දෙවියන් වහන්සේ එතුමියට දානය කළ සේක.

මරියතුමිය දෙවියන් වහන්සේගේ උතුම් මැවිල්ල වූ බව සභාවේ පිළිගැනීමයි. ඇය මව්කුස පිළිසිඳ ගත් මොහොතේ පටන්ම ශුද්ධවන්තව සිටියා ය. මේ අනුව දේව දූතයා විසින් 'විපුල ප්‍රසාද ලද්දී' වශයෙන් ඇය අමතන ලදී. දේව පුත්‍රයාණන්ගේ මාතාව වීම සඳහා දෙවියන් වහන්සේ ඇයව සියළුම වරප්‍රසාදයෙන් පූර්ණ කළ සේක. ක්‍රි. ව. 1854 දෙසැම්බර් 8 දින 'ඉන් එෆා බිලිෂ් දේවුස්' නමැති විශ්ව ලේඛනය මගින් එකළොස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ''මරියතුමියගේ නිර්මල පිළිසිඳීම' සභාවේ සත්‍යයක් ලෙස ප්‍රකාශ කළේ ය.

මිනිස් වර්ගයාගේ ගැළවුම්කරුවාණන් වූ ක්‍රිස්තුන් වහන්සේ දිනා දුන් ගැළවීම අරභයා, පූර්ව ප්‍රතිඵලයක් ලෙස දූතයා පළ කරන ලද සුවිශේෂ දීමනා හා වරප්‍රසාද හේතුකොට ගෙන එතුමිය පිළිසිඳගත් මොහොතේ සිටම ජන්ම පාපය හා බැඳී සියළු පාප කිළුටෙන් ආරක්ෂා කරන ලද බව, දෙවියන් වහන්සේ විසින් එළිදරව් කරන ලද සත්‍යතාවක් බව ප්‍රකාශ කෙරුණි. මෙම ප්‍රකාශනයට අනුව එතුමියව පරිශුද්ධ කරනු ලැබුවේ ක්‍රිස්තුන් වහන්සේ විසින් මතු දිනකදී ඉටු කරන ලබන ගැළවීමේ කාර්යයේ ප්‍රතිඵලයක් ලෙසිනි.

''විපුල ප්‍රසාද ලද්දී'' යනුවෙන් දේව දූතයාගේ ආචාරයට ඇගේ පිළිතුරු වූයේ, ''බලන්න මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙස ම මට සිදු වේවා'' යන්න ය. (ලූක් 1:38) මෙසේ එතුමිය දේව කැමැත්තට හිස නමා ගැළවුම්කාර ජේසුස් වහන්සේගේ මව වූවාය. දේව කැමැත්තට ඉඩ දුන්නා ය. තම පුත්‍රයාණන්ට ද උන්වහන්සේගේ ගැළවීමේ කාර්යයට ද කැප වූවා ය. උන්වහන්සේ සමග උන්වහන්සේ යටතේ දේව වරප්‍රසාදයෙන් ගැළවීමේ අභිරහසට සේවය කළා ය. එම නිසා මරියතුමීය මිනිසාගේ ගැළවීමේ කාර්යයට සහයෝගය දක්වූ බව ශුද්ධවූ සභාවේ ආදී පියවරු පිළිගත්හ. එතුමිය තම කීකරුකම කරණකොට ගෙන මුළු මනුෂ්‍ය වර්ගයාගේ ගැලවීමට හේතු වූ බව ආදි පියවරයෙකු වූ ශුද්ධවූ අයිරේනියස් තුමා පවසයි. 'ඒව' මගින් මරණය ද, 'මරියතුමිය' මගින් ජීවනය ද ලොවට ඇතුළු වූ බව එම පියවරු ප්‍රකාශ කළ හ.

### 7.1.1 විමුක්තිදායක කාර්යයෙහි ලා මරියතුමිය හා ජේසුස් වහන්සේ අතර වූ දැඩි සබඳතාව

- එළිසබෙත්තුමිය මරියෝත්තමාවට ආශිර්වාදලත් තැනැත්තිය ලෙස ආචාර කිරීම. (ලූක් 1:41-45)
- ස්නාවක ජොහාන් තුමා මව්කුස තුළ ප්‍රීතියෙන් ඉපිල යාම (ලූක් 41:45)
- ජේසු බිළිඳුන්ව එඬේරුන්ට ද ශාස්ත්‍රවන්තයන්ට ද පෙන්වීම.

- ඔබේ හදවත කඩුවකින් සිදුරු කරනු ලබන්නේ ය'' යනුවෙන් සිමියොන් දිවැසිවරයා පැවසීම (ලූක් 2: 34-35)
- දේව මාළිගයේ ළමා ජේසු නැති වූ විට, යළි සොයාගෙන ප්‍රශ්න කිරීමේ දී ලැබුණ පිළිතුර එතුමිය සිත් හි නිධන් කර ගැනීම. (ලූක් 2:41-52)
  යන සිද්ධීන්ගෙන් පැහැදිළි වෙයි.

ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතයේ දී එතුමිය අනාවරණය කරති. කනා නුවර මඟුල් ගෙදර දී වතුර වයින් කිරීමේ ප්‍රාතිහාර්යය සිදුවූයේ මරියතුමියගේ මැදිහත් වීම නිසා ය. මෙම සිදධිය මගින් එහි සිටි ශ්‍රාවකයන්ගේ විශ්වාසය වැඩි විය. එනයින් ඇය ජේසුස් වහන්සේගේ ගැළවීමේ කාර්යයට සහාය වීම සඳහා තිබුණු කැපවීම පෙන්නුම් කරයි.

'මෙතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුවද කරන්නැ'යි යන (ජොහාන් 2/5) සේවකයන්ට කළ ප්‍රකාශනයෙන් දේව බල පරාක්‍රමය කෙරේ තැබූ විශ්වාසයත්, සැම විට දේව කැමැත්ත ඉටු කිරීමත් ඇයගේ ආදර්ශවත් කාර්යභාරයට සාක්ෂි වේ. ක්‍රිස්තුන් වහන්සේගේ වචනය අසා, පිළිගෙන ඉටු කරන අය තමන් වහන්සේගේ ලේ නෑයන්ට වඩා උසස් වන බව ක්‍රිස්තු ප්‍රකාශනයෙන් මරියතුමියට උතුම් ප්‍රශංසාවක් පිදූ සේක. ගැළවීමේ කාර්යය තුළ දී මරියතුමිය සැමවිට දේව කැමැත්තට (අවනතභාවයත්) දේව වචනයට (අනුකූලතාවයත්) දැක්වූවා ය. (ලූක් 11: 27-28)

තව ද ඇදහිල්ලේ ගමනෙහි ඉදිරියෙන් සිටිමින් පුත්‍රයාණන්ගේ දුක් ප්‍රාප්තියට සහභාගි වෙමින් කුරුසිය පාමුල සිටිමින් (ජොහාන් 19:25) මාතෘක ප්‍රේමයෙන් යුක්තව උන්වහන්සේගේ යාගයට සම්බන්ධ වූවා ය. මෙතැනදී යළිත් තම පුතණුවන් දේව පියාට ඔප්පු කළා ය. අවසානයේ දී ක්‍රිස්තුන් වහන්සේ මරියතුමියව අපගේ මව වශයෙන් භාර දුන් සේක. ''ස්ත්‍රීය, මෙන්න නුඹේ පුත්‍රයා''යි වදාළ සේක. එදා කුරුස පාමුල සිටි ජොහාන් තුමා මුළු මිනිස් සංහතියේ නියෝජිතයා විය. (ජොහාන් 19: 26-27) ක්‍රිස්තුන් වහන්සේගේ මේ ප්‍රකාශනයෙන් මරියතුමියට ගැළවීමේ අඛණ්ඩ කාර්යයට සහාය වීම සඳහා නව පදවියක් පිරිනමයි. එනම් සභාවේ මතාව වීමයි.

පෙන්තකොස්ත දිනයවන තෙක් දේව සැලැස්ම විධිමත් ලෙස ප්‍රකාශ නො වීය. 'එබැවින් මරියතුමිය ද ගෝලයෝ ද එක්වී යාච්ඤා කළ හ.'' (ක්‍රියා 1:14) දේව දූතයා මංගලම් කී අවස්ථාවේ දී තමන්ට දානය කළ ශුද්ධාත්මයාණන් පතා යාච්ඤා කළ හ. ආත්ම ශරීරය පිටින් ස්වර්ගයට ඔසවා ගත් එතුමිය ස්වර්ගීය මහිමයේ සිට සියල්ලන්ගේ මධ්‍යස්ථකාරියව සිටින්නී ය. විශ්වාසකයන්ගේ ගැලවීම පරිසමාප්ත වන තුරු එතුමිය ක්‍රිස්තුන් වහන්සේ ඉදිරියේ මැදහත් වෙමින් අපට වරප්‍රසාද ලබා දෙයි. (පිළිසරණ වෙයි)

දෙවියන් වහන්සේ හා අප අතර සිටින එකම මධ්‍යස්ථකාරයාණෝ ක්‍රිස්තුන් වහන්සේ ය. (තිමති 25:6) මරියතුමිය ක්‍රිස්තුන් වහන්සේ හා අප අතර ප්‍රබල මධ්‍යස්ථකාරිය වී ඇත. එතුමියගේ දේවානුභාවය දේව අභිමතයේ ප්‍රතිඵලයකි. ඒවා ක්‍රිස්තුන් වහන්සේගේ පින් කුසල්වලින් නික්මෙයි. එමගින් අප හා ක්‍රිස්තුන් වහන්සේ අතරවන සම්බන්ධකම තහවුරු වෙයි.

කිසිම මැවිල්ලක් දේව පුත්‍රයාට සමාන නොවේ. එහෙත් ක්‍රිස්තු පූජකත්වයට, පූජකයන් හා ගිහියන් සම්බන්ධ වන්නා සේ, උන්වහන්සේගේ මධ්‍යස්ථකමට යම් ආකාරයක සම්බන්ධකමක් විශ්වාසිකයන්ට ද පැවරී ඇත. එම නිසා ශුද්ධවූ සභාව පැකිළීමක් නැතිව මරියතුමියගේ මධ්‍යස්ථභාවය ප්‍රකාශ කරයි. එය අත්දකියි. එය සැදැහැවතුන්ට ඉදිරිපත් කරයි. එම මධ්‍යස්ථ උපකාරය නිසා විශ්වාසිකයෝ ක්‍රිස්තුන් වහන්සේට වඩා ළැදි වෙති.

දේව මාතෘත්වයේ දීමනාව මගින් මරියතුමිය ගැළවුම්කාර ක්‍රිස්තුන් වහන්සේ සමග ද ශුද්ධවූ සභාව සමග ද බැඳී විශ්වාසයෙන් ද ප්‍රේමයෙන් ද ක්‍රිස්තුන් වහන්සේ හා බැඳීමෙන් ද සභාවට ආදර්ශයක් වෙයි. එතුමිය ඇදහිල්ලෙන් හා කීකරුකමින් ගැළවුම්කරුවාණන් මෙලොවට බිහි කළා ය.

ශුද්ධාත්ම වරමින් එසේ කළා ය. පුරාණ සර්පයාව නොව දේව පුත්‍රයාව විශ්වාස කළා ය. එම නිසා එතුමිය ගැළවීමේ කාර්යදාමය තුළ නව ඒව වෙයි. ගැළවීමේ ඉතිහාසයට සම්බන්ධ මරියතුමිය වේද සත්‍යතා කැටි කොට දක්වන කැඩපතකි. එම නිසා එතුමිය විශ්වාසයෙන්
- ක්‍රිස්තුන් වහන්සේ වෙතට ද
- ක්‍රිස්තු යාගය වෙතට ද

- දෙවි පියාණන්ගේ ප්‍රේමයට ද
  කැඳවන්නී ය. ගැළවීමේ කාර්යය සඳහා කැපවෙන සභාවට සහාය වන්නීය.

එමනිසා අප ඇයව ආදර්ශයට ගනිමු. එතුමියගේ චින්තනය, වචනය, ක්‍රියා, කීකරුකම, බැහැපත්කම, පිරිසිදුකම, ප්‍රේමය, දේව කැමැත්ත ඉටු කිරීම, දේව වචනය පිළිගැනීම ආදි ආදර්ශවත් ගුණාංග තුළ ජීවත් වෙමින් ඇයට උතුම් ම ගෞරවය දෙමින් ඇය උරදුන් ගැළවීමේ කාර්යයට අපි ද සැබැවින් දායක වෙමු. එතුමිය තුළින් තපුර ජයගනිමින් ශුද්ධවත් වීමට දිරි දරමු. ධර්මයාණන් ඇසුරින් එතුමිය ගැන භාවනා කරමු.

සැබෑ විශ්වාසයෙන් හා භක්තියෙන් යුක්තව,

- දේව මවගේ උතුම්කම දැන ගනිමු.
- එතුමිය කෙරෙහි ප්‍රේමයක් ඇති කර ගනිමු.
- එතුමියගේ ගුණ ධර්ම අනුව ජීවත් වෙමු.
- සභාව තුළ පැවැත්වෙන මරිය බැතියට සහභාගි වෙමු.

### 7.1.2 සභා ප්‍රකාශනවලින් ඉස්මතුවන මරිය දහම

දේවමාතාවන් පිළිබඳ ඉගැන්වීම් සභාවේ මුල් යුගයේ සිට අද දක්වා විවිධ මන්ත්‍රණ සභා මගින් ඉදිරිපත් කර ඇත. ඉන් ප්‍රධාන ස්ථානයක් ගන්නා එපේසි මන්ත්‍රණ සභාව හා දෙවන වතිකාන මන්ත්‍රණ සභාවල ඉගැන්වීම් ගැන අප අධ්‍යයනයක යෙදෙමු.

**එපේසි මන්ත්‍රණ සභාව (ක්‍රි.. 431)**

කොන්ස්තන්තිනෝපලයේ රදගුරු ධුරය දැරූ නෙස්ටෝරියස් නමැත්තා ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ගැනත් උන්වහන්සේ තුළ මනුෂ්‍යත්වය හා දේවත්වය සම්බන්ධ වීම ගැනත් වැරදි මතයක් ඉදිරිපත් කළේ ය. ඒ අනුව ඔහුගේ මතය වූයේ ක්‍රිස්තුන් වහන්සේ තුළ දේව ස්වභාවයත් මනුෂ්‍ය ස්වභාවයත් වෙන් වෙන් වශයෙන් පැවති බව ය. ඒ අනුව උන්වහන්සේ පුද්ගලයන් දෙදෙනෙකි. නැතහොත් දේව පෞරුෂය හා මිනිස් පෞරුෂය වශයෙන් පුද්ගලයන් දෙදෙනෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළ වැඩ සිටින බව ඔහු ප්‍රකාශ කළේ ය. මරිය තුමියගේ කුසයෙහි පිළිසිඳ ගත්තේ මනුෂ්‍යය ස්වභාවයෙන් යුක්තවූ ක්‍රිස්තුන් වහන්සේ පමණකි. එබැවින් මරිය තුමිය දෙව් මව් නොව (NON THEOTOKOS) ජේසුස් ක්‍රිස්තුන් යන මිනිසාගේ මව (christo- tokos) පමණක් බවත් දිව්‍ය සත්ප්‍රසාදය තුළින් අප ලබන්නේ ජේසු යන මිනිසාව පමණක් බවත් ඔහුගේ මතය විය. දෙවියන් වහන්සේට සම්බන්ධ වී ඇත්තේ ජේසු තුමාගේ දේව ස්වභාවය පමණක් ය යන මතය නෙස්ටෝරියස් ඉදිරිපත් කළේ ය. ඔහුගේ මතය අනුව මරියාවන් දෙව් මව් ලෙස පිළිගැනීම වැරදි සහගත ය. ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරු ධුරය දැරූ ශුද්ධවූ සිරිල් තුමා මේ වෙද භේදයට විරුද්ධව කටයුතු කරන ලදී.

**ක්‍රි.ව. 431 දී එපීසියේ මන්ත්‍රණ සභාවේ දී පහත සඳහන් තීරණ ගන්නා ලදී.**

1. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇත්තේ එක පෞරුෂයකි. එනම් එතුමාණන් එක පුද්ගලයෙකි.
2. එතුමන් තුළ දේව ස්වභාවයත් මනුෂ්‍ය ස්වභාවයත් ඒකාබද්ධව පවති.
3. එතුමන් සැබෑ දේව පුත්‍රයා වන අතර සැබෑ මනුෂ්‍යය පුත්‍රයා ද වේ.
4. මරිය තුමියගේ කුසයෙහි මනුකය ගෙන පිළිසිඳ ගත්තේ දේව පුත්‍රයාවන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නිසා එතුමියට දෙව්මව් යයි කිව හැකි වේ.

මෙලෙස මරිය තුමිය දෙව් මව් ලෙස මුළු සභාව ම පිළිගැනීම නිසා දේව මාතා භක්තිය වර්ධනයට ඉමහත් රුකුලක් විය. මරිය දහමට (Mariology) මෙම මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම්වලින් ප්‍රබල පන්නරයක් ලැබීය.

## දෙවන වතිකාන කතිකාවතේ දෙව් මව් පිළිබඳ කළ ඉගැන්වීම්

දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මරිය තුමිය පිළිබඳ වෙනම ලේඛනයක් ඉදිරිපත් නො කරන ලදී. එහෙත් ශුද්ධවූ සභාව පිළිබඳ ලේඛනයේ අට වෙනි පරිච්ඡේදය සම්පූර්ණයෙන් ම වෙන් කර ඇත්තේ මරිය තුමිය පිළිබඳව ය.
එම ලේඛනයේ 8 වෙනි පරිච්ඡේදය කොටස් 05 ම ඉදිරිපත් කර ඇත.

### 1. හැඳින්වීම.

මාංශගතවීමේ අභිරහසට මරිය වහන්සේගේ ඇති සම්බන්ධතාව පළමු කොටසින් පැහැදිලි කරයි.
ක්‍රිස්තුන් වහන්සේ හැරුණු කොට දෙව් පියාණන් වහන්සේට ඉතාම සමීප තැනැත්තිය මරිය තුමිය වේ. මාංශගතවීමේ අභිරහස තුළ මරිය තුමියගේ කාර්යය භාර්ය ගැනැත් ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය ගැනැත් දේව මතාවන්ට පැවරෙන යුතුකම් මේ කොටසින් පැහැදිලි කරයි.

### 2. ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ සැලැස්ම තුළ මරිය තුමියගේ භූමිකාව

ශුද්ධවූ බයිබලයේ පූරාණ ගිවිසුමේ මරිය වහන්සේගේ කාර්යයභාරය පැහැදිලිකර ඇත. විශේෂයෙන් උත්පත්ති පොතේ සඳහන් මිනිසාගේ මැවීමේ දී දුන් පොරොන්දුත්, දිවැසිවරුන්ගේ දිවැසි වාක්‍යයත්, සුවිශේෂවල හා අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ එතුමියගේ භූමිකාවත් පැහැදිලි කරයි.

### 3. මරියෝත්තමාවෝ සහ ශුද්ධවූ සභාව

මරියෝත්තමාවන් මිනිසුන් වෙත දක්වන මාතෘත්වයේ භූමිකාව ක්‍රිස්තුන් වහන්සේගේ මධ්‍යස්ථ බවට යටහත්ව සිදු වේ. මරියෝත්තමාවන් දක්වන මාතෘක ස්වභාවය හේතුවෙන් ක්‍රිස්තුන් වහන්සේගේ අසමසම ක්‍රියාකාරිත්වය කිසිදා අවතක්සේරුවකට හෝ හීනවීමකට හේතු නොවේ.

මරිය තුමිය තම කාර්යය ඉටු කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ වරප්‍රසාදයේ පිහිටෙන් ය. එතුමියගේ භූමිකාව රදා පවතින්නේ ක්‍රිස්තුන් වහන්සේගේ මැදහත්කම නිසා ඔවුන්වහන්සේ ලබන බලයෙනි.
ක්‍රිස්තුන් වහන්සේගේ මව් වශයෙන් පිළිසිඳීම, උපත, වර්ධනය, දේව මාළිගාවේ කැප කිරීම, දුක්ප්‍රාප්තියට සම්බන්ධ වීම ස්වාමින් වහන්සේගේ දාසියක් වශයෙන් කටයුතු කිරීම තුළ ය.

සභාව තුළ මරියෝත්තමාවෝ පරමාදර්ශය වෙයි. මරියෝත්තමාවෝ ක්‍රිස්තුන් වහන්සේගේ මව් වශයෙන් ද විශ්වාසිකයන්ගේ මව වශයෙන් ද ක්‍රියා කරයි.

ශුද්ධවූ සභාව ද මරියෝත්තමාවන් අනුගමනය කරමින් මවක්වන්නී ය. මරියෝත්තමාවන් තුළ පූර්ණ ශුද්ධවත්තභාවය සභාව හිමිකර ගෙන සිටින්නී ය. සභාව ජීවිත චර්යාවන්ගේ ආකෘතියක් වන්නේ මරියෝත්තමාවන් මෙන්, විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය හා දේව කැමැත්තට අනුකූලතාව දැක්වීම ය.

### 4. ශුද්ධවූ සභාව තුළ මරියෝත්තමාවන් කෙරෙහි භක්තිය

දේව මතාවන් වෙත භක්තිය, ශුද්ධවූ සභාව විසින් විශේෂ ගෞරවයකින් හා භක්තියකින් පවත්වන්නීය. පැරණි කාලවල පටන් දේව මව් වෙත භක්තිය විශ්වාසකයින් තුළ තිබුණි. විශේෂයෙන් විවිධ දුක් කරදර වලදී එතුමියගේ පිහිට සොයන්නට විය. එපීස මන්ත්‍රන සභාවෙන්පසු ජනතාව තුළ මරිය භක්තිය පුදුමාකාර ලෙස වර්ධනය විය. මරිය බැතිය ජනවන්දනාවට බද්ධවන අතර සභාව අනුමත භක්ති අභ්‍යාසයනට නිරත විමට අනුශාසනා කරයි. විශ්වාසිකයෝ සැබෑ මරිය බැතියේ ස්වභාවය තේරුම් ගෙන අවබෝධයකින් යුතුව සභාව තුළ ඇයට හිමි තැන දීමට බැඳී සිටී.

### 5. මරියෝත්තමාවන් වන්දනාවේ යෙදෙන දේව ජනතාවට සැබෑ බලාපොරොතුවේ හා සහනයේ සලකුණකි.

සාන්ත සභාව සිය පුර්ණත්වයට පැමිණෙන තෙක් මරියෝත්තමාවන් ස්වර්ගයේ දී ජේසුස් වහන්සේ තුළ තමන් අත් විඳින ආත්මික හා ශාරිරික මහිමය ඇසුරින් සාන්ත සභාවට ස්වරූපයක් හා ආරම්භයක් වන්නා හ. කතිකාවතේ අදහස වන්නේ මරියෝත්තමාවන් සියලුම දේව ජනතාව වෙනුවෙන් එනම් කතෝලික සභාවෙන් වෙන් වු ඇතැම් කොටස් වෙනුවෙන් ද මැදිහත් වන බව ය.

- ❖ අන් කිතුනු සභාවන්වල සමාජිකයෝ ද මරියතුමියට ගරු කරති.
- ❖ පෙරදිග සභාවන් ද තියෝටෝක්ස් යනුවෙන් මරියතුමිය අමතමින් ඇයට ගෞරවය දක්වයි.
- ❖ ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි විශ්වාස කරන අයගේ යැදුම වන්නේ අවසානයේ දී ශුද්ධවූ ත්‍රිත්වයේ මහා මහිමය පිණිස දේව ජනතාව සාමයෙන් හා එකමුතුකමෙන් ඒකාබද්ධ වීමයි.

### 7.1.3 මරිය බැතිය පිළිබඳ සභා නායකයන්ගේ වෙනත් ප්‍රකාශන

1. 1854 දී නව වන පියුස් පාස්තුමා මරියෝත්තමාවන්ගේ නිර්මල පිළිසිඳම සමස්ත සභාව විසින් පිළිගත යුතු සත්‍යතාවයක් වශයෙන් තම නිල බලයෙන් ප්‍රකාශ කරන ලදී. එන්ඞ්ෆාබිලිස් ඩේඋස් (Ineffabilis Deus) නැමැති අපෝස්තලික ව්‍යවස්ථාව තුළින් මෙය පැහැදිලි කරන ලදි.

2. 1950 නොවැම්බර් 01 දින දොළස් වන පියුස් පාප්තුමා මරියෝත්තමාවන්ගේ ස්වර්ගාරෝපණය සම්බන්ධයෙන් මුනිෆිචේන්ටිස් ඩියුස් (Munificentissimus Deus) නමින් අපෝස්තලික ව්‍යවස්ථාවක් නිකුත් කරන ලදි.

3. 1974 දි මරියාලිස් කුල්ටුස් (Marialis Cultus) නමින් හයවැනි පාවුලු පාප්තුමා අපෝස්තලික අනුශාසනාවක් නිකුත් කරන ලදී. මරිය බැතියට ජනවන්දනාවේ විශේෂ ස්ථානයක් හිමිවන බව මෙම ලේඛනයෙන් පැහැදිලි කරයි.

4. 1987 දී දෙවන ජුවාම් පාවුළු පාප්තුමා විසින් ගැලවුම්කාරයාණන්ගේ මැණියෝ (Redemptoris Mater) යන නමින් විශ්ව ලේඛනයක් ඉදිරිපත් කරන ලදී. මේ ලේඛනය තුළින් ක්‍රිස්තු අභිරහස තුළ මරියතුමියගේ කාර්යභාරය පැහැදිලි කරයි. සභාවේ කේන්ද්‍රස්ථානයට හිමිකම් දක්වන මරියතුමියගේ මාතෘත්වයේ මැදහත්කම පැහැදිලි කෙරේ.

### 7.1.4 මරියෝත්තමාවන් පිළිබඳ සභා ප්‍රකාශන මගින් ඉස්මතුවන දේව ධාර්මික කරුණු

මරියෝත්තමාවන් පිළිබඳ සභා ප්‍රකාශන මගින් ඉස්මතු වන දේව ධාර්මික කරුණු සැකෙවින් මෙසේ දැක්විය හැකි ය.

1. ජේසු සමිඳාණන් වහන්සේගේ ගැළවීමේ පළමු ඵලය භුක්ති විඳිනු ලැබුවේ මරියෝත්තමාවන් ය. තව ද ඕතොමන් ගැළවීමට සහය ලබා දී ඇත.

2. ජේසු සමිඳාණන් වහන්සේගේ මාතාවන් වීමෙන් ඕතොමන් දේව මාතාව යන විරුදාවලියෙන් නම් කර ඇතත් ඕතොමන්ට දේවත්වයක් නො මැත. ඕතොමන් දේවාශීර්වාදයෙන් පූර්ණ වූ මිනිස් දුවකි, ජේසු සමිඳාණන් වහන්සේ මෙලොවට බිහි කිරීමට දායක වූ මාතාවන් ය.

3. සාන්ත සභාවේ ආදර්ශමත් සාමාජිකාවක් වන මරියෝත්තමාවන් සභාවේ ආකෘතිය හා පරමාදර්ශය ද වශයෙන් සැළකිය හැකි ය.

4. ශුද්ධවන්තභාවයට මිනිසා ලද දේව කැඳවීමට උතුම් ප්‍රතිචාරය සම්බන්ධයෙන් උත්තරීතර ආදර්ශය ලැබෙන්නේ මරියෝත්තමාවන්ගෙන් ය.

5. මරිය දහම, ක්‍රිස්තුවේදය (Christology) හා ඉතා තදින් ම සම්බන්ධ බව සභා ප්‍රකශන මගින් ඉතා පැහැදිලිව පෙනේ.

6. මරියෝත්තමාවන් පිළිබඳ ධර්මය ශාසන ධර්මයේ ද කොටසකි. (මෙය වතිකාන කතිකාවතෙන් සනාථ කරන ඉගැන්වීමකි.) එසේ ම කතිකාවත මගින් ඇය සභාවේ මාතාවන් ද වශයෙන් ද නම් කර ගෞරව දක්වනු ලැබේ.

7. මරියෝත්තමාවන් කාන්තාවක් වශයෙන් ලැබිය හැකි උපරිම උදාරත්වය හිමි කරගෙන ඇත. කාන්තා විමුක්තිය ගැන කතා කරන සැමට ඕතෝමන්ගෙන් ලබන පිටිවහල සහ ආදර්ශය ඉතා බලගතු ය.

8. සභා ජනවන්දනාව හා භක්ති අභ්‍යාසවල මරිය බැතියට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි.

9. මරියෝත්තමාවන් විෂය කොට ගෙන රචිත විශ්ව චක්‍ර ලේඛන හා වෙනත් ලේඛනවල ඕතෝමන්ගේ මාතෘකභාවය සහ යැදුම් මධ්‍යස්ථ භාවය ප්‍රාර්ථනාකර ඇත.

10. මරියෝත්තමාවෝ බලාපොරොත්තුවේ හා සහනයේ සලකුණක් වන්නා හ.

# අටවන පාඩම

## 8. ආධ්‍යාත්මික ජීවිතය

### හැඳින්වීම

මිනිසාගේ ජීවිතයේ කරන කියන සෑම දෙයක් තුළින් අප දකින්නේ මිනිසා තුළ යම්කිසි බලවේගයක් තිබෙන බවයි. මිනිසා කරන කියන දෙය හොඳ වන්න කියා ය, හැමගේ පැතුම. නමුත් සෑම විට ම එසේ නොවන බව අපට දැකගත හැකි ය. එනිසා මිනිසාගේ ක්‍රියා සහ සිතුවිලි නරක අතට හැරෙන බවත් අපට දැකගත හැකි ය. මෙම බලවේගය මිනිසාගේ ආධ්‍යාත්මය කියා බොහෝවිට හඳුන්වා දෙනු ලැබේ.

දැන් ලෝකයේ පවතින සෑම ආගම ධර්මයක ම මහා විශාල වගකීම වන්නේත්, සෑම ආගම් කර්තෘවරයකුගේ ම මහා කාර්යය වූයේත් මෙම ආධ්‍යාත්මය හොඳ අතට හැරවීමයි. එමගින් මිනිසා නිතරම හොඳ මඟ යැවීමයි.

ක්‍රිස්තියානි ආධ්‍යාත්මික ජීවිතය රඳා පවතින්නේ ශුද්ධ වූ ත්‍රිත්වයේ ජීවිතය මතුපිට බව අපගේ ඇදහිල්ලේ පදනමයි. අත්තිවාරමයි. ත්‍රිත්වයීක ජීවිතයේ පදනම ආදරයයි. ප්‍රේමයයි. පැරණි ගිවිසුමේ මෙය අපට හෙළිදරව් කළේ, නොයෙකුත් පුද්ගලයන් තුළින්, පියාණන් වහන්සේ ම බව අප දනිමු. ඒ සමඟ ම පියාණන් වහන්සේ පැරණි ගිවිසුමේ නිතර ම දුන් පොරොන්දුවක් තිබිණි. එනම්, එම ප්‍රේමය, නැතහොත් පියාණන්ගේ ආධ්‍යාත්මය එළිදරව් කිරීමට තවත් කෙනෙකුව එවන බවයි. මෙය අපට සම්පූර්ණයෙන් ම එළිදරව් වන්නේ නව ගිවිසුමෙනි. ත්‍රිත්වයේ ආධ්‍යාත්මය සම්පූර්ණයෙන් දන්නේ ත්‍රිත්වයේ කෙනෙක් නිසා ජේසුතුමා අපට හෙළිදරව් කළේ පියාණන්ගේ ආධ්‍යාත්මය බව නව ගිවිසුමෙන් අපට වටහාගත හැක. විශේෂයෙන් ජුවාම්තුමාගේ සුවිශේෂයේ ජේසුතුමා සහ පියාණන් අතර සබඳතාවය ප්‍රකාශ කරන විට උන්වහන්සේ අපට හෙළිදරව් කරන්නේ පියාණන්ගේ ආධ්‍යාත්මයයි. මෙම එළිදරව්ව ප්‍රකාශ කිරීමට, ජේසුතුමා තවත් ශක්තිමත් කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේ උන්වහන්සේ මතුපිට එවූ බව සුවිශේෂ හතර ම පෙන්වා දෙන සැටි අපගේ මතකයට නඟා ගත යුතු ය.

ක්‍රිස්තුන් වහන්සේ මෙසේ අපට සම්පූර්ණයෙන් හෙළිදරව් කළ පියාණන්ගේ ආධ්‍යාත්මය ය, අපගේ ආධ්‍යාත්මික ජීවිතය කියා අප විසින් පිළිගනු ලබන්නේ. ශුද්ධ වූ සභාව තුළ කාලයාගේ ඇවෑමෙන් මෙම ත්‍රිත්වික ආධ්‍යාත්මික ජීවිතය ය, නොයෙක් අයුරින් "ආධ්‍යාත්මික ජීවිත වලට" තුළ බෙදී තිබෙන්නේ. ඒවා අතුරෙන් ප්‍රධාන වශයෙන් පහත සඳහන් කොටස් තුන අපට පෙන්විය හැක.

1. ගිහි ආධ්‍යාත්මික ජීවිතය
2. පැවිදි ආධ්‍යාත්මික ජීවිතය
3. පූජක ආධ්‍යාත්මික ජීවිතය.

අවසනාවකට වාගේ ක්‍රිස්තුන් වහන්සේ හෙළිදරව් කළ පියාණන්ගේ ආධ්‍යාත්මය මෙසේ බෙදා ගැනීමෙන්, ප්‍රධාන දේ අමතක වී අප විසින් හදාගත් ක්‍රමවේද ගැන අවධානය වඩාත් යොමුවී ඇත. කෙසේ නමුත් මෙම පාඩම ඉගෙන ගැනීමේ දී
ගිහි ආධ්‍යාත්මික ජීවිතය සහ, පැවිදි ආධ්‍යාත්මික ජීවිතය ගැන කරුණු ස්වල්පයක් සලකා බලමු.

## 8.1 ගිහි ආධ්‍යාත්මික ජීවිතය

"ගිහියා" යන සිංහල වචනයට තිබෙන ඉංග්‍රීසි වචනය "LAITY" යනුයි. මෙම ඉංග්‍රීසි වචනය බිඳ ඇවිත් තිබෙන්නේ ග්‍රීක වචන දෙකකින් ය. "LAIKOS" සහ "LAOS" යන වචන වලින් ය. "ජනතාවට අයිති" සහ "ජනතාව" යන අර්ථ එම ග්‍රීක වචන දෙකේ අර්ථයන් ය. එනිසා අද "ගිහියා" හෝ "ගිහි" යන්නෙහි අර්ථය මෙසේ අර්ථ කථනය කළ හැක. පූජාත්වරය නමැති සක්‍රමේන්තුව නොලැබූ, පැවිදි ජීවිතයට ඇතුළු නොවූ අයට "ගිහි" අය කියා අමතනු ලැබේ. පූජකවරුන් සහ පැවිදි අය ද මතක තබා ගත යුතු කරුණක් මෙහිදී මතක් කළ යුතු ය. එනම් පූජකවරය සහ පැවිදි බව ගිහි ජීවිතය මත ගොඩ නැඟී ඇති බවයි. දෙව් සත්හලේ ඉගෙන ගන්නා විට "ගරු සහෝදරතුමා" කියා දේව ජනතාව ඇමතුවත්, තේවාචාර්ය ධූරය ලබන තුරු එවැනි කෙනෙක් ගිහියෙකු බව මතක තබා ගැනීම වැදගත් ය.

බයිබල් ඉතිහාසය ගෙන බැලූ විට අපට පෙනී යන්නේ ලෙවීගේ ගෝත්‍රයට අයිති වූ අය ය, පූජකයන් ලෙස නිල වශයෙන් සිටින්නේ. බයිබලයේ අන් හැම නායකයකු ම ගිහි අය ය. පැරණි ගිවිසුමේ මෙය වඩාත් පැහැදිලි ලෙස පෙනේ. ආබ්‍රහම් ගිහියෙකි. මෝසෙස් ගිහියෙකි. පැරණි ගිවිසුමේ විරවරයන් සහ විරවරියන් ගිහි අය වූහ. දිවැසිවරු ගිහි අය ය. ස්නාවක ජුවාම් තුමා ගිහියෙකි. ජේසු තුමා ද මුලින් පෙනී සිටියේ ගිහි අයෙකු ලෙසින් බව පෙනේ.

එසේ නම් අද සාමාන්‍යයෙන් බලන ආකාරයට $ආධ්‍යාත්මික'' ජීවිතයක් තිබෙන්නේ පැවිදි හෝ පූජක අයට පමණ ද? බයිබලය අපට පෙන්වන්නේ මෙය අසත්‍යයක් බව ය. බයිබලය පෙන්වන්නේ ඉන් අනික් පැත්ත ය. ඉහත නම් සඳහන් කළ අය සහ බයිබලයේ එන වෙනත් ගිහි චරිත (රජවරු) අපට පෙනෙන්නේ ගැඹුරු ආධ්‍යාත්මයක් තිබුණු අය සැටියට ය. දාවිත් රජ සහ අනෙකුත් රජවරු වැරදි ආධ්‍යාත්මයකින් වරෙක ක්‍රියා කළ බව බයිබලය පෙන්වා දෙයි. දාවිත් සහ බාත්ෂීබා කථාන්දරය කියවන විට අපට මෙය පෙනේ. ජෝබ්ගේ චරිතයේ අවසානයේ දී අපට පෙන්වා දෙන්නේ ඔහු ගැඹුරු ආධ්‍යාත්මයකින් යුක්තව ජීවත් වූ කෙනෙක් හැටියට ය.

**මෙලෙස බලන කල ගිහි ආධ්‍යාත්මික ජීවිතයේ හැඩය කුමක් විය යුතු ද?**

1. ප්‍රථමයෙන් ම ගිහි ආධ්‍යාත්මික ජීවිතය දේව වචනය මත පදනම් විය යුතුයි. මෙය ඉතාමත් පැහැදිලි කරුණකි. දේව වචනය කියන්නේ පැරණි ගිවිසුමත් නව ගිවිසුමත් ය.
2. දෙවනුව ගිහි ආධ්‍යාත්මය ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයත්, උන්වහන්සේ අපට හෙළිදරව් කළ පියාණන්ගේ ආකල්ප මතු පිටත් පදනම් විය යුතු ය.
3. තුන්වැනිව, ගිහි ආධ්‍යාත්මික ජීවිතය සභාවේ ඉගැන්වීම් මතුපිට පදනම් විය යුතු ය. සභාවේ ඉගැන්වීම්වලින් ප්‍රධාන කොටස් දෙකක් ගැන ගිහියාගේ අවධානය යොමුවිය යුතු ය.

(අ) **සභාවේ සමාජ ධර්මය:** ගිහියා "ලෝකයේ'' තමන්ගේ රැකියා වැඩකටයුතු, සමාජීය වැඩකටයුතු, රැකියා වැඩ කටයුතු කරන විට, මේවා ගැන දැනුම ඉතාමත් අවශ්‍ය ය.

(ආ) **සභාවේ සාරධර්ම පද්ධතිය:** පවුල් ජීවිතය සහ ඒ හා සම්බන්ධ කරුණු සමඟ ගැටෙන විට සාරධර්ම ඉතා වැදගත් බව අප විසින් මතක තබාගත යුතු ය.

4. තම තමන්ගේ ජීවිත තත්ත්ව මත ගිහි ආධ්‍යාත්මය ගොඩ නඟා ගැනීම ගැන ගිහියා කල්පනාකාරී විය යුතු ය. ප්‍රථමයෙන් ම පවුල් ජීවිතයේ කාර්යභාරය සහ ඒවා ක්‍රියාවට නැංවීම ගැන අවධානය යොමු කළ යුතු ය. දෙවනුව තම තමන්ගේ රැකියාව ගැන පැහැදිලි අවබෝධයක් ඇතිකර ගැනීමත් ඉතා වැදගත් ය.
   රැකියාව කළයුතු ආකාරය, එහි වගකීම්, ක්‍රියාකාරීත්වය ගැන දැනගැනීම ක්‍රිස්තියානි වගකීම සම්පූර්ණත්වය කරා ගෙන යැමට උපකාරී වේ.
   නූතන සභා ඉතිහාසයේ ගිහියාට වැදගත් කැඳවීමක් ඇති බව ප්‍රකාශ කළේ දෙවැනි වතිකාන මන්ත්‍රණ සභාවයි. සෑම ක්‍රිස්තියානි (ස්ත්‍රී, පුරුෂ) ගිහියෙක් ම බෞතිස්මය ලබා ඇති බවත්, බෞතිස්ම කැඳවීමේ වගකීම් ඉතා වැදගත් බවත් II වන වතිකාන මන්ත්‍රණ සභාව පෙන්වා දෙයි. සෑම ක්‍රිස්තියානිකාරයෙකු ම සුබ අස්න ප්‍රකාශ කිරීමේ කාර්යයට කැඳවා ඇත. ලෝකයේ ඇති ජීවන තත්ත්වයන්, තමන්ගේ දෛනික සහභාගිත්වයෙන් නිතර නිතර නවතාවයකට පැමිණ විය යුතු බවත් ගිහියාට පෙන්වා දෙයි. එමගින් දේව රාජ්‍යය තමාට හැකි අන්දමින් ගොඩ නැගිය යුතු බව වතිකානු මන්ත්‍රණ සභාව පෙන්වා දෙයි. මෙසේ ගිහියාගේ ආධ්‍යාත්මික ජීවිතයට නව පන්නරයක් මන්ත්‍රණ සභාව හඳුන්වා දී ඇත. සභාව සභාව තුළ "දෙවැනි පන්තියේ පුරවැසියෙක්'' නැති බවත්, "අරයට වඩා මෙයා හොඳ ය'' යන ආකල්පයක් නැති බවත් පෙන්වීම, ගිහි ආධ්‍යාත්මිකත්වය ගැන II වතිකාන මන්ත්‍රණ සභාව ඉදිරිපත් කළ විප්ලවකාරී මතයකි. 1987 ගිහියා ගැන කථා කරන්නට විශේෂ සිනඩ් සභාවක් කැඳවා එහි ප්‍රතිඵල අනුව 1989 දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ Chritifideles Jaici යන ලේඛනය නිකුත් කරමින් ගිහි ආධ්‍යාත්මිකත්වයට නව පණක් දුන් බවත් අපට පැහැදිලි ය.

## 8.2. පැවිදි ආත්මික ජීවිතය

බෞතිස්මය ලබා විවාහ ජීවිතයට ඇතුළු නොවී, පූජකවරයට ඇතුළුවන අයට "පැවිදි පූජකයන්" කියා ද (Religious Priests), පූජකවරයට ඇතුළු නොවන පිරිමි අයට "පැවිදි සහෝදරයන්" කියා ද, පැවිදි ජීවිතයට ඇතුළු වන ස්ත්‍රීන්ට "පැවිදි සොයුරියන්" (Religious Sisters or Nuns) කියා ද ආමන්ත්‍රණය කරනු ලැබීම සහාවේ සිරිත ය. මෙසේ පැවිදි ජීවිතයට ඇතුළු වන අය දිළිඳුකමේ, ව්‍රත ශුද්ධියේ සහ කීකරුකමේ පොරොන්දු ද භාර ගනු ලබන බව විශේෂයෙන් කිව යුතු ය. පැවිදි ජීවිත ආධ්‍යාත්මය ගැන කථා කරන විට තවත් කරුණක් විශේෂයෙන් සඳහන් කළ යුතු ය. එනම්, ඒ ස්ත්‍රී පුරුෂ සියලු දෙන යම්කිසි පැවිදි පවුලකට, පැවිදි සංඝයකට අයිති වීමයි. එවැනි පැවිදි පවුලකට අයිති නොවී ජීවත්වීම පැවිදිකමට පටහැනි බව මතක තබා ගත යුතුයි.

පැවිදි පවුලකට මූලාරම්භකයෙක් සිටී. ඔහු හෝ ඇය හොඳට හිතාමතා, එම පැවිදි පවුල, ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් තවත් ගැඹුරු අන්දමින් ජීවත්විය යුතු, අන් අයට වඩා කැප වූ ආදර්ශයක් ලෙස ජීවත්විය යුතු දර්ශනයක් ඉදිරිපත් කරයි. එම දර්ශනය පිළිගන්නා අය එම පැවිදි පවුල තෝරාගෙන එය හා සම්බන්ධ වෙති. ක්‍රිස්තු ඉගැන්වීම් මත පදනම් නොවූ පැවිදි ජීවිතයක් නැත.

මේ පැවිදි ජීවිත ක්‍රම සහ ඒ හා සම්බන්ධ ආධ්‍යාත්මික ජීවිතය ගැන උදාහරණ කිහිපයක් ගැන අපි දැන් සලකා බලමු.

### දුගීන්ගෙත් දුගීන්ට සේවය කිරීම:

දුගීන් හට සුබාරංචිය දේශනා කිරීමට ජේසුස් වහන්සේ ආ බව උන්වහන්සේ ප්‍රකාශ කළ බව අපි දනිමු. මෙම ඉගැන්වීම ගැන කල්පනා කර ගරු තෙරේසා මව්තුමිය, එම කටයුත්ත සඳහා ඉන්දියාවේ කල්කටා නගරයෙන් තම පැවිදි සේවාව සහ පැවිදි පවුල ආරම්භ කළ බව අපි කවුරුත් දන්නා, අපේ ඇස් පිට පෙනෙන්නට තිබෙන හොඳම උදාහරණයකි. මෙම දුෂ්කර දූත සේවාව අනුව තෙරේසා මව්තුමිය ඇයගේ පැවිදි පවුලේ ආධ්‍යාත්මික ජීවිතය සකසා ඇත. දිළිඳුකමේ පොරොන්දුව අනුව ඔවුනට එකවර ළඟ තබාගත හැක්කේ අඳින්නට හැකි සාරි දෙකක් පමණ ය. කීකරුකමේ පොරොන්දුව අනුව ලෝකයේ ඕනෑම රටක සේවය කිරීමට ඔවුන් බැඳී සිටිය යුතු ය.

### ජේසුතුමා සහ තාරුණ්‍යය:

ජේසුස් වහන්සේ පසු පස්සේ ඒමට එක්තරා තරුණයකුට ආරාධනා කළ බවත් එම තරුණයා එය ප්‍රතික්ෂේප කළ බවත් අපි දනිමු. එම තරුණයාගේ ප්‍රධාන බාධකය වූයේ ධනය යි. ඒ ධනය අසීමිතව ඇති නිසා ය. අන් අයට කිසිම ධනයක් නැති නිසාත් ජීවිතයේ බොහෝ ප්‍රශ්නවලට මුහුණ පාන හැටි අපි දනිමු. ඉතාලියේ ටියුරින් පළාතේ කැස්ටෙල්නුඕවෝ නමැති ග්‍රාමයේ උපන් ජෝන් බොස්කෝ පියතුමා ඉතා දුගී අසරණ ළමා ජීවිතයක් ගතකිරීමේ අත්දැකීම මාර්ගයෙන් තරුණ, තරුණියන්ට සේවය කිරීමට පැවිදි පන්තියක් ආරම්භ කළ බව අපි දනිමු. "සැලේසියානු" පැවිදි නිකාය තරුණ තරුණියන්ගේ වෘත්තිය පුහුණුව, හැදියාව යනාදිය ගැන වෙහෙසෙමින් සේවය කරන බව අපට දක්නට හැක. අප රටේ ද ඔවුන් විශාල සේවාවක කරන බව අපි දැක ඇත්තෙමු. එම පැවිදි පවුලේ ආධ්‍යාත්මික ජීවිතය ද එසේ හැඩ ගැසීමට මූලාරම්භකයා වෙහෙසී ඇත.

### "දිළිඳුන්ට සුබාරංචිය දේශනා කිරීම":

මෙම කාර්යය ජේසු තුමාගේ හදට ඉතා ම ළංවූ, තම පියාණන්ගේ කාර්යයක් විය. මෙම කරුණ මුල් කරගෙන බිහිවූ පැවිදි පවුලකි, නිර්මල මරිය නිකායේ පැවිදි පූජකවරු සමූහ ය. මිෂනාරීන් මෙන් වෙනත් දේශ වලට ගොස් මේ කාර්යයට මුල පිරීම, සුබ අස්න දේශනා කිරීම සමඟ මුහුණ පෑ යුතු සාධාරණත්වයේ ප්‍රශ්න, දිළිඳුකම සහ එහි ආදීනව, අලුත් භාෂාවන් ඉගෙන ගැනීම, දේශනා කිරීමේ නිපුණත්වය යන මේවා මුල් කරගෙන, ඒ අනුව ආධ්‍යාත්මික ජීවිතය සකසා ගත් පැවිදි පවුලකි, නිර්මල මරිය නිකාය. ලංකාවේ කෙරෙන මෙම නිකායේ සේවය විමසා බැලීමෙන් අපට මෙය දැකගත හැකි ය.

ඉහත සඳහන් වූයේ උදාහරණ තුනක් පමණකි. නමුත් ඔබ දන්නා තවත් වෙනත් පැවිදි නිකායයන් ගැන විමසීමක් කර බැලුවොත් මෙය මනාව පැහැදිලි වේ. එනිසා පැවිදි පවුලක ආධ්‍යාත්මික ජීවිතයෙන් ගෙනහැර පාන්නේ ජේසුස් වහන්සේගේ ජීවිතයේ එක පැති කඩක් ගෙන එය ගැඹුරට ජීවත්වීමට මුළු සභාවට ම ආදර්ශයක් දීමයි. ජේසුස් වහන්සේගේ ජීවිතයේ පූර්ණත්වය කෙතරම් ගැඹුරු ද, පළල් ද කීවොත් එක පුද්ගලයෙකුට පමණක් එය ජීවත්විය නොහැකි ය. ශුද්ධ වූ සභාව නමැති මේ මහා ක්‍රිස්තු පවුල තුළ, ජේසු ජීවිතයේ ඒ ඒ පැතිකඩවල ජීවත් වී පෙන්වීමේ මහා වගකීම පැවිදි පවුල්වල ආධ්‍යාත්මික ජීවිතවලින් වන විශාල සේවාව ය.

දෙවැනි වතිකාන මන්ත්‍රණ සභාව පැවිදි ජීවිතයේ නවෝදයක් ඇති කරන්නට කියා පැවිදි නිකායනට ආරාධනා කළේ ය. වර්ෂ 1965 වතිකාන මන්ත්‍රණ සභාව මෙසේ ආරාධනා කළේ පැවිදි නිකායන් තුළ යම්කිසි අඩු පාඩු තිබුණ නිසා, එම අඩු පාඩු නූතන ලෝකයට සරිලන අන්දමට හැඩගස්සා ගත යුතු නිසා ය. මුල් ආරම්භකයාගේ අරමුණ ගැන නැවතත් බලා, සෑම නිකායකට ම තිබෙන විශේෂ කාර්යය ගැන නැවතත් සළකා බලා, එසේ නවෝදයක් ඇති කර ගන්න කියා ය, දෙවෙනි වතිකාන මන්ත්‍රණ සභාව ආරාධනා කළේ. 1966 හයවන පාවුලු පාප්තුමා ද ලේඛනයක් මගින් මෙම නිකායනට ආරාධනා කළේ ආධ්‍යාත්මික නවෝදයක් ඇති කර ගන්නට කියා ය.

ශුද්ධ වූ සභාව තුළ නිතර නිතර නවෝදයක් ඇති කරමින්, අද ලෝකයට ගැලපෙන අන්දමට ආධ්‍යාත්මික ජීවිතයේ ඒ ඒ පැති පෙන්වමින් දේව රාජ්‍යය ළඟා කිරීමේ කටයුත්තේ යෙදී සිටින වැදගත් සංස්ථා ය, පැවිදි නිකායයන්. එනිසා ඒවායේ ආධ්‍යාත්මික ජීවිතයන් හොඳාකාර පෙන්වීම සහ අවංකව, ක්‍රියාකාරීව ජීවත්වීම "සභාව ලෝකයට ගැලවීමේ සළකුණක්" ය යන කීමේ අදහස හොඳාකාරව විදහාපාන්නකි.

# නවවන පාඩම

## 9. සහභාගිශීලි සභාව

## 9.1. හැඳින්වීම

### සහභාගිශීලි සභාවක් යනු

බෙදාගැනීම

අපගේ අසල්වැසියා සමඟ ආහාරපාන, ඇඳුම්-පැළඳුම්, පොත්පත් මිල-මුදල්, දුක-සැප, ආදරය-කරුණාව, ප්‍රීතිය ශ්‍රමය බෙදාහදා ගැනීම. ශුද්ධ වූ සුවිශේෂය බෙදාගැනීම, දිව්‍ය සත්ප්‍රසාදය බෙදා ගැනීම සඳහන් වන අවස්ථා - පන්දහසකට කෑම දීම, අන්තිම රාත්‍රී භෝජනය.

**සාකච්ඡා කිරීම**

සෑම ක්‍රියාවකදී ම කිතුනු ඒකක තුළ, පියතුමා හා ජනතාව අතර, සාකච්ජාව මගින් සෑම කෙනෙක් තුළ ම අප, අපගේ යන හැඟීම ඇති වේ. පියතුමා හා ජනතාව අතර සහයෝගය, එකමුතුබව වර්ධනය වේ. සුවිශේෂයේ සාකච්ජා කිරීම සඳහන් වන අවස්ථා - කානා නුවර විවාහ මංගලෝත්සවය, පන්දහසකට කෑම දීම.

**සවන් දීම**

ඒකකයේ එකිනෙකාට සවන් දීම තුළ විශ්වාසය ගොඩනැගේ. දුක, සැප තේරුම් ගැනීමට හැකියාව ලැබේ.

විවිධ දීමනා තුළ එකමුතුවීම

දෙවියන් වහන්සේ අපට ලබාදී ඇති හැකියාවන් එකමුතු කර උන්වහන්සේ අපෙන් බලාපොරොත්තුවන සහභාගිශීලි සභාවක් ගොඩනැගීම. උදාහරණ ලෙස විවිධ අයගේ හැකියාවන්, දක්ෂතාවයන්, අදහස් උපයෝගී කරගෙන නිවසක් තැනීම.

**විශ්වාසයේ හා ආදරයේ සංසය**

උදාහරණ ලෙස පවුල තුළ සාමාජිකයන් අතර, ඇති විශ්වාසය, ආදරය, එකමුතුකම, අවංකකම, දුක-සැප, ප්‍රීතිය කඳුල බොදා ගැනීම, ඉවසීම, වැයවීම.

**උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීමේ සංසය.**

එනම් මුල් ක්‍රිස්තියානි සභාවේ ලක්ෂණයි. ඉගැන්වීම, සහභාගිකම, බෙදාගැනීම, එක්ව යාච්ඤා කිරීම, ගෙයින් ගෙට යාම, එක්සත්ව සිටීම. තම තමන් අතර ප්‍රීතියෙන් සිටීම, ත්‍යාගිවන්ත වීම, දෙවියන්ට ප්‍රශංසා කිරීම, දේව මාලිගාවේ රුස්වීම.

සහභාගිශීලි සභාවක් යනු හුදෙක් සංකල්පයක් නොවේ. ගොඩනංවා ගැනීමට නොහැකි දෙයක් ද නොවේ. මින් පෙර නොපැවති දෙයක් ද නොවේ. ශු. සුවිශේෂයේ ද සහභාගිශීලි සභාවක් පැවති බවට පෙන්වාදෙන කරුණු අනුව සාක්ෂි දරයි. (ක්‍රියා 2/42-47)

## 9.2. සභා ප්‍රකාශන වලට අනුව සහභාගිශීලී සභාව

- R.M. - (රෙදොම්ටෝරිස් මිසියෝ) මූලික කිතුනු සංඝවල අවශ්‍යතාව 2 ජුවාම් පාවුළු පාප්තුමා ප්‍රකාශ කරයි. (1990)

  මෙම කිතුනු සංඝයන් යාච්ඤාවේ සුබඅස්න භාවනාවේ සහ මානුෂික ගැටළු සඳහා පිළිතුරු සොයන සංඝයන් ය. ඔවුන් ප්‍රේමයේ ශිෂ්ටාචාරයක පදනම සොයා ධර්මදූතික ගමනක යෙදෙන සංඝයකි.

- **දෙවන වතිකාන මන්ත්‍රණ සභාව (G No. 15)**

  ධර්ම දූත කාර්ය භාරය යටතේ දේව දාසයන් සහ දාසියන් සැදැහැවත් සංඝ ඇති කළ යුතුය. එහි ප්‍රසාද ස්නාපනීය වගකීම්, පූජක, දිවැසි සහ එඬේර වගකීම ඉටු කළ යුතු ය. එවිට ලෝකය තුළ ජීවමාන දෙවිඳුන්ගේ සලකුණක් වීමට කිතුනු සංඝයට හැකියාව ලැබේ.

- **FABC -** ඉන්දුනීසියා, පස්වන සම්මන්ත්‍රණය (1990) ආසියාවේ සභාව සාංඝික සම්බන්ධනයේ සභාවක් විය යුතු ය. එහි ගිහි, පැවිදි, පූජක සෑම අන්‍යොන්‍ය පිළිගැනීම සහෝදරත්වයේ පදනම තුළ

ඉස්මතු කළ යුතු ය. එම සාංඝික ජීවිතය තුළ ශුද්ධාත්ම දිමනා ජීවත් කළ යුතුය. එය උත්ථානවූ ස්වාමින් වහන්සේට කරන සාක්ෂි දැරීමකි. තවද එය නව සහසුයේ මිහිමත තුළ දිවැසි වෙස් ගැනීමකි.

**- E.A. - (එක්ලේසියා ඉන් ඒෂියා - ආසියාවේ සභාව - 1999)**
**(දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින්)**

සෑම සභාවක්ම සාංඝික සම්බන්ධතයේ සහ සහජීවනයේ ස්වභාවයයන් මත පදනම් විය යුතු ය. එය සභාවේ ස්වභාවයයි. ආසියානු රදගුරු මණ්ඩලය මෙයට දෙන නාමය, "සහභාගිශීලි සභාව"යි. මේ සඳහා ශු. බයිබලීය පදනම් ලෙස අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ දෙවන පරිච්ඡේදය උපුටා ගත හැක. (ක්‍රියා 2/44-47, 4/32-35, 11/19-26)

**- E.N. - (ඉවැන්ජලී නුන්සියාන්ඩි) 6 වන ජුවාම් පාවුළු (NO. 58)**

සෑම කිතුනු සංඝයක් ම විශ්වීය සභාවන් සමග බැඳීමකින් කටයුතු කළ යුතු වන අතර, ඒ ඒ සභාවන්ට ආවේණිකව හුදකලාගත නොවිය යුතු ය.

**9. 3. සහභාගිශීලි සභාවේ පැරණි සහ නව ආදර්ශ බයිබලීය හා ධර්මදූතික සංකල්ප**

**පැරණි ගිවිසුම (ජෙරමියා 7/23, 31/31-34, එසකියෙල් 34/15, එසකියෙල් 34/31)**

ඉහත පාඨවලට අනුව දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර ඇති සම්බන්ධය කරුණු 2 ක් මත පදනම් වේ. ඉන් පළමුවැන්න නම් දෙවියන් වහන්සේ මනුෂ්‍යයාව සෑම අයුරින් ම පෝෂණය කිරීමක් සිදු කරන අතර මනුෂ්‍යයා හෙවත් දෙවියන් වහන්සේගේ බැටළු රැළ උන්වහන්සේගේ හඬට ඇහුම්කන් දීමත්, උන්වහන්සේගේ නීතිය පිළිපැදීමත්, උන්වහන්සේට යාග පූජා පුද කිරීමත් සිදුකළ යුතුවෙයි. මෙය ඉපැරණි දිවැස්ප්‍රසාදි වරුන්, රජවරුන් සහ පූජකයන්ගේ මැදිහත්කමින් සිදු කරන්නකි. එයට වඩා ගිහි සහභාගිත්වයක් පැරණි ගිවිසුමේ අපි නොදකින්නෙමු.

නව ගිවිසුම
තම ප්‍රසිද්ධ ජීවිතයේ ආරම්භයේ සිට ම සිය දූත මෙහෙවරට උරදීම සඳහා ජේසුස් වහන්සේ ගෝලයන් තෝරා ගත් බව අපට සුපුවත අනාවරණය කරයි. (මාක් 3/14) තව ද ලූක් සුවිශේෂයේ සැත්තෑ දෙනෙකුගේ කැඳවනු ලැබීමත්, යවනු ලැබීමත් දක්නට ලැබේ. (ලූක් 10/1) පන්දහසකට ආහාරදීම තුළ අපෝස්තුළුවරුන්ගේ සම්මාදම ද පැහැදිලි ය. අවසානයේ ස්වර්ගාරෝහණයට ප්‍රථම තම දූත මෙහෙවර ඉදිරියට ගෙනයාමට අපෝස්තුළුවරුන්ට පැවරීම සිදුවෙයි. (මතෙව් 28/19) මෙසේ අපෝස්තුළුවරුන් සමඟ අප ස්වාමීන් වහන්සේ තම දූත මෙහෙවර බෙදාගත් බව මනාව අපට අවබෝධ වෙයි. (ජුවාම් 20/20) තව ද, මෙම දූත කාර්යය තුළ තමන් හා සම්බන්ධවීම අත්‍යාවශ්‍ය ගුණාංගයකි. (ජුවාම් 15/5)

අපෝස්තුළුවරුන්ගේ ජීවිත ක්‍රියා පටිපාටිය තුළ ද සැදැහැවතුන්ගේ සහභාගිකම ධර්මදානයෙහි ලා ඔවුන්ගේ ජීවිත සාක්ෂිය පැහැදිලි ය.

වතිකාන කතිකාවතට පෙර සහභාගිශීලි සභාවේ ආදර්ශ

**A.** ත්‍රිකෝණාකාර සභාව

**B.** අපවර්ථන සභාව (යටිකුරු සභාව)

**C.** සංවිධානාත්මක සභාව

**දෙවන වතිකාන කතිකාවතට පසු**

i. ප්‍රාදේශීය සභාවන් හෙවත් පදවි
ii. පූජක සභාව
iii. පදවි දූත සේවා මණ්ඩල
iv. සභාව සහ මිසම් දූත සේවා මණ්ඩලය

**සම්බන්ධනය - නික් : 26/4, හිතෝ : 40/30, සිරාක් 9/4, ලෙවි : 3, 1 කොරි : 10/16, 1 පේදුරු 5/1**
**සහභාගිත්වය - නික් : 20/3-17, 20/22, ලෙවි : 19/1-27, ද්විතීය කථාව 12/1**

## 9.4. සහභාගිශීලී සභාවේ ආධ්‍යාත්මිකත්වය

### සාංඝිකත්වය පිළිබඳ සංකල්පයේ ආරම්භය

ශු. සභාව තුළ සාංඝිකත්වය ශු. ත්‍රිත්වයේ සාංඝිකත්වය තුළින් ගොඩනැගුනකි. දෙවියන් වහන්සේ සාංඝික වන සේක. ඒක දෙවියන් වහන්සේ, වහන්සේලා තිදෙනෙකුගෙන් යුක්ත ය. එය එකමුතුභාවයේ උච්ච ම වූ අවස්ථාවකි. පියාණන් වහන්සේටත්, පුත්‍රයාණන් වහන්සේටත්, ශුද්ධාත්මයාණන් වහන්සේටත්, උන්වහන්සේලාට ම ආවේණික වූ අනන්‍යතාවයක් ඇත. උන්වහන්සේලා අතර පවතින ගැඹුරු එකමුතුකම නිසා ම, ගැඹුරු සාංඝිකත්වයක් තුළ පවතින නිසාද එකම දෙවි කෙනෙකු ලෙස වැඩවාසය කරන සේක. මෙය සාමාන්‍ය මිනිස් බුද්ධියට අවබෝධකර ගත නොහැකි තරම් වූ ගැඹුරු සාංඝිකත්වයකි. සාංඝික වූ සභාවක් තුළ එකිනෙකා තම ජීවිත අන් අය සමඟ බෙදා ගනිමින් ද අන් අයගේ ජීවිත තමන් සමඟ බෙදා ගන්නට ඉඩහරිමින් ද, එකිනෙකා අතර නොකැඩෙන තිරසාර සම්බන්ධතාවයක් ගොඩනැගීම සහා සාංඝිකත්වයේ අනෙක් පැතිකඩයි. මෙය එක ම කාසියේ දෙපැත්ත වැනි ය. දෙවියන් වහන්සේ සමග ඇතිකර ගන්නා අවංක, සත්‍ය භක්ත්‍යාදර සම්බන්ධතාවයේ ප්‍රතිඵලය මනුෂ්‍ය වර්ගයා අතර ඇති කර ගන්නා සාංඝිකත්වයයි.

ආධ්‍යාත්මිකත්වය උගන්වන දෙයක් නොවන අතර හසුකර ගන්නා දෙයකි. මන්ද, එය අත් නොදකින දෙයක්වන අතර එය ජීවත්වන දෙයකි. ඇතැමුනට සාමාන්‍ය මානුෂික වාතාවරණයකට වඩා ආධ්‍යාත්මිකත්වය ඉහළට යන්නකි. එහෙත් අප ජීවත්වන පරිසරය තුළින් ම, නැතිනම් අප සමාජිකත්වය ලබා සිටින සභාව තුළ ම ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය සොයා ගැනීම වටී. සභාව නම් ක්‍රිස්තුන් වහන්සේගේ අතීන්ද්‍රිය ක්‍රිස්තු දේහයයි. එහි එක් ඉන්ද්‍රියකට තවත් ඉන්ද්‍රියක් ගැඹුරින් බැඳී පවතී. එය පෙර අප කතා කළ ශු. ත්‍රිත්වයේ පදනමයි.

- **දේව ජනතාව**
- **ක්‍රිස්තු දේහය**
- **ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය**

**(RE - EA No. 17, ජුවාම් 10/30, 14/10, 15/26, පිලිප්පි 1/19)**

සහභාගිශීලි සභාව පිළිබඳව අපේ ආධ්‍යාත්මික තේරුම් ගැනීම විය යුත්තේ ස්ප්‍රීතුවෙන් පිරි සක්‍රමේන්තුමය සභාව, සාංඝිකත්වයේ සහ ධර්මදූත සේවය පෙරදැරිවය. එහෙයින් සභාවේ ස්වභාවය අනිවාර්යයෙන්ම සාංඝික වූ සහභාගිශීලී බවක් උසුලන්නේ ශු. ත්‍රිත්වයේ සාංඝිකත්වය නිසා මානුෂික සාංඝිකත්වය බිහිවීමයි. "කොයිනෝනියියා" "අගපේ" යන්න සැකවින් සහභාගිශීලී සභාවේ අධ්‍යාත්මික පැදනමයි.

## 9.5. ගිහියා සහ සහභාගිශීලී සභාව

ආසියාතික සභාව සංඝයන්ගේ සංඝයක් වීමේ නව දැක්මේ ආලෝකය තුළ සෑම පදවියකම කුඩා කිතුනු සංඝ පිහිටුවීමට ශ්‍රී ලංකා රදගුරු මඩුල්ල ඒකමතිකව අනුමැතිය පළකළ හ.

රදගුරු පදවි කිහිපයක් ම මෙම තීරණය ක්‍රියාත්මක කරමින්, සාංඝික ජීවිතයේ නවෝදයක් ඇති කරමින් සභාවේ සහභාගිශීලී ස්වභාවය ප්‍රකාශවන්නට සලසා ඇත.

පූජක, පැවිදි, ගිහි සැමදෙන එක්ව එකිනෙකාගේ විශේෂිත කරිස්මාවන් හඳුනා ගනිමින් හා ඒවා අගය කරමින් අන්‍යොන්‍ය සබඳතාවෙන් කටයුතු කරන විට සභාව ඇත්ත වශයෙන් ම ඒකාබද්ධතාවෙන් යුක්ත වේ.

**අසිපා ක්‍රමවේදය** තුළින් කුඩා කිතුනු සංඝ පිහිටුවා වර්ධනය කිරීමට නොකඩවා අවධානය හා ප්‍රයත්නය දැරිය යුතුයි.

සැබෑ කිතුනු සංඝ හැඩ ගැස්වීමේ දී පූජක පැවිදි, ගිහි ජනතාව තුළ සැබෑ කිතුනු නායකත්වයක් ගොඩනැංවීමට කළ යුතු බැහැපත් සේවාවන් බොහෝමයක් ඇත. ක්‍රිස්තුන් වහනසේ වදාළ ලෙස ප්‍රධානියා වීමට කැමති තැනැත්තේ සියල්ලන්ගේ සේවකයා විය යුතු ය. "මා ආවේ සේවය ලබන්නට නොව සේවය කරන්නට ය." යන්න ක්‍රියාත්මක කෙරෙන බැහැපත් සේවාවන් ය.

තව දුරටත් සභාවේ නායකත්වය සෑම මට්ටමකදී ම බෙදාගත යුතුවූවක් වන අතර ස්වල්ප දෙනෙකු අතරේ වූ ඒකාධිකාරයක් නොවිය යුතු ය. මෙය සභාවේ සෑම ව්‍යුහයක් හා සංවිධානයක් කෙරෙහි වූ එනම් පදවි, දිසා, මිසම්, ධර්ම සභා, ගිහි අපෝස්තලික සංවිධාන ආදිය කෙරෙහි ද ක්‍රියාත්මක කළ යුත්තකි.

# දසවන පාඩම

## 10. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති

### හැඳින්වීම

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලට අනුව 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිකුත් කළ පළමු වැනි වාර්තාවෙන් සමස්ත පාසල් අධ්‍යාපනය මගින් අවසාන වශයෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ජාතික පොදු අරමුණු නවයක් හඳුන්වා දී ඇත. ඒවා ශිෂ්‍යයාට පාසල් කාලය තුළදී ම මුදුන්පත් කර ගැනීම අපහසු ය. පාසල් දිවියෙන් ඔබ්බට විහිදෙන දර්ඝ කාලීන වශයෙන් අත්පත් කර ගත හැකි අරමුණු නවයකි. එහෙත් ශිෂ්‍යයාගේ එම ගමනට අඩිතාලම වශයෙන් පාසල් අධ්‍යාපනය ලබන කාලය තුළදී ම ප්‍රගුණ කර ගත හැකි පොදු නිපුණතා පහක් ද එම වාර්තාවේ දක්වා ඇත.

කතෝලික ධර්මය ඉගැන්වීමට සූදානම්වන ගුරුවරයා ජාතික පොදු අරමුණුවල සිට විෂය නිර්දේශයේ පොදු අභිමතාර්ථ දක්වා වූ අපේක්ෂා අනුක්‍රමය සැළකිල්ලෙන් කියවා අවබෝධකර ගැනීම අත්‍යාවශ්‍ය ය. විෂය නිර්දේශයේ අඩංගු විෂය අන්තර්ගතය සිය පන්ති කාමරයේ දී සිසුන්ගේ ප්‍රවේශ චර්යාවට සහ තත්ත්වයන්ට ඔබින පරිදි ඉදිරිපත් කිරීම සඳහා ඉගෙනුම් අවස්ථා තෝරා ගැනීමේ දී හා ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී ඉහත සඳහන් විවිධ මට්ටම්වලට අධ්‍යාපන අපේක්ෂා පිළිබඳ අවබෝධය ප්‍රයෝජනවත් වේ. එම අපේක්ෂා ඉටු කර ගැනීමට නම් හුදෙක් පන්ති කාමර ඉගැන්වීම් පමණක් ප්‍රමාණවත් නොවන බව පැහැදිලි ය.

## 10.1 ජාතික පොදු අරමුණු නවය

i. ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාවයක් , ජාතික අනන්‍යතාවයක් හා ජාතික සමගියක් ගොඩ නැගීමට.
ii. පෘථුල වශයෙන් විසිරී යන සමාජ සාධාරණ රටා පිහිටුවීම.
iii. දැරිය හැකි ජීවන රටාවක් ගොඩනැගීම. (සුදුසු වාතය හා ජලය නොඅඩුව ලැබෙතැයි සිතිය නොහැකි වර්ෂ 2000 හා ඉන් ඔබ්බටත් ගැලපෙන ඉසිලිය හැකි ජීවන ක්‍රමයක් )
iv. උදාර වූ සැහීමක් හා ආත්ම තෘප්තියක් ගෙන දෙන්නා වූත් රැකියා අවස්ථා ජනිත කිරීම.
v. ජාතියේ සාමාජීය හා ආර්ථික වර්ධනයට රුකුලක් වන මානව සම්පත් සංවර්ධනය සඳහා සියල්ලන්ටම සහභාගි විය හැකි විවිධ අවස්ථා සැලසීම.
vi. එකිනෙකා ගැන අඛණ්ඩ වූත් , ගැඹුරු වූත් සැළකිල්ලක් දැක්වීමේ සංකල්පය තහවුරුවන ජාතිය ගොඩනැගීමේ කාර්යයෙහි ක්‍රියාශීලී සහභාගීත්වය
vii. නිරතුරුව වෙනස්වන ලෝකයේ අභියෝගයන්ට මුහුණපාන්නට හැකිවන පරිදි අනුවර්ථ රටාවන් ගොඩනැගීමේ හා තමන්ගේ හා අන්‍යයන්ගේ අභිවෘද්ධිය උදාවන සේ වෙනස් වීම හැසිරවීමේ ශක්තිය දියුණුකර ගැනීම.
viii. ස්ථාවරත්වය හා සුරක්ෂිතභාවය ජනිත කරවන්නා වූ අනපේක්ෂිත හා ව්‍යාකූල අවස්ථා වලට මුහුණ දීමේ ශක්තිය දියුණු කිරීම.
ix. ජාත්‍යන්තර සමාජයේ ගෞරවනීය ස්ථානයක් ඇති කර ගැනීමට උපයෝගී වන හැකියාවන් වර්ධනය කිරීම.

## 10.2 පොදු නිපුණතා පහ

### (අ) සන්නිවේදනය පිළිබඳ නිපුණතා

මෙම නිපුණතාවය කොටස් තුනකින් සමන්විත වේ. සාක්ෂරභාවය, ගණනය හා මාණනය සහ රූපණය යනුවෙනි.
සාක්ෂරභාවයට ඇතුළත් වන්නේ කල්පනා කිරීම, සවන් දීම, පැහැදිලි උච්චාරණය, අර්ථය සඳහා කියවීම , නිවැරදිව හා පැහැදිලිව ලිවීම ය.
ගණනය හා මාණනය ඇතුළත් වන්නේ යම් යම් දෙයට ඉලක්කම් භාවිතය, කාලය හා අවකාශය ගණන් බැලීම හා ක්‍රමානුකූලව මැනීම ය.
රූපණයට ඇතුළත් වන්නේ රූප සටහන් භාවිතයෙන් අදහස පිළිඹිබු කිරීම , රූප සටහනකින් ආකෘතියකින් හා වර්ණ වලින් විස්තර ,උපදෙස් හා අදහස් ප්‍රකාශ කිරීම හා සටහන් කිරීම ය.

## (ආ) පරිසරයට අදාළ නිපුණතා

පරිසරය යනු කුමක්දැයි ශිෂ්‍යයාට අවබෝධකර ගැනීමට සැලැස්වීම නව අධ්‍යාපනයේ පිළිගත් ප්‍රතිපත්තිමය දාර්ශනික හා මනෝ විද්‍යාත්මක සද්ධාන්තයකි. ඒ අනුව අනිවාර්යයෙන් ම ශිෂ්‍යයාට සමාජීය ජීවවිද්‍යාත්මක හා භෞතික පරිසරය පිළිබඳ මූලික අවබෝධය ලබා දිය යුතු ය.

**සමාජීය පරිසරය:**

පොදු සමාජයේ සාමාජිකයෙකු ලෙස සමාජ සම්බන්ධතා, පෞද්ගලික හැසිරීම , සාමාන්‍ය හා නීතිමය සම්මතයන් අයිතිවාසිකම් , වගකීම් හා යුතුකම් පිළිබඳ දැනුවත්කමින් නියුතු සංවේදී හැඟීමක් තිබිය යුතු ය.

**ජෛව පරිසරය :**

සජීවී ලෝකය , මනුෂ්‍යත්වය , පරිසර පද්ධතිය , ගස් , කැළෑ , මුහුදු , ජලය , වායුව , හා ජීවය (පැළෑටි , සත්ත්ව හා මනුෂ්‍ය ජීවය ආදිය හා සම්බන්ධ වූ හැඟීම් හා කුසලතාවයන් )

**භෞතික පරිසරය :**

අවකාශය , බලශක්තිය , ඉන්ධන හා ද්‍රව්‍යය පිළිබඳ නිපුණතා හා ඒ පිළිබඳ අවබෝධය මිනිස් ජීවිතයට සම්බන්ධ භාණ්ඩ , ආහාර , රෙදිපිළි , නිවාස , සෞඛ්‍යය , නින්ද , ගිමන් හැරීම , විවේකය ආදියට සම්බන්ධ වූ හැඟීම් හා කුසලතාවන් ද ඉගෙනීමට හා ජීවත් වීමට කොතෙකුත් දේ සකස් කර ගැනීම පිණිස උපකරණ භාවිතා කිරීමේ කුසලතා ද මෙයට ඇතුළත් වේ.

## (ඇ) ආචාර ධර්ම වලට හා ආගමට අදාළ නිපුණතා

මෙම තුන්වන නිපුණතා සමූහය ගුණාත්මක භාවය හා ආකල්පවලට බොහෝ දුරට අදාළ ය. සදාචාරධර්මවලට හා ආගමික වත් පිළිවෙත්වලට ද ආගමික පුද පූජා එදිනෙදා පැවැත්වෙන සිරිත් විරිත් හා ගති පැවතුම් ආදියට ද අනුකූලවන පරිදි කටයුතු කිරීමට හැකිවන සේ සදාචාරධර්මයන් තමා තුළ ඇතිකර ගැනීම අවශ්‍ය බව තහවුරු කරයි.

## (ඈ) ක්‍රීඩා හා විවේකය පිළිබඳ නිපුණතා

මෙම හතරවන නිපුණතා සමූහය සතුට හා එබඳු මානසික පෙළඹවීම්වලට සම්බන්ධ වේ. මෙය ක්‍රීඩා කිරීමෙහි හා මලල ක්‍රීඩාවෙහි හා නානාවිධ ආකාරයෙන් විවේක අවස්ථා ගතකිරීමේ දී පැහැදිලි ව විද්‍යාමාන වේ. මානසික හා ශාරීරික පැවැත්ම සඳහා මේවා අවශ්‍ය ය. තව ද, සහයෝගය දැක්වීම, කණ්ඩායම් වශයෙන් නොයෙක් ක්‍රීඩා කිරීම හා ජීවිතයේ කටයුතුවල දී සාධාරණ තරඟකාරීත්වය ආදියට සම්බන්ධ වේ.
සෞන්දර්ය අධ්‍යාපන කලාව, නාට්‍ය, සාහිත්‍ය, පර්යේෂණ හා වෙනත් මෙවැනි ආකාරයේ නිෂ්පාදනාත්මක කටයුතු ද මෙයට අන්තර්ගත ය.

## (ඈ) ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා

මෙම පස්වන නිපුණතා සමූහය ශීඝ්‍රයෙන් වෙනස්වන සංකීර්ණ ලෝකයේ ස්වභාවයට කෙලින් ම සම්බන්ධ ය. කෙනෙකු ඉගෙනගන්නා යමක් වෙතොත් එය සමීක්ෂණය කිරීමත්, යාවත්කාලීන කිරීමත් අවශ්‍ය වේ. දිගට ම සිත යොමුකර සිටීමේ ශක්තිය පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය. එමෙන් ම ඕනෑ අවස්ථාවක ඉතා සුළු දේ සම්බන්ධයෙන් පවා සැලකිලිමත් වීමට කැමැත්ත තිබිය යුතු ය. ජීවිත කාලය තුළ ඉගෙනීම පිළිබඳ නිපුණතාවේ පොදු කරුණු මේවා වේ. මේ අතර සන්නිවේදන අංශයේ පෙරළිය නිසා මෙම නිපුණතා අවශ්‍ය වේ.

(උපුටා ගැනීම ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වාර්තාව - අංක 5)

# එකොළොස්වන පාඩම

## 11. අන්තර් සභා සහජීවනය

**11.1.** කතෝලික සභාව කිතුනු සහා එකමුතුව වශයෙන් හඳුන්වා දෙනු ලබන්නේ "ත්‍රිත්ව එක දෙවියන් අදහමින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්වාමින් හා ගැලවුම්කරුවාණන් වශයෙන් පිළිගන්නෝ වෙති." මේ අනුව සහා එකමුතුව රැඳී පැවතිය යුත්තේ සභාවේ රුචි අරුචිය අනුව නොව ක්‍රිස්තුන් වහන්සේගේ වචනය අනුව ය. එනම් "පියාණෙනි, මා මෙසේ යාච්ඤා කරන්නේ ඔබ මා තුළ ද, මා ඔබ තුළ ද සිටින්නාක් මෙන් ඔවුන් ද අප තුළ ඒකත්වයක්වන පිණිසත් ඔබ මා එවා වදාළ බව ලෝකයා විශ්වාස කරන පිණිසත් ය." ජුවාම් 17/21 අනුව අනෙකුත් කිතුනු සහාද (ශු. ත්‍රිත්වය හා ක්‍රිස්තුන් වහන්සේ ගැලවුම්කාරයාණන් ලෙස පිළිගන්නා) ක්‍රිස්තුන් වහන්සේ ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය තුළ ඒකත්වයක් වීම සුවිශේෂ අනුබද්ධ ආඥාවකි. මේ අනුව සුවිශේෂක මග පෙන්වීම යටතේ බෞතිස්ම කරනු ලැබූ සියලු ම දෙනා මෙතෙක් එකිනෙකා වෙන්කර තැබීම වරදක් ලෙස පිළිගෙන දැනට එය බොහෝ දුරට නිවැරදි කර ඇත. ඒ අනුව පහත සඳහන් කිතුනු සහාවල ප්‍රසාද ස්නාපනය ශුද්ධ වූ සහා මාතාව පිළිගෙන ඇත.

- එංගලන්ත සහාව - ලංකා සහාව
- මෙතෝදිස්ත සහාව
- බවුතිස්ම සහාව
- ඩච්පෝම් සහාව - ඕලන්ද රෙපරමාදු සහාව
- ප්‍රෙස්බිටේරියන් සහාව
- දකුණු ඉන්දියා සහාව

මෙලෙස වලංගු වීම සඳහා අවශ්‍යවනුයේ ප්‍රසාද ස්නාපනය දෙන සේවකයා තම සහාවේ හෝ ක්‍රිස්තියානි සමාජයේ නිල වශයෙන් ඉගැන්වෙන න්‍යායන් විශ්වාසවන්ත ලෙස පිළිපැදීම ය.

**11.2.** කිතුනු හා එකමුතුකම ගොඩනැංවීමේදී අත්‍යාවශ්‍යයෙන් ම පොදු උනන්දුවක් ඇති කරුණු සම්බන්ධයෙන් සෙසු කිතුනු සහා සමඟ අත්වැල් බැඳගෙන යාච්ඤා කිරීමේදී හා එක්ව කටයුතු කිරීමේ අවස්ථා පිළිබඳව සැලකිලිමත් විය යුතු ය. උදාහරණ වශයෙන්

I. පොදු යැදුම් මෙහෙයවල් සංවිධානය කර ඒවාට සහභාගිවීම, ජාතික හා ආගමික ප්‍රශ්නවලදී එකට එකමුතුව ක්‍රියා කිරීම.
II. ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි ජනමාධ්‍ය වැඩසටහන්වල දී සහා එකමුතුව ක්‍රියා කිරීම.
III. පාසල් අධ්‍යාපනයට පොත් සැකසීම ධර්මෝපදේශයේ වර්ධනය සඳහා දැනට වඩා එකමුතුව ක්‍රියා කිරීම.
IV. රෝහල් සේවා සිරකරුවන් බැහැදැකීම සරසවි වැඩසටහන් සැකසීම ආදී සමාජීය ආර්ථික ක්ෂේත්‍රවල එකමුතුව ක්‍රියා කිරීම.
V. කිතුනු සහා එකමුතුවේ වැදගත්කම පිළිබඳව පූජක පැවිදි ගිහි පිරිස් දැනුවත් කිරීම විශේෂයෙන් මීසම් භාර පියතුමන් දැනුවත් කිරීම හා පුහුණු කිරීමද ඉතා වැදගත් වේ.

**11.3.** දැනට දුබල තත්ත්වයකට පත්ව ඇති සමයාන්කර සහදතාවයට නව පණක් දීමට නම් ඒ සඳහා ස්ථාවර පියවර ගත යුත්තේ සහා නායකයින් හා පූජක පැවිදි අය වේ. මන්ද සියවස් ගණන් මුළුල්ලේ කිතුනු සහාවන් අතර පැවැති වැරදි වැටහීම් හා දුර්මත දුරලීම සඳහා ප්‍රබල කැපවීමක අවශ්‍යතාවය දක්නට ලැබේ. තව ද, සහා අතර එකමුතුකම ගොඩනැගීමට නම් විනිවිද යන සුලු අවංකභාවයක් තිබිය යුතු ය. ඒ සඳහා මුල් පියවර තැබීමේ වගකීම පැවරී ඇත්තේ අපටම ය. මෙය පැහැදිලිව තේරුම් ගත්

ශුද්ධ වූ සභා මාතාව ජාත්‍යන්තර වශයෙන් හා ජාතික වශයෙන් විවිධ ක්‍රියාමාර්ග ගැනීමට මඟ පෙන්වීම ලබා දී ඇත.

I. විශේෂයෙන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මේ පිළිබඳ අවධානය යොමුකොට ක්‍රිස්තියානි සභා අතර සුහදතාවය නගාලීමේ නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා සෑම රාජගුරු පදවියකට ම පූජා ප්‍රසාදිවරුන්ගෙන්ද, පැවිද්දන් හා ගිහියන්ගෙන් ද යුත් කොමිසන් සභාවක් පත් කළ යුතු යැයි ප්‍රකාශ කිරීම.

II. මුළු දිවයිනේම සුහදතාවය නඟාලීමේ කාර්යයන් හැසිරවීම සඳහා විශේෂඥයන්ගේ සහය ද ඇති ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම. මේ කොමිෂන් සභාවේ ප්‍රධාන කටයුත්ත විය යුත්තේ සුහදතාව නඟාලීම සම්බන්ධයෙන් මග පෙන්වීම ද, සුහදතාව නඟාලීම ද වේ. ඊට අමතරව දේව නියමයන්, වෙනත් ව්‍යවස්ථාවන් හා නීත්‍යානුකූල සම්ප්‍රදායන් අනුව විශේෂ අවස්ථාවලදී ක්‍රියාකළ යුතු ආකාරය පෙන්වාදීම ද රාජගුරු පදවිවල ක්‍රියාකාරීත්වයන් එකලස් කිරීම ද වන්නේය.

III. මේ අනුව **1993** දී ආගම් අතර එකමුතුව පිළිබඳ නිකුත් කළ නියෝග ප්‍රමාද නොකර ශ්‍රී ලංකාව තුළ ක්‍රියාවට නැංවීම.

IV. කිතුනු සහා එකමුතුව ගැන උනන්දුවක් දක්වන ගිහි පැවිදි අයගෙන් සමන්විත කුඩා කණ්ඩායම් විමර්ශන, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා සංවිධානය කිරීම.

V. කිතුනු සහා එකමුතුව පිළිබඳ ශුද්ධාසනයෙන් නිකුත්කර ඇති ලිපි ලේඛන සිංහලෙන් හා දෙමළ භාෂාවෙන් නිකුත් කිරීම. මෙතෙක් සාකච්ඡා කළ කරුණු ක්‍රියාත්මක කරන විට කිතුනු සහා එකමුතුව වර්ධනය වේ.

ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි අවංක විශ්වාසයකින් හා සැබෑ ආදරයකින් යුතුව දෙවි මහෝත්තමයාණන් විසින් ප්‍රකාශිත ශු. බයිබලය කෙරෙහි අචල ගරුත්වයක් දක්වන්නේ නම් ඕනෑ ම සභාවක් සමඟ එකමුතුව ක්‍රියා කිරීම වරදක් නොවේ. එසේ වුවද මූලධර්මවාදීන් දරන දර්ශනය හාත්පසින් ම වෙනස් වූවකි. ඔවුහු කතෝලික හා සෙසු සභා හෙළා දකිති. අර්ථ විරහිත මතවාදීන් හි යෙදෙන අතර ශු. බයිබලය සම්බන්ධව විවිධ මත හා වචනාර්ථ අර්ථකථනයෙන් ඉදිරිපත් කොට බයිබලය පිළිබඳ නිසි අවබෝධයක් නොමැතිව අහිංසක බැටළු පැටවුන් නොමග යවමින් අනෙකුත් කිතුනු සභාවලින් ඔවුන් උදුරා ගැනීම ය. මෙය කිතු තුමන්ගේ වචනයට එරෙහිව යාමකි. “ඔබ ගොස් සකළ ජාතීන් ගෝලයන් කරන්න.” (මතෙව් 28:19) මේ අනුව ඔවුන් කරනුයේ ගෝලයන් කිරීම නොව ගෝලයන් සොරකම් කිරීම ය. එහෙත් ඔවුන්ගේ සභාවන් තුළ පවතින උණුසුම් සුහදශීලී සමීප සම්බන්ධතාවය ක්ෂණික යැදුම් ජනතා අවශ්‍යතාවයන් තුළදී ඔවුන් දක්වන වැඩි උනන්දුව අප අගය කළ යුතු ය. එය අපට මහත් ආදර්ශයකි.

**11.4** දෙවන වතිකාන කතිකාවතින් ඇරඹූ මඟ අනුව සංවාදය අත්‍යාවශ්‍ය අංගයක් වශයෙන් ප්‍රකාශයට පත්විය. **වර්තමාන ලෝකයේ ශු. සභාව** නම් ලේඛනයේ එම සංවාදය විවිධ අය සමඟ යොමු කරන ලදී.

- අදේව වාදීන්
- සභා විරුද්ධවාදීන් සමඟ
- සභාව තුළම විවිධ මතධාරීන් සමග
- සංවාදය සාමය ළඟා කර ගැනීමේ මඟක් වශයෙන් පිළිගන්නා ලදී.
- සංවාදය සැබෑ අයුරින් සිදු නොවීම නිසා ඇතිවූ ගැටළු.
- මිථ්‍යා මත පැතිරීම
- දෙවන ජුවාම් පාවුළු පාප් තුමන්ගේ සංචාරයේදී ඇති වූ විරෝධය
- මූලධර්මවාදීන්ගේ වැරදි මත පොදු ක්‍රිස්තියානි මතය වශයෙන් පැතිරීම
- බහුතරය සැක කිරීම - සාම ප්‍රයත්නයෙදී පවා සැක කිරීම
- මුදලේ බලයෙන් ආගමට හරවා ගන්නවා යන චෝදනාව එල්ල වීම
- කිතුනු ආයතන පවත්වාගෙන යන සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි සැක සහිතව බැලීම.

- ආගමික මූල ධර්මවාදීන් හිස එසවීම - බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආගම්වලද මෙම සංවාදය ක්‍රියාත්මක නොවීම.
- සංවාදය මගින් රටම ගිලගෙන ඇති පොදු සතුරා පරාජය කිරීමට හැකිවනු ඇති අතර සංවර්ධනය කරා පියවර මැනීමට පහසුවනු ඇත.

## 11.5 ශු. පාවුළුතුමා අන්‍යාගමිකයින් සමග සංවාදයේ යෙදුණු අවස්ථා සඳහන් සුවිශේෂ පාඨයන්

1. ක්‍රියා 13:15-41 පිසිදියේ හා අන්තියෝකයේ වැසියන් සමඟ ඇතිකර ගත් සංවාදය. මෙම සංවාදයේ ක්‍රිස්තුන් වහන්සේ කවුද යන්න වටහා දීම සඳහා සිදු කෙරිණි.
2. ක්‍රියා 14:11-78 විශ්වයේ විවිධ දෙවිවරුන්ට වන්දනා කරමින් සිටි ලුස්ත්‍රාවේ වැසියන් සමඟ සංවාදය. මෙය ඔහුගේ ජීවිතාදර්ශයෙන් පෙන්වා දීමට සිදුවිය.
3. ක්‍රියා 17:18-31 ඇතැන්ස් හි එපිකූරිය හා ස්තොයික දාර්ශනිකයින් සමඟ ඇතිකර ගත් සංවාදය
4. එපීස සහ කොලෝසිවරුන්ට යැවූ ලිපි, එපීස හා කෙලෝසිවරුන්ට යැවූ හසුන්වලින් මුළු ආසියාවේ නොස්ටික් වරුන් සමග සංවාදය, එදා තිබූ සංස්කෘතිය හා භාෂාවන් සමඟ ඇතිකරගත් සමීප සම්බන්ධතාවය මෙහිදී පෙන්වා දෙයි.

### නිගමනය

සංවාදය දෙවියන්ගේ ක්‍රියාවකි. එතුමාගේ ගමන් මඟයි. එම නිසා සංවාදයේ යෙදීම දෙවියන්ට කරන ගෞරවයකි.

සංවාදය ජීවිත වෙනසකට කරන ආරාධනාවකි. අන් අයගෙන් බොහෝ ඉගැනීමට ඇත. සංවාදය මගින් බටහිර දේව ධාර්මික චින්තන රටාවෙන් බැහැර වීමකි. මේ අනුව දේශීය මෙන් ම පෙර දිග චින්තන රටාවන් අවබෝධකර ගැනීමට ඇරයුමක් අඩංගු ය.

- සංවාදය දේශාණුරූපිකරණය සමඟ බැඳෙනු ඇත.
- සංවාදය වහල් බවින් මිදෙන්නට කරන ඇරයුමකි.
- සංවාදය මගින් තමන් තුළ ශරීරිකව ප්‍රවීණ චින්තනයන්ගෙන් බැහැරව විවෘත වීමට ඇරයුමක් ඇත.
- සංවාදයේ යෙදීමේ දී දේශපාලන භූමිකාවක් ද ඇත. එය හුදු පෞද්ගලික ක්‍රියාවක් නොවේ.
- සංවාදය එක් ක්‍රියාවකට සීමාවන්නක් නොව අඛණ්ඩව පවත්වා ගත යුතු ගමනකි.
- සංවාදය භාෂාමය ක්‍රියාවකි. වාචිකව අදහස් දැක්වීමකි.

## 11.6 අන්තර් ආගමික සබඳතාවය

1. දෙවියන් වහන්සේ මිනිසා මවන ලද්දේ සාමූහිකව සහජීවනයෙන් ජීවත්වීමට ය. ශුද්ධ බයිබලය අනාවරණය කරන පරිදි උන්වහන්සේ තම ස්වරූපය අනුව ස්ත්‍රිය ද, පුරුෂයා ද වශයෙන් වෙන්කර මැව් අතර ජාති කුල ආගම් වශයෙන් මැවූ බවක් සඳහන් නොවේ. එහෙත් ලෝක ඉතිහාසය තුළ කාලයත් සමඟ විවිධ ආගම් බිහිවී ඇතත් ඒ සෑම ආගමකට ම අයත්ව සිටින්නෝ අපේ ම සහෝදරයන් ය. "දෙවියන් වහන්සේගේ ස්වරූපයට මවන ලද මනුෂ්‍යයන් අතරින් සමහරු සහෝදරයින් ලෙස සැලකීමට අප කැමැති නොවෙමු නම් සියළු දෙනාගේ පියාණන්වන දෙවියන් වහන්සේට සාක්ෂිකාරයෙක් වශයෙන් ආරාධනා කරන්නට අපට නොපුළුවන." (දෙවන වතිකාන ප්‍රකාශන) "ප්‍රේම නොකරන්නා දෙවියන් වහන්සේ නාඳුනයි" (1 ජුවාම් 4/8). මේ අනුව දේව කැමැත්ත නම් සියළු ආගමිකයන් සහෝදරයන් සේ සලකා ක්‍රියා කිරීම ය.

2. ශ්‍රී ලංකාව තුළ අප ජීවත්වනුයේ 90% වඩා වෙනත් ආගම් අදහන ජනතාවක් සමඟ ය. මේ අනුව අප දේශය තුළ අන්තර් ආගමික සබඳතාව ඉතා වැදගත් ය. එය දෙවිපියාණන්ගේ ගැලවීමදායක කාර්ය ප්‍රකාශ කිරීමට මහඟු අවස්ථාවක් ද වේ. මේ ගැන කතා කරන දෙවැනි වතිකාන මන්ත්‍රණ සභාව "කතෝලික සභාව ආගම්වල දක්නට ලැබෙන සත්‍යය වූද, ශුද්ධ වූද දේවලින් කිසිවක් ප්‍රතික්ෂේප නොකරයි. අනෙක් ආගම්වල ක්‍රියා, ක්‍රමයන් හා ජීවිත ක්‍රමයන් ද, ශික්ෂාවන් හා ඉගැන්වීම ද ශුද්ධ වූ සභාව අවංක ගෞරවයේ සලකයි." මේ අනුව ශුද්ධ වූ සභා මාතාව මනුෂ්‍යයන් අතරේ වෙනස්

වුද ජාති, ආගම්, වර්ණ නිසා කෙරෙන හිරිහැර ද ක්‍රිස්තුන් වහන්සේගේ අභිප්‍රායට නොගැලපෙන දේවල් මෙන් ප්‍රතික්ෂේප කරයි. "ස්වර්ගයෙහි වැඩසිටින පියාණන් වහන්සේගේ දරුවන්වන පිණිස තමන්ට හැකි පරිද්දෙන් සියළු මනුෂ්‍යයන් සමග සමාදානයෙන් සිටින්න." (රෝම 12:18)

### 11.6.1 මේ සඳහා

1. අන්‍යෝන්‍ය වශයෙන් තමන්ගේ ඇදහිල්ලට සාක්ෂි දැරීම.
2. අනෙකුත් ආගම් සමග නිතර නිතර සංවාද ඇති කිරීම.
3. එකනෙකාට උදව් කිරීම බෙදා හදා ගැනීම තුළින් අන් අයගේ ප්‍රීතිය දුක සහ වේදනාවට සම්බන්ධව එකමුතු වීම.
4. සමාජ සංවර්ධන කටයුතු සඳහා (ක්‍රීඩා, සෞඛ්‍ය, අසරණයන්ට පිහිට වීම) අන්‍යාගමිකයන් සමග එකමුතුව ක්‍රියා කිරීම.
5. දිළිඳුකම, නූගත්කම, ලෙඩ රෝග, නිවාස හිඟය වැළැක්වීමට සංවිධානයවන ඕනෑම ආගමික සංවිධානයක් සමඟ එකමුතුව ක්‍රියා කිරීම.
6. ආගම් කෙරේ ඇති දුර්මත ඉවත ලා ඒවාට ගෞරව කිරීම. ඒතුළ ඇතිකරගත් අවිශ්වාසය එදිරිවාදිකම් නැතිකර සුහදශීලිව එකිනෙකා පිළිගැනීම.
7. සමාජ සාධාරණත්වය තුළ ක්‍රියාත්මක කරමින් සෑම ආගමික උත්සවයක් ම අගය කරමින් ඒවාට එකමුතුවෙමින් සියළු දෙනා සමග සුහදශීලිව ජීවත් වීම.

# ශාස්ත්‍රීය රචනයක් ලියන්නේ කෙසේ ද?

1. දහම් ගුරු තුන්වන විභාගය සමත්වන අපේක්ෂකයන්ට මාතෘකා තුනක් දෙනු ලැබේ. එම මාතෘකා අතරින් ඔබ කැමති එක් මාතෘකාවක් තෝරාගෙන රචනය ලිවිය යුතුවේ.
2. ඔබ මාතෘකාවක් තෝරා ගැනීමේ දී ප්‍රමාණවත් තරම් කරුණු සොයා ගත හැකි, ඔබ පුද්ගලිකව රුචිකත්වයක් දක්වන අංශයකින් මාතෘකාවක් තෝරා ගන්න.
3. ඔබ ලියන රචනයේ අලුත් බවක් තිබිය යුතුය. ඒ නිසා ඔබගේ සොයා ගැනීම්, මෙනෙහි කිරීම් හා අත් දැකීම් ඇතුළත් කළ හැකි මාතෘකාවක් තෝරා ගන්න. අදාළ මාතෘකාව පිළිබඳ අවබෝධයක් හා අත්දැකීම් ඇති පුද්ගලයන් සමග සාකච්ඡාකර කරුණු රැස් කරගන්න.
4. රචනය ලිවීමට පෙර දළ සටහනක් පිළියෙල කරන්න. පළමුව පරිච්ඡේද, මාතෘකා ලියා හැකි තරම් ඒවායේ අනු කොටස් ද වෙන්කර ගන්න.
5. ඔබට දී ඇති මාතෘකාව ගැන සැමවිටම අවධානය යොමු කරමින් පරිච්ඡේද පෙළගැස්විම ද, ඒවායේ අනුජේද ගොඩ නැගිමද කළ යුතුය. මෙය මාතෘකාව තුළම ගැඹුරට කරුණු විවරණය කරන රචනයක් වීම වැදගත් බව සළකන්න.
6. මෙම දළ සටහන පිළියෙල කිරිමට පෙර තම මාතෘකාවට අදාළව මෙතෙක් ලියැවි ඇති පොත් පත් කියවා බැලීම ප්‍රයොජනවත් ය.
7. ඔබේ රචනය සඳහා පෙළගැස්වු පරිඡේද ගණනට, වෙන වෙනම පත්‍රිකාව බැගින් වෙන්කර එවායේ පරිච්ඡේද ශිර්ෂයක් ලියා නම්කරන්න. පරිශීලන ග්‍රන්ථ කියැවීමේ දී, ඒ ඒ පරිච්ඡේද ශිර්ෂයට ගැලපෙන කොටස් ඔබට හමුවු විට එම කොටස්, එහි පිටුව, පොතේ නම, අදාළ වාක්‍ය කාණ්ඩ, කලින් වෙන් කරන ලද අදාළ පත්‍රිකාවෙහි සටහන් කරන්න.
8. තමා විසින් සකස් කළ ව්‍යුහයට අදාළව, රචනය නිර්මාණය විය යුතුය.
9. හැඳින්වීම, අභිමතාර්ථ, ප්‍රධාන කාණ්ඩ, නිගමනය පැහැදිලි ලෙස ඉදිරිපත් කළ යුතුය.
10. කරුණු ක්‍රමාණුකූලව පිළියෙල කළ යුතු වේ. සිරස්තල, උප සිරස්තල, ඡේද බෙදීම් ගැන සැලකිළිමත්වී ඒකාබද්ධතාව හා ගැලපෙන සුළු බව රැකෙන ආකාරයට පරච්ඡේද බෙදිය යුතුවේ.
11. පරිච්ඡේද අතර හොඳ සමබරතාවක් හා හොඳ සම්බන්ධතාවයක් තිබිය යුතුය. මුළු රචනයේ ම ඒකාබද්ධතාවය හා ගැලපෙන සුලුබව රැකෙන ආකාරයට පරිච්ඡේද බෙදිය යුතුය.
12. රචනය මගින් ඔබ අවධාරණයෙන් කියන යමක් තිබිය යුතුය. සෑම පරිච්ඡේදයක්ම එම මූලික කරුණට අදාළවිය යුතුය.
13. රචනය ආරම්භයේ දී හැඳින්වීම සහ අවසානයේ දි නිගමනය තිබිය යුතුය. හැඳින්වීම සඳහා ඔබගේ රචනයේ තේමාව හඳුන්වා දි එවැනි තේමාවක් තෝරා ගැනිමට විශේෂයෙන් හේතුවු කරුණු සඳහන් කළ හැක. ඒ හැර ප්‍රයොජනවත් වේ යැයි හැඟෙන වෙනත් තොරතුරු ද මෙහි ඇතුළත් කළ හැක. නිගමනය සඳහා රචනයේ අඩංගු කරුණුවලින් නිගමනයවන දේ සාරාංශ කොට දැක්විමක් මෙහි සිදුවිය යුතුය.
14. ඔබ ලියන රචනයට අදාළව ශුද්ධවු බයිබලයේ කොටස් ඉදිරිපත් කළ යුතුය. මාතෘකාවට අදාළ ශුද්ධවු සභාවේ ඉගැන්වීම් (දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් හා සභා නිල ප්‍රකාශයන්, විශ්ව ලේඛන සහ ලිපිවලින් අදාළ කොටස් සනාථ කිරීම වැදගත් ය.
15. රචනය ලිවීමේ දී මාතෘකාවට අදාළ කරුණු මූලාශ්‍ර ග්‍රන්ථ, සෙසු පරිශීලන ග්‍රන්ථ හා සඟරා යනාදියෙන් ගත හැක. එසේ ගත් කරුණු කුමන පොතකින් ද? එහි කර්තෘ කවුරුන් ද යන්න සඳහන් කළ යුතුවේ.
16. සමහරු විවිධ පතපොතින් උපුටා ගත් කරුණු පමණක් ඇතුළත් කර සම්පූර්ණ රචනයම ලිවීම කරනු ලැබේ. එසේ කිරිම වැරදි සහගත ය.
17. රචනය, ප්‍රායෝගික ජිවිතයට හා එදිනෙදා ජිවිතයට සම්බන්ධ කර ලිවිය යුතුවේ. එනම් පවුල, මීසම, සමාජය.
18. පැහැදිලි ලෙස අදහස් ඉදිරිපත් කළ යුතුය. අක්ෂර වින්‍යාසය ගැන සැළකිලිමත් වීම වැදගත් ය.
19. ඔබ ලියන රචනය වචන 2000 කට වැඩි විය යුතුයි. (අඩු තරමේ වචන 2000 ක් වත් බලාපොරොත්තු වේ.
20. රචනය පැහැදිළි ලෙස තනි පිටුවේ අත් අකුරුන් ලියා හෝ යතුරු ලියනයකර හෝ පරිඝනකයෙන් පිටපත් කර එවිය යුතුය.

**ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය,**
**"ලංකාරාම"**
**19, බැල්කම් පෙදෙස,**
**කොටා පාර, කොළඹ - 8.**

**දුරකථනය : 011-2685459**
**ෆැක්ස් : 011-2665021**
**විද්‍යුත් තැපෑල :** natcatbible@gmail.com